329 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 329 - இல. 5
Volume 329 - No. 5

2026 සැප්තැම්බර් 08 වන අඟහරුවාදා
2026 செப்ரெம்பர் 08, செவ்வாய்க்கிழமை
Tuesday, 08th September, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශ:**
 මහජන ආරක්ෂක ප්‍රකාශනය [තීරුව 759]
**නිවේදන:**
 ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය [තීරුව 761]
 කථානායකතුමාගේ සහතිකය [තීරුව 765]
 විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් [තීරුව 765]
 දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් [තීරුව 766]
 අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් [තීරුව 770]
**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 771]
**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අයවැය ඇස්තමේන්තුව** [තීරුව 771]
**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 778]
**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 778]
**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 780-815]
**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
 **නිෂ්පාදන ආයෝජන රට තුළ රඳවා ගැනීම සඳහා අපනයනකරුවන්ට පහසුකම් සැලසීම** [තීරුව 815]
**ඔලුවිල් වරාය සංවර්ධන ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය:**
 වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 818]
**විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත:**
 පළමුවන වර කියවන ලදී [තීරුව 823]
**විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත:**
 පළමුවන වර කියවන ලදී [තීරුව 824]
**මෝටර් වාහන පනත:**
 **නියෝග** [තීරු 824-930]
**කල් තැබීමේ යෝජනාව:**
 හානිකර සමාජ මාධ්‍යවලින් බාලවයස්කාර දරුවන් ආරක්ෂා කර ගැනීම [තීරු 931-941]
**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 941-956]


---

# பிரதான உள்ளடக்கம்


**சனாதிபதியிடமிருந்து வந்த செய்திகள்:**
 பொதுசனப் பாதுகாப்புப் பிரகடனம் [ப: 759]
**அறிவிப்புகள்:**
 இலங்கை ஊடக உயர்தொழிலர்களின் பட்டயம்பெற்ற நிறுவகம் சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு [ப: 761]
 சபாநாயகரது சான்றுரை [ப: 765]
 அரசியலமைப்புக்கான இருபத்திரண்டாம் திருத்தம் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள் [ப: 765]
 ஊழல் எதிர்ப்பு (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள் [ப: 766]
 நீதித்துறை (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள் [ப: 770]
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை [ப: 771]
**இலஞ்சம் அல்லது ஊழலுக்கெதிரான சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவின் வரவு செலவுத்திட்ட மதிப்பீடு** [ப: 771]
**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 778]
**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 778]
**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 780-815]
**தனி அறிவித்தல் மூல வினா:**
 உற்பத்தித்திறன்மிக்க முதலீடுகளை நாட்டில் தக்க வைத்துக்கொள்வதற்கு ஏற்றுமதியாளர்களுக்கு வசதியளித்தல் [ப: 815]
**ஒலுவில் துறைமுக அபிவிருத்தித் திட்டத்தின் தற்போதைய நிலை:**
 துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரினது கூற்று [ப: 818]
**நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் (திருத்தம்) சட்டமூலம்:**
 முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 823]
**நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் (திருத்தம்) சட்டமூலம்:**
 முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 824]
**மோட்டார் வாகனச் சட்டம்:**
 ஒழுங்குவிதிகள் [ப: 824-930]
**ஒத்திவைப்புப் பிரேரணை:**
 தீங்கு விளைவிக்கும் சமூக ஊடகங்களிலிருந்து சிறுவர்களைப் பாதுகாத்தல் [ப: 931-941]
**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 941-956]

# PRINCIPAL CONTENTS

MESSAGES FROM THE PRESIDENT:
Public Security Proclamation [Col. 759]

ANNOUNCEMENTS:
Chartered Institute of Media Professionals of Sri Lanka Bill: Determination of the Supreme Court [Col. 761]
Speaker's Certificate [Col. 765]
Twenty Second Amendment to the Constitution Bill: Petitions to the Supreme Court [Col. 765]
Anti-Corruption (Amendment) Bill: Petitions to the Supreme Court [Col. 766]
Judicature (Amendment) Bill: Petitions to the Supreme Court [Col. 770]

AUDITOR-GENERAL'S REPORT [Col. 771]

BUDGET ESTIMATE OF COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION [Col. 771]

PUBLIC FINANCE COMMITTEE REPORT (Col. 778]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 778]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 780-815]

QUESTION BY PRIVATE NOTICE:
Facilitation of Exporters to Retain Productive Investments in the Country [Col. 815]

CURRENT STATUS OF OLUVIL PORT DEVELOPMENT PROJECT:
Statement by Minister of Ports and Civil Aviation [Col. 818]

POISONS, OPIUM AND DANGEROUS DRUGS (AMENDMENT) BILL:
Read the First time [Col. 823]

POISONS, OPIUM AND DANGEROUS DRUGS (AMENDMENT) BILL:
Read the First time [Col. 824]

MOTOR TRAFFIC ACT:
Regulations [Cols. 824-930]

ADJOURNMENT MOTION:
Safeguard Underage Children from Harmful Social Media Platforms [Cols. 931-941]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 941-956]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 සැප්තැම්බර් 08වන අඟහරුවාදා***
*2026 செப்ரெம்பர் 08, செவ்வாய்க்கிழமை*
*Tuesday, 08th September, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශ
## சனாதிபதியிடமிருந்து வந்த செய்திகள்
## MESSAGES FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පහත සඳහන් සන්දේශය ගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා.

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
**President of Sri Lanka**

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/7/IX/3/01

2026 අගෝස්තු මස 25 වන දින

**ගරු අයි.ඩබ්ලිව්.එම්. ජගත් වික්‍රමරත්න මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

අනුර කුමාර දිසානායක
ජනාධිපති



## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
### இலங்கை ஊடக உயர்தொழிலர்களின் பட்டயம்பெற்ற நிறுவகம் சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு
### CHARTERED INSTITUTE OF MEDIA PROFESSIONALS OF SRI LANKA BILL: DETERMINATION OF THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

I wish to inform that I have received the Determination of the Supreme Court in respect of the Bill titled "Chartered Institute of Media Professionals of Sri Lanka", which was challenged in the Supreme Court in terms of Article 121(1) of the Constitution.
The Supreme Court has determined that,

(i) Clause 3(i) of the Bill is vague and is therefore inconsistent with Articles 12(1) and 14(1)(g) of the Constitution and may only be passed by the special majority required under Article 84(2) of the Constitution. The inconsistency would cease if the said Clause is deleted.

(ii) Clause 4(o) of the Bill is inconsistent with Articles 12(1) and 14(1)(g) of the Constitution and may only be passed by the special majority required under Article 84(2) of the Constitution. The inconsistency would cease if the said Clause is amended as proposed by the Court.

(iii) Clause 5(4)(b) of the Bill is inconsistent with Article 12(1) of the Constitution and may only be passed by the special majority required under Article 84(2) of the Constitution. The inconsistency would cease if Clause 5 is amended as proposed by the Court.

(iv) The rest of the Clauses of the Bill are not inconsistent with the Constitution.

I order that the full Determination of the Supreme Court be printed in the Official Report of today's Proceedings.

***ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය:***
*உயர் நீதிமன்றத் தீர்ப்பு:*
*Determination of the Supreme Court:*

**IN THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**

**"CHARTERED INSTITUTE OF MEDIA PROFESSIONALS OF SRI LANKA" BILL**

1. Udaya Kalupathirana,
No. 45/12, Ernest Place,
Lakshapathiya,
Moratuwa

2. Sunil Jayasekara,
No. 19,
Richard De Soysa Housing Complex,
Thalangama North, Battaramulla

**PETITIONERS**

**S.C.S.D. No. 27/2026**

Vs.

1. Hon. Attorney General,
Attorney General's Department,
Colombo 12.

2. Dr. Nalinda Jayatissa,
Minister of Health and Mass Media
Ministry of Health and Mass Media
No. 168, Asi Disi Medura,
Kirulapone Mawatha, Polhengoda,
Colombo 05.

3. Dr. Anil Jasinghe,
Secretary of Health and Mass Media ,
Ministry of Health and Mass Media,
No. 168, Asi Disi Medura,
Kirulapone Mawatha, Polhengoda,
Colombo 05.

**RESPONDENTS**

Counsel for the Petitioners: Lakshan Dias with Maneesha Kumarasinghe instructed by Dayani Panditharathne.

Counsel for the State: Kanishka De Silva Balapatabendi, DSG with Raidha Rizvi, SC instructed by Nimalika Wickremasinghe, SSA.

Before : Janak De Silva, J.
Dr. Sobhitha Rajakaruna, J.
Sampath B. Abayakoon, J.

The Court assembled for hearing at 10.00 a.m. on 7th August, 2026.

A Bill titled *"Chartered Institute of Media Professionals of Sri Lanka"* (Bill) was published as a Supplement to Part II of the Gazette of 5th June, 2026 and placed on the Order Paper of Parliament on 22nd July 2026 in accordance with Article 78(1) of the Constitution.

The jurisdiction of Court to determine the constitutionality of the Bill has been invoked by the Petitioners in terms of Article 121(1) of the Constitution. Court issued notice on the Hon. Attorney General as required by Article 134(1) of the Constitution.

The Petitioners have prayed *inter alia* that this Court declare that the Bill in whole or in part thereof, is inconsistent with all the Articles of the Constitution and require to be passed by not less than two-thirds of the whole number of Members of Parliament and approved by the People at a Referendum by virtue of the provisions of Article 83.

We have heard the Petitioners and the Hon. Attorney-General.

***Jurisdiction of Court***

This Court is exercising the jurisdiction vested on it in terms of Article 120 of the Constitution which requires it to determine whether the Bill in its entirety or any of its provisions is inconsistent with the Constitution. When a primary determination is made as provided in Article 123(1) as to any inconsistency with the Constitution, the consequential determinations the Court is required to make are specified in Article 123(2) which reads:

*"(2) Where the Supreme Court determines that the Bill or any provision thereof is inconsistent with the Constitution, it shall also state –*

*(a) whether such Bill is required to comply with the provisions of paragraphs (1) and (2) of Article 82; or*

*(b) whether such Bill or any provision thereof may only be passed by the special majority required under the provisions of paragraph (2) of Article 84; or*

*(c) whether such Bill or any provision thereof requires to be passed by the special majority required under the provisions of paragraph (2) of Article 84 and approved by the People at a Referendum by virtue of the provisions of Article 83,*

*and may specify the nature of the amendments which would make the Bill or such provision cease to be inconsistent."*

***Drafting History***

The drafting history of the Bill is reflected in several Cabinet Memoranda and the decisions taken thereon, copies of which have been made available to Court by the learned Deputy Solicitor General.

The Minister of Mass Media, by Cabinet Memorandum dated 24.09.2021, sought the approval of the Cabinet of Ministers for the establishment, under the Ministry of Mass Media and with State sponsorship, of a higher education, research and training institute for media, to be named the "Chartered Institute of Journalists – Sri Lanka". The Memorandum also sought approval for the drafting of the Bill necessary for the establishment of the said institution, the preparation of a project report relating to its establishment and the implementation of future activities in accordance with such project report.

The justification advanced for the establishment of the proposed institution was that, although four institutions within the university system conduct degree courses in mass communication, none of them provides the practical and technological knowledge considered necessary for the production of professional journalists, thereby giving rise to a number of issues within the Sri Lankan media culture. The Cabinet of Ministers granted its approval to the proposal on 05.10.2021.

It appears that, thereafter, the Minister of Mass Media presented a Note to the Cabinet dated 29.07.2022, entitled "Amending the name of the Chartered Institute of Journalists – Sri Lanka that has been proposed to be established by the Ministry of Mass Media as the 'Chartered Institute of Media Professionals – Sri Lanka'". The said Note, however, has not been tendered to Court.

The decision taken thereon on 15.08.2022 has, however, been made available to Court. By that decision, it was resolved to amend the name of the proposed institution to "Chartered Institute of Media Professionals – Sri Lanka". It was further decided to instruct the Legal Draftsman to draft legislation for the establishment of the "Chartered Institute of Media Professionals – Sri Lanka", based on the preliminary draft annexed to the said Note, having due regard to the observations made by the Minister of Finance, Economic Stabilization and National Policies.

Among the observations of the Minister of Finance, Economic Stabilization and National Policies were that the proposed institution should be established without State patronage and should comprise independent media professionals; provisions enabling the Minister to appoint members to the institution and permitting public officers to serve as ex officio members should be removed; provisions enabling the institution to make use of State resources should be removed; the institution should not be permitted to employ public servants or officers receiving a salary from the State; and the institution should be independent of the State and administered by professional media personnel.

On 19.03.2025, the Minister of Health and Media presented a Cabinet Memorandum entitled "Act to establish the Chartered Institute of Media Professionals". It appears that this Memorandum was presented following an intimation by the Legal Draftsman that fresh approval of the Cabinet of Ministers was required in order to proceed further with the draft Chartered Institute of Media Professionals Bill. On 07.04.2025, the Cabinet of

Ministers granted policy approval for the introduction of the Chartered Institute of Media Professionals of Sri Lanka Act and instructed the Legal Draftsman to expedite the finalization of the Bill for that purpose.

Thereafter, the Minister of Health and Media presented a Cabinet Memorandum dated 09.03.2026, to which a copy of the Chartered Institute of Media Professionals Sri Lanka Bill was annexed. The approval of the Cabinet of Ministers was granted on 30.03.2026.

***Overview of the Bill***

The Bill seeks to provide for the establishment of the Chartered Institute of Media Professionals (Institute) with a view to introducing and maintaining the professional standards for media professionals and matters connected therewith.

Part I deals with the establishment of the Institute, its objects, powers, duties and functions.

Part II deals with the management and administration of the affairs of the Institute. It provides for the establishment of a Governing Council (Council) and an Interim Council, which is intended to manage and administer the affairs of the Institute until the Governing Council is appointed.

Part III deals with the fund of the Institute.

Part IV contains general provisions.

***Clause 3(i)***

This identifies one of the objects of the Institute as *to accredit the media professionals in media professionalism at the evaluation of their efficiency*.

The learned Counsel for the Petitioner submitted that this is vague and has the effect of restricting media professionals from performing their professional functions and is contrary to Articles 12(1) and 14(1)(g) of the Constitution.

Learned DSG submitted that it is not intended to impose such restrictions.

In **Special Goods and Services Tax Bill [SC SD 01-09/2022]** it was held (at pages 35-36):

> *"Thus, it is seen that unspecific, wide and unregulated discretion is to be vested in the Minister. The conferment of such absolute and unfettered discretionary power distinctly lends itself to manifestly unreasonable, capricious or arbitrary decision making. It is necessary to emphasize that when unfettered and absolute power is vested in a human being or a group of persons, cannot be a guarantee of objectivity, reasonableness, absence of arbitrariness, protection of national and public interest, and the power will not be abused or used for corrupt purposes. The only assurance of objective, purposive, reasonable and transparent decision-making arises out of the vesting of well-structured power which must be exercised in accordance of well-defined, specific and objective criteria developed for the specific purpose of achieving objectives for which power has been vested. This Court needs to highlight that absolute and unfettered discretion being vested in an officer of the Executive is a recipe for (i) unreasonable and arbitrary decision-making, (ii) abuse of power, (iii) corruption, and (iv) the roadway to depredation of the Rule of Law On all such accounts, it results in an infringement of Article l2(1) of the Constitution which guarantees equal protection of the law."*

In **Colombo Port City Economic Commission Bill [S.C.S.D. Nos. 04/2021, 05/2021 ,07-23/2021]** it was held (at page 30):

> *"Upon reading of the Bill, the Court is of the view that the regulatory structure set out in the Bill lacks clarity and provides for the exercise of arbitrary power by the Commission and thus, inconsistent with Article 12(1) of the Constitution."*

In **Prevention of Terrorism (Temporary Provisions) Amendment Bill [S.C.S.D. No. 13-18/2022]** Court (at pages 36- 38) that:

> *"When a provision of law is vague, it would only benefit the wrongdoer. Such a provision would not uphold the Rule of Law.*
>
> *This Court has stated time and again that vagueness must be avoided in the bills in order to make such provisions consistent with Article 12(1) of the Constitution."*

This approach was approved in the **Petroleum Products (Special Provisions) Bill Determination [S.C.S.D. 50-52/2022]**.

We are of the view that Clause 3(i) is vague. It is not clear as to what is meant by *accredit*. Neither is it clear how the evaluation of their efficiency will be done.

We accordingly determine that Clause 3(i) is vague and is therefore inconsistent with Articles 12(1) and 14(1)(g) of the Constitution and may only be passed by the special majority required under the provisions of paragraph (2) of Article 84. The inconsistency will cease if Clause 3(i) is deleted.

***Clause 4(o)***

This empowers the Institute *to take necessary steps to introduce, develop, maintain and monitor professional standards in the field of media*.

The words *maintain* and *monitor* has wide import and is vague. It is inconsistent with Articles 12(1) and 14(1)(g) of the Constitution and may only be passed by the special majority required under the provisions of paragraph (2) of Article 84. The inconsistency will cease if Clause 4(o) is amended to read as follows:

> *"to take necessary steps to introduce and develop professional standards amongst the students and members of the Institute"*

***Clause 5(4)(b)***

This empowers the Interim Council to make rules in respect of the number of members to be selected and the criteria to select such members to the Institute and to elect and appoint members and the office bearers to the Council.

This to some extent mirrors the power given to the Council by Clauses 26(1)(a) and (b). However, Clauses 26(3), (4) and (5) specifies a procedure by which such rules made by the Council should be published and placed before Parliament for approval. Nevertheless, similar safeguards have not been specified for rules made by the Interim Council under Clause 5(4)(b).

This is arbitrary and inconsistent with Article 12(1) of the Constitution and may only be passed by the special majority required under the provisions of paragraph (2) of Article 84.

The learned DSG has in the written submissions proposed the following Committee Stage Amendment:

> *"Clause 5 -* *Delete lines 31 to 33 (both inclusive) and substitute the following: -*
>
> *"(c) The rules made under paragraph (b) shall be published in the Gazette within three months upon making of such rules and shall come into effect on the date thereof.*
>
> *(d) Every rule made by the Interim Council shall, within three months after its publication in the Gazette, be brought before Parliament for approval. Any rule which is not so approved shall be deemed to be rescinded as from the date of such disapproval, but without prejudice to anything previously done thereunder.*
>
> *(e) Notification of the date on which any such rule is deemed to be rescinded under paragraph (d) shall be published in the Gazette.*
>
> *(f)The Interim Council shall, within a period of one year from the date of operation of this Act, elect or appoint the members to the Council in terms of subsection (1).";*

We are of the view that the inconsistency will cease if Clause 5 is amended as proposed.

We have examined the rest of the clauses of the Bill and determine that they are not inconsistent with the Constitution.

***Summary of the Determination***

1. Clause 3(i) of the Bill is vague and is therefore inconsistent with Articles 12(1) and 14(1)(g) of the Constitution and may only be passed by the special majority required under the provisions of paragraph (2) of Article 84.
   The inconsistency will cease if Clause 3(i) is deleted.

2. Clause 4(o) of the Bill is inconsistent with Articles 12(1) and 14(1)(g) of the Constitution and may only be passed by the special majority required under the provisions of paragraph (2) of Article 84.
   The inconsistency will cease if Clause 4(o) is amended to read as follows:
   *"to take necessary steps to introduce and develop professional standards amongst the students and members of the Institute"*

3. Clause 5(4)(b) of the Bill is inconsistent with Article 12(1) of the Constitution and may only be passed by the special majority required under the provisions of paragraph (2) of Article 84.

The inconsistency will cease if Clause 5 is amended as follows:

*"Clause 5 - Delete lines 31 to 33 (both inclusive) and substitute the following: -*
*"(c) The rules made under paragraph (b) shall be published in the Gazette within three months upon making of such rules and shall come into effect on the date thereof.*
*(d) Every rule made by the Interim Council shall, within three months after its publication in the Gazette, be brought before Parliament for approval. Any rule which is not so approved shall be deemed to be rescinded as from the date of such disapproval, but without prejudice to anything previously done thereunder.*
*(e) Notification of the date on which any such rule is deemed to be rescinded under paragraph (d) shall be published in the Gazette.*
*(f)The Interim Council shall, within a period of one year from the date of operation of this Act, elect or appoint the members to the Council in terms of subsection (1).";*

We place on record our deep appreciation of the assistance given by learned Counsel for the Petitioners and the learned DSG.

Janak De Silva
Judge of the Supreme Court

Dr. Sobhitha Rajakaruna
Judge of the Supreme Court

Sampath Abeykoon
Judge of the Supreme Court

## II

## කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මවිසින් 2026 සැප්තැම්බර් 08 දින "ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන)" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## III

## විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
அரசியலமைப்புக்கான இருபத்திரண்டாம் திருத்தம் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
TWENTY SECOND AMENDMENT TO THE CONSTITUTION BILL: PETITIONS TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026 අගෝස්තු 19, 20 හා 21 දිනැති මාගේ නිවේදනයන්හි සඳහන් පෙත්සම් නවයට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම්වල පිටපත් පහත සඳහන් පරිදි මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

2026 අගෝස්තු 21 දින පෙත්සම් හතයි
2026 අගෝස්තු 24 දින පෙත්සම් හතරයි
2026 අගෝස්තු 25 දින පෙත්සම් අටයි
2026 අගෝස්තු 28 දින පෙත්සම් පහයි
2026 අගෝස්තු 31 දින පෙත්සම් තිස් එකයි
2026 සැප්තැම්බර් 01 දින පෙත්සම් දහයයි
2026 සැප්තැම්බර් 03 දින පෙත්සම් තුනයි
2026 සැප්තැම්බර් 04 දින පෙත්සම් දෙකයි

## IV

## දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
ஊழல் எதிர்ப்பு (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
ANTI-CORRUPTION (AMENDMENT) BILL: PETITIONS TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "දූෂණ විරෝධී (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් පහළොවක පිටපත්, මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ඔබතුමා මීට පෙර නිවේදනය කරපු කරුණු කාරණාවලින් ඔබතුමා පැහැදිලි කළා, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එරෙහිව මෙච්චර, මෙච්චර, මෙච්චර, මෙච්චර පෙත්සම් ප්‍රමාණයක් ඉදිරිපත් වෙලා තිබෙනවා කියලා. මම මේ මැදිහත්වීම කරන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121වන ව්‍යවස්ථාව ප්‍රකාරවත්, ඒ වාගේම ස්ථාවර නියෝග 50(3) ප්‍රකාරවත්, ස්ථාවර නියෝග 92(2)(අ) යටතේත්. මම ඔබතුමාට මේ කාරණය submit කරන්න කැමැතියි. ඔබතුමා සම්පූර්ණ ලේඛනයක් කියවා ගෙන ගියා, මෙච්චර, මෙච්චර පෙත්සම් ප්‍රමාණයක් ඉදිරිපත් වෙලා තිබෙනවාය කියලා. ඒ වාගේම ඔබතුමාට මම මේ කාරණයත් දැනුම් දෙන්න කැමැතියි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121වන ව්‍යවස්ථාව ප්‍රකාරව, මේ පෙත්සම් ඉදිරිපත් කරන්නට දින 14ක කාලයක් ලබා දීලා තිබෙනවා. හැබැයි මම ඔබතුමාට කියන්න කැමැතියි, ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව මේ මොහොත වන විට - මේ කාල සීමාව තුළ - ඉදිරිපත් කරපු පෙත්සමක්,- මම කියන්න කැමැතියි, මේ පෙත්සම්කරුවන් වන දූලාර ගුණතිලක සහ ශාන්ත ජයතිලක, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඒක point of Order එකක් නොවෙයි. *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, අහගන්න. පොඩ්ඩක් ඉන්න. මේක ව්‍යවස්ථානුකූල ප්‍රශ්නයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නොවෙයි. *[බාධා කිරීම්]* ගරු විපක්ෂ නායකතුමනි, ඒක point of Order එකක් නොවෙයි. *[බාධා කිරීම්]* නැහැ, ගරු විපක්ෂ නායකතුමනි, ඒක point of Order එකක් නොවෙයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි,*[බාධා කිරීමක්]* එය ශ්‍රේෂ්ඨාධිකරණයේ විවාදයට භාජන වෙමින් තිබෙන කාරණාවක්. ඔබතුමාට ඒ කාරණාව Point of Order එකක් විධියට ඉදිරිපත් කරන්න බැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද ඔබතුමාගේ point of Order එක? හරියට කියන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම බොහොම පැහැදිලිව ස්ථාවර නියෝග 50 (3) යටතේත්, ස්ථාවර නියෝග 92 (2) (අ) යටතේත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121වන ව්‍යවස්ථාව ප්‍රකාරවත් තමයි මේ point of Order එක ගෙන එන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ස්ථාවර නියෝග 50 (3)ට අනුව ඔබතුමා, -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා ලැයිස්තුවක් කියවා ගෙන ගියා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තීරණය ලැබෙන තුරු එම පනත් කෙටුම්පත න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න බැහැ නේ, විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ. මේක genuine point of Order එකක්. මේක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ස්ථාවර නියෝග 50 (3)හි තිබෙන්නේ, "ශ්‍රේෂ්ඨාධිකරණය වෙතින් එහි තීරණය ලැබෙන තුරු එකී පනත් කෙටුම්පත න්‍යාය පත්‍රයට ඇතුළත් නොකළ යුත්තේ ය" කියලා. *[බාධා කිරීමක්]* ගරු විපක්ෂ නායකතුමනි, එහෙම නම් ඔබතුමා ස්ථාවර නියෝග 50 (3) කියලා මොකක්ද කියන්නේ? *[බාධා කිරීම්]*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
කථානායකතුමාගේ නිවේදනය, - *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, පළමුවැනි දේ තමයි, - *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතුමාගේ නිවේදනය, - *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, - *[බාධා කිරීම්]* මේකට ඇහුම්කන් දෙන්න. I rise to a point of Order.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
කථානායකතුමාගේ නිවේදනය ඉවර වුණේ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඉවරයි, ඉවරයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, මගේ නිවේදන ඉවර කරලා නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, පළමුවෙනි කාරණය මේකයි. උසාවියේදී බේරාගන්න ඕනෑ ප්‍රශ්න උසාවියේදී බේරාගන්න ඕනෑ. පාර්ලිමේන්තුවට වාර්තා කරලා තිබෙන විධියට තමයි පාර්ලිමේන්තුව කටයුතු කරන්නේ. ස්ථාවර නියෝග 50 (3)හි මොකක්ද තිබෙන්නේ? ස්ථාවර නියෝග 50(3)හි තිබෙන්නේ මේකයි, I quote:

> "When the Speaker receives a copy of a reference addressed to the Chief Justice by the President in relation to a Bill which is in view of the Cabinet of Ministers urgent in the interest of national security or for the purpose of any matter relating to disaster management, and bears an endorsement to that effect under the hand of the Secretary to the Cabinet under Article 122(1) of the Constitution, such Bill shall not be placed on the Order Paper until the Speaker has received from the Supreme Court its determination as provided for in Article 122(1)(c) of the Constitution."

මේ, කොහේද යන්නේ, මල්ලේ පොල් කථා නේ. [බාධා කිරීම්] කොහේද යන්නේ, මල්ලේ පොල්. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉදිරිපත් කරපු පෙත්සම් ප්‍රමාණය තමයි මහලේකම්ලාට ලැබිලා ඔබතුමාට ලැබෙන්නේ. ඔබතුමාට ඒවා එවන්නේ නැහැ නේ; කෙළින්ම ඒවා එවන්නෙත් නැහැ නේ. මා දන්නා තරමින් ඒක තමයි ඔබතුමාට කරන්න තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මෙතුමා ස්ථාවර නියෝග 50(3) යටතේ ඉදිරිපත් කරපු point of Order එක තිබෙන issue එකට කිසිම relevance එකක් නැහැ. Standing Orders සම්බන්ධයෙන් අඩු ගණනේ විපක්ෂ නායකතුමාට හරි උපදේශකයෙක් අරන් දෙන්න. ඒකට පරණ නවුෂල් මහත්මයාව ගෙන්වා ගන්න. *[බාධා කිරීමක්]*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ නිවේදන ඉදිරිපත් කරමින් සිටියදී තමයි විපක්ෂ නායකතුමා ඒ බාධා කිරීම කළේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට මට අයිතියක් තිබෙනවා, ඔබතුමාගේ නිවේදනය අවසාන වනකල් දැනගන්න. ඔබතුමාගේ නිවේදනය දන්නේ නැතිව එතුමා කථා කරන්නේ කොහොමද? එහෙනම්, එතුමා ඔබතුමාගේ නිවේදනය කලින් දැනගෙන තිබෙන්න ඕනෑ. ඔබතුමාගේ නිවේදනය අවසන් නොවී තිබෙද්දී තමයි එතුමා නැඟිට්ටේ. ඔබතුමාගේ නිවේදනය ඉදිරිපත් කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

## V

## අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්

நீதித்துறை (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்

JUDICATURE (AMENDMENT) BILL: PETITIONS TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
2026 අගෝස්තු 19 දින මාගේ නිවේදනයෙහි සඳහන් පෙත්සමට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "අධිකරණ සංවිධාන (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සම් හතක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි. *[බාධා කිරීමක්]*

ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමා මතු කළ කාරණය point of Order එකක් නොවෙයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම\ ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XLVII කොටස; සහ
- 2025 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ II කොටස

මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අයවැය ඇස්තමේන්තුව
## இலஞ்சம் அல்லது ஊழலுக்கெதிரான சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவின் வரவு செலவுத்திட்ட மதிப்பீடு
## BUDGET ESTIMATE OF COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 31(1)(ආ) වගන්තිය ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් සකස් කරන ලදුව, මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ද සමඟ ඉදිරිපත් කරන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 2027 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව මම සභාගත කරමි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, "එකී අයවැය ඇස්තමේන්තුව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, විනාඩියක් මේකට සවන්දීලා ඔබතුමාගේ තීන්දු තීරණ ගන්න. *[බාධා කිරීම්]* මට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට බැහැ මට අණ කරන්න, "මේකට සවන් දෙන්න" කියලා. *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මම මේ කාරණාව ඉදිරිපත් කරන්නේ ස්ථාවර නියෝග 50 (3) තුළත්, ඒ වාගේම ස්ථාවර නියෝග 92 තුළත්, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, ඒක point of Order එකක් නොවෙයි. ඔබතුමා Standing Orders පොත හොඳින් කියවාගෙන එන්න. *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි. අපේ ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point එක මොකක්ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මගේ point එක තමයි, ස්ථාවර නියෝග 92 (2).

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 92 (2) මොකක්ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඔබතුමාගේ නිවේදනය කියවා අවසන් වුණාට පස්සේ ඡන්ද විමසීමක් තිබියදී හැර අන් කවර හෝ වේලාවක මන්ත්‍රීවරයාට, මේ පාර්ලිමේන්තුවේ කටයුතු බැහැර වෙනවා නම්, ඒ අවස්ථාව තිබෙනවා, මේ ස්ථාවර නියෝග අනුව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, වැරදියි. මගේ නිවේදනය අවසන් වෙලා තිබුණේ නැහැ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ලිපි ලේඛනාදිය පිළිගැන්වීම, ගරු අග්‍රාමාත්‍යතුමිය.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
Hon. Speaker, I present the -

(i) Annual Report of the University Grants Commission for the year 2024;

(ii) Annual Report and Accounts of the Sabaragamuwa University of Sri Lanka for the year 2024;

(iii) Annual Report and Accounts of the University of Moratuwa - Sri Lanka for the year 2024; and

(iv) Annual Report and Accounts of the Gampaha Wickramarachchi University of Indigenous Medicine for the year 2024.

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, I present the -

(i) Report on the observations and steps taken in terms of Standing Order No. 119(4) of the Parliament with regard to the matters mentioned on the Ministry of Education, Higher Education and Vocational Education in the Report of the Committee on Public Accounts, which was presented to Parliament; and

(ii) Report on the observations and steps taken in terms of Standing Order No. 119(4) of the Parliament with regard to the matters mentioned on the National Education Commission in the Report of the Committee on Public Accounts, which was presented to Parliament.

I move that these Reports be referred to the Committee on Public Accounts.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

Report on the details pertaining to “Transfers of Allocations through Virement Procedure” from 13 March, 2026 to 30 June, 2026, in terms of Section 24(4) of the Public Financial Management Act, No. 44 of 2024, and Section 5 of the Appropriation Act, No. 23 of 2025. - [The Hon. (Dr.) Harini Amarasuriya]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2025 වර්ෂය සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2025 වර්ෂය සඳහා එවකට නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ නාගරික සංවර්ධන අංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Standing Order 92(2)(ආ). ගෙදර ගිහිල්ලා කියවන්න, මේ 92(2). නැත්නම් ඔයාලගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා දෙන්න, 92(2)(ආ) කියලා එකක් තිබෙනවා කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එතැන point of Order එකක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ හැසිරීම හොඳ තත්ත්වයෙන් තියාගන්න.

ලිපිලේඛනාදිය පිළිගැන්වීම යටතේ, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, 2021/2022, 2022/2023 සහ 2023/2024 වර්ෂ සඳහා සී/ස ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තා මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2024 වර්ෂය සඳහා පොල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2024/2025 වර්ෂය සඳහා සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2025 වර්ෂය සඳහා සමුපකාර සේවක කොමිෂන් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ වයඹ පළාත් සභාව සහ ඒ යටතේ වූ ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව;

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ උතුරු පළාත් සභාව යටතේ වූ පළාත් පාලන ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව;

(iii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ නැගෙනහිර පළාත් සභාව යටතේ වූ පළාත් පාලන ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව;

(iv) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ඌව පළාත් සභාව යටතේ වූ පළාත් පාලන ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව;

(v) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ වයඹ පළාත් සභාව යටතේ වූ පළාත් පාලන ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව;

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

(vi) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ දකුණු පළාත් සභාව යටතේ වූ පළාත් පාලන ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා; සහ

(vii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ සබරගමුව පළාත් සභාව යටතේ වූ පළාත් පාලන ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

ගරු කථානායකතුමනි, 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 17 වගන්තිය සමඟ කියවිය යුතු 48 වගන්තිය යටතේ බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව සහ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදුව, 2026 ජූලි 16 දිනැති අංක 2497/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මම ඉදිරිපත් කරමි.

මෙම නියෝග බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ තාවකාලික සභාපතිවරයා වශයෙන් මම එම කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත යටතේ තීරණය; සහ

(ii) ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික අය වැය ඇස්තමේන්තු - 2027

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

ගරු කථානායකතුමනි, මට පොඩි වේලාවක් දෙන්න, ස්තුති කිරීමක් කරන්න.

අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවට භාෂා සම්බන්ධව ප්‍රශ්නයක් මතු වුණා. අපේ මන්ත්‍රීවරුනුත් දිගින් දිගටම මෙය ඉදිරිපත් කළා, ප්‍රශ්නයක් වශයෙන්. ලිපි ලේඛන දිගින් දිගටම එක් භාෂාවකින් පමණක් අමාත්‍යාංශවලින් ඉදිරිපත් වුණා. ඒක ගැටලුවක්. පාර්ලිමේන්තුව වාගේ තැනක ඒක ඉතාම වැරදි පූර්වාදර්ශයක්. මේ කාරක සභාවේ සභාපති වශයෙන් මම ගරු කථානායකතුමාට සහ මහ ලේකම්තුමියට එම ගැටලුව ඉදිරිපත් කරපු සැණින් - සතියක් වාගේ ඇතුළත - ගරු කථානායකතුමාගේ

මූලිකත්වයෙන් මහ ලේකම්තුමිය සමඟ රැස්වීමක් පවත්වලා තීරණයක් අරගෙන අමාත්‍යාංශවලට දැනුම්දීමක් කළා, ආංශික අධීක්ෂණ කාරක සභාවලට අනිවාර්යයෙන්ම භාෂා තුනෙන්ම සියලු ලිපි ලේඛන ලබා දෙන්න කියලා. මම හිතනවා, ඒක ඉතාම වැදගත් පියවරක් කියලා. මෙය අපි නැවත කිව යුතු දෙයකුත් නොවෙයි. අපි අමාත්‍යවරුන්ගෙනුත් ඉල්ලා සිටිනවා, මේක දිගටම follow up කරන්න කියලා. මේ භාෂා සම්බන්ධ ප්‍රශ්නයට ඉක්මනින් මැදිහත් වීම සම්බන්ධයෙන් ඔබතුමාට සහ මහ ලේකම්තුමියට මම ස්තුතිවන්ත වෙනවා, ගරු කථානායකතුමනි.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මොනරාගල, සිරිගල, පොතුවිල් පාර, 6 වන පටුමඟ, අංක 287/23 යන ලිපිනයෙහි පදිංචි ඩී.එම්.යූ.පී. දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஜகத் குணவர்தன)
(The Hon. (Dr.) Jagath Gunawardana)
ගරු කථානායකතුමනි, ගෝනවිල, මාකඳුර, අංක 149 යන ලිපිනයෙහි පදිංචි ටී.එම්.කේ.බී. ඒකනායක මහතා සහ වෙනත් නවදෙනෙකුගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
ගරු කථානායකතුමනි, මැණික්හින්න, දේවාල පාර, ගෙදරවෙල, අංක 46/3 යන ලිපිනයෙහි පදිංචි ජී.එම්. අබේරත්න බණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)
ගරු කථානායකතුමනි, පානදුර, ගාලු පාර, අංක 500/3/සී1 යන ලිපිනයෙහි පදිංචි ඕ.ආර්.ඩබ්ලිව්. ෆොන්සේකා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මාවතගම, නුවර පාර යන ලිපිනයෙහි පදිංචි සී.පී. ගුණවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### කිලිනොච්චි නගරයේ මහජන ක්‍රීඩාංගණය ඉදිකිරීම: විස්තර
### கிளிநொச்சி நகர பொது விளையாட்டு மைதான நிர்மாணம்: விபரம்
### CONSTRUCTION OF PUBLIC SPORTS COMPLEX IN KILINOCHCHI TOWN: DETAILS

1190/2025

**1.** **ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) කිලිනොච්චි නගරය මධ්‍යයේ පිහිටි මහජන ක්‍රීඩාංගණය 2010 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කර ඇති අතර, අද වනතුරු එම ක්‍රීඩාංගණය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ භාවිතය සඳහා පවරා දී නොමැති බව දන්නේද;

(ii) එම ක්‍රීඩාංගණය කවර මට්ටමේ ක්‍රීඩාංගණයක් ලෙස ඉදිකිරීමට සැලසුම් කර තිබේද;

(iii) මේ දක්වා මෙම ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iv) පසුගිය වර්ෂ 10 තුළ එම ප්‍රතිපාදනවලින් වැය කර ඇති ප්‍රමාණය කොපමණද;

(v) එම ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් සඳහා මෙතෙක් ගිවිසුම්ගත වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(vi) වර්තමානයේ ඉදිකිරීම් සිදු කරන කොන්ත්‍රාත්කරුවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් එම දිස්ත්‍රික්කයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඇති වී තිබෙන බලපෑම කවරේද;

(ii) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிளிநொச்சி நகர மத்தியில் அமைந்துள்ள பொது விளையாட்டு மைதானத்தை நிர்மாணிக்கும் பணிகள் 2010ஆம் ஆண்டில் ஆரம்பிக்கப் பட்டதோடு, இன்றளவிலும் அந்த மைதானம் விளையாட்டு வீர வீராங்கனைகளின் பயன்பாட் டுக்காக ஒப்படைக்கப்படவில்லை என்பதையும்;

(ii) மேற்படி விளையாட்டு மைதானத்தை எந்த வகைப்பாட்டுக்கு உரிய விளையாட்டு மைதான மாக நிர்மாணிக்கத் திட்டமிடப்பட்டுள்ளது என்பதையும்;

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

(iii) அந்த விளையாட்டு மைதானத்தை நிர்மாணிப் பதற்காக, இதுவரை ஒதுக்கீடு செய்யப்பட்டுள்ள நிதி எவ்வளவு என்பதையும்;

(iv) கடந்த 10 ஆண்டுகளில், இந்நிதியிலிருந்து செலவிடப்பட்டுள்ள தொகை எவ்வளவு என்பதையும்;

(v) அந்த விளையாட்டு மைதானத்தை நிர்மாணிப் பதற்காக இதுவரை ஒப்பந்தம் செய்துள்ள ஒப்பந்தக்காரர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(vi) தற்போது நிர்மாணப் பணிகளை மேற்கொள்ளும் ஒப்பந்ததாரர்கள் யாவர் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி விளையாட்டு மைதானத்தின் நிர்மாணப் பணிகளில் ஏற்பட்டுள்ள தாமதம் காரணமாக அந்த மாவட்டத்தைச் சேர்ந்த விளையாட்டு வீர, வீராங்கனைகளுக்கு ஏற்பட்டுள்ள பாதிப்பு யாது என்பதையும்;

(ii) கிளிநொச்சி மாவட்டத்தில் விளையாட்டுத் துறையை மேம்படுத்துவதற்காக எடுக்கப் பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Youth Affairs and Sports:

(a) Will he inform this House -

(i) whether he is aware that the construction of the public sports complex located in the centre of the Kilinochchi Town was commenced in the year 2010 and has not yet been handed over for the use of the athletes;

(ii) the level to which the sports complex has been planned to be constructed;

(iii) the amount of funds allocated for the construction of aforesaid sports complex so far;

(iv) the amount spent from aforesaid funds during the last 10 years;

(v) the number of contractors engaged so far for the construction of the sports complex; and

(vi) the names of the contractors currently carrying out the construction?

(b) Will he also inform this House the -

(i) impact this construction delay has had on the sportsmen and sportswomen of the district; and

(ii) measures that have been taken for the development of the sports sector in the Kilinochchi District?

(c) If not, why?

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**

(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)

(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ව්‍යාපෘතිය සම්පූර්ණ වශයෙන් නිමා වී නොමැත. එසේ වුවද, 2019 වසරේදී ජනතා අයිතියට පවරා ඇත.

(ii) අංග සම්පූර්ණ ක්‍රීඩා පහසුකම්වලින් සමන්විත ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීමට සැලසුම් කර තිබිණ.

(iii)

| වර්ෂය | වෙන් කරන ලද ප්‍රතිපාදනය (රුපියල්) |
|---|---|
| 2011 | 495,606,966.00 |
| 2018 | 141,923,244.21 |
| 2025 | 105,039,250.00 |
| 2026 | 26,640,000.00 |

(iv)

| වර්ෂය | වෙන්කරන ලද ප්‍රතිපාදනය (රුපියල්) | වැය කළ ප්‍රමාණය (රුපියල්) | වැය කළ ප්‍රතිශතය |
|---|---|---|---|
| 2011 | 495,606,966.00 | 495,606,966.00 | 100% |
| 2018 | 141,923,244.21 | 9,934,627.09 | 7% |
| 2025 | 105,039,250.00 | 21,007,850.00 | 20% |
| 2026 | 26,640,000.00 | මෙතෙක් බිල්පත් ඉදිරිපත් වී නොමැත | - |

(v) තුනයි.

1. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (2011)
2. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව (2018)
3. ඒ.කේ.කේ. ඉංජිනියර්ස් (පුද්ගලික) සමාගම (2025)

(vi) ඒ.කේ.කේ. ඉංජිනියර්ස් (පුද්ගලික) සමාගම.

(ආ) (i) කිලිනොච්චි මහජන ක්‍රීඩාංගණය ක්‍රීඩා පුහුණුවීම් සඳහා දැනටමත් භාවිත කරනු ලබන අතර, ප්‍රතිසංස්කරණය කළ යුතු යටිතල පහසුකම් හඳුනාගෙන ඒවා මේ වන විට ප්‍රතිසංස්කරණය කිරීම ආරම්භ කර ඇත.

(ii) කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් සහ ක්‍රීඩා ක්ෂේත්‍ර නිලධාරීන් සමඟ කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලසුම් අංශය විසින් 2026-2030 දක්වා වසර 5ක ක්‍රීඩා සංවර්ධන සැලැස්මක් සකස් කරමින් පවතී.

මේ වන විට එම ප්‍රදේශයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩා දක්ෂතා නැංවීම උදෙසා කිලිනොච්චිය දිස්ත්‍රික්කය සඳහා 2026 වර්ෂයේ පහත ආකාරයට මුදල් ප්‍රතිපාදන වෙන් කර ඇත.

| | විස්තරය | ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) |
|---|---|---|
| 1 | කිලිනොච්චි මහජන ක්‍රීඩාංගණයේ පිහිනුම් තටාක සංකීර්ණයේ එක් පසක ප්‍රේක්ෂකාගාරයක් ඉදිකිරීම | 16,500,000.00 |
| 2 | කිලිනොච්චි මහජන ක්‍රීඩාංගණයේ කාන්තා වැසිකිළි ඒකකයේ ප්‍රතිසංස්කරණ කටයුතු | 1,400,000.00 |
| 3 | කිලිනොච්චි මහජන ක්‍රීඩාංගණයේ පිරිමි වැසිකිළි ඒකකයේ ප්‍රතිසංස්කරණ කටයුතු | 1,400,000.00 |
| 4 | කිලිනොච්චි මහජන ක්‍රීඩාංගණයේ ඉරිතැලීම් අලුත්වැඩියා කිරීම සහ ගිලා බැසීම් සඳහා ප්‍රතිකර්ම සිදු කිරීම ඇතුළුව වේදිකාව වැඩිදියුණු කිරීම | 7,340,000.00 |
| 5 | ඉලන්තාරකෙයි ක්‍රීඩා සමාජ ක්‍රීඩාංගණය (Ilantharakai Sports Club Ground) | 5,000,000.00 |
| 6 | පූනගරී මහජන ක්‍රීඩාංගණය (Poonagary Public Playground) | 5,000,000.00 |
| 7 | කිලි/අක්කරායන් මහා විද්‍යාලය (KN/ Ak-karayan Maha Vidyalaya) | 5,085,711.52 |
| 8 | කිලි/ කිලිනොච්චි හින්දු විද්‍යාලය (KN/ Kilinochchi Hindu College) | 5,036,080.00 |
| 9 | කිලි/මාසර් රජයේ දෙමළ මිශ්‍ර විද්‍යාලය (KN/ Masar Government Tamil Mixed School) | 5,000,000.00 |
| 10 | පයින්තමිල් ක්‍රීඩා සමාජ ක්‍රීඩාංගණය (Painthamil Sports Club Playground) | 6,450,000.00 |
| 11 | කිලි/ කිලිනොච්චි මධ්‍ය මහා විද්‍යාලය (KN/ Kilinochchi Central College) | 6,187,400.00 |
| එකතුව | | 64,399,191.52 |

(ඇ) පැන නොනඟී.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, கிளிநொச்சி மாவட்டத்தில் மிகப் பிரதானமான மைதானமாக இருக்கின்ற இந்த மைதானம் முன்னர் 'ரொட்ரிகோ மைதானம்' என்றுதான் அழைக்கப் பட்டது. ஒரு காலத்தில் கிளிநொச்சி பட்டின சபையாக இருந்தபொழுது, இது பட்டின சபைக்குக்கீழ் இருந்தது. இப்பொழுது இது பிரதேச சபைக்குக்கீழ் இருக்கவேண்டிய மைதானம் ஆகும். யுத்தம் முடிவடைந்ததன் பின்னர், கடந்த 17 ஆண்டுகளாக மாறி மாறி ஆட்சிக்கு வந்த அரசாங்கங்களால் இந்த மைதானத்தை நிர்மாணிப்பதற்கு நிதி ஒதுக்கப்படுமெனக் கூறப்பட்டாலும், இதன் நிர்மாணப் பணிகள் பூரணப்படுத்தப் படாமல் இழுத்தடிக்கப்பட்டுக் கொண்டே செல்கின்றன. 2009ஆம் ஆண்டுக்கு முதல் இந்த மைதானம் நல்ல முறையில் மிகச் சீராக இயங்கியது. இந்த மைதானம் எப்பொழுது முழுமைப்படுத்தப்பட்டு கரைச்சி பிரதேச சபையிடம் கையளிக் கப்படும் என்பதைத் தங்களால் தெரிவிக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

දැනටමත් අපි මෙහි සංවර්ධන කටයුතු විශාල ප්‍රමාණයක් කරමින් සිටිනවා. මම මීට මාසයකට විතර කලිනුත් ගිහිල්ලා, ක්‍රීඩාංගණයේ තව ඉදි කිරීම් කටයුතු ගණනාවක වැඩකටයුතු ආරම්භ කළා. අපි පුළුවන් ඉක්මනට ඒකේ ඉතිරි වැඩ කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. මොකද, දැනට ක්‍රීඩාංගණය පාවිච්චි කරනවා. අලුත්වැඩියාවන් ටිකක් තමයි කරන්න තිබෙන්නේ. ඒක අපි අනිවාර්යයෙන් කරනවා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, எனது இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கிளிநொச்சி மாவட்டத்துக்கென தனியான கிரிக்கெட் மைதானமோ, உதைபந்தாட்ட மைதானமோ, பொது மைதானங்களோ இல்லை என்பது தாங்கள் அறிந்ததே! வடக்கு மாகாணத்தின் மையப் புள்ளியான கிளிநொச்சியில் அமைந்திருக்கின்ற இந்த ரொட்ரிகோ மைதானம் கரைச்சி பிரதேச சபைக்குரியது. ஆனால், இப்பொழுது அந்த மைதானத்தைத் தங்களிடம் கையளிக்க வேண்டுமென மத்திய அரசினால் கடிதம் அனுப்பப்பட்டு இருப்பதாகக் கேள்விப் படுகின்றோம். அது உண்மையான செய்தியா என்பது தெரியாது. இந்த மைதானம் வட மாகாணத்துக்குக்கீழ் இருக்கின்ற ஒரு பிரதேச சபைக்குரியது. வடக்கு மாகாணத் தைச் சேர்ந்த இளைஞர், யுவதிகளுக்குரிய பயிற்சி மைதானமாகவும் இம்மைதானம் காணப்படுகின்றது. இந்த மைதானத்தை கரைச்சி பிரதேச சபையிடம் விரைவாக ஒப்படைப்பதற்கு தங்களுக்கு என்ன தடங்கல் இருக்கின்றது என்பதைக் குறிப்பிட முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

මම ඒ ගැන හරියටම සොයා බලන්නම්. නමුත්, ඔබතුමාට පැහැදිලි කිරීමක් කරන්නම්. ඔබතුමාම කියන ආකාරයට, ප්‍රාදේශීය සභාව යටතේ ඒක තිබිලා නඩත්තු කරන්නේ නැහැ, ක්‍රීඩා පිටියේ කටයුතු හරියට කෙරෙන්නේ නැහැ, සංවර්ධන කටයුතු වෙන්නේ නැහැ, ඒගොල්ලන්ට ඒවාට මුදල් නැහැ. ඒක නිසා මේ ප්‍රාදේශීය සභා යටතේ තිබෙන ක්‍රීඩාංගණ ගොඩක් වෙලාවට අභාවයට යනවා. මොකද, ඒගොල්ලන්ට ඒවාට වියදම් කරන්න සල්ලි නැති නිසා සහ ඒ සම්බන්ධයෙන් ඒ අයට වුවමනාව නැති නිසා. සමහර තැන්වල ඒවා අපට ගන්න එක කරදරයක්, වැඩ වැඩි වෙනවා. නමුත්, අපි ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් ඒ වාගේ තැන්වලදී ගන්න සූදානම් කරනවා. ඒක කරන්නේ අපට වත්කම් අත්පත් කර ගන්න නොවෙයි, ක්‍රීඩාව වෙනුවෙන්, ක්‍රීඩාවේ සංවර්ධනය වෙනුවෙන්.

## පාසල්වල ක්‍රියාකාරී නොවන පරිගණක දෘඩාංග: අලුත්වැඩියා කිරීම

பாடசாலைகளிலுள்ள பழுதடைந்த கணினி வன்பொருட்கள்: பழுதுபார்த்தல்

NON-FUNCTIONAL COMPUTER HARDWARE IN SCHOOLS: REPAIR

1528/2025

**2. ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පරිගණක, බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ සහ සුහුරු පුවරු වැනි උපකරණ අලුත්වැඩියා කිරීමේදී බොහෝ පාසල් අභියෝගයන්ට මුහුණ දෙන බව දන්නේද;

(ii) පාසල්වල පවතින ඉලෙක්ට්‍රොනික උපකරණ අක්‍රිය වන අවස්ථාවල අලුත්වැඩියා කළ යුතු ක්‍රියා පටිපාටිය කවරේද;

(iii) උතුරු පළාතේ පාසල්වල ඇති ඉලෙක්ට්‍රොනික උපකරණ අතරින් අක්‍රියව පවතින උපකරණවල ප්‍රතිශතය කලාප අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

[ගරු තුරෙරාසා රවිකරන් මහතා]

(iv) එම පළාතේ ඇතැම් කලාපවල ඇති තොරතුරු තාක්ෂණ විෂයට අදාළ ගුරු හිඟය හේතුවෙන් කලාප මට්ටමේ තාක්ෂණ කණ්ඩායම ඵලදායි ලෙස යොදාගැනීමට නොහැකිවී ඇති බව දන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) පාසල්වල ඇති පරිගණක දෘඩාංග අලුත්වැඩියා කටයුතු සඳහා පසුගිය වර්ෂ 05 තුළ වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය පළාත් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මුදල් ප්‍රතිපාදන පාසල්වල පරිගණක දෘඩාංග අලුත්වැඩියා කිරීම සඳහා ප්‍රමාණවත් වන්නේද;

(iii) පාසල්වල පරිගණක දෘඩාංග අලුත්වැඩියාව සඳහා තිරසර සැලැස්මක් ක්‍රියාත්මක කරන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) கணினிகள், பல்லூடக எறிவைகள், சூட்டிகைப் பலகைகள் போன்ற சாதனங்களைப் பழுது பார்ப் பதில் பெரும்பாலான பாடசாலைகள் சவால்களை எதிர்கொள்வதை அறிவாரா என்பதையும்;

(ii) பாடசாலைகளில் காணப்படும் இலத்திரனியல் சாதனங்கள் பழுதடையும்போது, அவற்றைப் பழுதுபார்ப்பதற்கு மேற்கொள்ளவேண்டிய நடவடிக்கைமுறை யாது என்பதையும்;

(iii) வட மாகாணப் பாடசாலைகளில் காணப்படும் இலத்திரனியல் சாதனங்களில் பழுதடைந்துள்ள சாதனங்களின் வீதம் வலய வாரியாக வெவ் வேறாக யாவை என்பதையும்;

(iv) மேற்படி மாகாணத்தின் சில வலயங்களில் காணப்படும் தகவல் தொழில்நுட்பப் பாடத்துக் கான ஆசிரியர் பற்றாக்குறையால் வலய மட்ட தொழில்நுட்பக் குழுவை வினைத்திறனுடன் ஈடுபடுத்த முடியாதிருப்பதை அறிவாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) பாடசாலைகளிலுள்ள கணினி வன்பொருள் களைப் பழுதுபார்ப்பதற்கு கடந்த 5 ஆண்டுகளில் ஒதுக்கப்பட்ட தொகை மாகாண வாரியாக வெவ்வேறாக யாவை என்பதையும்;

(ii) அத்தொகை பாடசாலைகளின் கணினி வன் பொருட்களைப் பழுதுபார்க்கும் நடவடிக்கை களுக்குப் போதுமானதா என்பதையும்;

(iii) பாடசாலைகளின் கணினி வன்பொருட்களைப் பழுதுபார்க்கும் நடவடிக்கைகளுக்கு நிலையான தொரு திட்டம் செயற்படுத்தப்படுகின்றதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether she is aware that many schools face challenges in repairing equipment such as computers, multimedia projectors and smart boards;

(ii) the procedure to be followed in cases where electronic equipment in schools become non-functional;

(iii) separately, by zone, the percentage of non-functioning electronic equipment in schools in the Northern Province; and

(iv) whether she is aware that the Zonal Technology Team has not been utilized effectively due to the shortage of Information Technology teachers in certain zones of the Province?

(b) Will she also inform this House -

(i) separately, by province, the financial allocation made for the repair of computer hardware in schools during the last five years;

(ii) whether the aforesaid financial allocation is sufficient for the repair of computer hardware in schools; and

(iii) whether a sustainable plan will be implemented for the repair of computer hardware in schools?

(c) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) පරිගණක, බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ හා සුහුරු පුවරු වැනි උපකරණ අලුත්වැඩියා කිරීමේදී බොහෝ පාසල් මුහුණ දෙන අභියෝග සඳහා අවශ්‍ය සහාය ලබා දීමේ ක්‍රියාමාර්ග පහත පරිදි සැලසුම් කර ක්‍රියාත්මක කරමින් පවතී.

මෙහි මූලික කාර්යයක් ලෙස ජාතික මට්ටමින්, පළාත් මට්ටමින් හා කලාප මට්ටමින් අදාළ දෘඩාංග හා ජාලකරණ නඩත්තු කාර්යයන් සඳහා පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

පාසල් මට්ටමේ පරිගණක දෘඩාංග හා ජාලකරණ විමසුම් කණ්ඩායම් වැඩසටහන 2011/19 චක්‍රලේඛයක් මඟින් පිහිටුවා ඇත. පාසල් මට්ටමින් මේ ක්‍රියාවලිය සිදු කරන ලද අතර කොවිඩ්-19 වසංගත තත්ත්වය සමඟ මෙම ක්‍රියාවලිය පසුබෑමකට ලක් විය. නමුත් කලාප මට්ටමින් හා පළාත් මට්ටමින් දෘඩාංග නඩත්තු සංචිතය සක්‍රියව සිදු කරන ලදී. ඒ අනුව පාසල්වල පරිගණක හා උපාංග අලුත්වැඩියා කලාප දෘඩාංග සාමාජික ගුරුවරුන් සම්පත් පුද්ගලයන් යොදා ගෙන සිදු කරනු ලබයි.

(ii) උපකරණවල වගකීම් කාලය පවතී නම් වගකීම් ලබා ගත් ආයතනයෙන් අලුත්වැඩියාව සිදු කරන අතර, මෙම ඉලෙක්ට්‍රොනික උපකරණවල වගකීම් කාලය ඉක්මවා ඇත්නම් ඒ ඒ උපකරණවල ස්වභාවය අනුව අදාළ ආයතන කිහිපයක් මඟින් මිල ගණන් කැඳවා අවම මිල ගණන් යටතේ අවශ්‍ය අලුත්වැඩියාව සිදු කිරීමට හැකියාව ඇත.

(iii) ඒ අනුව උතුරු පළාතේ සියලු ඉලෙක්ට්‍රොනික උපාංගවලට අදාළ වාර්තාව උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් ලබාගෙන, පහත ඇමුණුම මඟින් ඉදිරිපත් කර ඇත.

**ඇමුණුම: 01**

(අ) (iii)

| කලාපය | භාවිත කළ හොහැකි ඉලෙක්ට්‍රොනික උපකරණවල ප්‍රතිශතය (%) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | Desktop /Laptop | Projector | Smart Boa rd / Panel | Printer | TV | Photo copier | Tablet PC | Scanner | UPS |
| යාපනය | 47.38% | 54.95% | 29.90% | 36.17% | | 51.41% | | | |
| වලිකාමම් | 47.41% | 42.86% | 28.90% | | | | | | |
| වඩමාරච්චි | 19.90% | 8.75% | 8.86% | | | | | 6.84% | |
| තෙන්මාරච්චි | 28.27% | 30.48% | 30.00% | | | | 39.09% | 28.11% | |
| දීවකම් | 75.33% | 32.00% | 30.67% | 51.16% | 58.18% | 42.86% | | | |
| කිළිනොච්චි (උතුර) | 52.55% | 35.14% | 26.15% | 81.82% | | | | 22.89% | 80.00% |
| කිළිනොච්චි (දකුණ) | 38.24% | 22.22% | 18.00% | 25.00% | | | 16.67% | 13.33% | 44.44% |
| මුලතිව් | 74.84% | 82.76% | 62.21% | 76.42% | | | 72.22% | 70.64% | |
| තුනුක්කායි | 73.71% | 42.86% | 36.99% | 57.14% | | | 54.41% | 16.25% | 74.64% |
| මන්නාරම | 53.23% | 50.00% | 21.95% | | 39.50% | | | 32.65% | |
| මඩු | 54.43% | 57.69% | 24.59% | 35.85% | | | | 60.23% | 39.52% |
| වවුනියා (උතුර) | 50.80% | 37.88% | 11.58% | 61.63% | | | | 6.15% | 52.59% |
| වවුනියා (දකුණ) | 52.15% | 41.88% | 10.91% | | | | | 11.39% | |

(iv) උතුරු පළාතේ තොරතුරු තාක්ෂණ විෂයට අදාළ ගුරු හිඟය හේතුවෙන් කලාප මට්ටමින් තාක්ෂණ විෂයට අදාළ සංඛ්‍යාව අඩු වී ධාරිතාව අඩු වී ඇත. මේ සඳහා විසඳුමක් ලෙස තොරතුරු තාක්ෂණ දැනුවත් ගුරුවරුන්ගෙන් සමන්විත දෘඪාංග හා ජාලකරණ නඩත්තු ගුරු සංචිතයක් පිහිටුවීමටත්, ඔවුන් සඳහා පුහුණු වැඩසටහන් මාලාවක් පවත්වා අවශ්‍ය දැනුම ලබා දීමටත් අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. කලාප 13 සඳහා ගුරුවරුන් 76ක් පුහුණු කර දෘඪාංග නඩත්තු කාර්යයන්ට යොදවා ඇත. ඒ අනුව එම ගුරුවරුන් මඟින් දෘඪාංග නඩත්තු කටයුතු සිදු කර ගෙන යනු ලබයි. 2025 වර්ෂයට මේ සඳහා ලබා දුන් ප්‍රතිපාදන රු.3,250,000ක් හා 2026 වර්ෂය සඳහා රුපියල් 2,565,000ක ප්‍රතිපාදන ලබා දී ඇත. තවද, පළාත් මට්ටමින් පාසල් සිසුන් ද දෘඪාංග නඩත්තු කටයුතු සඳහා පුහුණු කර ඇත.

(ආ) (i) මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම.

පළාත් පාසල්වල ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම යටතේ පළාත් මට්ටමින් ලබා ගත් පාසල්වල ක්‍රියා විරහිත ඩිජිටල් උපාංග පිළිබඳ තොරතුරු මඟින් එක් එක් පළාත සඳහා සකස් කර ගත් අලුත්වැඩියා සැලැස්මක් අනුව අදාළ පළාත් පාසල්වල ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් නඩත්තු වැඩසටහන පැවැත්වීම සඳහා සම්පත් දායක මුදල් ලබා දීම, නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය සුළු ප්‍රාග්ධන, පරිභෝජන ද්‍රව්‍ය සපයා ගැනීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු මඟින් ඉල්ලීම් කර ඇති අතර, ඒ සඳහා අධ්‍යාපන උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් අමතර ප්‍රතිපාදන ලබා දීම (2023-2026) සිදු කරන ලදී.

විස්තර පහත වගුවේ දැක්වේ.

| | පළාත | වැඩසටහන් පැවැත්වීමට ලබා දෙන ප්‍රතිපාදන මුදල රු.මි. | | | |
|---|---|---|---|---|---|
| | | 2026 | 2025 | 2024 | 2023 |
| 1 | වයඹ | 6.29 | 8.25 | 1.2 | 4.4 |
| 2 | නැගෙනහිර | 3.5 | 4.25 | 2.55 | 4 |
| 3 | උතුර | 2.535 | 3.25 | 1.8 | 4 |
| 4 | ඌව | 2.5 | 2.5 | 1.7 | 4 |
| 5 | උතුරු මැද | 2.26 | 12.9 | 2.2 | 3.2 |
| 6 | බස්නාහිර | 1.2 | 2.75 | 1.65 | 6 |
| 7 | දකුණ | 3.2 | 2.75 | 1.65 | 3.6 |
| 8 | සබරගමුව | 1 | 1.75 | 1.05 | 4.4 |
| 9 | මධ්‍යම | 1.924 | 3.75 | 2.25 | 6.4 |
| | | 24.409 | 42.15 | 15.99 | 40 |

(ii) එම මුදල් ප්‍රතිපාදන පළාත් මට්ටමින් ප්‍රමාණවත් නොවන අවස්ථාවල අමතර ප්‍රතිපාදන නැවත පළාත් වෙත අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා දී ඇත. තවද, පළාත් ප්‍රතිපාදන තුළ ද පරිගණක නඩත්තු කාර්යය සඳහා ප්‍රතිපාදන සලසා ගෙන ඇත.

(iii) පරිගණක නඩත්තු සම්බන්ධයෙන් 2007, 2017 සහ 2023 වර්ෂවල නිකුත් කර ඇති ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ මාර්ගෝපදේශ සංග්‍රහය යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. ඩිජිටල් අධ්‍යාපනය සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය කාර්ය සාධන බලකාය සමඟ එක්ව අදාළ නඩත්තු මාර්ගෝපදේශ යාවත්කාලීන කර පාසල් වෙත යොමු කිරීමට සැලසුම් කර ඇත. මේ

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

සම්බන්ධයෙන් සලකා බලා මේ වන විට පාසල් පද්ධතියට ලබා දෙන පරිගණක සහ උපාංග, සුහුරු පුවරු, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, අභ්‍යන්තර පරිගණක ජාලය ඇතුළු සියලු ඩිජිටල් උපකරණ යාවත්කාලීනව නඩත්තු කර පවත්වා ගෙන යෑම තහවුරු කිරීම සඳහා පහත පරිදි ක්‍රියාත්මක කරමින් පවතී.

- දැනට පාසල් වෙත ලබා දී ඇති පරිගණක හා දෘඪාංග නඩත්තු කාර්යයන් සඳහා පුහුණු කර ඇති ගුරු සංචිතය ප්‍රමාණවත් නොවන බැවින්, එම කණ්ඩායමේ සාමාජික සංඛ්‍යාව වැඩි කර පුහුණු කිරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම හා පුහුණු කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල ලබා ගැනීම හා පුහුණු අවශ්‍යතා හඳුනා ගෙන ඇත. 2026 ඔක්තෝබර් මාසයේ අදාළ පුහුණුව ලබා දීමට සැලසුම් කර ඇත.

- පාසල්වල පරිගණක හා නඩත්තු කටයුතු සඳහා සම්බන්ධ වී දායකත්වය ලබා දෙන ගුරුවරුන්ට ගමන් වියදම හෝ සම්පත්දායක දීමනා ලබා දීමට පවතින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ තුළ ප්‍රමාණවත් විධිවිධාන නොමැති නිසා ඒ සම්බන්ධයෙන් නැවත සලකා බලා අවශ්‍ය අනුමැතිය ලබා ගෙන පරිගණක දෘඪාංග හා ජාලකරණ සාමාජිකයන්ගේ සම්පත් දායකත්වය සඳහා විධිමත් ගෙවීම් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත.

(ඈ) අදාළ නොවේ.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ பிரதமர் அவர்களே, பதில் அளித்தமைக்கு நன்றி! அங்கு சில விடயங்கள் தாமதமாக இருப்பதையும் போதியளவு ஆளணி இல்லாமல் இருப்பதையும் நீங்கள் சுட்டிக்காட்டி இருக்கிறீர்கள். இருந்தாலும், பாடசாலைகளில் பெருகியுள்ள இலத்திரனியல் கழிவுகளைச் சீராக்குவதில் வன்னித் தேர்தல் மாவட்டத்திலுள்ள பெரும்பாலான பாடசாலைகளில் இடர் நிலவுகின்றது. வலய மட்ட வன்பொருள் அணியே பாடசாலை களிலுள்ள கணினிகளைத் திருத்துவதோடு, இலத்திரனியல் சாதனங்களுக்குரிய தொழில்நுட்ப மதிப்பீட்டு அறிக்கை களையும் வழங்குகின்றது. இந்த வன்பொருள் அணி, ஒவ்வொரு வலயத்திலுமுள்ள தகவல் தொழில்நுட்ப ஆசிரியர் களைக் கொண்டே இயங்குகின்றது.

வட மாகாணத்தில் மொத்தமாக 170 தகவல் தொழில்நுட்ப ஆசிரியர்கள் பற்றாக்குறையாக உள்ளனர். இது 31 சதவீதமாகும். இப்பற்றாக்குறைச் சதவீதமானது, வட மாகாணத்திலுள்ள சீரற்ற ஆசிரியர் வளப் பரம்பலால் தீவகம், தென்மராட்சி, மடு ஆகிய கல்வி வலயங்களில் மிகவும் அதிகமாக உள்ளது. அங்கு கிட்டத்தட்ட 40 சதவீதமான வெற்றிடங்கள் காணப்படுகின்றன. இவ்வாறான ஆசிரியர் பற்றாக்குறையோடு, ஒவ்வொரு பாடசாலையாகச் சென்று கணினிகளைத் திருத்துவதற்கும் தொழில்நுட்ப மதிப்பீட்டு அறிக்கைகளைத் தயாரிப்பதற்கும் வன்பொருள் அணியினர் மிகவும் இடர்படுகின்றனர். மேசைக் கணினிகளைத் திருத்துவதற்குரிய பயிற்சிகள் அவர்களுக்கு வழங்கப்படுகின்ற போதிலும், மடிக்கணினிகள், அச்சுப்பொறிகள், வரைபட்டிகைகள், பல்லூடக எறிவைகள் மற்றும் சூட்டிகைப் பலகைகள் உள்ளிட்டவற்றில் வன்பொருள் திருத்தங்களை மேற்கொள்வதற்குப் போதியளவு பயிற்சிகள் அவர்களுக்கு வழங்கப்படுவதில்லை. இதனால் இவ்வகையான இலத்திரனியல் சாதனங்களைத் திருத்துவதிலும் தொழில்நுட்ப மதிப்பீட்டு அறிக்கைகளை உரிய காலத்தில் வழங்குவதிலும் தாமதம் ஏற்படுகின்றது.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Hon. Speaker, the points raised by the Hon. Member are valid. There is a shortage of teachers and it is an issue we are facing. However, we are in the process of recruiting teachers this year. We hope that at least 50 per cent of those vacancies would be filled through one recruitment process. We are also in the process of filling more of those vacancies within this year and at the beginning of next year.

The exam had been conducted for the recruitment of 23,000 teachers. The recruitment process is currently being organized and will be completed this year. We expect, with those recruitments, that 50 per cent of those vacancies in provincial schools would be filled and we have also organized a training programme for them accordingly.

We are also in the process of assessing the needs - infrastructure, equipment and devices - as well as addressing maintenance issues in schools. Money has been allocated to the provincial councils to deal with those and on request, additional money could also be provided.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ பிரதமர் அவர்களே, உண்மையிலேயே இந்த விடயங்களில் இப்படியான தவறுகள் இருக்கின்றன என்பதைச் சுட்டிக்காட்டி, அவற்றைச் சீர்செய்ய வேண்டு மெனச் சொன்னமைக்கு நன்றி தெரிவிக்கின்றேன்.

என்னுடைய இரண்டாவது மேலதிக வினாவானது, திருத்தியும் பாவிக்க முடியாத இலத்திரனியல் கழிவுகளைப் பாடசாலைகளில் இருந்து காலதாமதமின்றி அப்புறப்படுத்தல் தொடர்பானது.

பொருட்கணக்கெடுப்பின் பின்னர் "D" - "Disposal" என்று அடையாளமிடப்படுபவை பெரும்பாலும் மண்ணில் புதைக்கப் படுகின்றன அல்லது எரிக்கப்படுகின்றன. "D" என்று அடையாளமிடப்படும் இவ்வாறான இலத்திரனியல் கழிவுகளை அவ்வாறு மண்ணில் புதைப்பதையும் எரிப்பதையும் ஏற்றுக்கொள்ளலாமா? காலங்கடந்த தொழில்நுட்ப சாதனங்களை பாடசாலை மட்டத்தில் 'sale' என அடையாளப்படுத்தி விற்பது நடைமுறைச்சாத்தியமானதா? காலங்கடந்த கணினிகளை, உடைந்த காதணி கேட்பொறிகளை, சுட்டிகளை, விசைப்பலகைகளை கிராம மட்டங்களில் யார் வாங்கிப் பயன்படுத்தப் போகிறார்கள்? பதிவழிக்க வேண்டிய இலத்திரனியல் சாதனங்களை உரிய கல்வி வலயங்கள் பொறுப்பெடுத்து, முறையாக மீள்சுழற்சி

செய்யும் நிறுவனங்களுக்குப் பாரப்படுத்துவதே பொருத்த மானதாக இருக்கும். இவ்வாறாக நடைமுறைக்குப் பொருத்தமற்ற 'sale' மற்றும் 'disposal' என அடையாளமிட்டு, பொருத்தமற்ற வகையில் சமூகத்துக்கு மீள விடுவிக்கப்படும் இலத்திரனியல் கழிவுகள் தொடர்பாக தங்கள் அமைச்சு நியாயப்பாடான ஒரு மாற்று நடவடிக்கையை முன்னெடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, the Hon. Member has raised an extremely important point. That is about e-waste management. We are currently in the process of issuing guidelines as to how that should be managed. I have to admit that it is not a clear-cut procedure and we need some advice as to how that should be done because there is a problem, not just within the education system, but in general, with the disposal of unsafe e-waste. So, that is an issue we need to tackle. I am very grateful to the Hon. Member for raising that issue. That is something we are working on with the Ministry of Digital Economy in getting the guidelines ready, at least, for the education system.

## හැඹිලි දැල් මත්ස්‍ය කර්මාන්තයේ යෙදෙන යාත්‍රා: බලපත්‍ර
சுருக்குவலை மீன்பிடித்தலில் ஈடுபட்டுள்ள படகுகள்: அனுமதிப்பத்திரங்கள்
VESSELS ENGAGED IN RING NET FISHING: LICENCES

1645/2025

**3. ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) උතුරු සහ නැඟෙනහිර පළාත්වල හැඹිලි දැල් මත්ස්‍ය කර්මාන්තයේ යෙදෙන යාත්‍රා සඳහා බලපත්‍ර ලබාදීමේ ප්‍රමාදයක් සිදුවන බවත්;

(ii) එම ප්‍රමාදය හේතුවෙන්, නිශ්චිත කාලයකදී පමණක් අස්වැන්න ලබාගත හැකි මසුන් ඇල්ලීමට නොහැකිවී ඇති බවත්;

(iii) බලපත්‍ර නොමැතිව ධීවර කටයුතුවල යෙදීම හේතුවෙන් ධීවරයන්, ධීවර ආම්පන්න සහ යාත්‍රා, නාවික හමුදා නිලධාරින් සහ ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තු නිලධාරින් විසින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර දඩ මුදලක් නියම කරන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත අ(i)හි සඳහන් බලපත්‍ර ලබා දීම ප්‍රමාද වීමට හේතු කවරේද;

(ii) ඉදිරියේදී නියමිත කාලය තුළ බලපත්‍ර ලබා දීමට පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் சுருக்குவலை மீன்பிடித் தொழிலில் ஈடுபடும் படகுகளுக்கான அனுமதிப் பத்திரங்களை வழங்குவதில் தாமதம் நிலவுகின்றது என்பதையும்;

(ii) மேற்படி தாமதத்தின் காரணமாக குறிப்பிட்ட காலத்தில் மாத்திரமே பிடிக்கக் கூடிய மீன்களைப் பிடிக்க முடியாதுள்ளது என்பதையும்;

(iii) அனுமதிப் பத்திரங்களின்றி மீன்பிடி நடவடிக்கை களில் ஈடுபடும் மீனவர்கள், அவர்களுடைய மீன்பிடி உபகரணங்கள் மற்றும் படகுகளுடன் கடற்படை உத்தியோகத்தர்கள், கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் திணைக்கள உத்தியோகத்தர்களினால் கைது செய்யப்பட்டு, நீதிமன்றத்தில் ஆஜர்படுத்தப்படுவதையும், அவர்களுக்கு அபராதம் விதிக்கப்படுவதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி அ(i) இல் குறிப்பிடப்பட்டுள்ள அனுமதிப் பத்திரங்களை வழங்குவதில் தாமதம் ஏற்படுவதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(ii) எதிர்காலத்தில் உரிய காலத்தில் அனுமதிப் பத்திரங்களை வழங்க நடவடிக்கை எடுக்கப் படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries, Aquatic and Ocean Resources:

(a) Is he aware that -

(i) there is a delay in issuing licences for vessels engaged in the ring net fishing industry in the Northern and Eastern Provinces;

(ii) owing to the delay, it has not been possible to harvest fish that are available only at a specific time; and

(iii) fishermen, fishing gear and vessels engaged in fishing activities without licenses are apprehended by Navy officers and the Fisheries and Aquatic Resources Department officers, produced before the courts and fined?

(b) Will he inform this House -

(i) the reasons for the delay in issuing the licences mentioned in (a) (i) above; and

(ii) whether steps will be taken to issue licenses within the stipulated time in the future?

(c) If not, why?

**ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)

ගරු කථානායකතුමනි, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) උතුරු, නැගෙනහිර ප්‍රදේශවල නීත්‍යනුකූල ලෙස හැඹිලි දැල් බලපත්‍ර ලබා ගෙන ඇති ධීවර යාත්‍රා සඳහා ප්‍රමාදයකින් තොරව බලපත්‍ර අලුත් කිරීම මේ වන විටත් සිදු කර ඇත. මෙම බලපත්‍රයක වලංගු කාලය වර්ෂයක් වන අතර, ඒ අනුව ධීවරයෙකුට බලපත්‍රයක් ලබා ගැනීමට වැය කළ යුතු වන්නේ වර්ෂයකට එක් දිනක් පමණි.

2026 වර්ෂය සඳහා, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ බලපත්‍ර 174ක්, මුලතිව් දිස්ත්‍රික්කයේ බලපත්‍ර 12ක්, මන්නාරම දිස්ත්‍රික්කයේ බලපත්‍ර 30ක්, පුත්තලම දිස්ත්‍රික්කයේ බලපත්‍ර 68ක්, යාපනය දිස්ත්‍රික්කයේ බලපත්‍ර 34ක් දැනට නිකුත් කර ඇත.

(ii) හැඹිලි දැල් බලපත්‍ර ලබා දීමේදී එම දැල් සඳහා ඇසක ප්‍රමාණය අඟල් 1 ½ක් වශයෙන්ද, දැලේ උපරිම දිග මීටර් 225ක් වශයෙන්ද පිරිවිතර නියම කර ඇත. මේ නිසා එම ප්‍රමාණයට වඩා විශාල ඕනෑම මත්ස්‍ය වර්ගයක් මෙම දැලට හසු වීම සිදු වේ. ඒ අනුව මෙම දැල භාවිතයෙන් විශාල ලෙස වර්ධනය වන මසුන් මෙන්ම කුඩා මසුන්ද හසුවීම සිදු වේ.

හැඹිලි දැල් භාවිත කර අලගොඩු පන්නය බහුලව සිදු කරනුයේ වසරේ මාර්තු මස සිට මැයි මස දක්වා වූ කාල සීමාව තුළ වේ. නමුත් විවිධ පාරිසරික සාධක මත දින වකවානු සුළු වශයෙන් වෙනස්වීම සිදු වේ. ඒ අනුව මත්ස්‍ය ගහනය පිළිබඳව ලබා ගන්නා දත්ත පදනම් කරගෙන නියමිත දිනවල බලපත්‍ර ලබා දීම සිදු කරනු ලබයි.

ඒ අනුව බලපත්‍ර ලබා දීමේ ප්‍රමාදයක් සිදුව නැත.

(iii) ධීවර කර්මාන්තය කළමනාකරණය කිරීම සඳහා නෛතික ප්‍රතිපාදන 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත හා ඒ යටතේ සකස් කරන ලද නියෝග මඟින් සලසා දී ඇත. එම නෛතික විධිවිධානවලින් බැහැරව කටයුතු කරන ඕනෑම තැනැත්තකු වරදකරුවකු වන අතර, ඒ අනුව ඔවුන් සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදු කළ යුතුය.

එමෙන්ම එම පනත යටතේම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මෙන්ම ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරීන්ද බලයලත් නිලධාරීන් ලෙස නම් කර ඇති බැවින්, නීති විරෝධීව ධීවර කටයුතුවල නිරත වන්නන් සම්බන්ධයෙන් නීතිමය කටයුතු කිරීමට දෙපාර්ශ්වයටම බලය ඇත.

ඒ අනුව සෑම ධීවර මෙහෙයුමක් සඳහාම බලපත්‍ර ලබා ගත යුතු වනවා සේම, හැඹිලි දැල් පන්න ක්‍රමය සඳහාද බලපත්‍ර ලබා ගැනීම කළ යුතුය. බලපත්‍ර නොමැතිව ධීවර කටයුතුවල නිරත වුවහොත්, ඔවුන් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.

නමුත් නීත්‍යනුකූලව රැකියාව කරන ධීවරයන්ට කිසිදු බාධාවකින් තොරව ධීවර කර්මාන්තයේ නිරත විය හැකිය.

(ආ) (i) අදාළ නොවේ.

(ii) සෑම විටම නියමිත කාලය තුළ බලපත්‍ර ලබා දීම සිදු කරනු ලබයි.

(ඇ) අදාළ නොවේ.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ சபாநாயகர் அவர்களே!

கௌரவ பிரதி அமைச்சர் அவர்களே! திருகோணமலை மாவட்டத்தில் OFRP என்று சொல்லப்படுகின்ற சிறிய படகுகளுக்கு மாத்திரமே இந்தச் சுருக்கு வலை மீன்பிடிக்கான அனுமதிப்பத்திரங்கள் வழங்கப்படுகின்றது; வேறு மாவட்டங் களைப் போன்று IMUL என்று சொல்லப்படுகின்ற பெரிய வகை பலநாள் படகுகளுக்கு வழங்கப்படுவதில்லை. குறிப்பாக இந்த அனுமதிப்பத்திரமானது, சூறை மீன்களைப் பிடிப்பதற்காகப் பயன்படுத்துகின்ற 1.5 inches கண் கொண்ட சுருக்கு வலைக்குத்தான் வழங்கப்படுகின்றது. ஆனால், இந்த அனுமதிப்பத்திரம் 1983ஆம் ஆண்டு வெளியிடப் பட்ட வர்த்தமானியின் அடிப்படையில் வழங்கப்படுகின்ற காரணத்தால், அந்த நிபந்தனைகள் இப்பொழுது திருகோணமலை மாவட்டத்திலே காணப்படுகின்ற பிரச்சினை களோடு ஒப்பிட்டுப் பார்க்கின்றபோது பல சிக்கல்களை ஏற்படுத்துகின்றன. குறிப்பாக, கடலில் 7 மைல் தூரம் சென்று அந்த வலையைப் பயன்படுத்தி மீன்களைப் பிடிக்க வேண்டுமென்ற நிபந்தனையானது, எங்களுடைய மாவட் டத்தைப் பொறுத்தவரை பொருத்தமற்றதாகக் காணப்படு கின்றது. கௌரவ பிரதி அமைச்சர் அவர்களே, சூறை மீன்களைப் பிடிப்பதற்கான புதிய திட்டத்தை அறிமுகப்படுத்தி, இந்த வலைக்கான அனுமதிப்பத்திரங்களை வழங்குவதற்குரிய நடவடிக்கைகள் ஏதும் உங்கள் அமைச்சின்மூலம் எடுக்கப் படுகின்றதா? என்பதை என்னுடைய முதலாவது மேலதிகக் கேள்வியாக நான் இந்த இடத்திலே கேட்க விரும்புகின்றேன்.

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)

ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමනි, ධීවර කර්මාන්තයේ හඳුනාගෙන තිබෙන පන්න වර්ග කිහිපයක් තිබෙනවා. ධීවර කර්මාන්තය සඳහා මේ පන්න වර්ග ඉතිහාසයේ හඳුන්වා දී තිබෙන අරමුණු කිහිපයක් තිබෙනවා. එයින් එක් අරමුණක් තමයි, මේ පන්න ක්‍රමය මඟින් නෙළා ගන්නා මත්ස්‍ය අස්වැන්න වැඩි වෙන්න ඕනෑ කියන එක. දෙවැනි එක තමයි, සාගරය අභ්‍යන්තරයේ තිබෙන පරිසර පද්ධතිය - ජීවී, අජීවී පද්ධතිය - සම්බන්ධ ආරක්ෂාව. තිරසර සංවර්ධනය පදනම් කරගෙන තමයි පන්න ක්‍රමය යොදා ගෙන තිබෙන්නේ. ඔබතුමා විසින් ඉදිරිපත් කර තිබෙන හැඹිලි දැල් භාවිත කරන්න පුළුවන් වෙන්නේ මීටර් 225ක් දිග, මීටර් 25ක් ගැඹුර, අඟල් එකහමාරක ඇස තිබෙන දැල්වලටයි. ඒක භාවිත කරන්න පුළුවන් නාවික සැතපුම් හතකට එහායින්. උදෑසන හයත්, හැන්දෑවේ හයත් අතර වෙලාවේ තමයි ඒ දැල් භාවිත කරන්න පුළුවන් වෙන්නේ. ඒ වේලාව යොදාගෙන තිබෙන්නේ ඇයි? මේ සියලු දේවල් ඉතිහාසයේදී විද්‍යාත්මක පදනමක් මත තමයි කරලා තිබෙන්නේ. විශේෂයෙන් අපේ අමාත්‍යාංශයේ scientific body එක තිබෙන්නේ NARA ආයතනයේ. NARA ආයතනය දීර්ඝ කාලයක් කරපු පර්යේෂණ අනුව තමයි මේ කොන්දේසි යොදලා තිබෙන්නේ. ගරු

මන්ත්‍රීතුමනි, සාගර අභ්‍යන්තරයේ සිටින මත්ස්‍ය සම්පතේ ප්‍රමාණය, මත්ස්‍යයන්ගේ වර්ධනය සැලකිල්ලට අරගෙන තමයි ඒ කොන්දේසි යොදලා තිබෙන්නේ. ඇසේ ප්‍රමාණය කුඩා නම්, රාත්‍රී කාලයේ ලයිට් එකක් භාවිත කළොත්, නාවික සැතපුම් හතකට මෙහායින් දැල් දැම්මොත් කුඩා ප්‍රමාණයේ මත්ස්‍යයන් තමයි ඒ දැලට අහුවෙන්නේ. එතකොට විශාල ප්‍රමාණයකට වර්ධනය විය හැකි මත්ස්‍යයන් ප්‍රමාණයක් අහිමි වෙනවා. ඒකෙන් සිදු වෙන්නේ ධීවර කර්මාන්තයට නෙළා ගත හැකි මත්ස්‍ය සම්පත අහිමි වෙන එකයි. මම විශ්වාස කරනවා, ඔබතුමාට මම මේ කියන කාරණය අවබෝධ වෙන්න ඇති කියලා. මේ කොන්දේසි යොදන්නේ ධීවර කර්මාන්තයේ තිරසර සංවර්ධනය වෙනුවෙන්. ඔබතුමාට කිසියම් ක්‍රමයක්, යෝජනාවක් තිබෙනවා නම් ඒ යෝජනාව අපට ඉදිරිපත් කරන්න. අපි ඒක NARA ආයතනයට ලබා දෙන්නම්. ඒ සම්බන්ධව පර්යේෂණය කරලා ඒ යෝජනාව හොඳ නම් අපට ඉදිරියේදී ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන්.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

මේ යෝජනාව NARA එකට කලිනුත් දීලා තිබෙනවා. ත්‍රිකුණාමලයේ විතරයි ඒ ප්‍රශ්නය තිබෙන්නේ. කිලෝමීටර හතකට මෙහායින් දැල් දමන්න බැහැ කියන එක කින්නියා, මූතූර් ප්‍රදේශවලට ප්‍රශ්නයක්ව තිබෙනවා. සමහර විට අනෙක් දිස්ත්‍රික්කවලට ඒ ප්‍රශ්නය නැතුව ඇති. ඒ ගැන සලකා බලන්න කියලා මා ඉල්ලා සිටිනවා.

அதுபோல், தற்போது சுருக்கு வலை அனுமதிப்பத்திரத்தை ஒருவரின் பெயரிலிருந்து இன்னொருவரின் பெயருக்கு மாற்றம் செய்ய முடியாத நிலை காணப்படுகின்றது. இதனால் இந்த அனுமதிப்பத்திரங்களைப் பெறுகின்றவர்கள் பல பிரச்சினைகளை எதிர்நோக்குகின்றார்கள். குறிப்பாக, தந்தை இறந்துபோனால், அவருடைய அனுமதிப்பத்திரத்தை மகனின் பெயருக்கு மாற்றம் செய்ய முடியாதவொரு சூழல் காணப் படுவதன் காரணமாகப் பல்வேறு பிரச்சினைகள் எதிர்நோக்கப் படுகின்றன. ஆகையால், கௌரவ பிரதி அமைச்சர் அவர்களே! இவ்வனுமதிப்பத்திரத்தைத் தடையில்லாமல் அவர்களுடைய பிள்ளைகளின் பெயருக்கு மாற்றம் செய்யும் நடவடிக்கையை முன்னெடுக்க முடியுமா என்பதை என்னுடைய இரண்டாவது மேலதிகக் கேள்வியாக நான் கேட்க விரும்புகின்றேன்.

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)

ගරු මන්ත්‍රීතුමනි, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය පිහිටා තිබෙන්නේ ත්‍රිකුණාමල බොක්ක තිබෙන ප්‍රදේශයේ. කින්නියා පැත්තේ ඉඳලා නාවික සැතපුම් හතක් කියනකොට මේ බොක්කට අදාළ ප්‍රදේශය ඉවත් කළාම සාගර කලාපයට කුඩා ප්‍රමාණයක් තමයි අයිති වෙන්නේ. ඒ කියන්නේ, විස්ථාපනය සැලකුවාට පස්සේ. ඒ අසාධාරණය පිළිබඳව - ඔබතුමා කියපු කරුණ ගැන - අපි මීට පෙරත් සාකච්ඡා කළා. ඒ කාරණය ගැන අවබෝධයක් ගැනීමට තවදුරටත් ඒ සම්බන්ධව සාකච්ඡා වෙනවා.

ඊට අමතරව ගරු මන්ත්‍රීතුමනි ඔබතුමා කලින් සඳහන් කළා OFRP boats, ඒ කියන්නේ එක්දින ධීවර යාත්‍රාවලින් පමණයි මේ හැඹිලි දැල පාවිච්චි කරන්නේ, බහුදින - IMUL - යාත්‍රාවල හැඹිලි දැල භාවිත කරන්නේ නැහැ කියලා. ඒක නිවැරදි විය යුතුයි. NARA එක දැනට මේ සම්බන්ධව කරපු පර්යේෂණවලට අනුව අවසාන වාර්තාවේ තිබෙන්නේ මේ දුර ප්‍රමාණයන්, මේ තිබෙන කොන්දේසිම පමණයි, ගරු මන්ත්‍රීතුමනි. ඒවා වෙනස් කරන්න තවම යෝජනාවක් ඇවිල්ලා නැහැ. ඔබතුමා කියන සමහර ප්‍රදේශවලට අදාළව මේ සම්බන්ධයෙන් සාර්ථකව යෝජනාවක් ඉදිරිපත් වෙනවා නම්, අපි සූදානම් NARA එකට ඒ සම්බන්ධව නැවත පර්යේෂණයකට යෝජනා කරන්න. එසේ යෝජනාවක් තිබෙනවා නම් අපේ අමාත්‍යාංශයට ලබා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

## සතොස වෙළඳසැල් ජාලය: 2024/01 සිට 2025/10 දක්වා කාර්යසාධනය
## சதொச விற்பனை வலையமைப்பு: 01/2024 முதல் 10/2025 வரையிலான செயலாற்றுகை
## SATHOSA OUTLET NETWORK: PERFORMANCE FROM 01/2024 TO 10/ 2025

1660/2025

**4. ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දිවයින පුරා ඇති සතොස වෙළඳසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) 2024 ජනවාරි මාසයේ සිට 2025 ඔක්තෝබර් මාසය දක්වා වසා දැමීමට කටයුතු කරන ලද සතොස වෙළඳසැල් සංඛ්‍යාව කොපමණද;

(iii) උක්ත කාලසීමාව තුළ සමස්ථ සතොස වෙළඳසැල් ජාලය ලබා ඇති ලාභය සහ වියදම එක් එක් මාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, කරාපිටිය සතොස වෙළඳසැල මේ වනවිට වසා දමා ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நாட்டிலுள்ள சதொச விற்பனை நிலையங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) 2024ஆம் ஆண்டு சனவரி மாதம் தொடக்கம் 2025ஆம் ஆண்டு ஒக்ரோபர் மாதம் வரையான காலப்பகுதியில் மூடப்பட்ட சதொச விற்பனை நிலையங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) மேற்படி காலப்பகுதியில் ஒட்டுமொத்த சதொச விற்பனை வலையமைப்பு பெற்றுக்கொண்ட இலாபம் மற்றும் அதன் செலவினம் ஒவ்வொரு மாதத்துக்கும் ஏற்ப வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

[ගරු චානක මාදුගොඩ මහතා]

(ஆ) (i) காலி மாவட்டத்தின், கராபிட்டிய சதொச விற்பனை நிலையம் தற்போது மூடப்பட் டுள்ளமையை அவர் அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House -

(i) the number of Sathosa outlets located Islandwide;

(ii) the number of Sathosa outlets that were closed down from January, 2024 to October, 2025; and

(iii) the profit and expenditure of the entire Sathosa outlet network during the said period, separately for each month?

(b) Will he also inform this House -

(i) whether he is aware that the Karapitiya Sathosa outlet in the Galle District has now been closed; and

(ii) if so, the reasons therefor?

(c) If not, why?

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 424කි. (2026.08.17 දිනට)

(ii) 31කි.

(iii) ඇමුණුම මඟින් දක්වා ඇත.

(ආ) (i) ඔව්.

(ii) ඔව්.

කරාපිටිය ලංකා සතොස අළෙවිසැල පවත්වා ගෙන ගිය ගොඩනැඟිල්ලේ හිමිකරු විසින් එය යළි ලබා දෙන ලෙස කළ ඉල්ලීමට අනුව අදාළ ගොඩනැඟිල්ල නැවත ඔහු වෙත භාර දීමට කටයුතු කර ඇත.

එම අළෙවිසැල වෙනුවට වෙනත් අළෙවිසැලක් මේ දක්වා විවෘත කර නොමැත.

තවද, කරාපිටිය නගරය තුළ අළෙවිසැලක් ස්ථාපිත කර පවත්වා ගෙන යෑම සඳහා ප්‍රමාණවත් වාණිජමය හා පාරිභෝගික හැකියාවක් පවතින අතර, මීට පෙරද කරාපිටිය නගරයේ ලංකා සතොස අළෙවිසැලක් සාර්ථකව හා ලාභදායී ලෙස පවත්වා ගෙන ගොස් ඇති බැවින් එම නගරය තුළ අපගේ ව්‍යාපාරික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා ඉහළ අවශ්‍යතාවක් පවතින බව හඳුනා ගෙන ඇත. ඒ අනුව කරාපිටිය නගරයේ නැවතත් ලංකා සතොස අළෙවිසැලක් ස්ථාපිත කිරීමේ අරමුණින් කලක සිටම සුදුසු ස්ථානයක් හෝ ගොඩනැඟිල්ලක් සොයා ගැනීම සඳහා අඛණ්ඩව කටයුතු කරමින් සිටින අතර, මේ සම්බන්ධයෙන් පෞද්ගලික අංශයට මෙන්ම රජයට අයත් ගොඩනැඟිලි පිළිබඳව ද අවධානය යොමු කරමින් සොයා බලා ඇති නමුත් මේ දක්වා අපගේ ව්‍යාපාරික අවශ්‍යතාවන්ට හා අළෙවිසැල් පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය මූලික පහසුකම්වලට ගැළපෙන සුදුසු ගොඩනැඟිල්ලක් හඳුනා ගැනීමට හැකියාවක් ලැබී නොමැත.

එමෙන්ම කරාපිටිය නගරය තුළ අළෙවිසැලක් නැවත ස්ථාපිත කිරීම මඟින් පාරිභෝගික අවශ්‍යතා සපුරාලීමට මෙන්ම ප්‍රදේශයේ ආර්ථික ක්‍රියාකාරකම් සඳහාද ආයතනය වශයෙන් දායකත්වයක් ලබා දීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කරනු ලබන අතර, කරාපිටිය නගරය තුළ ලංකා සතොස අළෙවිසැලක් ස්ථාපිත කිරීමට සුදුසු ස්ථානයක් ලැබෙන අවස්ථාවකදී අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලව අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව වැඩිදුරටත් දන්වා සිටීමට කැමැත්තෙමි.

(ඇ) අදාළ නොවේ.

| | 2024 Jan | 2024 Feb | 2024 Mar | 2024 Apr | 2024 May | 2024 Jun | 2024 Jul | 2024 Aug | 2024 Sep | 2024 Oct | 2024 Nov | 2024 Dec |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Expenses | (696,427,458) | (736,887,163) | (758,283,220) | (775,616,235) | (701,065,500) | (683,250,887) | (678,100,916) | (703,839,825) | (681,068,480) | (711,308,572) | (711,909,684) | (651,870,742) |
| Profit/(Loss) | (42,781,001) | (66,803,804) | (29,673,690) | 31,527,765 | (135,746,070) | (118,988,914) | (94,403,650) | (95,089,874) | (77,151,358) | (108,504,368) | (160,252,431) | 55,529,795 |

| | 2025 Jan | 2025 Feb | 2025 Mar | 2025 Apr | 2025 May | 2025 Jun | 2025 Jul | 2025 Aug | 2025 Sep | 2025 Oct | 2025 Nov | 2025 Dec |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Expenses | (679,271,092) | (632,126,486) | (684,479,425) | (643,365,864) | (638,537,025) | (625,362,164) | (649,960,199) | (659,590,294) | (664,437,731) | (654,162,674) | (650,675,912) | (759,406,843) |
| Profit/(Loss) | (98,393,917) | (37,096,862) | (65,358,712) | 64,446,619 | (54,911,727) | (81,756,603) | (87,638,421) | (44,749,173) | (67,827,918) | (16,747,364) | (14,084,807) | 70,207,442 |

| | 2026 Jan | 2026 Feb | 2026 Mar | 2026 Apr | 2026 May | 2026 Jun | 2026 Jul |
|---|---|---|---|---|---|---|---|
| Expenses | (621,919,634) | (612,497,066) | (639,837,958) | (664,605,293) | (610,396,153) | (610,033,769) | (612,477,106) |
| Profit/(Loss) | (89,637,062) | (63,444,369) | 60,474,898 | 58,917,267 | (31,948,414) | (22,903,048) | 13,164,822 |

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පිළිතුරු ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ වනවිට අපට දකින්නට ලැබෙන දෙයක් තමයි අපි අත්‍යවශ්‍ය භාණ්ඩ ලැයිස්තුවක් අරගෙන සතොස ආයතනයකට ගියොත්, අපිට එම සතොස ආයතනයෙන් සම්පූර්ණ භාණ්ඩ ලැයිස්තුව මිලදී ගන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ කියන එක. එහි ගොඩක් බඩු අඩුයි. ඒ නිසා මේ වන විට සතොස ආයතනය පිළිබඳව තිබෙන විශ්වසනීයත්වය බිඳිලා තිබෙනවා. ඒ වාගේම, සතොස ආයතනයකින් බඩු කොටසක් අරගෙන අනෙකුත් බඩු මිලදී ගැනීම සඳහා වෙනත් කඩවලට යන්න සිදු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ වාගේම මේ වන විට සතොසේ තිබෙන භාණ්ඩවල මිල ගණන් ඉතාම ඉක්මනින්; සතියක් ඇතුළත උච්චාවචනය වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මීට සතියකට පෙර සතොස ආයතනයේ සීනි කිලෝවක් රුපියල් 218ට තිබුණා. අද එහි සීනි කිලෝවක් රුපියල් 239ක් වෙලා රුපියල් 21කින් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම, එහි පරිප්පු කිලෝවක් රුපියල් 223ට තිබුණා. අද එහි පරිප්පු කිලෝවක් රුපියල් 229ක් වෙලා තිබෙනවා. රුපියල් 6කින් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම, එහි රතු කැකුළු කිලෝවක් රුපියල් 169ට තිබුණා. අද වෙනකොට එහි රතු කැකුළු කිලෝවක් රුපියල් 174ක් වෙලා තිබෙනවා. රුපියල් 5කින් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම, එහි සුදු හාල් කිලෝවක් රුපියල් 186ට තිබුණා. අද සුදු හාල් කිලෝවක් රුපියල් 189ක් වෙලා තිබෙනවා. ඒ කියන්නේ, රුපියල් 3කින් වැඩි වෙලා තිබෙනවා. භාණ්ඩ කිහිපයක මිල උච්චාවචනයන් ගැන විතරයි මම කිව්වේ. ඒ අනුව සතියක් ඇතුළත සතොස ආයතනයේ බඩුවල මිල ගණන් ඉතාම ඉක්මනින් උච්චාවචනය වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, සතොස ආයතනයට අල්ලපු වැටේ තිබෙන සුපර්මාර්කට් ඇතුළු වෙනත් අළෙවිසැල්වල මේ වනවිටත් සතොස ආයතනයට වඩා අඩු මිල ගණන්වලට එම භාණ්ඩ තිබෙනවා. විශේෂයෙන්ම සතොස ආයතනයේ රුපියල් 239ට තිබෙන සීනි කිලෝව පිට කඩේක රුපියල් 230යි. ඒ කියන්නේ ඒවායේ සීනි කිලෝවක මිල රුපියල් 9කින් අඩුයි. ඒ වාගේම සතොස ආයතනයේ පරිප්පු කිලෝවක මිල රුපියල් 239යි, පිට කඩයක රුපියල් 235යි. ඒ කියන්නේ, රුපියල් 4කින් අඩුයි. ඒ වාගේම සතොස ආයතනයේ රතු කැකුළු සහල් කිලෝවක මිල රුපියල් 174යි, පිට කඩයක රුපියල් 168යි. ඒ කියන්නේ, රුපියල් 6කින් අඩුයි. ඒ වාගේම සුදු සහල් කිලෝවක මිල රුපියල් 189යි, පිට කඩයක රුපියල් 186යි. ඒ කියන්නේ රුපියල් 3කින් අඩුයි. මා ඒ සඳහන් කළේ භාණ්ඩ කිහිපයක මිල පමණයි.

සතොස කියන්නේ රජයේ ආයතනයක්. භාණ්ඩ මිල පාලනය කරන්න රජය බලාපොරොත්තු වන තැනක්. මේ මිල උච්චාවචනය ඇතුළේ සතොස පිළිබඳ විශ්වසනීයත්වය බිඳ වැටිලා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා එය හඳුනාගෙන ඒ පිළිබඳ යම් ක්‍රියාමාර්ගයක් නුදුරේදීම ගන්න බලාපොරොත්තු වනවාද? මොකද, සතොස කියන්නේ මේ රටේ සාමාන්‍ය ජනතාවට අත්‍යවශ්‍යම ආයතනයක්. ඒ නිසා ජනතාව තුළ මේ විශ්වසනීයත්වය වර්ධනය කරන්න ඔබතුමා යම් පියවරක් ගන්න සූදානම් ද කියන කාරණය මා අහන්න කැමැතියි.

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)

ගරු කථානායකතුමනි, පසුගිය සතිය තුළ භාණ්ඩ කිහිපයක මිල වෙනස්වීම පිළිබඳවයි ගරු මන්ත්‍රීතුමා කථා කළේ. විශේෂයෙන් අපි අප්‍රේල් මාසයේ සිට භාණ්ඩ ගණනාවක මිල අනෙක් ආයතනවල මිලට වඩා යම් ප්‍රමාණයකින් අඩු කළා. ඒ අතර සැලකිය යුතු ලෙස මිල අඩු වෙච්ච භාණ්ඩ ප්‍රමාණයකුත් තිබෙනවා. හැබැයි ප්‍රශ්නය මෙකයි, ගරු කථානායකතුමනි. අපි ආණ්ඩුව ගන්නකොට සතොස ආයතනය රුපියල් බිලියන 24ක පාඩුවක් ලබමින්, රුපියල් බිලියන 11කට ආසන්න මුදලක් ණය වශයෙන් බාහිර පාර්ශ්වකරුවන්ට ගෙවන්න තිබුණා. ඒ වාගේම රුපියල් බිලියන 5ක OD එකකුත් තිබුණා. එවැනි තත්ත්වයක් තිබියදී තමයි අපි මේ ආයතනය භාර ගත්තේ. ගරු කථානායකතුමනි, මේ හේතුව නිසාම සැපයුම්කරුවන්ගෙන් ටෙන්ඩර් කරලා අපි බඩු ගන්නවා. සැපයුම්කරුවන්ගේ ටෙන්ඩරයට භාණ්ඩ මිලදී ගෙන නැවත ඔවුන්ට ගෙවීම් කිරීමේදී සැලකිය යුතු පාඩුවක් සිදුව තිබෙනවා. ඒ පාඩු වෙච්ච ප්‍රමාණය ගත්තොත්, අතිවිශාලයි. ඒ පාඩුව හැම දාමත් සිද්ධ වෙලා තිබුණා. අපි මේ ආයතනය භාර ගන්නකොට රුපියල් මිලියන 160ක මාසික පාඩුවක් තිබුණා. හැබැයි, අපි ඒක ගිය මාසයේ ලාභ ලබන මට්ටමට ගෙනාවා. හැබැයි අපට තිබෙන ප්‍රශ්නය මෙකයි, ගරු කථානායකතුමනි. සතොසට බඩු ගැනීමේදී පෞද්ගලික අංශ මිලදී ගන්නවා වාගේ සැපයුම්කරුවන්ගෙන් ගන්න බැහැ. ඒක, පළමුවෙනි කාරණය.

දෙවෙනි කාරණය මෙකයි. ඒ බඩු අපි මිලදී ගත්තාම ඒගොල්ලන්ගේ payment එක කරන්න මාසයක විතර කාලයක් ගත වනවා. හැබැයි, අනෙකුත් ආයතන භාණ්ඩ මිලදී ගන්නේ ඒ මොහොතේම සල්ලි දීලා. ඒ නිසා සතොසට ලැබෙන commission එකට වඩා, ඒ ආයතනවලට ලැබෙන commission එක වැඩියි. නමුත් අපට ලැබෙන commission එකේ ප්‍රමාණය සලකා බලා භාණ්ඩ ගණනාවක මිල පසුගිය දවස්වල අඩු කළා.

අපි දන්නවා, දැන් යම් යම් භාණ්ඩවල හිඟතාවක් පවතින බව. ඒ හිඟතාවට උත්තරයක් විධියට අපි ලංකා සතොස ආයතන සහ සමුපකාර වෙනුවෙන් වහලා තිබුණු සතොස ආරම්භ කරලා, අපේ corporate ආයතනයත් ආරම්භ කරලා, තොග මිලදී ගැනීම්, ආනයනය කිරීම් සහ තොග සැපයීමේ ක්‍රියාවලියට ආරම්භයක් ලබා දෙනවා. ඒ අනුව ලබන මාසය විතර වනකොට අපි මාතර තොග ගබඩාව ආරම්භ කරනවා. ඊළඟට, කුරුණෑගලත් එකක් ආරම්භ කරනවා. ඒ විධියට දිස්ත්‍රික්කයකට එක ගණනේ තොග ගබඩා ආරම්භ කරලා බෙදා හැරීමේ කටයුතු ක්‍රියාත්මක කරනවා. ආනයනය, තොග සැපයීම කියන කාරණා දෙක ක්‍රියාත්මක වුණොත් අපි විශ්වාස කරනවා, අනෙක් ඔක්කෝම තැන්වලට වඩා අඩු මිලකට අපට භාණ්ඩ අළෙවි කරන්න පුළුවන් කියලා. ඒ වෙනුවෙන් අපි දැන් නිශ්චිත සැලසුමකින් යුතුව කටයුතු කරනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, පසුගිය කාලයේ සතොස ආයතන පාඩු ලබලා තිබුණා, ඒ නිසා තමයි යම් ගැටලුවක් නිර්මාණය වුණේ කියලා. හැබැයි මගේ ප්‍රශ්නයෙන් අහපු කරාපිටිය සතොස ආයතනය ලාභ ලබමින් තිබිච්ච ආයතනයක්. ඒ වාගේම මීට මාස දෙකකට පෙර හික්කඩුවේ තිබුණු සතොස ආයතනයත් වැහුවා. හික්කඩුව සතොස කියන්නේ අවුරුද්දකට රුපියල් කෝටියක පමණ ආදායමක් - ලාභයක් - ලබන ආයතනයක්. ඔබතුමා කියනවා, සතොස ආයතන පාඩු ලබනවා කියලා. හැබැයි, අද ලාභ ලබන සතොස ආයතනත් ඔබතුමන්ලාගේ පාලන කාලයේ වහමින් ඉන්නවා. එතකොට මේ සතොස ආයතන තවත් පාඩු ලබනවා නේ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කරාපිටිය සතොස ආයතනය වහලා අද වන විට අවුරුද්දක් වෙනවා. අවුරුද්දක් ගියා, ඔබතුමන්ලාට ඒ සඳහා අලුත් තැනක් සොයා ගන්න. ඔබතුමා ආසන්නයේම අපේ ගරු රත්න ගමගේ නියෝජ්‍ය ඇමතිතුමාත්, ඒ වාගේම ගරු නලින් හේවගේ නියෝජ්‍ය ඇමතිතුමාත් ඉන්නවා. අපේ ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව හරහා කරාපිටිය නගරයෙන් ස්ථානයක් සොයා දීමේ හැකියාව එතුමන්ලාට තිබෙනවා. අවුරුද්දක් යනකම් ඔබතුමන්ලා ඒ කාරණය පමා කළේ ඇයි? මොකද, කරාපිටිය නගරය මධ්‍යයේ තිබුණු සතොස ආයතනය බොහෝ ලාභ ලබපු තැනක්.

[ගරු වානක මාදුගොඩ මහතා]

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා අලාභය ගැන කථා කරනවා. නමුත්, මේ වහමින් ඉන්නේත් ලාභ ලබන සතොස ආයතන. ඔබතුමා මේ තත්ත්වය හඳුනාගෙනද ඉන්නේ? ඔබතුමන්ලාගේ රජය යටතේ සතොස ආයතන ප්‍රවර්ධනය කරනවාද, එහෙම නැත්නම් සතොස ආයතන වහන තැනට ක්‍රමානුකූලව කටයුතු කරනවාද කියන කාරණය මම අහන්න කැමැතියි.

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)

ගරු කථානායකතුමනි, එතුමා කියන විධියටම, ලාභ ලබන සතොස ශාඛා ගණනාවක් වහන්නත් අපට සිද්ධ වෙලා තිබෙනවා. කරාපිටිය සතොස ආයතනයත් ඒ වාගේ එකක්. ඒකට හේතුවක් තිබෙනවා. සතොසට නොවෙයි, දැන් පාරිභෝගිකයෝ කැමැතියි, වාහනයකින් ඇවිල්ලා බඩු මිලදී ගැනීම් කළ හැකි තැනකට යන්න. ඔය වසා දමා තිබෙන සමහර සතොස ආයතන ගත්තොත්, පසුගිය කාලයේ විවිධ තැන්වල විවිධ ස්ථානවල තමන්ට කැමැති තැන්වල දාලා තිබුණු ඒවා. ඒ නිසා පාඩු ලැබූ සතොස ශාඛා ගණනාවක් අපි වැහුවා. ලාභ ලබපු සතොස ආයතන කිහිපයකුත් වැහිලා තිබෙනවා. ඒ සතොස ආයතන වැහෙන්න හේතුව තමයි, ඒ අදාළ සතොස ආයතන පවත්වාගෙන ගිය ගොඩනැඟිලි අදාළ පාර්ශ්වකරුවන් විසින් ලබාගෙන තිබෙන එක, ඉල්ලා තිබෙන එක. අපි අත්සන් කරලා තිබෙන ගිවිසුම් අනුව ඒ අය එම ගොඩනැඟිලි ඉල්ලුවාට පස්සේ ඒ ස්ථාන නොදී ඉන්න අපට බැහැ. එවැනි ගොඩනැඟිලි භාර දුන්නාට පස්සේ අලුත් තැනක් ඉක්මනින් සොයා ගැනීමේ හැකියාවක් අපට නැහැ. මේ සතොස ආයතනත් අපි Cargills Food City වාගේ ආයතනත් එක්ක ගැටෙන ආයතන බවට පත් කරන්න නම් ඒකට පහසුකම් තිබෙන තැනක් ඕනෑ කරනවා. ඒ සඳහා මිනිස්සුන්ට පහසුකම් ලැබෙන තැනක් ඕනෑ. ඒ නිසා parking තිබෙන, වර්ග අඩි 3,000කට එහා ගොඩනැඟිල්ලක් තිබෙන තැනක් අපි හොයනවා. ඒ මූලික පහසුකම් නැති තැනක සතොස ආයතනයක් අලුතින් ආරම්භ කිරීමේ හැකියාවක් නැහැ. ඒ නිසා ලාභ ලබමින් තිබියදී වැහිච්ච සතොස ආයතන පිළිබඳව හොඳම අධ්‍යයනයක් අපට තිබෙනවා. විශේෂයෙන්ම තණමල්විල තිබෙන සතොස ආයතනයත් දැන් වැහෙන්න ළඟයි. ජගත් පුෂ්පකුමාර මැතිතුමාට අයත් ගොඩනැඟිල්ලක තමයි එය පවත්වාගෙන යන්නේ. එතුමා ඒ ගොඩනැඟිල්ල ඉල්ලා තිබෙනවා. ඒ වෙනුවට අලුතින් ඉඩමක් හෝ අරගෙන තාවකාලික ගොඩනැඟිල්ලක් හදලා හරි අපි නැවත සතොස ආයතනය පටන්ගෙන එම ප්‍රදේශයේ සිටින පාරිභෝගිකයින්ට අවශ්‍ය සේවා සලසන්න බලාපොරොත්තු වෙනවා.

## පොතුවිල් ප්‍රා.ලේ. කොට්ඨාසයේ සුනාමියෙන් පීඩාවට පත් ජනතාවට ලබා දුන් විකල්ප නිවාස: ඉඩම් ඔප්පු

பொத்துவில் பிரதேச செயலாளர் பிரிவில் சுனாமியால் பாதிக்கப்பட்ட மக்களுக்கு வழங்கப்பட்ட மாற்று வீடுகள்: காணி உறுதிகள்

ALTERNATIVE HOUSES PROVIDED TO TSUNAMI-AFFECTED PEOPLE IN POTTUVIL DS DIVISION: LAND DEEDS

1740/2025

**5. ගරු එම්.එස්. අබ්දුල් වාසිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2004.12.26 දින ඇති වූ සුනාමි ව්‍යසනය හේතුවෙන් පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආපදාවට ලක්වූ ජනතාවට නිවාස අහිමි වූ බවත්;

(ii) එම ජනතාව සඳහා රජය සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් පෞද්ගලික ඉඩම්වල සහ රජයේ ඉඩම්වල විකල්ප නිවාස ඉදිකර ලබා දී ඇති බවත්;

(iii) එම විකල්ප නිවාස, සර්වෝදයපුරම්, සෙංකාමම්, හිජ්රා නගර්, කනහර් ගම්මානය, කෝමාරි 1 සහ කෝමාරි 2 යන ග්‍රාම නිලධාරි වසම්වල පිහිටි රජයේ ඉඩම්වල ඉදිකර ඇති බවත්;

එතුමිය දන්නේද?

(ආ) (i) වසර 18කට අධික කාලයක් ගතවී ඇතත් මේ වන තෙක් එම ජනතාවට අදාළ ඉඩම් ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

(ii) එම ජනතාවට කඩිනමින් ඉඩම් ඔප්පු ලබා දීම සඳහා ගෙන ඇති හෝ ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2004.12.26ஆம் திகதி ஏற்பட்ட சுனாமி பேரழிவின் காரணமாக பொத்துவில் பிரதேச செயலாளர் பிரிவில் பாதிக்கப்பட்ட மக்கள் வீடுகளை இழந்தார்கள் என்பதையும்;

(ii) மேற்படி மக்களுக்கு அரசாங்கத்தினாலும் அரச சார்பற்ற அமைப்புகளினாலும் தனியார் காணிகளில் மற்றும் அரச காணிகளில் மாற்று வீடுகள் நிர்மாணித்துக் கொடுக்கப்பட்டுள்ளன என்பதையும்;

(iii) மேற்படி மாற்று வீடுகள் சர்வோதயபுரம், செங்காமம், ஹிஜ்ரா நகர், கனகர் கிராமம், கோமாரி 1 மற்றும் கோமாரி 2 ஆகிய கிராம அலுவலர் பிரிவுகளிலுள்ள அரச காணிகளில் நிர்மாணிக்கப்பட்டுள்ளன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) 18 வருடங்களைக் கடந்துள்ளபோதிலும், இது வரையில் அந்த மக்களுக்கு உரிய காணிகளுக்கான உறுதிகள் வழங்கப்படாதுள்ளமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி மக்களுக்கு துரிதமாக காணி உறுதிகளை வழங்குவதற்கு எடுத்துள்ள அல்லது எதிர்காலத்தில் எடுக்கப்படவுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Is she aware that the -

(i) people affected by the tsunami disaster that occurred on 26.12.2004 in the Pottuvil Divisional Secretary's Division lost their homes;

(ii) Government and Non-Governmental Organizations had constructed and provided alternative houses on private lands and State lands for those people; and

(iii) aforesaid alternative houses had been constructed on State lands in the Grama Niladhari Divisions of Sarvodayapuram, Senkamam, Hijra Nagar, Kanahar Village, Komari 1 and Komari 2?

(b) Will she inform this House the -

(i) reasons for the relevant land deeds not yet been granted to the aforesaid people, even though a period of more than 18 years had elapsed; and

(ii) steps that have been taken or will be taken in the future to grant land deeds to those people expeditiously?

(c) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Hon. Speaker, the Answer is as follows:

(a) (i) Yes, I am aware that the people of the Pottuvil Divisional Secretary's Division lost their homes due to the tsunami disaster.

(ii) The Government and Non-Governmental Organizations had constructed and provided alternative houses on the lands where the tsunami-displaced people were residing and on government lands.

(iii) Those alternative houses had been constructed on government lands located in the Grama Niladhari Divisions of Sarvodayapuram, Senkamam, Hijra Nagar, Komari 1 and Komari 2. Tsunami housing had not been constructed in the Kanahar Gramam area and the resettlement of individuals displaced by the war had been undertaken there.

(b) (i) There are problems with granting the deeds as some of the original land owners who first received those lands are no longer residing on them. The original land owners had sold the lands to third parties. So, those are some of the issues that have been currently identified.

(ii) The Divisional Secretary, Pottuvil has been collaborating with the Land Commissioner General's Department in order to take necessary steps to issue deeds to the people displaced by the tsunami disaster. Accordingly, it was proposed to issue those deeds to the original residents or to their family members in the event the original residents are deceased, and to provide the land on a short-term or long-term lease basis to the individuals who are not original residents or those who have purchased the land.

(c) Not relevant.

**ගරු එම්.එස්. අබ්දුල් වාසිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
கௌரவ பிரதமர் அவர்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொண்டு, என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

நாடளாவிய ரீதியில் 2004ஆம் ஆண்டு ஏற்பட்ட சுனாமி பேரழிவு காரணமாகப் பாதிக்கப்பட்டு வீடுகளை இழந்த மக்களுக்கான வீடுகள் அரசினாலும் அரச சார்பற்ற நிறுவனங் களினாலும் கட்டி வழங்கப்பட்டன.

அம்பாறை மாவட்டத்தின் பொத்துவில் பிரதேச செயலாளர் பிரிவு மக்களுக்காக வழங்கப்பட்ட வீடுகள் அமையப் பெற்ற பிரதேசங்களில் அடிப்படை வசதிகள் குறிப்பாக குடிநீர், சுகாதாரம், போக்குவரத்து, கல்வி, சரியான வீதியமைப்பு போன்றன இல்லாமை காரணமாக JICA Village, Senkamam, Sarvodayapuram, Komari, Sangaman Kandy போன்ற பிரிவுகளில் மக்கள் பலர், தமது மாற்று வீடுகளை குடும்பத்தினருக்கு வழங்கியும், விற்பனை செய்தும் வேறு இடங்களில் வாழ்ந்து வருவதை இங்கு குறிப்பிட விரும்புகிறேன். இவ்வாறு புதிய குடியிருப்பாளர்களுக்கான வீடுகள், வீட்டு ஆவணங்களை வழங்க முடியுமா? அல்லது இவ்வாறு புதிய குடியிருப்பாளர்கள் தமது குடியிருப்புக்கான ஆவணங்களைப் பெற்றுக்கொள்ள என்ன வழிகளை மேற்கொள்ள வேண்டுமெனக் கேட்கின்றேன்.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, that is what was explained, that the Pottuvil Divisional Secretary is currently working with the Land Commissioner General to sort out, first, the issues of ownership because, as was mentioned, some of the owners are deceased or had sold their properties. So, the issue of ownership has to be settled first and that process is underway. Then, the issues with regard to repairs or water issues that those people are facing could be addressed through the normal means; it does not make a difference whether they are tsunami-affected or not or what the circumstances were. The usual procedures for dealing with those issues could be followed; that is applicable to those households also.

**ගරු එම්.එස්. අබ්දුල් වාසිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன். இது என்னுடைய பிரதான வினாவுடன் தொடர்புடையதாக இல்லாதுவிட்டாலும், இன்றைய நாள் அமர்வு எனது நாடாளுமன்ற காலத்தின் இறுதி நாளாக இருக்குமென எதிர்பார்ப்பதால், கௌரவ பிரதம அமைச்சரிடம் கேட்க விரும்புகின்றேன்.

[ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා]

அம்பாறை மாவட்டத்தின் பொத்துவில் பிரதேச செயலாளர் பிரிவில் 21 முஸ்லிம் பாடசாலைகளும் 2 சிங்களப் பாடசாலைகளும் 8 தமிழ் பாடசாலைகளும் உள்ளன. இன ரீதியாகப் பிரிக்கப்பட்டுள்ள இந்த 31 மூவினப் பாடசாலை களையும் இணைத்து, பொத்துவிலுக்கென ஒரு புதிய கல்வி வலயத்தை உருவாக்கித் தருமாறு கடந்த 16 வருட காலமாக கோரிக்கை விடுத்து வருகின்றோம். ஆனால், இன்று வரை எந்தவிதமான சாதகமான முடிவுகளும் எட்டப்படவில்லை. இந்த உயரிய சபையில் நானும் பல தடவை இது பற்றி உரையாற்றி இருக்கின்றேன்.

கௌரவ பிரதம அமைச்சர் அவர்களே, நீங்கள் இதனைக் கவனத்திற்கொள்வதாகச் சொன்னீர்கள். எமது பொத்துவில் பிரதேச செயலாளர் பிரிவிலுள்ள மூவினப் பாடசாலை களையும் இணைத்து, இனரீதியற்ற ஒரு கல்வி வலயத்தை பொத்துவிலில் ஆரம்பிக்க நடவடிக்கை எடுப்பீர்களா? அவ்வாறு நடவடிக்கை எடுப்பதன்மூலம் மிகத் தொலை விலுள்ள எமது பாடசாலை மாணவர்கள் சிறப்பான கல்வியைப் பெறமுடிவதுடன், ஆசிரியர் பற்றாக்குறையையும் நிரந்தரமாகத் தீர்க்க முடியுமெனக் கூற விரும்புகின்றேன்.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, as was mentioned, the Hon. Member raised this issue previously also. We are currently in the process of analysing all of the zones and the distribution of zones. When that plan is finalized, we can make a final decision about this particular zone as well. We cannot take it in isolation; it has to be part of the entire reorganizing of the district and that province. So, that review is underway. Within the next year, we will be implementing the new administrative arrangements for those schools, but that can only be finalized once that initial assessment is planned. Currently, there is a pilot project underway in Dehiattakandiya. We are taking lessons from that to apply to all of those other areas.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 6 -1827/2026- (1), ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

Sir, I ask the Question.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ඔලුවිල් වරාය: විස්තර
### ஒலுவில் துறைமுகம்: விபரம்
### OLUVIL PORT: DETAILS

2236/2026

**7. ගරු අබුබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ ධීවර සහ වාණිජ වරායක් ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින් 'ඔලුවිල් වරාය' පිහිටුවන ලද බව දන්නේද;

(ii) එම වරාය පිහිටුවා මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) වරායේ ඉදිකිරීම් කටයුතු සඳහා මූල්‍ය ආධාර සැපයූ විදේශ රාජ්‍යය කවරේද;

(iv) ඒ සඳහා වැය කරන ලද සම්පූර්ණ මුදල කොපමණද;

(v) වරායේ මෝය කට වැලි තැන්පත් වීම හේතුවෙන් එහි මෙහෙයුම් කටයුතු අත්හැර දැමීමට පෙර, එය කාර්යක්ෂමව ක්‍රියාත්මක වූ කාල සීමාව කොපමණද;

(vi) එම වරාය අක්‍රිය තත්ත්වයට පත්ව මේ වනවිට ගත වී ඇති කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වරාය ආරම්භයේදී එමඟින් ප්‍රතිලාභ ලැබූ ධීවරයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට එමඟින් ප්‍රතිලාභ ලබන ධීවරයන් සිටින්නේද;

(iii) එසේ නම්, එම ධීවරයන් සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම වරාය ජාතික මත්ස්‍ය නිෂ්පාදනයට සහ රටේ ආර්ථිකයට දායකත්වය ලබා දිය හැකි අයුරින් ප්‍රතිසංස්කරණය කිරීමට රජය සැලසුම් කර තිබේද;

(v) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச் சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாறை மாவட்டத்தில் மீன்பிடித் துறைமுக மாகவும் வணிகத் துறைமுகமாகவும் செயற் படுத்தும் நோக்கத்துடன் 'ஒலுவில் துறைமுகம்' நிறுவப்பட்டமையை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி துறைமுகம் நிறுவப்பட்டு தொழிற் பாட்டு நடவடிக்கைகள் ஆரம்பிக்கப்பட்ட திகதி யாது என்பதையும்;

(iii) துறைமுகத்தின் நிர்மாணப் பணிகளுக்கு நிதியுதவி அளித்த நாடு யாது என்பதையும்;

(iv) அதன் நிர்மாணப் பணிகளுக்குச் செலவிடப்பட்ட முழுத் தொகை எவ்வளவு என்பதையும்;

(v) துறைமுகத்தின் முகத்துவாரத்தில் மணல் தேங்கியமையால் அதன் நடவடிக்கைகள் கைவிடப்படுவதற்கு முன்னதாக, அது வினைத்திறனுடன் இயங்கிய காலப்பகுதி யாது என்பதையும்;

(vi) மேற்படி துறைமுகம் எவ்வளவு காலமாகச் செயலிழந்து காணப்படுகின்றது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) துறைமுகம் இயங்கிய ஆரம்ப காலத்தில் அதன்மூலம் பயனடைந்த மீனவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) தற்பொழுது அதன்மூலம் பயனடைகின்ற மீனவர்கள் உள்ளார்களா என்பதையும்;

(iii) ஆமெனில், அந்த மீனவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) மேற்படி துறைமுகத்தை தேசிய மீன் உற்பத்திக்கும் நாட்டின் பொருளாதாரத்துக்கும் பங்களிப்பு வழங்கக்கூடிய வகையில் புனரமைப்பதற்கு அரசாங்கம் திட்டமிட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனில், அது தொடர்பான விபரங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries, Aquatic and Ocean Resources:

(a) Will he inform this House -

(i) whether he is aware that the Oluvil Port was established with the objective of operating as a fishery and commercial harbour in the Ampara District;

(ii) the date on which the said port was established and its operations were commenced;

(iii) the foreign country that provided financial assistance for the construction of the said port;

(iv) the total expenditure incurred on the said construction;

(v) the period during which the aforesaid port was in operation prior to the abandonment of its operations due to the accumulation of sand at the river mouth; and

(vi) the period of time that has elapsed up to now since the said port became inactive?

(b) Will he also inform this House -

(i) the number of fishermen who benefitted from the port at the time of its commencement of operations;

(ii) whether there are fishermen benefitting from it at present;

(iii) if so, the number of such fishermen;

(iv) whether the Government has planned to renovate the Oluvil Port in a manner that would enable it to contribute to national fish production and the national economy; and

(v) if so, the details of such plans?

(c) If not, why?

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)

ගරු කථානායකතුමනි, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) වරායේ ඉදිකිරීම් කටයුතු ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙතින් සිදු කර ඇති බැවින්, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය මඟින් විමසීම් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

(iii) ශ්‍රී ලංකා වරාය අධිකාරිය මඟින් විමසීම් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

(iv) ශ්‍රී ලංකා වරාය අධිකාරිය මඟින් විමසීම් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

(v) ශ්‍රී ලංකා වරාය අධිකාරිය මඟින් විමසීම් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

(vi) මේ සම්බන්ධයෙන් නිශ්චිත පිළිතුරක් ලබා දිය නොහැක. ශ්‍රී ලංකා වරාය අධිකාරිය මඟින් විමසීම් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

(ආ) (i) ඔලුවිල් ධීවර වරාය අක්‍රිය තත්ත්වයේ පවතින බැවින් එහි කටයුතු ක්‍රියාත්මක නොවේ.

(ii) ඔලුවිල් ධීවර වරාය අක්‍රිය තත්ත්වයේ පවතින බැවින් එහි කටයුතු ක්‍රියාත්මක නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) සැලසුම් කර ඇත.

(v) මේ වනවිට ඔලුවිල් ධීවර වරාය, ජාතික මත්ස්‍ය නිෂ්පාදනයට සහ රටේ ආර්ථිකයට දායකත්වය ලබා දිය හැකි අයුරින් ප්‍රතිසංස්කරණය කිරීමට අදාළව ජනාධිපති ලේකම් කාර්යාලය, පරිසර අමාත්‍යාංශය, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව හා මෙම අමාත්‍යාංශය එක්ව කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) අදාළ නොවේ.

**ගරු අබුබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)

நன்றி, கௌரவ பிரதி அமைச்சர் அவர்களே!

கிழக்கு மாகாணத்திலுள்ள அம்பாறை மாவட்டத்தின் பொருளாதார வளர்ச்சியிலும், கடல்சார் பொருளாதாரத்திலும் முக்கிய பங்காற்றக்கூடிய ஒலுவில் துறைமுகம் இன்று எதிர்பார்த்த நன்மைகள், நோக்கங்கள் எய்தப்படாமல் பயன்படுத்த முடியாத நிலையில் காணப்படுகிறது. இதற்குக் காரணம், இத்துறைமுகத்தின் நுழைவாயில் முறையான

[ගරු අබූබකර් අතම්බාවා මහතා]

முகாமைத்துவமின்றி மணல் நிரம்பிக் காணப்படுவதேயாகும். அங்கு வணிகத் துறைமுகம், மீன்பிடித் துறைமுகம் என இரண்டு துறைமுகங்கள் ஒன்றாக அமைந்திருக்கின்றன. இந்த இரண்டு துறைமுகங்களும் ஒரே நுழைவாயில் மூலமாகவே கடலோடு இணைக்கப்பட்டுக் காணப்படுகின்றன. அந்தப் பிரதேசத்தில் வசிக்கின்ற 15,000க்கும் அதிகமான மீனவர் களுடைய கேள்வி என்னவென்றால், அதன் நுழைவாயிலைப் புனர் நிர்மாணம் செய்து, மண்ணை அகற்றி, அதைத் தனியாக மீன்பிடித் துறைமுகமாக மாற்ற முடியாதா? அதற்கான சந்தர்ப்பங்கள் இருக்கின்றதா? என்பதாகும். இதனை என்னுடைய முதலாவது மேலதிக வினாவாகக் கேட்கின்றேன்.

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා විසින් යොමු කරන ප්‍රශ්නය, අපේ රටේ නොවිසඳුණු ප්‍රශ්නයක් සේ තමයි සලකන්නේ. දශක 4කට ආසන්න කාලයක් ඔලුවිල් ධීවර වරායේ ඉදිකිරීම් කටයුතු කළා. ඔලුවිල් ධීවර වරාය ගත්තොත්, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ධීවර වරාය එහි එක් පාර්ශ්වයක්. අනෙක් පාර්ශ්වය වාණිජ වරායක්. මේ වරාය දෙකේම ඉදිකිරීම් කටයුතු කිරීමේදී නිශ්චිත විද්‍යාත්මක ක්‍රමවේද අනුගමනය නොකිරීම තමයි ප්‍රධාන හේතුව වෙලා තිබෙන්නේ. මේ මොහොතේදී ගිහින් ඒ වරායන් දෙක නිරීක්ෂණය කළත් පෙනෙනවා, වාණිජ වරායේ කිසිදු නැවකුත් නැහැ, ධීවර වරායේ කිසිදු ධීවර බෝට්ටුවකුත් නැහැ කියන එක, ගරු කථානායකතුමනි. ඒ තරමටම වැලිවලින් පිරිලා තිබෙන්නේ. ප්‍රධාන වශයෙන් මෙහි ඉදිකිරීම් කටයුතු කිරීමේදී නැඟෙනහිර පළාතට අදාළව සාර්ථක ශක්‍යතා අධ්‍යයනයක් සිද්ධ කරලා නැහැ. සාමාන්‍යයෙන් ධීවර වරායක් ඉදිකරනවා නම් ඒ සඳහා දීර්ඝ කාලීන ශක්‍යතා අධ්‍යයනයක් කරන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමනි. ඒ කියන්නේ, රළ පහරේ වේගය බලන්න ඕනෑ, ඒ wave pattern එක බලන්න ඕනෑ, wind speed එක බලන්න ඕනෑ, ඒ වාගේම රළෙහි ස්වභාවය බලන්න ඕනෑ, sea currents බලන්නත් ඕනෑ. මේ කිසිදු දෙයක් සම්බන්ධව නිශ්චිත විද්‍යාත්මක පරීක්ෂණයකින් තොරව තමයි මෙම ඉදිකිරීම් කටයුතු කර තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් වසරක්, වසර එකහමාරක් වැනි කාලයක් අරගෙන මොරටුව විශ්වවිද්‍යාලයෙන් මෙහි sketch එකක්, දළ ආකෘතියක් හදනවා. මොරටුව විශ්වවිද්‍යාලය එම දළ ආකෘතිය හදලා, එය නිරීක්ෂණය කරනවා. ඒ නිරීක්ෂණයෙන් ගත්ත දත්ත පදනම් කරගෙන විද්‍යාත්මක දැනුමයි, ධීවර ප්‍රජාවගේ තිබෙන සාම්ප්‍රදායික දැනුමයි කියන මේ දැනුම් දෙකේ සංකලනයෙන් තමයි එවැනි වරායක් ඉදි කරන්නේ. නමුත් එය අසාර්ථක ඉදිකිරීමක් බවට පත් වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා කියපු විධියට අපේ රජය කාලයේදීත් විදේශ රටවල් කිහිපයක ආයතන කිහිපයකින්ම ඉල්ලීමක් කළා, එම වරාය ඒ අයට ලබා දෙන්න, සංවර්ධනය කරන්න පුළුවන් කියලා. නමුත්, ඒ අය වැලි ටික ඉල්ලනවා. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වැලිවල තත්ත්වය පිළිබඳව පරීක්ෂණයක් කරලා තිබෙනවා. ඒ අනුව එම වැලිවල ඛනිජ ද්‍රව්‍ය අන්තර්ගතයි. එම නිසා ඒ වැලි විදේශීය රටකට දීමේදී ගැටලු සහගත තත්ත්වයක් පවතිනවා.

ගරු මන්ත්‍රීතුමනි, එම වරාය අපි අත්හැර දමා නැහැ. අපි ඒ වරාය සම්බන්ධයෙන් පවතින ප්‍රශ්නය පිළිබඳව සොයා බැලීමක් කරනවා. වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, වරාය අධිකාරිය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, පරිසර අමාත්‍යාංශය, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සහ වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ඒකාබද්ධ ව්‍යුහයක් දැන් අපි සකස් කර තිබෙනවා. එම ඒකාබද්ධ ව්‍යුහයෙන් අඛණ්ඩව පරීක්ෂණයක් කරනවා සහ ඒ සම්බන්ධව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරනවා. එම පරීක්ෂණ සහ ශක්‍යතා අධ්‍යයනය අනුව එම වරාය සම්බන්ධයෙන් කරන්නේ කුමක්ද කියන එක අපට අනාගතයේදී බලා ගන්න පුළුවන්.

**ගරු අබූබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)

கௌரவ சபாநாயகர் அவர்களே, உண்மையில் கடந்த காலங்களில் கிழக்கு மாகாணம் மீன்பிடித் துறை தொடர்பான விடயங்களில் கைவிடப்பட்ட நிலையில் காணப்பட்டது. இருந்தாலும், இப்போது எங்களுடைய கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சு கிழக்கு மாகாணத்திற் குட்பட்ட மட்டக்களப்பு, திருகோணமலை, அம்பாறை மாவட்டங்களுக்குப் பெருமளவு நிதியை ஒதுக்கீடு செய்து, பல அபிவிருத்தித் திட்டங்களைச் செய்து வருகின்றது. அம்பாறை மாவட்டத்தில், பெரியநீலாவணை பிரதேசத்துக்கு 24 மில்லியன் ரூபாயும், காரைதீவு பிரதேசத்துக்கு 22 மில்லியன் ரூபாயும், நிந்தவூர் பிரதேசத்துக்கு 22 மில்லியன் ரூபாயும் ஒதுக்கப்பட்டு மீனவர்களுடைய தங்குமிட வசதி, பல்தேவை கட்டிடங்கள் அமைத்தல் போன்ற பல தேவைகள் நிறைவேற்றப்பட்டு வருகின்றது. அதற்கு நான் நன்றி தெரிவித்துக் கொள்கின்றேன்.

குறிப்பாக, மிக நீண்டகாலமாக அபிவிருத்தியை வேண்டிநின்ற ஒரு மீன்பிடித் துறைமுகமான மட்டக்களப்பு மாவட்டத்தில் உள்ள வாழைச்சேனை துறைமுகத்திற்காகப் பெருமளவு நிதி ஒதுக்கீடு செய்யப்பட்டிருக்கிறது. அந்தத் துறைமுக வேலைகளை எப்போது ஆரம்பிக்கவிருக் கின்றீர்கள்? குறிப்பாக, இளைஞர்கள் மீன்பிடித் துறைக்கு வருவது குறைவாகக் காணப்படுவதனால் digital economy திட்டத்தை அடிப்படையாகக்கொண்டு இளைஞர்களைக் கவரும் விதமாக எதிர்காலத்திலே இந்த மீன்பிடித் துறையை நாடு முழுவதும் அபிவிருத்தி செய்வதற்கான ஏதேனும் திட்டங்களை எங்களுடைய இந்த அரசாங்கம் வகுத்துள்ளதா? என்பதை இச்சந்தர்ப்பத்திலே என்னுடைய இரண்டாவது மேலதிக வினாவாகக் கேட்கின்றேன்.

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)

ගරු අතම්බාවා මන්ත්‍රීතුමනි, ඔබතුමා, ඔබතුමාගේ ප්‍රදේශයට අදාළව හොඳ ප්‍රශ්නයක් යොමු කළේ. නැඟෙනහිර පළාතේ ඔලුවිල් වාගේ ධීවර වරායන්වලින් ප්‍රයෝජනයක්, උපයෝගීතාවක් ලැබෙන්නේ නැති නිසා වාලච්චේන ධීවර වරායේ වැඩ කටයුතු ආරම්භ කරන්න අපි සූදානම්ව සිටිනවා. ඒ අනුව ඉදිරි වර්ෂ තුන ඇතුළත වාලච්චේන ධීවර වරායේ ඉදිරි සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 1,070ක් වෙන් කර තිබෙනවා. එහි වැඩ කටයුතු ඔක්තෝබර් 18වැනි දා අපි ආරම්භ කරනවා. මිලියන 300ක වියදමින් quay wall එක හැදීමේ කටයුතු අපි ආරම්භ කරනවා.

ඒ වාගේම මේ වර්ෂ කිහිපය තුළ විශාල මුදල් ප්‍රමාණයක් ආයෝජනය කළා, ගන්දර ධීවර වරායට. එය පුළුල් ධීවර වරායක්. Quay wall එක මීටර් 650ක් පමණ තිබෙනවා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 13,600ක් - බිලියන 13.6ක් - වෙන් කර තිබෙනවා. සැප්තැම්බර් 25වැනි දා පළමු අදියරේ විවෘත කිරීම කරනවා. ඒ වාගේම දියකඩනය ගොඩ නැඟීමත් ආරම්භ කරනවා.

ඊළඟට, විෂයභාර ගරු අමාත්‍යතුමා ඇතුළු අමාත්‍යතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් සැප්තැම්බර් මාසයේ 25වැනි දා ගන්දර ධීවර වරාය විවෘත කරනවා. වාලච්චේන ධීවර වරායේ පළමුවැනි අදියරේ වැඩ කටයුතු අපි ආරම්භ කරනවා, ඔක්තෝබර් 18වැනි දා. ගාල්ල ධීවර වරායේ අලුත් වෙන්දේසි ශාලාව ඔක්තෝබර් මාසයේ දෙවන සතිය තුළ ආරම්භ කරනවා, රුපියල් මිලියන 250කින්. අම්බලන්ගොඩ ධීවර වරායේ ප්‍රතිසංස්කරණ කටයුතුත් රුපියල් මිලියන 75ක වියදමින් ඔක්තෝබර් පළමුවැනි සතියේ අපි ආරම්භ කරනවා. කල්පිටිය, අම්බලන්ගොඩ, ගාල්ල, ගන්දර, කුඩාවැල්ල ආදී ලංකාව වටේ තිබෙන ධීවර වරායන්වල වැඩ කටයුතු මේ වන විට අවසන් වෙමින් පවතිනවා. ලබන මාසය අවසන් වෙනකොට ඒවායේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කරනවා. වාලච්චේන ධීවර වරායේ කටයුතු ඔක්තෝබර් 18වැනි දා ආරම්භ කරනවා.

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති මුද්‍රණාලය: විස්තර
## கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சின் கீழுள்ள அச்சகங்கள்: விபரம்
## PRINTING PRESS UNDER MINISTRY OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION: DETAILS

2267/2026

**8. ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අමාත්‍යාංශය සතුව පවතින මුද්‍රණාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ සේවය කරන සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) එම මුද්‍රණාල පිහිටි ස්ථාන සහ වර්තමාන ක්‍රියාකාරී තත්ත්වය කවරේද;

(iv) ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින මුද්‍රණාල තිබේ නම්, ඒවා යථා තත්ත්වයට පත් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) එම මුද්‍රණාල යථා තත්ත්වයට පත් කිරීමෙන් අත්වන ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මේ වනවිට ක්‍රියාකාරී තත්ත්වයේ පවතින මුද්‍රණාල මඟින් සිදු කරනු ලබන කාර්යභාරය කවරේද;

(ii) අමාත්‍යාංශය යටතේ මුද්‍රණාල පැවතීම හේතුවෙන් රජයට අත්වන ප්‍රතිලාභ කවරේද;

(iii) මුද්‍රණාල නවීකරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) அமைச்சுக்குச் சொந்தமான அச்சகங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அவற்றில் பணியாற்றும் ஊழியர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) மேற்படி அச்சகங்கள் அமைந்துள்ள இடங்கள் யாவை என்பதுடன், அவற்றின் தற்போதைய செயற்பாட்டு நிலை யாது என்பதையும்;

(iv) செயற்பாட்டு நிலையில் இல்லாத அச்சகங்கள் இருப்பின், அவற்றை மீண்டும் செயற்பாட்டு நிலைக்குக் கொண்டுவருவதற்காக எடுக்கப் பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(v) மேற்படி அச்சகங்களை மீண்டும் செயற்பாட்டு நிலைக்குக் கொண்டுவருவதன்மூலம் கிடைக்கப் பெறும் நன்மைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) தற்போது செயற்பாட்டு நிலையிலுள்ள அச்சகங் களினால் மேற்கொள்ளப்படும் பணிகள் யாவை என்பதையும்;

(ii) அமைச்சின்கீழ் அச்சகங்கள் காணப்படுவதன் காரணமாக அரசாங்கத்துக்குக் கிடைக்கப்பெறும் நன்மைகள் யாவை என்பதையும்;

(iii) அச்சகங்களை நவீனமயப்படுத்துவதற்காக மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the number of printing presses under the Ministry;

(ii) the number of employees working in them;

(iii) the names of the locations where the said printing presses are situated and their present operational status;

(iv) if there are printing presses that are not operational, the measures that have been taken to restore them to working condition; and

(v) the benefits that can be derived from restoring the said printing presses to working condition?

(b) Will she also inform this House the -

(i) role played by the printing presses that are currently in operational status;

(ii) benefits that can be derived by the Government as a result of having printing presses under the Ministry; and

(iii) measures that will be taken to modernize the printing presses?

(c) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) එකයි. එනම් රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

(ii) රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ සේවක සංඛ්‍යාව

- ස්ථිර - 445
- කොන්ත්‍රාත් - 21

(iii) වටරැක, පාදුක්ක හි පිහිටා ඇත.
ක්‍රියාකාරී තත්ත්වයේ පවතී.

(iv) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

(ආ) (i) රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව මඟින් ඉටු කරන කාර්යභාරය:

- රජයෙන් ලැබෙන ඇණවුම පරිදි පාසල් පෙළපොත්/මොඩියුල මුද්‍රණය
- ආරක්ෂක මුද්‍රණ කටයුතු
  - පළාත් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය
  - ලොතරැයි මුද්‍රණය
  - රහස් ලේඛන මුද්‍රණය
- SPC අභ්‍යාස පොත් මුද්‍රණය
- විවිධ රාජ්‍ය ආයතන සඳහා මුද්‍රණ කටයුතු සිදුකිරීම
- අනෙකුත් වාණිජ මුද්‍රණ කටයුතු සිදුකිරීම
- පුද්ගලික මුද්‍රණ ඇණවුම් කටයුතු
- මැතිවරණ මුද්‍රණ කටයුතු
- දිවයිනේ දිස්ත්‍රික්ක කිපයක් පුරා SPC අළෙවි සැල් ජාලය පවත්වාගෙන යෑම

(ii)

- වෙළෙඳ පොළ මිල පාලනය කිරීමේ සාධකයක් ලෙස රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව පැවතීම
- වෙළෙඳ පොළ ප්‍රමිතිය හා ගුණාත්මක බව පාලනය
- විශ්වාසදායී ආරක්ෂක මුද්‍රණ (Security printing) ඒකකයක අවශ්‍යතාව සපුරාලමින් රාජ්‍ය අංශයේ එකම රාජ්‍ය ව්‍යවසාය ආයතනය ලෙස රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව පැවතීම
- මහා පරිමාණ මුද්‍රණ යාන්ත්‍රණයක අවශ්‍යතාව සැපිරීම
- රජය සතු මුද්‍රණ යාන්ත්‍රණයක අවශ්‍යතාව සපුරාලීම
- මුද්‍රණ කටයුතු සඳහා පවතින පිරිවැය අවම කරගැනීම
- දීර්ඝ කාලයක සිට රාජ්‍ය ආයතනයක් ලෙස රැකියා අවස්ථා සලසා දෙමින් පුහුණු මානව සම්පතක් සහිත වීම
- රාජ්‍ය භාගය ලෙස රජයට ප්‍රතිලාභ අයවීමට ඉඩ සලසා දීමට හැකි වීම

(iii)

- ජාත්‍යන්තර වෙළෙඳ පොළ ඉලක්ක කරගනිමින්, ඉහළ තාක්ෂණයෙන් සහ උසස් ආරක්ෂිත මුද්‍රණ (Smart security printing) හැකියාවන්ගෙන් සමන්විත නවීන මුද්‍රණ ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කර ඇත
- වසර 50කට අධික කාලයක් භාවිත කර ඇති පැරණි හා යල් පැන ගිය යන්ත්‍රෝපකරණ ක්‍රමයෙන් ඉවත් කර නව උපකරණ ගැනීම

  උදා: නවීන තාක්ෂණයෙන් සමන්විත කාර්යක්ෂම CTP යන්ත්‍රයක් මිලදී ගැනීම

(ඇ) අදාළ නොවේ.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)
ගරු අග්‍රාමාත්‍යතුමියට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, පිළිතුර ලබා දීම සම්බන්ධයෙන්. ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ අවුරුද්දේ මෑත කාලයේ දෙවැනි වාර විභාගය පැවැත්වීමේදී වයඹ පළාතේ විශාල ගැටලුවක් මතු වුණා, State Printing Corporation - SPC - එකට ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කරලා දෙන්න අපහසුවීම මත. එහිදී නිලධාරින්ට ඇඟිල්ල දිගු වුණා, මෙය ඔවුන්ගේ දුර්වලකමක් කියලා. නමුත් පසුව අනාවරණය වුණා, ලබාගත්ත order එක නියමිත පරිදි ලබා දීමට අපහසුවීම මත තමයි ඒ ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කරලා දීලා නැත්තේ, ඒ නිසා තමයි දෙවැනි වාර විභාගයේදී ගැටලුකාරී තත්ත්වයක් මතු වුණේ කියලා. මම ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් දැනගැනීමට කැමතියි, ඉදිරියේදී මෙවැනි ප්‍රමාදයන් වළක්වා ගන්නට ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද කියලා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, පළාත් මට්ටමේ ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම සහ ඒවා කළමනාකරණය කිරීම සිද්ධ වෙන්නේ ඒ ඒ පළාත තුළින්. ඒ කියන්නේ ඒකට අමාත්‍යාංශයේ මැදිහත්වීමක් නැහැ. විමධ්‍යගත විෂයයක් හැටියට ඒක පළාතට භාර දෙයක්. නමුත් මේ සිද්ධිය සිද්ධ වුණේ කොහොමද කියලා සොයා බැලීමට අමාත්‍යාංශය පුළුල් විමර්ශනයක් සිදු කළා. මෙතැන අවස්ථා ගණනාවකදී සන්නිවේදන හා කළමනාකරණ ප්‍රශ්න මතු වී තිබෙන බව අපිට එම විමර්ශනය හරහා නිරීක්ෂණය කරන්න පුළුවන් වුණා. අපි ඒ අනුව කාර්ය මණ්ඩලය කැඳවා නිසි පරිදි උපදෙස් ලබා දුන්නා. ඒ වාගේම මෙවැනි තත්ත්වයන් ඉදිරියේදී සිදු නොවෙන්න ගත යුතු ක්‍රියාමාර්ග ගැනත් සාකච්ඡා කර තිබෙන්නේ, අර විමර්ශනයෙන් ආපු recommendations එක්ක.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)
බොහොම ස්තුතියි, ගරු අග්‍රාමාත්‍යතුමියනි. ඇත්තටම පළාත් මට්ටමින් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීමේ කටයුත්තේදී එම ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර තමයි රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවත් ඉල්ලුම් කර ඒකට කැමැත්ත ප්‍රකාශ කර තිබෙන්නේ. ගරු

කථානායකතුමනි, පළාත් මට්ටමින් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීමේ කටයුත්තේදී ඉදිරියටත් මෙවැනි යම් යම් බාධා පැමිණෙන්න පුළුවන්. නමුත් උතුරු මැද පළාත තුළ කිසිදු ගැටලුකාරී තත්ත්වයක් නැතුව ඒ කටයුතු සිද්ධ වෙනවා කියා තිබෙනවා. උතුරු මැද පළාත් සභාව තුළ මුද්‍රණාලයක් ස්ථාපනය කර තිබෙන නිසා එම වැඩ කටයුත්ත ඉතා පහසුවෙන් කරගන්න පුළුවන් වෙලා තිබෙනවා කියලා අපට දැන ගන්න ලැබී තිබෙනවා.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. පළාත් මට්ටමින් එවැනි ආකාරයේ මුද්‍රණාල පිහිටුවීම තුළින් විශාල වාසියක් අත් වෙනවා. දරුවන්ට අවශ්‍ය ප්‍රශ්න පත්‍ර ගුණාත්මකභාවයෙන් සහ රහස්‍යභාවයෙන් යුතුව මුද්‍රණය කරන්නටත් හැකියාව ලැබෙනවා, රජයේ පාලනය යටතේ එවැනි මුද්‍රණාල ස්ථාපනය කළොත්. ඒ නිසා එවැනි වැඩ පිළිවෙළක් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ආරම්භ කරන්න හැකියාව තිබෙනවාද කියලා ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් මම දැන ගන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, තවම අපි එහෙම සාකච්ඡාවක් සිදුකර නැහැ. අපි රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව හරහා තමයි එම කටයුතු සිද්ධ කරන්නේ. පළාත් මට්ටමින් කාටද ඒක දිය යුත්තේ කියන තීරණය නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදය හරහා ගන්න පුළුවන්. පළාතකට අවශ්‍ය නම්, ඒ කටයුත්තට මැදිහත් වෙන්නත් පුළුවන්. රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවත් එම ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළින් තේරී එන එකක් තමයි. ඒ නිසා ඒකට අපිට මැදිහත්වීමක් කරන්න බැහැ. ඒක ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ තෝරා ගන්නා එකක්. රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව තවත් කාර්යක්ෂම කරන එක තමයි මේ වෙලාවේ අපේ objective එක. පළාත් මට්ටමින් තව ඒවා පිහිටුවීම සම්බන්ධව මේ වෙලාවේ අපි තීරණයක් අරගෙන නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය. ගරු රවී කරුණානායක මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### නිෂ්පාදන ආයෝජන රට තුළ රඳවා ගැනීම සඳහා අපනයනකරුවන්ට පහසුකම් සැලසීම
### உற்பத்தித்திறன் மிக்க முதலீடுகளை நாட்டில் தக்க வைத்துக்கொள்வதற்கு ஏற்றுமதியாளர்களுக்கு வசதியளித்தல்
### FACILITATION OF EXPORTERS TO RETAIN PRODUCTIVE INVESTMENTS IN THE COUNTRY

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මම ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි. ශ්‍රී ලංකාවේ අපනයන තරගකාරිත්වය සහ නිෂ්පාදන ආයෝජන රට තුළ රඳවා ගැනීම සම්බන්ධවයි මා මෙමඟින් අසන්නේ.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාව 2030 වන විට ඇමෙරිකානු ඩොලර් බිලියන 36ක අපනයන ආදායමක් ළඟා කර ගැනීමට යෝජනා කර ඇත. එම ඉලක්කය සපුරා ගැනීම සඳහා නව ආයෝජන ආකර්ෂණය කිරීම පමණක් නොව, දැනට සිටින අපනයනකරුවන් සහ ඔවුන්ගේ ආයෝජන රට තුළ රඳවා ගෙන තවදුරටත් පුළුල් කිරීම අත්‍යවශ්‍ය වේ.

ගරු කථානායකතුමනි, අපේ රටේ විශේෂයෙන් වරප්‍රසාද ලත් නිල අගය එකතු කරන කොම්පැනිය තමයි MAS Holdings සමාගම. එම සමාගම ඇමෙරිකානු ඩොලර් මිලියන 93ක් පමණ තමිල්නාඩුවේ ආයෝජනය කරමින් - investing in Tamil Nadu - රැකියා 7,000ක් පමණ නිර්මාණය කිරීමට සැලසුම් කරන අතරතුර ශ්‍රී ලංකාවේ ඇතැම් නිෂ්පාදන මෙහෙයුම් ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ වාර්තා දැඩි අවධානයට ලක් විය යුතු ය. එසේ වුවද, 2025 අවසානය වන විට ශ්‍රී ලංකාවේ සේවකයන් 73,034ක් පමණ සේවයේ යොදවා ඇති MAS සමාගම මෙරට ප්‍රධානතම සේවා යෝජකයෙකු ලෙස තවදුරටත් කටයුතු කරයි. Sir, the reason why I am mentioning that MAS Holdings is one of the biggest companies in Sri Lanka is, in our thrust to reach that investment target of US Dollars 36 billion, we cannot afford to have such investments moving out of the country. The reason for that is what I am questioning about. මෙහි මූලික ගැටලුව වන්නේ, ශ්‍රී ලංකාව කලාපීය තරගකාරිත්වය - regional competitiveness - අහිමි කර ගනිමින් සිටින්නේද, එහි ප්‍රතිඵලයක් ලෙස අනාගත ආයෝජන සහ රැකියා ඉන්දියාව ඇතුළු තරගකාරී රටවල් වෙත යොමු වීමේ අවදානමක් පවතින්නේද යන්නයි.

ඒ අනුව, පහත ප්‍රශ්න සඳහා පිළිතුරු ගරු අග්‍රාමාත්‍යතුමිය මෙම සභාවට දන්වන්නේ ද?

1. ශ්‍රී ලාංකික අපනයනකරුවන්ගේ සැලකිය යුතු නව නිෂ්පාදන ආයෝජන විදේශ රටවල සිදු කිරීමට පෙළඹෙන්නේ ඇයි? විදුලිබල පිරිවැය, බදු, ශ්‍රම ඵලදායීතාව, මූල්‍ය පහසුකම්, ප්‍රවාහන හා logistics පිරිවැය, අමුද්‍රව්‍ය, නියාමන ප්‍රමාදයන් සහ ප්‍රතිපත්ති ස්ථාවරත්වය සම්බන්ධයෙන් ඉන්දියාව, බංග්ලාදේශය සහ වියට්නාමය සමඟ සසඳන විට ශ්‍රී ලංකාවට පවතින අවාසි රජය හඳුනා ගෙන තිබේ ද?

That is, the economic realities with which cost-push inflation is taking place in Sri Lanka, Sir.

2. 2022-2026 කාලය තුළ ශ්‍රී ලංකාවෙන් වෙනත් රටවලට ගෙන ගොස් ඇති නිෂ්පාදන ආයෝජන, නිෂ්පාදන ධාරිතාව සහ රැකියා ප්‍රමාණය කොපමණ ද? ඒ හේතුවෙන් ශ්‍රී ලංකාවට අහිමි වූ ආයෝජන සහ අපනයන ආදායම කොපමණ ද?

3. ආයෝජන ශ්‍රී ලංකාව තුළ රඳවා ගැනීම සඳහා රජය හඳුන්වා දීමට යෝජනා කරන විශේෂ 'ආයෝජන රඳවා ගැනීමේ පැකේජය' කුමක්ද?

What I am asking is, what measures have been taken for protection and retention of investments in Sri Lanka.

එයට තරගකාරී කාර්මික විදුලි ගාස්තු, බදු සහ ප්‍රාග්ධන දීමනා, යන්ත්‍රෝපකරණ හා අමුද්‍රව්‍ය සඳහා බදු සහන, කඩිනම් VAT ප්‍රතිපූරණ, මූල්‍ය පහසුකම්, කාර්මික ඉඩම් සහ අතිරේක ආයෝජන, අපනයන හා රැකියා නිර්මාණයට සම්බන්ධ දිරි ගැන්වීම් ඇතුළත් කරන්නේ ද?

4. තමිල්නාඩුවේ මෙන් දින 21ක් ඇතුළත තනි කවුළු - Single -Window - ක්‍රමයක් මඟින් ආයෝජන අනුමැතිය ලබා දීමේ ක්‍රමවේදයක් ශ්‍රී ලංකාවට හඳුන්වා දිය නොහැක්කේ මන්ද? BoI, EDB, ශ්‍රී ලංකා රේගුව සහ අනෙකුත් ආයතන සඳහා නීතිමය වශයෙන් බැඳී පවතින අනුමැති කාල සීමා හඳුන්වා දෙන්නේ ද?

[ගරු රවී කරුණානායක මහතා]

Sir, that is the most important thing. A Single-Window clearance system is what is required. Now that you have Mr. Duminda Hulangamuwa as President's Economic Adviser, who is a well-known and a proven professional, ensure that the BoI offers these companies more opportunity before more exports move out of the country.

5. යුරෝපා සංගමය සහ ඉන්දියාව අතර නිදහස් වෙළෙඳ ගිවිසුම - India-EU FTA - යටතේ ඉන්දියානු ඇඟලුම් සඳහා අපේක්ෂිත තීරුබදු රහිත හෝ වරණීය වෙළෙඳ පොළ ප්‍රවේශය ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තයේ තරගකාරිත්වයට කෙසේ බලපාන්නේද? එම සහන ක්‍රියාත්මක වීමට අපේක්ෂිත දිනය කවදා ද?

Sir, we also have to look at the EU GSP Plus, which is also under threat. That is another issue. Now, with the India-EU Free Trade Agreement having an impact on us, we must ensure, at all costs, that we retain our GSP Plus status from the European Union. So, I would appreciate it if you would take the lead on that.

6. 2027න් පසුවත් ශ්‍රී ලංකාවට හිමි EU GSP Plus සහනය සුරක්ෂිත ද? එය අහිමි වීමේ හෝ සීමා වීමේ අවදානම් මොනවාද? ඉන්දියාවට සාපේක්ෂව ශ්‍රී ලාංකික අපනයනකරුවන් තීරුබදු අවාසියකට පත්වීම වැළැක්වීම සඳහා රජය ගෙන ඇති විකල්ප ක්‍රියාමාර්ග මොනවාද?

Sir, I ask the next question in English because it has an international ramification.

7. Has Government consulted MAS Holdings and other major exporters and SMEs regarding what is required to retain and expand their next generation of investments in Sri Lanka and what their principal concerns are, and what action has been agreed on?

8. What measurable competitiveness targets will the Government implement to ensure that Sri Lanka retains investment, employment and value addition rather than progressively exporting them to competing economies?

Thank you, Sir.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Hon. Speaker, we are in the process of collecting information to respond to this Question. I will respond as soon as possible.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍ය ගරු අනුර කරුණාතිලක මහතා.

2026.06.24 දින ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම.

## ඔලුවිල් වරාය සංවර්ධන ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය: වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## ஒலுவில் துறைமுக அபிவிருத்தித் திட்டத்தின் தற்போதைய நிலை: துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரினது கூற்று
## CURRENT STATUS OF OLUVIL PORT DEVELOPMENT PROJECT: STATEMENT BY MINISTER OF PORTS AND CIVIL AVIATION

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)
Hon. Speaker, the Answer to the Question raised by Hon. Kader Masthan on 24.06.26 is as follows:

1. The date of commencement was 01st of July, 2008.

   Objectives and goals:
   - Develop a modern port with suitable shore facilities for general cargo and coastal passenger transport.
   - Support future port expansion into a larger commercial port.
   - Support fishing activities and related shore-based services and industries.
   - Facilitate transportation of essential goods, construction materials, equipment, agricultural and fisheries products between the East and other regions.
   - Promote coastal passenger transport and improve regional connectivity.
   - Increase fish production, particularly tuna and related species.
   - Create employment opportunities and generate foreign exchange.
   - Provide facilities for offshore and deep-sea fishing vessels to overcome existing operational constraints.
   - Attract private investment for cement, fertilizer and other industrial facilities.
   - Provide bunkering facilities for coastal and offshore vessels.

2. The documents requested for are as follows:
   - Annex 01: Feasibility Study Report
   - Annex 02: Environmental Impact Assessment Report
   - Annex 03: Gazette Notification related to the land allocation

- Annex 04: Cabinet Memorandum No. 2005/13 dated 30th June, 2005 submitted to obtain the approval of the Cabinet of Ministers for the award of the contract for the construction of the Oluvil Port Project.

Sir, I **table*** all these four Annexes.

3. It happened in 2005, 21 years ago. So, it is very difficult to find the relevant documents. Therefore, we are not in a position to submit those documents.
4. Loan assistance had been provided by the Nordea Bank Denmark A/S for the Oluvil Port Development Project. The Loan Agreement between the Ministry of Finance, Planning and Economic Development of the Democratic Socialist Republic of Sri Lanka and the Nordea Bank Denmark A/S for the financing of the Oluvil Port Development Project was signed on 23rd May, 2008. I **table*** a copy of the Loan Agreement as Annex 05.

5. Yes.
   - The project was successfully completed on 22.11.2012, and the Final Completion Certificate was issued on 26.05.2015 to M/s MT Hojgaard A/S. I **table*** the details as Annex 06.
   - The fishing harbour commenced operations in September, 2013 and remained operational until 2019. After 2019, the operations had been suspended. However, the commercial harbour could not be operationalized due to severe siltation and the inability to maintain the required navigational depth at the harbour entrance. So, due to those reasons, now, it is not operational either commercially or as a fishery harbour.
   - During 2013 to 2015, significant sand accumulation occurred at the harbour mouth, navigation channel and in coastal areas accompanied by severe coastal erosion along the northern coastline and sand deposition on the southern side.
   - SLPA requested DANIDA technical assistance on 06.03.2014 to investigate the coastal processes and identify feasible mitigation measures. DANIDA accepted the request on 17.03.2014.
   - Following further coordination through ERD, DHI - Denmark submitted its technical and financial proposal on 14.05.2016.
   - Cabinet approval was obtained on 10.08.2016 to expedite negotiations with DANIDA for the required studies.
   - Accordingly, the Littoral Drift Study commenced on 19.08.2016 with DANIDA financial assistance and was undertaken by DHI - Denmark, focusing on coastal sediment transport, siltation and erosion and sustainable mitigation measures for Oluvil Port.

6. According to the Cabinet Decisions received regarding the Oluvil Port, the following actions had been taken by the Sri Lanka Ports Authority - SLPA.

<u>Transfer of Fishery Harbour</u>

- Cabinet Decision No.16/2061/725/009-I dated 26.10.2016 approved the transfer of Lots 01 and 04 of the Oluvil Fishery Harbour to the Ministry of Fisheries.
- An MoU between SLPA and the Ministry of Fisheries was signed on 09.05.2022 to formalize the transfer.
- The facilities were intended to be operated as a fishery harbour.

<u>Calling for EoI/RFP for the long-term lease of lands and buildings belonging to Sri Lanka Ports Authority at Oluvil for port-related industries/ business ventures</u>

Cabinet Decision No. 22/1787/628/016-1 dated 21.11.2022 approved a competitive EoI/RFP process to attract private investment for port-related industries at Oluvil. That had been done, but only one investor had forwarded his submission.

- A Special Project Evaluation Committee - SPEC - was appointed to evaluate the investor proposals.
- EoI was invited from industries for ship/ boat repair and maintenance, vessel building/ dismantling, fisheries-related industries and solar energy projects.
- Following the EoI, proposals were received for ship repair and maintenance, heavy mineral mining and value-added processing and fish processing.
- Shortlisted investors were invited to submit detailed proposals under the RFP process.
- Cabinet approval was subsequently obtained for a ship repair and maintenance investment project using available land and facilities.
- The selected investor failed to respond to the Letter of Intent - LoI - within the stipulated period, despite extensions and many reminders.
- Consequently, the proposed investment was not materialized, and the matter was reported to the Cabinet on 03.11.2025.

7. Yes. According to the information provided by the Coast Conservation and Coastal Resource Management Department, revetments comprising armour boulders have been constructed along approximately 16.5 kilometres of the coastline to mitigate coastal erosion occurring in the vicinity of Oluvil Port. Furthermore, the Coast Conservation and Coastal Resource Management Department has informed that an annual allocation of

---

* පුස්තකාලයේ තබා ඇත.
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

[ගරු අනුර කරුණාතිලක මහතා]

approximately Rs. 57 million will be provided for the implementation of coastal protection and maintenance measures to address the erosion issues associated with Oluvil Port.

8. The plans this Government intends to implement in the future to ensure the full operation and utilization of the Oluvil Port is as follows:

At present, the Oluvil Port remains covered with sand - annually, there are two sand formations from two different directions during the two seasons in the year - which has created operational challenges in maintaining standard shipping and maritime activities.

So, the Government is exploring the best alternative uses to reactivate the port facility in a manner that provides maximum economic benefit both to the region and the country. To achieve this, the Government is currently in active discussions with various investors to utilize the port effectively for suitable commercial and development projects.

However, we still have not found any tangible solution or a potential investor for this purpose. We have received several proposals, but there are certain technical as well as some financial lapses.

Upon the successful conclusion of these negotiations, the Government will take necessary steps to operationalize the port premises at optimum capacity and boost the regional economy.

Thank you.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ அமைச்சர் அவர்கள் நீண்ட ஒரு பதிலைத் தந்திருக்கின்றார். நன்றி! இந்தப் பிரச்சினை ஒரு சமூகத்திற்கு அரசியல் ரீதியாகத் தலைமை வகித்த ஒருவர்மீது சுமத்தப்பட்டிருக்கின்ற குற்றச்சாட்டு என்ற அடிப்படையில் இதிலே என்ன பிழைகள் ஏற்பட்டன என்பதை இங்கு நான் குறிப்பிட விரும்புகின்றேன். அதாவது, குறித்த சாத்தியக்கூற்று ஆய்வு அறிக்கையின்படி துறைமுக நிர்மாண வேலைகள் நடைபெறும்பொழுதே harbour mouthஇல் நிரந்தரமாக dredger, அதாவது மண் pump பண்ணுகின்ற machineஐயும் ஒரு கப்பலையும் வைத்து மண் படிந்தவுடன் அதை pump பண்ணியிருந்தால் இந்தக் harbourக்கு இந்தளவுக்குத் தாக்கம் ஏற்பட்டிருக்காது.

அதேபோல, design பண்ணப்பட்டதன்படி, harbour mouthஐ ஒரு பக்கம் கல்லால் round up பண்ணியிருக்க வேண்டும்; இன்னொரு பக்கம் concrete cylinder பண்ணியிருக்க வேண்டும். அதை contract எடுத்த அந்த company, concrete பண்ணுவதில் பிரச்சினை ஏற்பட்டதால் அதைச் செய்ய முடியாதென்று அந்தக் காலகட்டத்தில் கூறியதால், Sri Lanka Ports Authority அந்த வேலையை அந்த period இற்குள் முடிப்பதற்காக அந்தப் பக்கத்தையும் கல்லால் round up பண்ண அனுமதி கொடுத்தது. அதுதான் இந்தத் திட்டம் தோல்வியடைவதற்குக் காரணம் என்று அந்தப் பகுதியிலுள்ள இது சம்பந்தமாக நிபுணத்துவம் வாய்ந்த engineersஆல் குற்றஞ் சாட்டப்படுகின்றது. ஆனால், இது சம்பந்தமாகப் போடப்பட்ட plan நல்லது.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය කෙටියෙන් අසන්න.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
ஒலுவில் பகுதியில் மேற்கொள்ளப்பட்ட இந்தத் திட்டம் சரியான முறையில் நடைபெற்றிருந்தால் கிட்டத்தட்ட பல ஆயிரக்கணக்கானவர்களுக்கு வேலை வாய்ப்புக் கிடைத்திருக்கும். இதன்மூலமாக அம்பாறை மாவட்டம் மட்டுமல்ல, கிழக்கு மாகாணமே செழிப்படைந்திருக்கும். இதன் திட்ட ஏற்பாடுகளால்தான் இது தோல்வியடைந்ததாகக் கருதப் படுவதால், இது சம்பந்தமாக நாங்கள் பேசுவதை விடுத்து, இந்தத் துறையில் நிபுணத்துவம் பெற்ற engineers உடனும் Sri Lanka Ports Authority உடனும் ஒரு கலந்துரையாடலை மேற்கொள்ள கௌரவ அமைச்சர் அவர்கள் ஓர் ஏற்பாட்டை மேற்கொண்டால், இதை வெற்றிகரமான ஒரு திட்டமாக மாற்றலாம். ஏனென்றால் நான் முன்பு கூறியதுபோல, இது மறைந்த தலைவர் அஷ்ரஃப் அவர்களுடைய ஒரு கனவு! அந்தக் கனவை நிறைவேற்ற நாங்கள் நடவடிக்கையெடுக்க வேண்டும். அமைச்சர்களாக இருந்தவர்கள் அங்கு சில வேலைகளைச் செய்ய எடுத்த நடவடிக்கைகளால்தான் இது fail அடைந்திருக்கின்றது.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා දැන් අවසන් කරන්න.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
ஒரு நிமிடம் தாருங்கள்!

இந்தத் திட்டம் நல்லது. ஆனால், இது தோல்வியடைவதற்கு இவ்வாறான சில செயற்பாடுகள்தான் காரணம். முஸ்லிம் சமூகத்திற்கு அரசியல் ரீதியாகத் தலைமை தாங்கியவருக்கு இதன்மூலமாக அபகீர்த்தி ஏற்பட்டிருப்பதால் இவ்வாறான ஒரு சந்தர்ப்பத்தை -

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළා වාගේ මේ ප්‍රශ්නයේ දී කිසිම විධියක ජන කොටසකට චෝදනාවක් එල්ල කරන්න මම කැමති නැහැ. නමුත්, අවාසනාවකට, මේකේ ආරම්භක සැලැස්මේ සහ විශේෂයෙන් ශක්‍යතා අධ්‍යයනයේ දී සැලකිල්ලට ගත යුතුව තිබූ වැදගත් කරුණු රාශියක් මගහරිමින් තමයි මේ technical design එක කරලා තිබෙන්නේ. මොකද, ඒ ප්‍රදේශය ගැන අවබෝධයක් තිබෙන ඔබතුමා විශේෂයෙන් දන්නවා ඇති, අවුරුද්දේ කාල දෙකක මේ harbour mouth එකේ වැලිපර - sand formations - ගොඩනැඟෙනවා කියලා. ඒක වැළැක්වීම සඳහා අවශ්‍ය වන තාක්ෂණික සැලැස්ම, තාක්ෂණික ගොඩනැඟීම කරන්නේ නැතිව තමයි මේ වරාය ගොඩනැඟිලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, harbour mouth එක ගත්තොත්, සාමාන්‍යයෙන් පයින් ඇවිදගෙන යන්න පුළුවන් ප්‍රමාණයට දැන් වැලිපර පිරිලා තිබෙනවා. අපි එක සැරයක් මෙහි වැලි ඉවත් කළත්, අවුරුද්දේ හැම සීසන් එකේම මේ වැලිපර - sand formations - ගොඩනැඟීම සිදු වෙනවා. මේක කාල දෙකකදී දෙපැත්තකට සිදු වෙනවා. එම නිසා දීර්ඝ කාලීන උත්තරයක් හැටියට එක සැරයක් වැලි ඉවත් කරලා වරාය පාවිච්චි කරන්න බැලුවත්, හැම අවුරුද්දේම විශාල පිරිවැයක් දරලා වැලි ඉවත් කිරීම සිද්ධ කරන්න වෙනවා. ඒ නිසා මේක මූල්‍ය වශයෙන් කොයි තරම් දුරට feasible ද කියන එක ගැන සාකච්ඡාවක් පවතිනවා. අපිට දැනෙන විධියට, ධීවර වරායක් හැටියට අවුරුදු තුනක විතර කාලයක් මේක operate වෙලා තිබෙනවා. නමුත්, commercial වරායක් හැටියට operate වෙලා නැහැ. ඒගොල්ලන් මේක ධීවර වරායක් හැටියට සංවර්ධනය කරලා ඉස්සරහට යනවාද කියන එක ගැන අපි අවස්ථා කිහිපයකදී ධීවර අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කළා. ඒගොල්ලන්ගෙන් අපට සාර්ථක උත්තරයක් ලැබුණේ නැහැ. මොකද, මේකේ තිබෙන තාක්ෂණික ගැටලු සහ ඒ තිබෙන මූල්‍යමය - මූල්‍ය ශක්‍යතාව පිළිබඳ - ගැටලු නිසා. කොහොම වුණත්, හොඳ ආයෝජකයෙක් හොයා ගෙන මේක යම් ප්‍රමාණයකට හරි සාර්ථක කරගෙන ප්‍රදේශයටත්, මුළු රටටත් ආර්ථික වශයෙන් වැදගත් ව්‍යාපෘතියක් බවට මෙය පරිවර්තනය කරන්න අපි උත්සාහ කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත
### நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் (திருத்தம்) சட்டமூலம்
### POISONS, OPIUM AND DANGEROUS DRUGS (AMENDMENT) BILL

"(218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මහතා විසිනි.***

***2026 සැප්තැම්බර් 22වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 செப்ரெம்பர் 22, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Harshana Nanayakkara, Minister of Justice and National Integration; to be read a Second time upon Tuesday, 22nd September, 2026 and to be printed and to be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.*

### විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත
### நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் (திருத்தம்) சட்டமூலம்
### POISONS, OPIUM AND DANGEROUS DRUGS (AMENDMENT) BILL

"(218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මහතා විසිනි.***

***2026 සැප්තැම්බර් 22වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 செப்ரெம்பர் 22, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Harshana Nanayakkara, Minister of Justice and National Integration; to be read a Second time upon Tuesday, 22nd September, 2026 and to be printed and to be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2 අනුමත කිරීම සඳහා ඉදිරිපත් කිරීම, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා. You have 15 minutes.

## මෝටර් වාහන පනත: නියෝග
## மோட்டார் வாகனச் சட்டம்: ஒழுங்குவிதிகள்
## MOTOR TRAFFIC ACT: REGULATIONS

[පූ.භා. 11.18]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 202 වගන්තිය සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 මැයි 19 දිනැති අංක 2489/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.08.18 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

[ගරු බිමල් රත්නායක මහතා]

ගරු කථානායකතුමනි, ඊට අමතරව න්‍යාය පත්‍රයේ විෂය අංක 2 දරන යෝජනාවද මා ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි. මේ විවාදය ආරම්භ කිරීමට ප්‍රථමයෙන් සිහිපත් කළ යුතු කාරණයක් තිබෙනවා. පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ භෝජනාගාර කළමනාකරුවකු වශයෙන් අවුරුදු 33ක් සේවය කළ ටී.එච්.ඩී. බන්දුල පද්මසිරි මහතා සැප්තැම්බර් 03වෙනි දා අභාවප්‍රාප්ත වුණා. එතුමාගේ අභාවය ගැන අපගේ ශෝකය ප්‍රකාශ කරන්නට මම මෙය අවස්ථාවක් කර ගන්නවා. එතුමා ඉතාම සුහදව තම කාර්යභාරය ඉටු කළ නිලධාරියෙක්. අපි 2000 අවුරුද්දේ පාර්ලිමේන්තුවට ආපු දවසේ ඉඳලාම දන්න කෙනෙක්; ඉතාම සුහදව කටයුතු කළ කෙනෙක්. එතුමා රෝගාතුර වෙලා ඉඳලා සැප්තැම්බර් 03වෙනි දා අභාවප්‍රාප්ත වුණා. අපි ඉතාම කනගාටු වෙනවා, සුහදශීලී හොඳ නිලධාරියෙකු පාර්ලිමේන්තුවට අහිමිවීම ගැන.

ගරු කථානායකතුමනි, අපි අද දිනයේදී මෝටර් වාහන පනත යටතේ නියෝග දෙකක් ඉදිරිපත් කරනු ලබනවා. ඒ වාගේම ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ තිබෙන වැඩසටහන් ගැනත්, අපි මුහුණ දීලා තිබෙන අභියෝග ගැනත් ජනතාව දැනුවත් කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

අද ඉදිරිපත් කර තිබෙන නියෝගවල අරමුණු පිළිබඳව මම කෙටියෙන් කියන්නම්. ගරු කථානායකතුමනි, නියෝජ්‍ය ඇමතිතුමා සහ අපේ අනෙක් මැති ඇමතිවරු තව කරුණු පිළිබඳව විශාල වශයෙන් පැහැදිලි කරයි. පළමුවෙනි කාරණය තමයි, අපි ගැසට් එකක් ඉදිරිපත් කරලා ඒක අද පාර්ලිමේන්තුවෙන් අනුමත කර ගන්න බලාපොරොත්තු වෙනවා. අපි යෝජනා කරලා තිබෙන නියෝග අදාළ වෙන්නේ මගී ප්‍රවාහනයේ නිරත වෙන බස් රථ, වෑන් රථ වාගේ වාහනවලට පමණයි. පෞද්ගලිකව තමන්ගේ ගමන් යන වාහනවලට මේක අයිති වෙන්නේ නැහැ. ඒවාත් කරගත්තාට කමක් නැහැ. නමුත්, බස් රථවලින් හෝ office vansවලින්, නැත්නම් school vansවලින් මගීන් ප්‍රවාහනය කරනවා නම්, එහෙමත් නැත්නම් trip එකක් යනවා නම්, අන්න එවැනි වාහන අනිවාර්යයෙන්ම කිලෝමීටර 5,000කට අඩු ධාවන කාලයකදී හෝ මාස තුනකට අඩු කාලයකදී රථ වාහන යෝග්‍යතාව පිළිබඳ සාමාන්‍ය මට්ටමේ පරීක්ෂණ සහතිකයක් ලබාගත යුතුයි. කිලෝමීටර 5,000 ඉක්මවන්න කලින් roadworthiness test එකක් කර ගන්න ඕනෑ. සාමාන්‍යයෙන් අවුරුද්දකට වරක් කරන roadworthiness test එක නොවෙයි, ඒක ටිකක් comprehensive එකක්. මේක ඊට වඩා අඩු, සාමාන්‍ය තත්ත්වයක එකක්. ගරාජ් එකකින් මිල ගණන් ගත්තොත්, එතැන එක එක ඉලක්කම් තිබෙන්න පුළුවන්. නමුත්, සාමාන්‍යයෙන් රුපියල් 1,500ක, රුපියල් 2,000ක වාගේ සීමාවක කර ගන්න පුළුවන් කියන එක තමයි අපේ අදහස. එතැනදී tests කිහිපයක් කර ගන්න අවශ්‍යයි. ඒකට හේතුව තමයි, බොහෝ ප්‍රධාන වාහන අනතුරුවලදී - 2025 මැයි මාසයේ සිදු වුණු කොත්මලේ අනතුර ගත්තත්, ඊට පස්සේ ඇල්ලේදී සිදු වුණු අනතුර ගත්තත් - අපට බොහෝ වෙලාවට දකින්න තිබුණු දෙයක් තමයි trips යන හෝ මගී ප්‍රවාහනය කරන බස් රථ හරියාකාරව නඩත්තු කරන්නේ නැහැයි කියන එක. අඩු ගණනේ බ්‍රේක්වත් හදාගෙන නැහැ. අනතුරට ලක් වූ එක් බස් රථයක Motor Vehicle Examiner's report එක අපි ළඟ තිබෙනවා. අද අපේ මන්ත්‍රීතුමෙක් ඒක මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරයි. ගරු කථානායකතුමනි, අනතුරට පත් වුණු එක් බස් රථයක Motor Vehicle Examiner's report එකේ තිබෙනවා, අවුරුද්දක් තිස්සේම එක පැත්තක බ්‍රේක් වහලා තිබෙන්නේ කියලා. ඔබතුමා වාහන පදවන කෙනෙක් නිසා දන්නවා නේ, එහි ඇති බරපතළකම. ඒවා හදලා නැහැ. අපි දැක්කා, මේ ළඟදී පොලීසියෙන් බස් රථයක් අත්අඩංගුවට අරගෙන තිබුණා. ඒ බස් රථයේ brake hose එක හදලා තිබෙන්නේ මල්වලට වතුර දමන hose එකකින්. ඒ වාගේ අන්තිම නොසැලකිල්ලෙන් තමයි වාහන ගෙනියන්නේ. මිනිස්සු trips යන්නේ සතුටු වෙන්න. සල්ලි දීලා යන්නේ. නමුත්, අපරාදේ ජීවිත නැති වෙනවා.

මෑතකදී මොනරාගලදී - ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාගේ දිස්ත්‍රික්කයේ - ට්‍රැක්ටර් ට්‍රේලරයක් අනතුරට ලක් වෙලා එහි ගමන් ගත් 5දෙනෙක් නැති වුණා. ඒ වාගේම තව විශාල අනතුරක් සිදු වුණා. ඒකට හේතුව තමයි ට්‍රැක්ටර් ට්‍රේලරයේ කිසිම ලයිට් එකක් නොතිබීම. එතකොට ඈතින් එන ලොකු ට්‍රක් එකට පෙනෙන්නේ නැහැ. ට්‍රක් එකේ බකට් එක ඒ ට්‍රේලරයේ අයිනේ හැප්පෙනවා. එතකොට මිනිසුන්ගේ ඔළු උඩින්, බෙලි උඩින් යන්නේ. සමහර විට ඒ මිනිස්සු වන්දනාවේ යන්නේ, දෙවියන්ට කියන්න. අන්තිමට ඒ ගමන යන්න වෙන්නෙත් නැහැ. එම නිසා විශේෂයෙන්ම වාහන කුලියට දෙන අය වගකීමක් ගන්න ඕනෑ. මේක ව්‍යාපාරයක්. කවුරුවත් පිනට යන්නේ නැහැ නේ. නිකම් යාළුකමට එක්කගෙන යන්නේ නැහැ නේ, හුඟක් අය. ඒ නිසා ඔවුන්ට වගකීමක් තිබෙනවා. ව්‍යාපාරයක් වුණාම, ව්‍යාපාරයක් ලෙස කරන්න ඕනෑ. එහෙම කරන්න ඕනෑ. ඒ නිසා තමයි අපි මේ යෝජනාව කරන්නේ. කාටවත් එක්වර විශාල බරක් පටවන්න අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ. එම නිසා මාස තුනකට වරක් තමන්ගේ වාහනයේ මූලික දේවල් ටික check කර ගන්න.

අපි මේ මඟින් අලුත් industry එකක් සහ profession එකකුත් develop කරනවා. NVQ Level 4 සුදුසුකම සහ දැනුම තිබෙන වෘත්තිකයන්ට ගරාජ් එකක ලියාපදිංචි වෙලා වාහන check කරන්න පුළුවන්. එතකොට, ඔවුන්ට අමතර ආදායමකුත් ලැබෙනවා වාගේම, motor mechanism ශිල්පය දන්නා අයට ඒක ස්වේච්ඡාවෙන් කරන්න අවස්ථාවකුත් ලැබෙනවා. ඒක තමයි අපේ පළමුවැනි අරමුණ. පළමුවන ගැසට් පත්‍රයෙන් ඉදිරිපත් කර තිබෙන්නේ ඒකයි.

ගරු කථානායකතුමනි, දෙවැනි ගැසට් පත්‍රය මෙයයි. අපේ රට ගොඩක් දේවල්වලින් ඉස්සරහට ගිහිල්ලා තිබුණත්, මාර්ග ආරක්ෂාව පැත්තෙන්, රථ වාහන අනතුරු පැත්තෙන් ලෝකයේ රටවල් අතරින් අපේ රට ඉන්නේ හොඳ තැනක නොවෙයි කියන එක ඔබතුමා දන්නවා. අපි ඉන්නේ ලෝකයේ නරක category එකේ. ගිය අවුරුද්දේ රථ වාහන අනතුරුවලින් අපේ රටේ 2,750ක් මැරුණා. ඒ විධියට අතිවිශාල පිරිසක් අනතුරුවලට පත් වෙනවා. හරියට ගණන් බලලා නැති වුණත්, සාමාන්‍ය අදහස තමයි දළ ජාතික නිෂ්පාදිතයෙන් - GDP එකෙන් - සියයට 3ත්, 5ත් අතර ප්‍රමාණයක් රිය අනතුරු නිසා විනාශ වෙනවා කියන එක. ඒ නිසා අපි එක පාරට නොවෙයි, ක්‍රමානුකූලව මීට අවුරුද්දකට කලින් survey එකකුත් කරලා අධිවේගී මාර්ගයේ යන වාහනවල පිටුපස seatsවල යන අයටත් seat belts අනිවාර්ය කළා. ඒක කරලා අවුරුද්දක් වෙනවා. කිසිම කෙනෙකුට seat belts දමන්නේ නැතුව අධිවේගී මාර්ගයේ යන්න බැහැ. වාහනයේ ඉස්සරහා යන්නත් බැහැ, පිටුපස යන්නත් බැහැ. මොකද, අධිවේගී මාර්ගේ සිදු වන accidents ගත්තොත්, ඒ වාහනවල පිටුපස යන අයට තමයි වැඩිම හානි සිදු වෙලා තිබෙන්නේ. පිටුපස යන අය seat belts දමන්නේ නැතුව ගියාට, ඒගොල්ලෝ යන්නේත් පැයට කිලෝමීටර 100ක වේගයෙන්. එතකොට, windscreen එක කඩාගෙන එළියට වැටිලා, ඒ වාහනයටම යටවෙලා තමයි එක්කෝ තුවාල වෙන්නේ, එක්කෝ මැරෙන්නේ. ගොඩක් වෙලාවට කාන්තාවන් සහ දරුවන් තමයි ඒ විධියට අනතුරට ලක් වෙන්නේ. මොකද, ඒගොල්ලෝ තමයි වාහනවල පිටුපස

යන්නේ. එම නිසා අවුරුද්දක් තිස්සේ අපි ඒක අනිවාර්ය කරලා තිබෙනවා. Seat belts තිබෙනවා නම්, අධිවේගී මාර්ගයේ යනකොට අනිවාර්යයෙන්ම ඒවා දාගෙන යන්න ඕනෑ.

ඔය අතරේ තවත් ප්‍රශ්නයක් ආවා. ගරු අගමැතිතුමියනි, seat belts ඇවිල්ලා නැති වාහන අපේ රටේ තිබෙනවා. යම් කාලයකට කලින් ආපු වාහනවල නිෂ්පාදකයා විසින් seat belts සවි කරලා නැහැ. අන්න ඒ වාහන සඳහා seat belts හදාගන්න අපි අවුරුද්දක කාලයක් ලබා දුන්නා. ඒ, මාස තුනෙන් තුනට කල් දැමීම් කරලා, දැනුවත් කිරීම් අතිවිශාල ප්‍රමාණයක් කරලායි, ගරු කථානායකතුමනි. Orthopedic surgeonsලාට, ලංකාවේ ප්‍රවීණ ක්‍රීඩකයින්ට, කලාකරුවන්ට, විවිධ සංවිධානවල ප්‍රධානීන්ට මේ අවස්ථාවේදී මම ස්තුතිවන්ත වනවා. මොකද, ඔවුන් පාරට බැහැලා පත්‍රිකා බෙදලා කිව්වා, තමන්ගේ වාහනවල seat belts හදාගන්න කියලා. ඒ නිසා මේ එන සැප්තැම්බර් මස 19වැනි දායින් පස්සේ අධිවේගී මාර්ගයේ යනවා නම්, seat belts තිබෙන වාහනයක තමයි යන්න වෙන්නේ. මම මේ කාරණය විශේෂයෙන්ම කියන්න හේතුව මේකයි. මීට කලින් පැවති මාධ්‍ය සාකච්ඡාවකදීත් මම මේ පිළිබඳව කිව්වා. Seat belts හදාගත්තේ නැති staff service vans තිබෙන්න පුළුවන්, school vans තිබෙන්න පුළුවන්. නමුත් මේ නීතිය ක්‍රියාත්මක කිරීම අවුරුද්දක් තිස්සේ කල් දමලා තිබුණේ, මාස තුනෙන් තුනට. හැබැයි, මේ එන සැප්තැම්බර් මස 19වැනි දායින් පස්සේ තමන්ගේ staff service van එකේ, තමන්ගේ school van එකේ seat belts හදාගත්තේ නැත්නම්, ඒ වාහනවල රියැදුරන්ට පොලීසියෙන් දඬුවම් කරාවි. මොකද සමහරු හිතාගෙන ඉන්න පුළුවන්, තමන්ගේ වාහනේ office යන මිස්ලා ටික යොදාගෙන, ඉස්කෝලේ යන දරුවෝ ටික යොදාගෙන, "මෙන්න අපට අධිවේගී මාර්ගයට එන්න දෙන්නේ නැහැ" කියලා උද්ඝෝෂණ කරන්න. මේ නීතිය ක්‍රියාත්මක කරන එක අපි අවුරුද්දක් කල් දමලා තිබුණා, මාස තුනෙන් තුනට. "Seat belts හදාගන්න කියලා මිනිසුන්ට පත්‍රිකා බෙදන්නේ, තමුසෙට පිස්සුද?" කියලා මම ඇති වෙනකල් බැණුම් අහලාත් තිබෙනවා. කොහොම හරි මේ සැප්තැම්බර් මස 19වැනි දායින් පස්සේ හැම වාහනයකම seat belts හදාගන්න ඕනෑ. Seat belts හදාගන්න අමාරු නැහැ. ලේලන්ඩ්, ටාටා වාගේ සාමාන්‍ය බස්වලත් ඕනෑ තරම් seat belts හදාගෙන තිබෙනවා, විනයගරුක අය.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
Expressway එකේ යන වාහනවලට විතරද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Expressway එකේ යන වාහනවලට විතරයි, ගරු මන්ත්‍රීතුමා. අනෙක් මාර්ගවල යන වාහනවලට තවම මේ නීතිය ක්‍රියාත්මක කරන්න බැහැ. මේ ඔක්කෝම කරලා තිබෙන්නේ ජනතාව වෙනුවෙන්. ඉතින් ඒ නියෝග දෙක තමයි අද අනුමත කරන්නේ. ඒ නිසා මම කරුණාවෙන් ඉල්ලා සිටින්න කැමැතියි, 19වැනි දායින් පස්සේ expressway එකේ ගිහිල්ලා entry points ළඟ බොරුවට රස්තියාදු වෙන්න එපා කියලා. Seat belts නැත්නම්, normal "A" "B" road එකක යන්න. මොකද, seat belts හදාගන්න හැම කෙනාටම අපි ඇති තරම් කල් දුන්නා.

ගරු කථානායකතුමනි, මෙ අවස්ථාවේදී ප්‍රවාහනය සම්බන්ධයෙන් තවත් කරුණු කාරණා කිහිපයක් කියන්න තිබෙනවා. අපි දන්නවා, අපේ රටේ ප්‍රවාහනය හොඳ තත්ත්වයක නැහැ, විශාල ගැටලුකාරී තත්ත්වයකයි තිබෙන්නේ කියලා. අපි උත්සාහ කරමින් ඉන්නවා, ඒවා නිවැරදි කරන්න. නමුත් මම හිතන්නේ නැහැ, අපි ඒක අවශ්‍ය මට්ටමකට ගෙනැල්ලා තිබෙනවාය කියලා. නමුත් අපේ රජය, විශේෂයෙන්ම මුදල් අමාත්‍යාංශය අපේ රටේ ආර්ථිකය ශක්තිමත් පැත්තට අරගෙන තිබෙන නිසා අතිදැවැන්ත අධිවේගී මාර්ග ව්‍යාපෘති ගණනාවක් අපි මේ අවුරුද්ද තුළ පටන් ගන්නවා. මොකද, විශාල වශයෙන් මුදල් අවශ්‍ය වන ව්‍යාපෘති තමයි අධිවේගී මාර්ග ව්‍යාපෘති කියන්නේ. ඔබතුමන්ලාගේ අවබෝධය සඳහා මම ඉන් කිහිපයක් කියන්නම්. ගරු කථානායකතුමනි, මේ එන නොවැම්බර්, දෙසැම්බර් මාස දෙකේදී අපි පටන් ගන්නවා, දඹුල්ල අධිවේගී මාර්ගයේ කුරුණෑගල ඉඳලා ගලේවෙල දක්වා කොටස. ඒ වාගේම රුවන්පුර අධිවේගී මාර්ගයේ කහතුඩුව සිට ඉංගිරිය දක්වා කොටසත් අපි පටන් ගන්නවා, මේ නොවැම්බර්වල, නැත්නම් දෙසැම්බර්වල. ඒ වාගේම ගරු ජනාධිපතිතුමා අපට උපදෙස් දුන්නා, කටුනායක ඉඳලා හලාවත දක්වාත් අධිවේගී මාර්ගයක් හදන්න අවශ්‍ය සැලසුම්කරණය පටන් ගන්න කියලා. අපි දැන් RDA එකට උපදෙස් දීලා තිබෙනවා, ඒ සම්බන්ධව feasibility studies පටන් ගන්න කියලා. අපි බලාපොරොත්තු වනවා, කටුනායක ඉඳලා හලාවතට පොඩ්ඩක් එහාට - දැදුරු ඔය පාලම කිට්ටුවට වාගේ - ඒ අධිවේගී මාර්ගය දීර්ඝ කරන්න.

ඒ වාගේම අපි යෝජනා කරලා තිබෙනවා, අනුරාධපුරය හෝ වවුනියාව - විශේෂයෙන්ම අනුරාධපුරය - මුල් කරගෙන, එතැනින් එක pool එකක් පටන් අරගෙන, එතැනින් අධිවේගී මාර්ග network එකක් පටන් ගන්න පුළුවන්ද කියලා අධ්‍යයනයක් කරන්න. ඒ හැම එකක්ම කවදා හරි connect කරන්න වෙයි. නමුත් අපි හැම එකක්ම කොළඹ ඉඳලා connect කරන්න හිතුවොත්, ඒ සමහර ඒවා අපට ආර්ථික වශයෙන් දරාගන්න අමාරුයි. උදාහරණයක් හැටියට, පුත්තලම සිට අනුරාධපුරය දක්වා දැන් තිබෙන මාර්ගය ගත්තොත්, ඒකත් අධිවේගී මාර්ගයක් වාගේම තමයි.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
කඩවත-මීරිගම කොටස?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔව්, කඩවත-මීරිගම කොටසත් අපි හදාගෙන යනවා, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට පොළොන්නරුවේ ඉඳලා එනකොට ලෙහෙසි වෙන්න. 2028 මැයි මාසය වෙනවා, කඩවත-මීරිගම කොටස ඉවර කරනකොට. පොතුහැර-රඹුක්කන කොටසත් අපි ඉවර කරනවා, 2027 අවුරුද්දේ අප්‍රේල් මාසය වාගේ වනකොට. තාර ප්‍රශ්නයක් නිසා එහි පොඩි delay එකක් වුණා. නමුත් අපි හිතනවා, 2027 අවුරුද්දේ අප්‍රේල් මාසය වාගේ වනකොට පොතුහැර-රඹුක්කන කොටස ඉවර කරන්න පුළුවන් වෙයි කියලා. 2029 අවුරුද්දේ මැයි මාසය වනකොට අපි ඔය ඔක්කෝම සම්පූර්ණයෙන් ඉවර කරනවා, කුරුණෑගල-ගලේවෙල කොටස හැරෙන්න. ඒකත් අපි හිතනවා, 2030 අවුරුද්දට කලින් ඉවර කරගන්න පුළුවන් වෙයි කියලා. අධිවේගී මාර්ගවල කථාව ඒකයි.

ඒ වාගේම අපි ජාතික මහාමාර්ග සැලැස්මක් හදාගන්න ඕනෑ. අපේ රටේ වෙලා තිබෙන්නේ මොකක්ද, ගරු කථානායකතුමනි? යම්කිසි මාර්ගයක් හදන්න ඕනෑ වුණාට සමහර විට ඒ පවතින ආණ්ඩුවටවත් ඒක හදාගන්න වෙන්නේ නැහැ, සල්ලි තිබුණත්. ඇයි ඒ?

ඒ මාර්ගවලට අදාළව සැලසුම් හදලා නැහැ. ඒ සඳහා ඕනෑ කරන ඉඩම් අත්පත් කරගෙන නැහැ. ඒ සඳහා ඕනෑ කරන engineering designs හදලා නැහැ. අවශ්‍යතාවක් ඇති වුණාට කිසිම රාජ්‍ය නායකයෙකුට, කිසිම අගමැතිවරයෙකුට හෝ

[ගරු බිමල් රත්නායක මහතා]

අගමැතිවරියකට, ප්‍රවාහන ඇමතිවරයෙකුට ඉක්මනින් යම්කිසි මාර්ගයක් හදන්න බැහැ. ඒ සඳහා වැය වන කාලයෙන් සියයට 70ක් ගත වන්නේ මාර්ගය හදන එකට නොවෙයි. අපි අහලා තිබෙනවා, දියුණු රටවල අවුරුදු 20ක, 30ක මහාමාර්ග සැලැස්මක් සකස් කරලා තිබෙනවා කියලා. ඒ අය එම මාර්ග plan කරලා, design කරලා තිබෙන්නේ. එතකොට සල්ලි pass කරන ඒවා, ඉඩම් acquire කරන ඒවා වාගේ දෙයක් තමයි කරන්න තිබෙන්නේ. RDA එක හදපු සැලැස්මක් තිබෙනවා. ඒ සමහර ඒවා ඒ වේලාවේ හිටපු ඇමතිතුමාගේ ආසනයට වැඩිපුර වාසි වන විධියට හදපුවා. ඒ සමහර ඒවාට logic එකක් නැහැ. ඒවා තමයි තිබිච්ච සැලසුම්. සාමාන්‍යයෙන් අපේ රටේ මාර්ග හැදිලා තිබෙන්නේ එහෙම නේ. වරාය භාර ඇමතිගේ දිස්ත්‍රික්කයේ තමයි වරාය හදන්නේ. ඒ වාගේ සැලසුම් තමයි ක්‍රියාත්මක වෙලා තිබුණේ.

අපි රටේ ජාතික ආර්ථික සංවර්ධනය ඉලක්ක කරගෙන කටයුතු කරනවා. විශේෂයෙන්ම නොසලකා හරින ලද ජන කොට්ඨාස අපේ රටේ ඉන්නවා. ඒගොල්ලන් ඉලක්ක කරගත් ජාතික මංමාවත් සැලැස්මක් අපි සකස් කරන්න බලාපොරොත්තු වනවා, 2035 දක්වා. අපි හිතනවා, අවුරුදු දෙක තුනක් ඇතුළත මේවා සියල්ල estimate කරලා, plan කරලා, design කර ගත්තාට පස්සේ අපට ඒක කරන්න පුළුවන් කියලා. අපි ඒ කටයුතු ඒ විධියට කරනවා.

ගරු කථානායකතුමනි, මම මේ කියන කාරණය මීට කලිනුත් කිව්වා. අපි බලාපොරොත්තු වනවා, ඉදිරියේදී අපේ රටේ මාර්ග ආරක්ෂාව වෙනුවෙන් අවශ්‍ය තීරණ ක්‍රියාත්මක කරන්න. අපි ඒක අනුමත කරලා ඉවරයි. අපේ රටේ මගී ප්‍රවාහන සේවාවන්හි නිරත වන සියලුම රියැදුරු මහත්වරුන් - බස්, school van රියැදුරු මහත්වරුන් - සියලුදෙනාම PT Licence එකක් ගන්න ඕනෑ. දැනුත් ඒක තිබෙනවා. දැන් PT Licence එක ගන්නේ දවස් දෙකක training එකකින්. අපි විශාල අධ්‍යයනයක් කරලා දින 10ක training එකක් හදලා තිබෙනවා. ඒ සඳහා modules 10ක් තිබෙනවා. ඒ modules 10ට ඒගොල්ලන් දවස් 10ක් එක දිගට එම අදාළ ස්ථානයේ ඉන්න ඕනෑ නැහැ. මම දන්නවා, කිසිම රියැදුරු මහත්මයෙකුට එක දිගට දවස් 10ක් එහෙම ඉන්න බැහැ කියලා. නමුත් අපට පුළුවන්, ඒක දවස් දෙක බැගින් දවස් පහක් කරන්න. ඒක නිසා PT Licence එක ගැනීම අනිවාර්ය කරලා අපි එම කටයුත්ත පටන් අරගෙන තිබෙනවා. අපි ඒ course එක ගැසට් කරන්න දාලා තිබෙනවා. දැන් පටන් අරගෙන තිබෙනවා, ශ්‍රී ලංගම වාගේ ආයතනවලින් PT Licence එක දෙන්න. අපි පෞද්ගලික අංශයේ සියලුම බස් හිමියන්ගෙන් ඉල්ලා සිටිනවා, තමන්ගේ රියැදුරු මහත්වරුන්ව ක්‍රමානුකූලව ඒ සඳහා යොමු කරන්න කියලා. හදිසි වෙන්න අවශ්‍යතාවක් නැහැ. මොකද course එක ගැසට් කළාට, ඒ facilities හැදෙන්න ඕනෑ නිසා. ඒ facilities හැදෙන විධියට PT Licences ගන්න පුළුවන්. රටේ සම්පූර්ණයෙන්ම facilities හැදුණාට පස්සේ අපි යම්කිසි කාලයක් කියනවා, මේ කාලය තුළදී එම කටයුත්ත අවසන් කර ගන්න කියලා.

ගරු කථානායකතුමනි, මාර්ග ආරක්ෂාව වෙනුවෙන් මුදල් වෙන් කරන්න අපට සල්ලි තිබුණේ නැහැ. එම නිසා කැබිනට් මණ්ඩලයෙන් අවසර දුන්නා, ප්‍රාදේශීය සභාවලට ඒ සඳහා මුදල් වෙන් කරන්න. ඒ අනුව මහාමාර්ග අමාත්‍යාංශයෙන් මාර්ග ආරක්ෂාව වෙනුවෙන් ප්‍රාදේශීය සභා විශාල ප්‍රමාණයකට සල්ලි වෙන් කරලා තිබෙනවා. අපට අවශ්‍යයි, ප්‍රාදේශීය සභා සභාපතිතුමන්ලා road safety championsලා කරගන්න. ඒගොල්ලන් තමන්ගේ ප්‍රදේශයේ accident free zones හදන්න ඕනෑ, එක පාර බැරි නම් මේ stretch එකේ - මේ කිලෝමීටර පහේ - accidents වෙන්න දෙන්නේ නැහැ කියලා ඒ කටයුත්ත කරන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, your time is up.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මට විනාඩි දෙකක් දෙන්න, ගරු කථානායකතුමනි.

මෙට්‍රෝ බස් සේවාව ගැනත් ගොඩක් අය කථා කරලා තිබෙනවා. මෙට්‍රෝ බස් සේවාව සාර්ථක කර ගන්න පුළුවන් වන්නේ කොහොමද? අපට අවශ්‍ය නැහැ, වෙන බස් එකක යන කෙනකු මෙට්‍රෝ බස් එකට නග්ගා ගන්න. අපට අවශ්‍ය වන්නේ පෞද්ගලික වාහනයෙන් එන අය ඒ වාහනය ඔවුන්ගේ ගෙදර තියලා මෙට්‍රෝ බස් එකට නඟින කෙනකු බවට පත් කරන්න. ඒක නිසා අපි ගරු මන්ත්‍රීතුමන්ලා හැම කෙනාගෙන්ම ඉල්ලා සිටින්නේ මෙයයි. හැම Metro Bus halt එකක් කියන්නේම Park and Ride place එකක් විය යුතුයි. බස් 122ක fleet එකක් ගරු ජනාධිපතිතුමා විසින් launch කරනවා. මේ අවුරුද්දේ අග හෝ ලබන අවුරුද්දේ මුල වෙද්දි ඒකට තව බස් රථ 50ක් එකතු වනවා. ජපන් ආණ්ඩුවෙන් බස් රථ 8ක් ත්‍යාගයක් වශයෙන් දුන්නා. චීන ආණ්ඩුවෙන් අපට low-bed electric buses 100ක් දෙන්න පොරොන්දු වෙලා තිබෙනවා. අපි හිතනවා, ලබන අවුරුද්ද වන විට බස් රථ 272ක fleet එකක් එකතු වෙයි කියලා. එතකොට අපට පුළුවන්, ලංකාවේ තව දිස්ත්‍රික්ක ගණනාවකට මෙම සේවාව ගෙන යන්න. හැම Metro Bus halt එකක්ම Park and Ride place එකක් විය යුතුයි. එම නිසා මම පක්ෂ, විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා කාගෙනුත් ඉල්ලා සිටිනවා, මේ සඳහා සහයෝගය දෙන්න කියලා. පෞද්ගලික අංශයට පුළුවන්, පොඩි parking එකක් දාන්න. Metro Bus halt එක ළඟ බයිසිකලය හෝ කාර් එක නතර කළා, මෙට්‍රෝ බස් එකට නැග්ගා. එතැන පර්චස් 30ක ඉඩමක් තිබෙන කෙනෙකු ඉන්නවා නම්, අපි ඔහුට parameters ටිකක් සහ app එකක් දෙනවා. ඒ කෙනාට ඒකෙන් සල්ලි හොයන්න පුළුවන්. ආණ්ඩුවට ඒ parking එකෙන් සල්ලි හොයන්න ඕනෑ නැහැ.

ඒ වාගේම අපි රාජ්‍ය අංශයෙනුත් ඉල්ලීමක් කරනවා. රාජ්‍ය අංශයේ හැම office එකක්ම හවස 5.00න් පස්සේ වහලා, ගරු කථානායකතුමනි. කොළඹ, මාතර, නුගේගොඩ කියන කොහේ ගත්තත් සමහර වෙලාවට අපට වාහනයක් නතර කරන්න තැනක් නැහැ. ගරු කථානායකතුමනි, ඔබතුමා ඉන්න කඩුරුවෙල ගත්තත් ඒ ප්‍රදේශයේත් වාහනයක් නතර කරන්න හරි අමාරුයි. එම නිසා අපි කියන්නේ හවස 5.00 ඉඳලා රෑ 8.00 වනතුරු රාජ්‍ය අංශයේ තැන්වල parkingවලට ඉඩ දෙන්න කියන එකයි. ඒ සඳහා සල්ලි අය කරන්න. හවස 5.00 ඉඳලා රෑ 8.00, 9.00 වනතුරු security guard කෙනෙක් දාලා parkingවලට ඒ space එක දෙන්න. ඒකේ කිසි වැරැද්දක් නැහැ. පෞද්ගලික අංශය ගත්තොත්, හවස 5.00න් පස්සේ බැංකුවලට කවුරුවත් customersලා එන්නේ නැහැ. නමුත් ඒගොල්ලන් ලොකු spaces අරගෙන තියාගෙන ඉන්නවා. ඒ වාගේම ලොකු shopping malls තිබෙනවා. ඒගොල්ලන්ගේ peak hoursවල විතරයි සෙනඟ ඇවිල්ලා parking පිරෙන්නේ. කොළඹ තිබෙන ලොකුම ඉඩම් අරගෙන බලන්න. ඒවා ඔක්කෝම shopping mallsවලින් අරගෙන තිබෙන්නේ, specially, supermarketsවලින්. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. ඒගොල්ලන් අපට කරදරයක් කරලා නැහැ. ඒගොල්ලන්ගේ customersලාට ඒගොල්ලන් parking දීලා තිබෙනවා. හැබැයි, අපි ඒගොල්ලන්ට කියන්නේ ඒගොල්ලන්ට විතරක් තියා ගන්නේ නැතිව, peak hoursවල ඒගොල්ලන්ට විතරක් තියා ගෙන අනෙක් වෙලාවට ඒවා open කරන්න කියායි. ඒ සඳහා සල්ලි ගන්න. එහෙම නැතිව අපට කොළඹ අලුතින් ඉඩම් හදන්න බැහැ, එක එක්කෙනාගේ ඉඩම් එක එක්කෙනා එක එක විධියට පාවිච්චි කළොත්. පාරවල් හදලා අපට මේ ප්‍රශ්නය විසඳන්නත් බැහැ. එම නිසා Park and Ride කියන එක අපි insist කරනවා.

අද ගොඩක් අය කථා කරන්න ඉන්න නිසා අවසාන වශයෙන් මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරනවා. අපි ලංගම ආයතනය හදන්න මහන්සි වෙනවා. ඒ සඳහා අභියෝග විශාල ප්‍රමාණයක් තිබෙනවා. අපි හිතනවා, Debate එක අතරතුරේදී ඒ සම්බන්ධයෙන් කරුණු කියන්න පුළුවන් කියලා. ඒ වාගේම අපි UDA එකයි, RDA එකයි එකතු කරලා තමයි දැන් ඒ සඳහා සැලසුම් කරන්නේ, ගරු කථානායකතුමනි. හැම expressway exit එකක්ම, හැම entrance එකක්ම mini-township එකක් විධියටයි අපි හදන්න යන්නේ.

ඒ වාගේම මම කියන්න කැමැතියි, number plates ගැනත්. මම හිතනවා, ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය ඇමතිතුමාත් ඒ පිළිබඳව කියයි කියලා. Number plates සම්බන්ධව තිබෙන ප්‍රශ්නය ගත්තොත්, 2026 වසරේ ඉඳලා දෙන number plates සති දෙකක් ඇතුළතදී ලබා දෙන්න අපට පුළුවන් වනවා, ගරු කථානායකතුමනි. අපි try කරනවා, සතියක් ඇතුළත number plates ලබා දෙන්න. ඒ වාගේම ඉලෙක්ට්‍රික් වාහනවලට කොළ පාට number plates දෙන්න අපි දැන් ඇත්තටම නියෝග කරලා තිබෙනවා. ඒක ගැසට් පත්‍රයේ පළ කරන්න ඕනෑකම තිබෙනවා. ඒක නීතිමය ගැටලුවක් නොවෙයි. කොළ පාට number plates තමයි නීත්‍යනුකූල වෙන්නේ. රථ වාහන සම්බන්ධ කරුණුවලදී පොලීසිය ඒ වෙනුවෙන් අතිවිශාල කාර්යභාරයක් කරනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කවුද ඒකට ගෙවන්නේ? දැන් number plate එකක් තිබෙනවා නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔව්.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක order කරද්දි ගෙවන්න ඕනෑ කවුද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපි ඒ ගැන කල්පනා කරලා බලන්න ඕනෑ, රවී මන්ත්‍රීතුමනි. ඔබතුමා ඇහුවේ හොඳ ප්‍රශ්නයක්. දැන් අපි ඉන්න strategy එකේ තිබෙන්නේ ඇත්තටම,- *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. මෙහෙමයි. මම ඒ කාරණය පිළිගන්නවා. දැන් number plates පරක්කු වෙලා හම්බ වෙන්නේ. Driving licence එක එහෙමවත් ලැබෙන්නේ නැහැ. අවුරුද්දක්, දෙකක් ගත වුණත් සමහර driving licences තවම ලැබිලා නැහැ. ඒ කියන්නේ, level එකකින් එහාට ආයතන කුඩු පට්ටම් කළාම ඒවා ගොඩ ගන්න ලෙහෙසි නැහැ. අපි පුදුමාකාර struggle එකක් කරනවා, DMT එක යන්තම් උඩට ගන්න. ඔබතුමා කිව්ව number plates සම්බන්ධ ප්‍රශ්නය ගැනත් හොයලා මම උත්තරයක් ලබා දෙන්න බලන්නම්. EVsවලට කොළ පාට එනවා. අනෙක් ඒවාට කහ පාට පරණ එකමයි භාවිත කරන්නේ. අපි හිතනවා, අද ඉල්ලන අයට සති දෙකක වාගේ කාලයක් තුළදී number plates දෙන්න පුළුවන් වෙයි කියලා. ඒ කාලයත් අපි සතියට අඩු කරනවා. ගරු මන්ත්‍රීතුමනි, ලක්ෂ ගාණක backlog එකක් තිබෙනවා. ඒ සම්බන්ධ හරිම ඉලක්කම මා ළඟ තිබෙනවා. අවශ්‍ය වුණොත් මම පසුව ඒ ගැන කියන්නම්. *[බාධා කිරීමක්]* No. ඊට වඩා ගොඩක් වැඩියි, ගරු මන්ත්‍රීතුමනි. ගරු කථානායකතුමා කථාව අවසන් කරන්න කියලා මා දිහා බලා ගෙන ඉන්නවා. ඒ නිසා මට ඒ ගැන තොරතුරු දැන් හොයන්න අමාරුයි. Number plates සම්බන්ධ ප්‍රශ්නය ගත්තොත්, දැන් bid එක දිනලා තිබෙන කොම්පැනියෙන්ම අරගෙන backlog එක clear කරන්නත් අපි බලාපොරොත්තු වනවා. උපරිම වේගයෙන් ගියත්, double shifts දාලා ගියත් backlog එක clear කරන්න මාස 8ක්වත් ගත වෙයි කියලා අපි හිතනවා.

ඒ වාගේම driving licences සම්බන්ධව ගත්තොත්, එතැනත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම backlog එකක් තිබෙනවා. අපි අලුත් කොමසාරිස් ජනරාල්වරයෙක් පත් කර ගත්තා. අද ඉඳලා වසරක වාගේ කාලයක් ඇතුළතදී ජනතාවට අත්‍යවශ්‍යම දේවල් ටික කරන්න අපට පුළුවන්කම ලැබෙයි කියලා අපි හිතනවා. ගරු කථානායකතුමනි, මට වැඩිපුර වෙලාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Sajith Premadasa. You have 12 minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[පූ.භා. 11.40]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම අද උදේ වරුවේ මම ස්ථාවර නියෝග සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පදනම් කරගෙන ප්‍රශ්නයක් මතු කළා. ඒ කියන්නේ, 50 (3)වන ස්ථාවර නියෝගය, 92(2) (ආ)වන ස්ථාවර නියෝගය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121වන ව්‍යවස්ථාව පදනම් කරගෙන ඒ ප්‍රශ්නය මතු කළා. හැබැයි, කනගාටුවට කාරණාව මෙයයි. ඇත්තවශයෙන්ම මට ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්නට අවස්ථාව ලබා දුන්නේ නැහැ.

මම විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න ඕනෑ. මම ඒ ප්‍රශ්නය මතු කළේ ගරු කථානායකතුමා මේ සභාවට ඉදිරිපත් කරපු විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතට අදාළ පෙත්සම් ප්‍රමාණය සම්බන්ධයෙන් දෝෂයක් තිබුණු නිසායි. ඇත්තවශයෙන්ම දූලාර ගුණතිලක, ඒ වාගේම ශාන්ත ජයතිලක යන අයත් විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතට විරුද්ධව පෙත්සම් ඉදිරිපත් කරලා තිබෙනවා. හැබැයි, එම පෙත්සම් විභාගය සඳහා විවෘත අධිකරණයේ කැඳවීමක් කරලා නැහැ. ඒ අතපසුවීම තුළ ඒ අයගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදු වෙලා තිබෙනවා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකවරයා වශයෙන් මට මේ කාරණාව මතු කරන්නට අවස්ථාව ලබා නොදීම ගැන ඇත්තවශයෙන්ම මම කනගාටු වෙනවා. මේ පෙත්සම් දෙක නොකැඳවීම තුළ, එයට සවන් නොදීම තුළ අපි විශ්වාස කරනවා, මේ පෙත්සම් ක්‍රියාවලිය සම්පූර්ණ නැහැ, එය සම්පූර්ණ කරලා තමයි විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය මේ සභාවට ඉදිරිපත් විය යුත්තේ කියා. විශේෂයෙන්ම *audi alteram partem* කියන ප්‍රතිපත්තිය තුළ, ඒ නීතිමය මූලධර්මය තුළ හැමදෙනාටම සවන් දෙන්න ඕනෑ; අනෙක් පැත්තටත් සවන් දෙන්න ඕනෑය කියන මූලධර්මය අනුගමනය කිරීම ඉතාම වැදගත්.

විශේෂයෙන්ම මෝටර් වාහන පනත යටතේ වන නියෝග සම්බන්ධයෙන් සාකච්ඡාවට භාජන වන අද දවසේ මේ සභාවේදී කියැවුණා, විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනවාය කියලා. විශේෂයෙන්ම අධිවේගී මාර්ග ව්‍යාපෘති ගැන කියැවුණා. මේ හැම දෙයටම මුදල් අවශ්‍යයි. මේ හැම දෙයටම මුදල් අවශ්‍ය නම් රටේ ආර්ථික වර්ධන වේගය ඉහළ යන්නට ඕනෑ. රටේ ආර්ථික වර්ධන වේගය ඉහළ යන්නට නම් සෘජු විදේශ ආයෝජන අපේ රටට ලැබෙන්නට ඕනෑ. ඇත්තවශයෙන්ම ඔබතුමන්ලා අධිවේගී මාර්ග හදන අතරතුර අධිවේගීව මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරන තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා. ඔබතුමන්ලා ඒක ශීඝ්‍රගාමීව සිද්ධ කරනවා. ඇත්තවශයෙන්ම අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය හැකිළීම - සංකෝචනය කිරීම - තුළ මොකක්ද වෙන්නේ? අපේ රටේ ස්වාධීන අධිකරණයක් නැහැ, ප්‍රජාතන්ත්‍රවාදය නැහැ, විශේෂයෙන්ම අධිකරණය පිළිබඳව තිබෙන විශ්වසනීයත්වය නැහැ කියලා විදේශ ආයෝජකයන්ට මතයක් ගියොත් මොකක්ද වෙන්නේ? සෘජු විදේශ ආයෝජන අපේ රටට එන එක අඩු වෙනවා, අවම වෙනවා. ඒක බලපානවා, ආර්ථික වර්ධන වේගයට. ඒක බලපානවා, ජාතික ආදායමට. එතකොට ඔබතුමන්ලා බලාපොරොත්තු වන අධිවේගී මාර්ග හැදීම බරපතළ ප්‍රශ්නයක් වෙනවා. එයට මුදල් සොයා ගැනීමත් බරපතළ ප්‍රශ්නයක් වෙනවා. මොකද, ඒ ඔබතුමන්ලා අධිවේගීව ප්‍රජාතන්ත්‍රවාදය සංකෝචනය කිරීම නිසා සහ ඔබතුමන්ලා අධිවේගීව අධිකරණයේ ස්වාධීනත්වය පලුදු කරන නිසා.

ඇත්තවශයෙන්ම සෘජු විදේශ ආයෝජන ලබා ගන්නට ජාත්‍යන්තරයේ විශ්වසනීයත්වය අවශ්‍යයි. ඒක මම හිතන්නේ ඔබතුමා පිළිගන්නවා, ගරු සභානායකතුමනි. ජාත්‍යන්තරයේ විශ්වසනීයත්වය ඇති කර ගන්නට නම්,- පොදු රාජ්‍ය මණ්ඩලයේ නීතිඥ සංගමයේ ප්‍රධානියා වන ස්ටීවන් තිරූ කියන මහත්මයා අපේ රටට ආවා. එතුමා අපේ රටට ඇවිල්ලා,- *[බාධා කිරීමක්]* ගරු සභානායකතුමනි, මට විනාඩියක් දෙන්න. බාධා කරන්න එපා. *[බාධා කිරීමක්]* මට බාධා කරන්න එපා. *[බාධා කිරීමක්]* ගරු සභානායකතුමනි, මට කරුණාකරලා බාධා කරන්න එපා. මම ඔබතුමාට බාධා කළේ නැහැ නේ. මගේ කථාවෙන් පස්සේ ඔබතුමා අදහස් ඉදිරිපත් කරන්න. *[බාධා කිරීම්]* දැන් බලන්න,- *[බාධා කිරීම්]* කරුණාකරලා මට බාධා කරන්න එපා කියලා බොහොම ගෞරවයෙන් මම ඉල්ලීමක් කරනවා. *[බාධා කිරීම්]* ස්ටීවන් තිරූ මහත්මයා මේ රටට ඇවිල්ලා අධිකරණ ඇමතිතුමාත් එක්ක සාකච්ඡාවකට appointment එකක් ඉල්ලුවා. නමුත් ඒ සඳහා අවස්ථාව ලබා දුන්නේ නැහැ. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමියත් එක්ක සාකච්ඡාවකට appointment එකක් ඉල්ලුවා. නමුත්, ඒ සඳහා අවස්ථාව දුන්නේත් නැහැ. එතුමා ඇවිල්ලා මාවත් හමු වුණා. එතුමා 2026.09.07වැනි දින වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මම ඒ වාර්තාව **සභාගත*** කරනවා, සියලුදෙනාගේම දැන ගැනීම සඳහා.

---

***** ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ඒ වාගේ තත්ත්වයක් තුළ ජාත්‍යන්තර සබඳතා තිබෙන, ඒ නීතිඥ සංගමයේ ප්‍රධානියෙකුට ලංකාවට ඇවිල්ලා අධිකරණ ඇමතිතුමා හමු වෙන්න අවස්ථාවක් නැති වනකොට, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමිය හමු වෙන්න අවස්ථාවක් නැති වනකොට අනිවාර්යයෙන් රටේ රාජ්‍ය පාලනය පිළිබඳව, ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව සහ අධිකරණයේ නිදහස පිළිබඳව බරපතළ ප්‍රශ්න ඇති වෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ස්ථාවර නියෝග අනුව ගරු විපක්ෂ නායකතුමා අමාත්‍ය මණ්ඩලයේ ඇමතිවරයකු - අධිකරණ ඇමතිවරයා කිව්වාම නමක් තිබෙනවා; එතුමා හර්ෂණ නානායක්කාර - ඉලක්ක කරගෙන ප්‍රකාශයක් කරන නිසා මම එතුමාගෙන් මේ කාරණය දැනගන්න කැමැතියි. ගරු විපක්ෂ නායකතුමනි, Commonwealth Lawyers Association කියන, ඔබතුමා ඔය refer කරන ආයතනය පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවල් - රටවල් පනස් ගණනක් තිබෙනවා, මගේ දැනීමේ හැටියට - විසින් පිළිගත් නීතිඥවරුන්ගේ සංගමයක්ද, එහෙම නැතිනම්, එය වෙනත් සංගමයක්ද, එහි සාමාජිකත්වය ගැනෙන්නේ කොහොමද පිළිබඳවත් යම් කිසි පැහැදිලි කිරීමක් කරන්න කියලා. මොකද, පොදු රාජ්‍ය මණ්ඩලයීය නීතිඥ සංගමය කිව්වාම සාමාන්‍යයෙන් රටට එන අදහස, හැඟීම වෙන්නේ, ඒ, රාජ්‍යයන් සියල්ලම පිළිගත් නීතිඥ සංගමයක්, ඒකට අපේ අධිකරණ ඇමතිතුමා වෙලාව දුන්නේ නැහැ කියන එක නේ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමාගේ කථාව තුළදී කරුණාකරලා ඒකත් පැහැදිලි කරන්න කියලා.

අපි ජාත්‍යන්තර සංවිධාන එක්ක ගනුදෙනු කරනවා. නමුත්, ගරු විපක්ෂ නායකතුමනි, මම දැන ගන්න කැමැතියි, ඒක පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවල්වලින් පිළිගත් පොදු රාජ්‍ය මණ්ඩලයීය නීතිඥවරුන්ගේ සංගමයක්ද කියලා. පොදු රාජ්‍ය මණ්ඩලයීය කථානායකවරුන්ගේ සංගමය තිබෙනවා. මේ, ඒ වාගේ එකක්ද, නැත්නම් වෙනස් එකක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අදහස් ඉදිරිපත් කිරීමට එතුමා ගත් කාලය එතුමාගේ පාර්ශ්වයෙන්ම අඩු කරන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔව්, ආණ්ඩු පාර්ශ්වයේ වෙලාවෙන් දුන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවල් සහ ක්‍රමවේද පිළිබඳ අංශු මාත්‍රයක දැනුමක් තිබෙනවා නම්, මේ ගැනත් දැනගන්න. Commonwealth Lawyers Association කියන්නේ, පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවල්වල නීතිඥවරුන් නියෝජනය කරන රාජ්‍ය තාන්ත්‍රික සමූහයක්. *[බාධා කිරීමක්]* ඔව්, ඒක අනිවාර්යයෙන්ම. Commonwealth Lawyers Association එක represent කරලා තමයි ඒ සභාපතිවරයා ඇත්ත වශයෙන්ම අපේ රටට පැමිණියේ. *[බාධා කිරීම්]* බාධා කරන්න එපා, පොඩ්ඩක් අහගෙන ඉන්න. බාධා කරන්න එපා. කරුණාකරලා අවස්ථාව ලබා දෙන්න. ඇත්ත වශයෙන්ම මම මේ කාරණාව කියන්නේ මෙතුමා අධිවේගී මාර්ග හදන එකට අපි කැමැති නිසායි. අධිවේගී මාර්ග හදන්න සල්ලි ඕනෑ, ආර්ථිකය වර්ධනය වෙන්නට ඕනෑ, ඒකට සෘජු විදේශ ආයෝජන එන්නට ඕනෑ. Commonwealth Lawyers Association එකේ President ලංකාවට ආවාම ඔහුට හමු වන්නට අවස්ථාවක් ලැබෙන්නේ නැත්නම් නරක පණිවුඩයක් යනවා, ආයෝජකයන්ට. මේක අවබෝධ කර ගන්න, මේක හඳුනා ගන්න.

ඒ නිසා විශේෂයෙන්ම මම මේ කාරණය කියන්න කැමැතියි. එතුමා බරපතළ කරුණු ගණනාවක් ඉදිරිපත් කළා. අපි දන්නවා, නීතිමය සංකල්පයක් තිබෙන බව, *nemo judex in causa sua* යනුවෙන්. ඒ කියන්නේ, තමන් පිළිබඳව තමන්ට වාඩි වෙලා නඩු අහන්නට බැහැ. ඒක කේසවානන්ද භාරතී නඩුවෙන් බොහොම පැහැදිලිව ප්‍රකාශ කරලා තිබෙනවා. එතැනදී අභිලාෂයන් අතර, ඒ පිළි අතර ගැටුමක් - conflict of interest - තිබෙනවා. එහෙම තිබෙන්නට බැහැ. ඒ නිසා ඇත්ත වශයෙන්ම full bench එකක් අවශ්‍යයි. ඒ විතරක් නොවෙයි, පත් කරන bench එක ජ්‍යෙෂ්ඨත්වය අනුව ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. ඒ විතරක් නොවෙයි, පිළිතුරු ලබා දීමේ අයිතිය - right to reply - තිබෙන්නට ඕනෑ. විශේෂයෙන්ම මේ විභාගයන් තුළ පිළිතුරු ලබා දීමේ අයිතිය තිබුණෙත් නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 වන ව්‍යවස්ථාව යටතේ, සමහර petitionsවලට සවන් දෙන්නටත් අවස්ථාව ලබා දුන්නෙත් නැහැ. ඒ නිසා විශේෂයෙන් මම කියනවා, සෘජු විදේශ ආයෝජන,-

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

Point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමිය?

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු විපක්ෂ නායකතුමා මේ අවස්ථාවේදී අධිකරණය විසින්,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

Standing Order number එක කියලා ඉන්න.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

ස්ථාවර නියෝග 83 යටතේ මම කියන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අධිකරණය සම්බන්ධයෙන්, විනිසුරුවරුන් සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුව තුළ කථා කරනවා නම්, Substantive Motion එකක් ගෙනැල්ලා තමයි කථා කරන්න පුළුවන්. *[බාධා කිරීම්]* Substantive Motion එකක් ගෙනෙන්න ඕනෑ. *[බාධා කිරීම්]* අහගෙන ඉන්නකෝ. Substantive Motion එකක් ගෙනැල්ලා කථා කරන්නට ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. *[බාධා කිරීම්]* එහෙම නැතිව මේ ආකාරයට විනිසුරුවන්ගේ ක්‍රියාකලාපය මෙතැන විවේචනයට ලක් කරන්න බැහැ. *[බාධා කිරීම්]* දිගින් දිගටම පාර්ලිමේන්තුව තුළ විශේෂයෙන් අග්‍ර විනිශ්චයකාරවරයා සහ Supreme Court එකේ අනෙක් විනිසුරුවරුන්ව මේ ආකාරයෙන් විවේචනයට ලක් කිරීම නවත්වන්නට ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ සම්බන්ධයෙන්,-

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ස්ථාවර නියෝග 83- *[බාධා කිරීමක්]* මේක Speakerගේ අවසරය ඇතිව කථා කරන්න පුළුවන්.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

But, the Speaker has not given any permission.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේක කියලා දෙන්න, කරුණාකරලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඕක point of Order එකක් නොවෙයි නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙතුමියට අවස්ථාව දිය යුතුයි. ඒ වාගේම මේ වනවර කථා කියන කට්ටිය එළියට දමන්න කටයුතු කරන්න. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ point of Order එක ඉදිරිපත් කරන්න.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
Madam, I will read out the relevant Standing Order.

"83(1) The personal conduct of the President, or the Acting President, Members of Parliament, Judges or other persons engaged in the administration of justice shall not be raised except upon a substantive motion;"

It states, "except upon a Substantive Motion". Madam Chair, the Leader of the Opposition is violating Parliamentary procedure to disrespect the Chief Justice and the Judges of the Supreme Court of Sri Lanka.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාරණය පැහැදිලියි.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
That should not be allowed; that should not be allowed in this Chamber. They are repeatedly doing this. So, that should not be allowed. - *[Interruption.]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Substantive Motion එකක් අවශ්‍ය බව තමයි ලේකම් මණ්ඩලය සඳහන් කරන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමා කථා කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමිය - සමාවෙන්න, ඇමතිතුමියද මන්ත්‍රීතුමියද කියලා දන්නේ නැහැ - පොට වරද්දාගෙන තිබෙන්නේ. මොකද, මම කථා කළේ නැහැ, අපේ රටේ ගරු විනිශ්චයකාරවරුන් පිළිබඳව. මම කථා කළේ, ස්ටීවන් තිරු මහත්මයා ගැන. මෙතුමිය පොට වරද්දාගෙන තිබෙන්නේ. මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වයට මරු පහරවල් එල්ල කරනවාට අපි කවදත් විරුද්ධයි. අපි මේ රටේ අධිකරණයට උපරිම ගරුත්වය ලබා දෙනවා.

මම කියන්නේ මේකයි. මෙතුමා ඉදි කරන්නට බලාපොරොත්තු වෙන අධිවේගී මාර්ගවලට මුදල් අවශ්‍යයි. ආර්ථික වර්ධන වේගය ඉහළ මට්ටමක තිබෙන්න ඕනෑ. ඒකට සෘජු විදේශ ආයෝජන අවශ්‍යයි. ඒ සඳහා සල්ලි අවශ්‍යයි. යහපත් රාජ්‍ය පාලනයක් රට තුළ ක්‍රියාත්මක වෙන්නේ නැහැයි කියලා, අධිකරණයේ ස්වාධීනත්වය නැහැයි කියලා මතයක් නිර්මාණය වෙනකොට අපේ රටට ආයෝජන එන්නේ නැහැ. ඒ කාරණාවයි මම මේ කියන්නේ. ඇයි, මෙච්චර කලබල වෙලා තිබෙන්නේ? අපට කථා කරන්න පොඩ්ඩක් අවස්ථාව දෙන්න.

ස්ටීවන් තිරු මැතිතුමා කියන විධියට court packing සිද්ධ වෙනවා කියලා, bench fixing සිද්ධ වෙනවා කියලා අදහසක් - impression එකක් - ගියොත්, ඒක රටට හොඳ නැහැ, ප්‍රජාතන්ත්‍රවාදයට හොඳ නැහැ. අධිකරණයේ ස්වාධීනත්වයට මරු පහරක් එල්ල කරනවාට අපි තරයේ විරුද්ධයි කියන එක මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. ඒ නිසා ස්ටීවන් තිරු මැතිතුමා හමුවෙලා, එතුමා එක්ක සංවාදයක් ඇති කරගෙන, එතුමාට වැරදි අවබෝධයක් ඇති නොවන ආකාරයට ගරු ඇමතිවරුන් අදහස් ඉදිරිපත් කළා නම් ලෝකයට හොඳ මතයක් යනවා. දැන් ලෝකයට ගිහිල්ලා තිබෙන්නේ නරක මතයක්. ලෝකයට ගිහිල්ලා තිබෙන්නේ *nemo judex in causa sua,* තමන් තමන්ගේම case එක වෙනුවෙන් වාඩි වෙනවා කියන එකයි. එහෙම හොඳ නැහැ. ඒ නිසා තමයි full bench එකක් පත් කරන්න ඕනෑ. ඒක තමයි ස්ටීවන් තිරු මහත්මයා කිව්වේ. ඒ වාගේම ජ්‍යෙෂ්ඨත්වය මත bench එක පත් කරන්න ඕනෑ. ඒක තමයි ස්ටීවන් තිරු මහත්මයා කිව්වේ. අන්න ඒ නිසා අපි අනිවාර්යයෙන්ම මේ අධිකරණ පද්ධතිය තුළ තිබෙන මූලධර්ම රකින්නට ඕනෑ. ඒ වාගේම *audi alteram partem,* අනෙක් side එක කියන දෙය අහන්න ඕනෑ. ඒක කරනවා කෙසේ වෙතත්, ව්‍යවස්ථාවේ 121වන ව්‍යවස්ථාව යටතේ නීත්‍යනුකූලව පෙත්සම් ඉදිරිපත් කරපු අයගේ ඒ පෙත්සම් කැඳෙව්වෙත් නැහැ. ඒ කරුණු ටික ඉදිරිපත් කරන ගමන්, පුදුම සහගත කාරණාවක් ගැනත් මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

වර්තමාන ජනාධිපතිවරයා විපක්ෂයේ ඉන්නකොට කිව්වා, සෞඛ්‍ය කියන්නේ මූලික අයිතියක්, ඒ මූලික අයිතිය ශක්තිමත් කරන්න ඕනෑ, ඉස්පිරිතාලයට ගියාම තමන්ට ඇඳක් දෙන්න අසමත් නම් ආණ්ඩුවට විරුද්ධව නඩු කියන්න පුළුවන් කියලා. එතුමාගේ වචනවලින්මයි මම මේ කියන්නේ. හැබැයි, දැන් එතුමා කියන්නේ මොකක්ද? එතුමා කියනවා, සෞඛ්‍ය සේවය වෙනස් කරනවා, හිතෙන හිතෙන වෙලාවට ඉස්පිරිතාලයට යන්න බැහැ, පොළට යනකොට ඉස්පිරිතාලයට යන්න බැහැ, හන්දියට ආවාම ඉස්පිරිතාලයට යන්න බැහැ කියලා. එහෙම කරන්නේ කොහොමද? සෞඛ්‍ය, මූලික අයිතිවාසිකමක් කියලා එතුමා විපක්ෂයේ ඉන්නකොට කිව්වා. දැන් කියනවා, හිතුමතේට ඉස්පිරිතාලයට යන්න බැහැ කියලා. මොකක්ද, මේක පිටුපස තිබෙන කාරණාව? සෞඛ්‍ය පද්ධතියේ බරපතළ කඩා වැටීමක් තිබෙනවා. අපේ රටේ බරපතළ ඖෂධ හිඟයක් තිබෙනවා. අපේ රටේ ඉස්පිරිතාලවල උපකරණ හිඟයක් තිබෙනවා. අපේ රටේ වැදගත් ශල්‍ය කර්මවලට පෝලිමේ ඉන්න සිද්ධ වෙනවා. අන්න ඒ නිසා තමන්ට වැඩ බැරි වන කොට එවැනි එක එක තීන්දු තීරණ රටට දෙන්නේ නැතිව, සෞඛ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳව රජයේ වගකීම තමයි විපක්ෂයේ ඉන්න කොට කියපු දේ ආණ්ඩු පක්ෂයට ආවාට පසුව ක්‍රියාත්මක කරන එක.

අද තරගයට අස්වැසුම ප්‍රතිලාභය කපනවා; පෝලිමට ගිහිල්ලා අස්වැසුම ප්‍රතිලාභය කපනවා. දුප්පත් ජනතාව අසරණභාවයට ලක් වෙලා. කුඹුරේ ඉඳගෙන ගොයම් කකා වී කිලෝවට රුපියල් 150ක් දෙනවා කිව්වා, ගොවි ජනතාවට. ඒක දැන් රුපියල් 120ට බැහැලා තිබෙනවා. ලාල් කාන්ත මැතිතුමා කියනවා, වී කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 137ක් වැය වෙනවා කියලා. බඩු මිල ඉහළ යනවා. ඒ අතරතුර කනගාටුදායක කාරණාව තමයි,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට නියමිත කාලය නම් අවසන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, මට වෙලාව ගන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විපක්ෂයට වෙන් කර තිබෙන වෙලාවෙන් තවත් විනාඩි 5ක් උපරිම වශයෙන් ලැබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොහොම ස්තුතියි.

අස්වැසුම ප්‍රතිලාභය කප්පාදු කරනවා. අස්වැසුම ප්‍රතිලාභ ටික සම්පූර්ණයෙන්ම ඉවත් කරනවා. වී ගොවියාට ලබා දෙනවා කියපු වී සඳහා වන රුපියල් 150ක ස්ථාවර මිල රුපියල් 120ට බැහැලා තිබෙනවා. ඇමතිතුමාම කියනවා, වී කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 137ක් යනවා කියලා. බඩු මිල අහස උසට යනවා. මෙවන් තත්ත්වයක් තුළ,- *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විනාඩියක් ඉන්න. Do not interrupt me, please; බාධා කරන්න එපා.

මේ තත්ත්වය තුළ ජනාධිපතිතුමා ක්‍රියාත්මක කරනවා, පව චාරිකාව. ඒ පව චාරිකාවේත් පව වරුසාවක් රටේ ජනතාවට ඉදිරිපත් කරනවා. එහෙම බොරු කියන්න එපා කියලා මම කියනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අධිකරණ ඇමතිතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
I will raise it very quickly. - *[Interruption.]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
දැන් කී පාරක් නම් interrupt කළාද.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු විපක්ෂ නායකතුමනි, මම ඔබතුමාගේ වෙලාව ගන්නේ නැහැ. ඉතාම කෙටියෙන් මේ පැහැදිලි කිරීම කරන්නම්. මොකද, සුපුරුදු පරිදි ඔබතුමා නොදන්නා දේවල් ගොඩක් අදත් කථා කළා. ඒ නිසා, ඒ ටික පැහැදිලි කරන්නයි මම මේ උත්සාහ කරන්නේ. ඔබතුමා Commonwealth Lawyers Association එක ගැන කථා කළා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, I rise to a point of Order.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Commonwealth Lawyers Association කියන්නේ නරක සංවිධානයක් කියලා මම කියන්නේ නැහැ. නමුත්, ඒක රාජ්‍ය තාන්ත්‍රික සංවිධානයක් නොවෙයි. *[බාධා කිරීමක්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට කථා කරන්න දෙන්නේ නැද්ද?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මගේ නම mention කළා. *[බාධා කිරීමක්]* මගේ නම mention කළා. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට වෙලාව ලබා දෙනවා, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මා එම නීතිඥ සංගමයේ ප්‍රධානියාට මුණගැසීමක් ලබා දුන්නේ නැහැ කිව්වා. මා කියන්නේ මේකයි. Commonwealth Lawyers Association කියලා කියන්නේ, නීතියෙන් පිළිගත්, පොදු රාජ්‍ය මණ්ඩලයේ රටවල් පිළිගත් එකක් නොවෙයි. නමුත්, fee-paying club එකක්. එහි membersලා මෙහේට ආවා. ඔවුන්ව මුණ ගැසෙන්න කිසි බාධාවක් නැහැ. අපි රාජ්‍ය තාන්ත්‍රිකව එය,- *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙතැන නිශ්ශබ්දතාව රැකලා ගරු ඇමතිතුමාට එතුමාගේ කරුණු පැහැදිලි කිරීම කරන්න ඉඩ දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මොකක්ද rule එක?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ඒ අය මුණගැසෙන්න අපි ඉඩ දුන්නේ නැහැ කියලා මගේ නම නේ කිව්වේ. මම point of Order එක ගත්තේ ඒකයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කී පාරක් නම් බාධා කළාද?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු විපක්ෂ නායකතුමනි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, Commonwealth Lawyers Association කියන්නේ පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවලින් නිල වශයෙන් පිළිගත් සංවිධානයක් නොවෙයි, පෞද්ගලික සාමාජිකයන් විසින් ගාස්තු ගෙවනු ලබන සංවිධානයක්. එහෙම වුණා කියලා ඒක නරකයි කියා මම කියන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට වෙලාව ලබා දෙනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

කෙසේ වෙතත්, ඒ අයත් මෙහේ ඇවිල්ලා යම් යම් ප්‍රකාශ කරලා ගියා. ඒ ප්‍රකාශ කොච්චර නිවැරදි ද කියලා අපි වෙනම බලන්නට ඕනෑ. මම පැහැදිලිව මේ කාරණය පෙන්වන්න ඕනෑ. හැම රටේම නියෝජිතයෙක් එහි ඉන්නවා. ඔවුන් සාධනීය වැඩ කොටස් රාශියක් කරනවා, ඒ Commonwealth එක තුළ. නමුත්, එය Commonwealth Secretariat එකේ ලියාපදිංචි එකක් නොව, පෞද්ගලික සාමාජික ගාස්තු ගෙවන කණ්ඩායමක්. හැබැයි, ඒ කට්ටිය වුණත්,- *[බාධා කිරීම්]* ලංකාවේ නියෝජිතයා උපුල් ජයසූරිය මහත්මයා. ඉතින්, මා කියන්න උත්සාහ කරන්නේ මෙයයි. ඒ නීතිඥ සංගමයේ ප්‍රධානියා මාව මුණගැසෙන්න අවස්ථාවක් ඉල්ලුවා. *[බාධා කිරීම්]* මම අවස්ථාවක් දුන්නා. නමුත්, එදින මම කොළඹ නැති නිසා ඔහුට එන්න බැහැ කිව්වා. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

සභාව නිහඬ වෙන්න.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ඒ නිසා කරුණාකර මේ Commonwealth Lawyers Association කියන එක පොදු රාජ්‍ය මණ්ඩලයේ රටවලින් නිල වශයෙන් පිළිගත් එකක් කියලා විතරක් කියන්න ලැහැස්ති වෙන්න එපා. *[බාධා කිරීම්]* එපමණයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ කාලය ලබා ගන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මට උදේ කථා කරන්න දුන්නේත් නැහැ, දැන් කථා කරන්න දෙන්නේත් නැහැ. මොකක්ද මේ?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ඔබතුමාට තවත් විනාඩි 3කුත් තත්පර 46ක කාලයක් තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම මේ කාරණාව කියන්නම්, ගරු හර්ෂණ නානායක්කාර මැතිතුමාට. ඔබතුමාට ලොකු ගරුත්වයක් අප තුළ තිබුණා. ඔබතුමා එදා උදේ වරුවේ ඇවිල්ලා කිව්වා, "එහෙම විසි දෙවන සංශෝධනයක් නැහැ" කියලා. නමුත් ටොකු ගණනාවක් ඇන්නාට පස්සේ හවස ඇවිල්ලා කිව්වා, "නැහැ, විසි දෙකක් එනවා" කියලා. *[බාධා කිරීම්]* එහෙම කියපු කෙනා තමයි Commonwealth Lawyers Association එක ගැන ප්‍රශ්න කරන්නේ. *[බාධා කිරීම්]* එහෙම නම් මම අභියෝගයක් කරනවා, Commonwealth Lawyers Association එක පිළිගන්නේ නැහැ කියලා රජයේ පාර්ශ්වයෙන් යෝජනාවක් ගෙනෙන්න කියලා. ගෙනෙන්න, එහෙම යෝජනාවක්. එතකොට ලෝකයට යනවා, පුදුමාකාර පණිවුඩයක්. *[බාධා කිරීම්]* නිකම් ඉන්න. මට කථා කරන්න ඉඩ දෙන්න. මම මේ කියන්න හදන්නේ බිමල් රත්නායක මැතිතුමා ආරම්භ කරන අධිවේගී මාර්ගය හදන්න සල්ලි හොයන විධියක්.

මම ඒක කියන්නයි හදන්නේ. ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, සෘජු විදේශ ආයෝජන අපේ රටට ආවේ නැත්නම්, අපේ රටේ ආර්ථිකය වර්ධනය වෙන්නේ නැහැ; අපේ රටේ ආර්ථිකය වර්ධනය වන්නේ නැත්නම්, රාජ්‍ය ආදායම ලැබෙන්නේ නැහැ; ආණ්ඩුවට සල්ලි ලැබෙන්නේ නැහැ; එතකොට ඔබතුමාට අධිවේගී මාර්ග හදන්න බැහැ. ඔබතුමා එය පිළිගන්න ඕනෑ. අධිකරණයේ ස්වාධීනත්වයට මරු පහරක් විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතින් එල්ල කරන කොට අනිවාර්යයෙන්ම ආයෝජකයෝ අපේ රටට එන්නේ නැහැ. ඒ භයයි අපට තිබෙන්නේ. ඔබතුමන්ලා අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්න. ඔබතුමන්ලාගේ හොඳටයි මේ කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මා අවසාන වශයෙන් කියන්නේ මෙයයි. මේ ඔක්කෝම වෙද්දී රට පුරාවටම පව වාරිකා ක්‍රියාත්මක කරන්න, පව වරුසාවක් රටේ ජනතාවට ලබා දෙන්න ඔබතුමන්ලා කටයුතු කරනවා. එදා රටේ ජනතාවට ඉදිරිපත් කළ, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන වැඩසටහන ජනාධිපතිවරණයට, මහ මැතිවරණයට, පළාත් පාලන මැතිවරණයට පෙර කරුණාකර බොරුවෙන් තොරව, රැවටීමෙන් තොරව, ඇන්දවිල්ලෙන් තොරව ක්‍රියාත්මක කරන්න කියලා මා විශේෂයෙන්ම කියනවා. ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, ඔබතුමා ක්‍රියාත්මක කරන්න සැලසුම් කරන අධිවේගී මාර්ග ව්‍යාපෘතියට අපේ සහයෝගයත් අනිවාර්යයෙන්ම ලබා දෙනවා, එය රටට හොඳක් වන නිසා. නමුත්, රටට ආදායමක් නොලැබෙන, රටේ ප්‍රජාතන්ත්‍රවාදයට මරු පහරක් එල්ල වන රටේ අධිකරණයේ නිදහස සහමුලින්ම ම්ලේච්ඡ ආකාරයෙන්, කුරිරු ආකාරයෙන්, මෘගාකාරයෙන් උල්ලංඝනය කරන හැම පියවරකින්ම වළකින්න. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ගෙන එන්නට ඔබට නෛතික අයිතියක් නැහැ. ඒක, null and void. මොකද, පනත් කෙටුම්පතට විරුද්ධව ඉදිරිපත් වුණු පෙත්සම් ගණනාවක පෙත්සම්කරුවන් විභාගයට නොකැඳවීම තුළ ඒ අයගේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදු වෙලා තිබෙනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව බලයට පත් වුණේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කරන්නට නොවෙයි, මානව අයිතිවාසිකම් සුරක්ෂා කරන්නටයි. ගරු ඇමතිතුමනි, අධිවේගී මාර්ග ඉදි කරන්නට ඔබතුමාට ධෛර්යය, ශක්තිය, වාසනාව ලැබේවා! අපටත් එයට ලබා දෙන්න පුළුවන් සක්‍රිය දායකත්වය ලබා දෙන්නට කටයුතු කරනවා කියන එක මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

ස්තුතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම තත්පර කිහිපයයි ගන්නේ. ගරු විපක්ෂ නායකතුමා මගේ නමත් කියපු නිසා මෙය කිව යුතුයි. හැබැයි, එතුමා ආදරයෙන් එම කාරණය කිව්වේ. එම නිසා මමත් ආදරයෙන්ම උත්තර දෙන්නයි යන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි අධිවේගී මාර්ගත් ආරක්ෂා කරගෙන, ආයෝජකයනුත් ආරක්ෂා කරගෙන, ජාත්‍යන්තර සබඳතාත් ආරක්ෂා කරගෙන, අපේ විපක්ෂ නායකතුමාත් ආරක්ෂා කරගෙන මේ ගමන යනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු සභානායකතුමනි, ඔබතුමා ආදරයෙන් මට ප්‍රතිචාර දක්වපු නිසා බොහොම ආදරයෙන්, දයාවෙන්, කරුණාවෙන් මමත් ඔබතුමාට කියා සිටිනවා, රටේ අධිකරණයට අත ගහන්න එපා කියලා. රටේ අධිකරණයේ ස්වාධීනත්වයට මරු පහරක් එල්ල කරන විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත වහා ඉවත් කර ගන්න. එය වහා ඉවත් කර ගන්න. ඒකයි මම ආදරයෙන් කියන්නේ.

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ස්ථාවර නියෝග 82(2)(ආ) යටතේ මම කියන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඉදිරිපත් කරන්න.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 82 (2) (ආ) ස්ථාවර නියෝගයේ සඳහන් වන පරිදි, විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු විසින් අපේ ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමියට ඉතාම අනුචිත, මේ ගරු සභාවට නොගැළපෙන ප්‍රකාශ සිදු කළා. මම ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර මේ ගරු සභාවේ එවැනි ප්‍රකාශ සිදු කරන්නට ඉඩ දෙන්න එපා කියලා. මෙතැන විපක්ෂයේ මන්ත්‍රීවරියන් දෙදෙනෙක් ඉන්නවා. මම එතුමියන්ලාගෙන් අහනවා, ඔබේ සහෝදර මන්ත්‍රීවරියකට එවැනි ප්‍රකාශ කරද්දී ඔබගේ ප්‍රතිචාරය කුමක්ද කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
එම වචන හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙස මා නියෝග කරනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ස්ථාවර නියෝග 92 (2) (ආ) යටතේ මම කියන්නේ.

අධිකරණ ඇමතිතුමා මේ සභාවේ කියලා තිබෙනවා, "කක්කුස්" කියලා වචනයක්. අධිකරණ ඇමතිතුමාට "කක්කුස්" කියන්න පුළුවන්. මම මේ නිකම්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කිව්වාම අයින් කරන්නේ ඇයි? එතුමාට කියන්න පුළුවන් නම් අපට කියන්න බැරි ඇයි?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 12.05]

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දවසේ විශේෂ කාරණය වන්නේ, මෝටර් වාහන පනත යටතේ ඉදිරිපත් කර තිබෙන, නීති ක්ෂේත්‍රයට අදාළ නියෝග අනුමත කිරීමයි. ප්‍රවාහන ක්ෂේත්‍රය ගත්තාම, එය එක පැත්තකින් ආරක්ෂාකාරී එකක් විය යුතුයි. ඒ කියන්නේ, මහ ජනතාවට ආරක්ෂාකාරී ලෙස ප්‍රවාහනයේ යෙදෙන්න ඕනෑ වපසරිය, ඒ පහසුකම් හැදෙන්න ඕනෑ. රජය ඒ වෙනුවෙන් අවශ්‍ය කරන ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙළක් සකස් කිරීමේ ක්‍රියාවලියක ඉන්නවා. ඒ සඳහා අවශ්‍ය කරන නීති රීති පද්ධති වැඩිදියුණු කරන්න ඕනෑ නම් අපි සෑම අවස්ථාවකම ඒ වෙනුවෙන් අවශ්‍ය නීති අලුතින් හඳුන්වා දෙන්නත්, ප්‍රවාහනයට අදාළ නීතිමය පදනම ශක්තිමත් කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නත් කටයුතු කරමින් සිටිනවා. එහි ප්‍රතිඵලයක් විධියට තමයි විශේෂයෙන්ම අධිවේගී මාර්ගවල ගමන් කිරීමේදී ආරක්ෂක ආසන පටි අනිවාර්ය කිරීම සහ මගී ප්‍රවාහනයේ යෙදෙන රථ වාහනවල කිලෝමීටර 5,000කට සැරයක් යෝග්‍යතාව පරීක්ෂා කිරීම අවශ්‍යයි කියන නීති දෙක අප සම්මත කර ගන්න යන්නේ.

ප්‍රවාහනය කියන්නේ, අපේ රටේ ආර්ථිකයටත්, ජනතාවටත් බලපාන දෙයක්. ආරක්ෂාව වාගේම කාර්යක්ෂම ප්‍රවාහන සේවයක අවශ්‍යතාව කියන්නේ, අපේ රටේ මහජනතාව දීර්ඝ කාලයක් තිස්සේ දවන ගැටලුවක්. කාර්යක්ෂම සහ ආරක්ෂාකාරී වුණත් අද ලෝකයට ගැළපෙන විධියට සුව පහසු ප්‍රවාහන මාධ්‍ය භාවිත කිරීමේ අයිතිය අපේ රටේ ජනතාවට තිබෙනවා. ඒ නිසා රජයක් - ආණ්ඩුවක් - විධියට ප්‍රතිපත්තිමය සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම්, වැඩ පිළිවෙළ හරහා සුව පහසු ප්‍රවාහන සේවයක් ජනතාවට ලබා දීමට අවශ්‍ය යැයි කියන ප්‍රතිපත්තියේ ඉඳලා, ඒ වුවමනාවේ ඉඳලා ඒ වෙනුවෙන් අයවැයෙනුත් අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරමින් යන මොහොතක් මේ තිබෙන්නේ. ආරක්ෂාකාරී, කාර්යක්ෂම, සුව පහසු සහ ලාභදායී කියන කාරණාත් අපි බලන්න ඕනෑ. මේ කාරණා ටික ඔක්කොම එකතු වුණාම තමයි රටක ප්‍රවාහනය මහජනතාවට සුවදායක, එහෙම නැත්නම් මහජනතාවගේ ජීවිතය වඩ වඩාත් යහපත් පැත්තට පරිවර්තනය කරන්නක් බවට පත් වෙන්නේ. නමුත් අපේ රටේ විවිධ ප්‍රදේශවල විෂමතා ගොඩක් තිබෙනවා. විශේෂයෙන් මාර්ග පද්ධතියේ යටිතල පහසුකම්වල. ඒ වාගේම අපි භාවිත කරන පොදු ප්‍රවාහන ඇණියේ - අපේ රජයේ පොදු රථ වාහනවල - සහ පෞද්ගලික අංශය විසින් පොදු ප්‍රවාහනයට යොදවා තිබෙන වාහනවල සුව පහසුව පිළිබඳව අපට ප්‍රශ්න තිබෙනවා. ඒවායේ නඩත්තුව පිළිබඳවත් ප්‍රශ්න තිබෙනවා.

අපි පිළිගන්නවා, පසුගිය වසර දෙක ඇතුළත දුම්රිය, බස් රථ ඇතුළු පොදු ප්‍රවාහනය සංවර්ධනය කිරීම වෙනුවෙන් ප්‍රවාහන අමාත්‍යාංශය විධියටත්, ආණ්ඩුවක් විධියටත් විශාල කාර්යභාරයක් කරමින් ඉන්නවා කියලා. මේ කටයුතු සම්බන්ධීකරණ සඳහා සියලු දිස්ත්‍රික්කවල ඉන්නවා, ප්‍රවාහන අමාත්‍යාංශයට අදාළ මන්ත්‍රීවරයෙක්. අපි දිස්ත්‍රික්ක තුළ ප්‍රවාහන අනුකමිටු හදලා තිබෙනවා. ඒ සියලුදෙනා එකතුවෙලා ප්‍රතිපත්තිමය සහ ප්‍රායෝගික වෙනස්කම් සිදු කර ගැනීම සඳහා අවශ්‍ය මෙහෙයවීම, වැඩ පිළිවෙළ සකස් කිරීම සඳහා අවශ්‍ය කැපවීම කරමින් ඉන්නවා. වසර දෙකක් තුළ අපි ඉදිරි ගමනක් ඇවිල්ලා තිබෙනවා. හැබැයි අපේ වුවමනාව වෙලා තිබෙන්නේ, අපේ රටේ ජනතාවට ගුණාත්මක ප්‍රවාහන සේවයක් ලබා දෙන්නත් ඒ හරහා රටේ ජාතික ආර්ථිකයට අවශ්‍ය ජවය ලබා දෙන්නත්. ඒක තමයි ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අපට තිබෙන අදහස සහ දැක්ම වෙන්නේ. අනෙකුත් දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වෙන විවිධ වැඩසටහන් ගැන අපේ මන්ත්‍රීවරු කථා කරයි. මම මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන නිසා මහනුවර දිස්ත්‍රික්කයත්, ප්‍රධාන වශයෙන් මහනුවර නගරය කේන්ද්‍රගත කරගෙන දැනට ක්‍රියාත්මක වෙන ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළ වෙනස්කම් සහ අපි යන්න බලාපොරොත්තු වෙන දිශානතිය සම්බන්ධයෙන් යම් අදහසක් මේ ගරු සභාවට ඉදිරිපත් කළොත් හොඳයි කියලා හිතනවා.

මහනුවර දිස්ත්‍රික්කය වාගේම මහනුවර නගරය කියන්නේ, කාර්යබහුල නගරයක්. දීර්ඝ කාලයක් තිස්සේ තිබෙන රථ වාහන තදබදය වාගේම, රථ වාහනයක් park කරගන්න තිබෙන අපහසුතාව ඇතුළු පොදු ප්‍රවාහනයේ තිබෙන ගැටලුවලින් පීඩාවට පත්වෙච්ච ජනතාවක් ඉන්න ප්‍රදේශයක් තමයි මහනුවර කියන්නේ. ඒ දිස්ත්‍රික්කය ගත්තොත්, නාගරික, අර්ධ නාගරික, ග්‍රාමීය කියන සියලු විවිධත්ව, විෂමතා සහිත දිස්ත්‍රික්කයක්. ඒක නිසා යටිතල පහසුකම්වල ඉඳලාම මේ සේවාවල විවිධ පරිමාණයේ ගැටලු මහනුවර දිස්ත්‍රික්කය තුළ තිබෙනවා. ඒවා ඉවත් කර ගැනීම සඳහා අවශ්‍ය මූලික වැඩ කටයුතු අපි කරමින් සිටිනවා. අපි දැකපු මූලිකම දෙයක් තමයි අවිධිමත් ලෙස - සැලසුම්සහගත නොවී - ජනතාවට ප්‍රතිලාභයක් නොලැබෙන ලෙස මේ සංවර්ධන වැඩසටහන් පෙළ ගස්වා තිබීම. යම් යම් කාලවල යම් යම් දේශපාලන බලපෑම් මත ඇතැම් ව්‍යාපෘති ඉදිරියට ගිහින් තිබෙනවා; ඇතැම් ව්‍යාපෘති ආපස්සට ගිහින් තිබෙනවා; ඇතැම් ව්‍යාපෘති ආරම්භ කරලාම නැහැ. JICA එක වැනි ජාත්‍යන්තර ආයතන එක්ක, UDA එක එක්ක එකතු වෙලා විවිධ පරීක්ෂණ සහ විවිධ සංකල්ප හදලා තිබෙනවා, සැලසුම් හදලා තිබෙනවා. නමුත්, මේ ඔක්කොම එකට එකතු කරගෙන ගන්න ඕනෑ විසඳුමක් සම්බන්ධයෙන් පොදු වැඩ පිළිවෙළක් තිබිලා නැහැ. ඒවා ක්‍රියාත්මක කරගන්න ඕනෑ කියන අදහසක් තිබිලා නැහැ. ඒ විධියට ආපු ඇතැම් ව්‍යාපෘති නතර වෙලා තිබුණා. අත්‍යවශ්‍යයෙන්ම කරගත යුතු ඇතැම් ව්‍යාපෘති පටන් ගන්නේ නැතුව තිබුණා. ඒ නිසා අතරමඟ නතර වෙලා තිබුණු ගැටඹේ ගුවන් පාලමේ කටයුතු මේ වෙනකොට අපි ආරම්භ කර තිබෙනවා. ඒක ඉතාම ඉක්මනින් අවසන් කර ගැනීම තමයි අපේ අරමුණ වෙලා තිබෙන්නේ. ඒ වගේම තමයි මහයියාව උමඟ. ඒ, අධික රථවාහන තදබදයක් තිබෙන තැනක්. මහයියාව අනෙක් උමඟේ වැඩ කටයුතු අපි දැන් ආරම්භ කරලා තිබෙනවා.

ඒ වාගේම විලියම් ගොපල්ලව මාවත දීර්ඝ කාලයක් තිස්සේ මංතීරු හතරකට සැලසුම් කරලා තිබුණාට මංතීරු හතරකට ගෙනැල්ලා තිබුණේ නැහැ, මහනුවර දුම්රිය ස්ථානය දක්වා. අපි මේ වෙනකොට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීලා ඒ කොන්ත්‍රාත් පිරිනමලා විලියම් ගොපල්ලව මාවත මංතීරු හතරක් දක්වා පරිවර්තනය කරමින් යනවා.

ඒ වාගේම ධර්මරාජ විද්‍යාලය සහ වැව රවුම සම්බන්ධ කරන ලූවි පීරිස් මාවත ඉතාම පටු මාර්ගයක් විධියට තිබුණේ. එම මාර්ගය වැව රවුමට සම්බන්ධ වෙන තැන කිසිම පහසුවක් තිබුණේ නැහැ. විද්‍යානුකූලව ගත්තොත්, රථවාහන හසුරුවා ගැනීමේ හැකියාව අඩු තැනකින් තමයි මාර්ගයට ප්‍රවේශ වුණේ. හරි මංසන්ධියක් තිබුණේ නැහැ. ඒ නිසා නිසි ලෙස අම්පිටිය පැත්තත් සම්බන්ධ කරමින්, මංසන්ධියකුත් නිර්මාණය කරමින් ඒ මාර්ගය ද්විත්ව මාර්ගයක් විධියට පුළුල් කරනවා.

මහියංගනය මාර්ගයේ තැන්නේකුඹුර සහ එතැනින් එහාට අවශ්‍ය පුළුල් කිරීම් ටික කරගැනීමේ සැලසුම් සකස් කරලා තිබෙනවා. ඒ වාගේම අධිවේගී මාර්ගය ගලගෙදරට ආවාට පස්සේ ගලගෙදර කටුගස්තොට දක්වා දැනට තිබෙන මාර්ගය මංතීරු හතරක් දක්වා පුළුල් කිරීම කරගෙන යනවා.

අපි පසුගිය අයවැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම මේ අය වැයනුත්, ඉදිරි අය වැයවලිනුත් මුදල් වෙන් කරන්න සැලසුම් කරලා තිබෙනවා, මහනුවර නගරයට තිබෙන ප්‍රවේශ මාර්ග සියල්ලම සම්මත ද්විත්ව මාර්ග හෝ ඒ ආශ්‍රිත ගුණාත්මක ප්‍රමිතිගත මාර්ග පද්ධතියක් බවට පරිවර්තනය කිරීම සඳහා. අපි ඒ සියලු වැඩසටහන් ආරම්භ කරලා තිබෙනවා. මෙකේ විශේෂම දේ තමයි මහනුවර නගර මධ්‍යයේ ගොඩ නැඟෙන මහනුවර බහුමාධ්‍ය ප්‍රවාහන පර්යන්තය - KMTT ව්‍යාපෘතිය. දැන් ඒ ගොඩනැඟිල්ලේ වැඩ ගොඩක් ඉවර වෙලා තිබෙන්නේ. මේක ලංකාවේ කොහේවත් පාවිච්චි කරලා නැති, අත්දැකලා නැති ව්‍යාපෘතියක්. KMTT ව්‍යාපෘතියේ විශේෂත්වය තමයි ගොඩනැඟිල්ලේ ප්‍රවේශය හැම ක්ෂේත්‍රයටම තිබීම. දුම්රිය ස්ථානයට තිබෙනවා, උඩ පේරාදෙණිය පාරට තිබෙනවා, විලියම් ගොපල්ලව මාවතට තිබෙනවා, මහනුවර මහ රෝහලට තිබෙනවා. ඒවා ගුවන් මාර්ගයකින් සම්බන්ධ වෙනවා.

මෙහි තවත් ප්‍රධානම දෙයක් තිබෙනවා. මේ වෙනකොට නගරයේ ස්ථාන හතක විතර තමයි බස් රථ නවත්වලා තිබෙන්නේ. ගමනාන්ත පැත්තෙන් ගත්තොත්, දවසකට මහනුවර නගරයට බස් ගමනාන්ත 5,000ක් විතර තිබෙනවා. මේ ඔක්කොම නගරය මැදට ඇවිත් තමයි නතර වෙන්නේ. ඒක තමයි අපි දකින මූලිකම අර්බුදය. එම නිසා ඒ ආයතන එක්කත් කථා කරලා rerouting ව්‍යාපෘතියක් යනවා, මේ KMTT එකත් එක්ක. එතකොට නගරය මැද නවත්වන්නේ නැතිව අන්ත දෙකක බස් රථ මාර්ග reroute කරන්න, සම්බන්ධ කරන්න සැලසුම් කරලා තිබෙනවා. එතකොට නගරයේ මැද නතර කරන්නේ නැතිව KMTT පහසුකම යටතේ ඒ ගොඩනැඟිල්ලත් පාවිච්චි කරලා අනෙක් අන්තයට යන්න පුළුවන්. අන්ත දෙකක් එකතු කරන්න ඕනෑ. මේ සඳහා අවශ්‍ය මූලික ක්‍රියාවලිය ආරම්භ වෙලා තිබෙනවා. KMTT වලින් විතරක් මහනුවර නගරයේ සියලු ප්‍රශ්න විසඳෙන්නේ නැති වෙයි. ඒක නිසා පේරාදෙණිය, කටුගස්තොට සහ තැන්නේකුඹුර ප්‍රදේශවලට satellite bus stations ගේන්න ඕනෑ කියන තැන අපි ඉන්නවා. ඒත් එක්කම අපි නගරයට මෙට්‍රෝ බස් පද්ධතිය හඳුන්වලා දීලා විධිමත් ආකාරයකට, ඒ කියන්නේ වාහන ගෙදර තියලා හෝ යම් Park and Ride ස්ථානයක තියලා පොදු ප්‍රවාහනයට ප්‍රවේශ වෙන්න පුළුවන් විධියට මහනුවර ප්‍රවාහන පද්ධතිය ප්‍රතිසැලසුම්ගත කිරීමේ වැඩ කටයුතුවල ඉන්නේ. රටේම ප්‍රවාහන පද්ධතිය වෙනස් කරමින් මහජනතාවට වඩා හොඳ සේවයක් සැලසෙන ප්‍රවාහන පද්ධතියක් ලබා දෙමින් පවතින අවස්ථාවක මහනුවර දිස්ත්‍රික්කයත් ඒ සැලසුම් එක්ක ඉදිරි ගමනක් යමින් ඉන්නවා. මෙම කාරණා ගැන අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 12.15]

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

நன்றி, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே!

இன்றைய தினம் மோட்டார் வாகனச் சட்டத்தின்கீழான இரண்டு ஒழுங்குவிதிகள் தொடர்பாக இங்கு பேசப்படுகிறது. மிகவும் நல்ல விடயங்கள் இந்த ஒழுங்குவிதிகளில் கொண்டு வரப்பட்டிருக்கின்றன; இந்த இரண்டு ஒழுங்குவிதிகளையும் நாங்கள் வரவேற்கின்றோம். எங்களுடைய நாட்டில் ஒரு வருடத்தில் கிட்டத்தட்ட 2,500 இறப்புகள் வீதி விபத்து களினால் ஏற்படுகின்றன. இந்த எண்ணிக்கை இலங்கையில் ஏற்படும் மொத்த இறப்புகளில் கிட்டத்தட்ட 2 சதவீதமாகும். இந்த வீதி விபத்துகளினால் இறக்கின்றவர்களில் கிட்டத்தட்ட 40-45 சதவீதமானவர்கள் சிறுவர்களும் முதியவர்களுமாக இருக்கிறார்கள். மிகுதியான 55 சதவீதமானவர்கள் இந்த நாட்டினுடைய பொருளாதாரத்தை மேம்படுத்தக்கூடிய இடைத்தர வயதினராகவும் வயது குறைந்தவர்களாகவும் இருக்கிறார்கள். ஆகவே, எங்களுடைய நாட்டின் பொருளாதாரத்தில் இந்த வீதி விபத்துக்கள் பாரிய தாக்கத்தை ஏற்படுத்துகிறது என்பதில் எந்தவித சந்தேகமும் இல்லை.

இலங்கையில் ஒரு வருடத்தில் சராசரியாக 8,000 தொடக்கம் 10,000 வீதி விபத்துக்கள் நடைபெறுவதாகச் சொல்லப்படுகிறது. இந்த வீதி விபத்துகளைப் பார்க்கும்போது, குறிப்பாக பாதசாரிகளும், இருசக்கர வாகனங்களில் பயணிப்பவர்களுமே அதிகம் பாதிக்கப்படுவதைக் காணக் கூடியதாக இருக்கின்றது. 2021ஆம் ஆண்டின் தரவுகளின்படி, வீதி விபத்து மரணங்களில் பாதசாரிகள் 27 சதவீதமும், இருசக்கர வாகன ஓட்டிகள் 43 சதவீதமாகவும் உள்ளனர். அவ்வாறு இறப்பவர்களில் கிட்டத்தட்ட 75 சதவீதமானவர்கள் சுறுசுறுப்பாக இயங்கி நாட்டினுடைய பொருளாதாரத்தை மேம்படுத்தக்கூடிய வயதினராக இருக்கிறார்கள். இந்த விபத்துகளால் ஏற்படும் இறப்புகள் மற்றும் மிகக் கடுமையான காயங்களுக்கு உட்பட்டவர்களுடைய வைத்தியச் சிகிச்சைக் காக, 2021ஆம் ஆண்டு 3 பில்லியன் அமெரிக்க டொலர்கள் செலவு செய்யப்பட்டிருக்கின்றது. இந்த 3 பில்லியன் அமெரிக்க டொலர் என்பது, எங்களுடைய நாட்டின் GDPஇல் 3.1 சதவீதம். அதேவேளை, 2022ஆம் ஆண்டில் நாட்டின் சுகாதார சேவைகளுக்காக ஒதுக்கப்பட்ட மொத்த நிதி GDPஇன் 4.1 சதவீதம். அதாவது, மொத்த நிதி ஒதுக்கீட்டின் 3.1 சதவீதம் வீதி விபத்துக்களின் சிகிச்சைச் செலவாக ஏற்பட்டு இருக்கின்றது. எனவே, எங்களுடைய பொருளாதாரத்தின் பெரும்பகுதி இவ்வாறு வீதி விபத்துக்கள் ஏற்படுவதால் செலவாகின்றது. ஆகவே, வீதி விபத்துக் களைத் தடுப்பதற்காக கௌரவ போக்குவரத்து அமைச்சர் அவர்களால் முன்மொழியப்பட்ட ஒழுங்குவிதிகளை நான் வரவேற்கின்றேன்.

வீதி விபத்துக்கள் ஏற்படுவதற்குப் பல காரணங்கள் சொல்லப்பட்டாலும், எமது நாட்டில் பொதுப் போக்குவரத்து வசதிகள் மேம்படுத்தப்படாமல் இருப்பது அல்லது பொதுப் போக்குவரத்து வசதிகளால் மக்களுடைய தேவைகளை ஈடுசெய்ய முடியாமல் இருப்பதுதான் அதற்கு முக்கியமான ஒரு காரணமாக இருக்கிறது. 2022ஆம் ஆண்டின் புள்ளிவிபரத் தரவுகளின்படி, கிட்டத்தட்ட 1,000 பேருக்கு 400 பதிவு செய்யப்பட்ட வாகனங்கள் இருப்பதாக அறிய முடிகிறது. தற்பொழுது புதிய வாகனங்கள் இறக்குமதி செய்யப்பட்ட பின்னர் நிச்சயமாக 1,000 பேருக்கு 600 முதல் 700 வரையான வாகனங்கள் இருக்கலாம். ஆகவே, பொதுப் போக்குவரத்தைச் செம்மையாக்குவதன்மூலமாக, மக்கள் அவற்றைப் பயன் படுத்தும்போது, roadஇல் தனியார் வாகனங்களின் எண்ணிக்கையைக் குறைக்கக்கூடியதாக இருக்கும் என்பதை இந்தச் சந்தர்ப்பத்தில் நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன். எங்களுடைய நாட்டில் இந்த வருடத்தின் முதல் எட்டு மாதங்களில் 1,600க்கும் மேற்பட்ட மக்கள் வீதி விபத்துக் களால் இறந்திருக்கிறார்கள். இந்த இழப்பு, இந்த வருடம் இலங்கையில் டெங்கு நோயால் இறந்தவர்களின் எண்ணிக்கையோடு ஒப்பிட்டுப் பார்க்கும்பொழுது, 30 சதவீதம்

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

அதிகமாகும். ஆகவே, இந்த விடயங்களை உன்னிப்பாக அவதானித்து, இந்தச் சட்டங்களில் மாற்றங்களைக் கொண்டு வர வேண்டியது மிகவும் அவசியமான தேவையாக இருக்கிறது.

அதேபோல், இன்றைய தினம் கொண்டுவரப்படுகின்ற மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் ஒன்றின்மூலம், seat belts - ஆசனப்பட்டி அணிவது கட்டாயமாக்கப்படுகிறது. இந்த மாதம் 19 ஆம் திகதிவரை அவற்றைப் பொருத்துவதற்குப் போதிய கால அவகாசம் கொடுக்கப்பட்டு இருக்கிறது. கிட்டத்தட்ட ஒரு வருட கால அவகாசம் கொடுக்கப்பட்டிருந்தது. குறிப்பாக, அதிவேக நெடுஞ்சாலைகளில் பயணிக்கின்ற அனைவரும் ஆசனப்பட்டி அணிய வேண்டுமென்று அறிவுறுத்தப்பட்டு இருக்கிறது. ஆனால், சென்ற கிழமை நான் வவுனியாவில் இருந்து busஇல் வரும்பொழுது, அதிவேக நெடுஞ்சாலைகளில் பயணிக்கின்ற அந்த busஇலே standing passengers - நின்று பயணிப்பவர்களும் இருந்தார்கள். ஆசனத்தில் இருக்கின்றவர்கள் ஆசனப்பட்டி அணிய வேண்டும் என்று நாங்கள் பேசிக்கொண்டு இருக்கின்றோம். ஆனால், அதிவேக நெடுஞ்சாலைகளில் இரவு வேளைகளில் பஸ்சில் பயணிக்கும்பொழுது என்ன செய்கிறார்கள் என்றால், வெளியில் தெரியாமல் இருப்பதற்காக busஇற்குள் இருக்கும் lights எல்லாவற்றையும் off பண்ணிவிட்டு, மக்களை நின்றுகொண்டு பயணிக்க அனுமதிக் கின்றார்கள். நின்று வருபவர்கள் எவ்வாறு ஆசனப்பட்டியை அணிவது? இதனை உடனடியாகச் check பண்ணி உரிய நடவடிக்கை எடுக்க வேண்டும். அதேபோல, நண்பர் ஒருவர் எனக்குச் சொன்னார்; நெடுஞ்சாலைகளில் தூர இடங்களுக்குப் பயணிக்கின்ற AC busகளில் உள்ள ஆசனங்களுக்கு மேலதிகமாக standing passengersஐ ஏற்றுகிறார்கள் என்று. உதாரணத்துக்கு, standing passengersஐ check பண்ணுகின்ற inspectors roadஇல் நிற்கின்றார்கள் என்ற தகவல் அவர்களுக்கு வரும்பொழுது, பயணிகளை busஇல் இருந்து இறக்கி, ஓட்டோ ஒன்றை hire பண்ணி அதில் அனுப்பி, இன்ன இடத்தில் நில்லுங்கோ, நாங்கள் வந்து ஏற்றுகின்றோம் என்று சொல்லி, checking முடிந்த பிறகு திரும்பவும் இந்த standing passengers ஏற்றிக்கொண்டு போகின்றார்கள். இந்த நிலைமை மாற வேண்டும்; இதற்கு மிகவும் இறுக்கமான நடவடிக்கைகளை எடுக்க வேண்டும்.

நான் ஏற்கனவே சொன்னதுபோல, வீதி விபத்துக்களில் இருசக்கர வாகனங்கள் முக்கியமாகப் பாதிக்கப்படுகின்றன. இலங்கையில் இருசக்கர வாகனங்களை ஓட்டுவதற்கான சாரதி அனுமதிப் பத்திரம் எப்படி வழங்கப்படுகிறது என்றால், ஒரு '8' போட்டுக் காட்டினால் சரி! அவர்கள் roadஇல் ஓடி trial காட்டத் தேவையில்லை. '8' போட்டு, trial காட்டி, ஓட்டுநர் உரிமத்துடன் வீதிக்கு வருபவர்கள்தான் இந்த accidentஆல் பாதிக்கப்படுகிறார்கள். உண்மையில், இருசக்கர வாகனங் களுக்கான ஓட்டுநர் உரிமத்தைப் பெற்றுக் கொள்வதற்கு, examinerக்கு வீதியில் வாகனங்களை ஓட்டிக் காட்டவேண்டும். அப்படி இல்லாமல், அவர்கள் '8' போட்டுக் காட்டினால் அவர்களுக்கு licence கொடுக்கலாம் என்றால், இரு சக்கர வாகனங்களால் ஏற்படுகின்ற வீதி விபத்துகளைக் குறைக்க முடியாது.

குறிப்பாக, இரவு நேரத்திலே பயணிக்கின்ற உழவு இயந்திரங்கள், Landmasters போன்றவற்றிலே பின்பக்கத்திலே ஒளிரக்கூடிய reflectors இல்லை; அது கட்டாயமாக்கப்பட வேண்டும். ஏனென்றால், இரவில் வாகனங்களில் செல்லும்போது tractors, two-wheelersஇற்குக் கிட்டப் போனபிறகுதான் முன்னால் ஒரு வாகனம் போகின்றது என்பதை அறியக்கூடியதாக இருக்கின்றது. ஆகவே, ஒளிரக்கூடிய reflectors பொருத்துவது சட்டமாக்கப்பட வேண்டும். குறிப்பாக, இந்த உழவு இயந்திரங்களிலும் Landmastersஇற்கும் கட்டாயம் reflectors பொருத்தப்பட வேண்டுமென்று சட்டமாக்கப்பட்டால் பல விபத்துகளை விவசாயம் மேற்கொள்ளும் எங்களுடைய மாவட்டங்களில் - பிரதேசங்களில் - தடுக்கக்கூடியதாக இருக்கும்.

அடுத்து, இந்த மாதத்திலே நடைபெறுகின்ற முக்கியமான ஒரு விடயம் தொடர்பாகவும் இந்த சபையிலே குறிப்பிடலா மென்று நினைக்கின்றேன். அதாவது, ஐக்கிய நாடுகள் மனித உரிமைகள் பேரவையின் 63ஆவது கூட்டத்தொடர் நேற்று ஆரம்பமாகியிருக்கின்றது. இது ஒரு மாதம் - அடுத்த மாதம் 7ஆம் திகதி வரை - ஜெனீவாவிலே நடைபெறவிருக்கின்றது. இந்தப் பேரவையினால், இலங்கையில் நிகழ்ந்த மனித குலத்திற்கு எதிரான குற்றங்கள், மனித உரிமை மீறல்கள் தொடர்பான அறிக்கை வெளியிடப்பட்டிருக்கின்றது. அந்த அறிக்கையை நாங்கள் வரவேற்கின்றோம். அதில் குறிப்பாக, "இலங்கை அரசாங்கத்தால் நடைமுறைப்படுத்த ஒப்புக் கொள்ளப்பட்ட பல விடயங்கள், எங்களுடைய நாட்டிலே உள்நாட்டுப் போர் முடிவடைந்து 17 வருடங்கள் நிறைவடைந்தும் நடைமுறைக்கு வரவில்லை" என்ற குற்றச்சாட்டுச் சொல்லப்பட்டிருக்கிறது.

குறிப்பாக, பயங்கரவாதத் தடைச் சட்டத்தை நீக்குதல், காணிகளை விடுவித்தல், அரசியல் கைதிகளின் விடுதலை, வலிந்து காணாமல் ஆக்கப்பட்டோருக்கான தீர்வு, மாகாண சபைத் தேர்தல் நடத்துவது போன்ற பல விடயங்கள் இன்னும் செய்யப்படாமல் இருக்கின்றன என்பதை அந்த அறிக்கையிலும் சுட்டிக்காட்டியிருக்கிறார்கள். அதற்கப்பால், ஜனாதிபதித் தேர்தல், பொதுத் தேர்தலின்போது உங்களுடைய தேர்தல் விஞ்ஞாபனங்களிலே, "நாங்கள் ஆட்சிக்கு வந்து உடனடியாக இந்த விடயங்களுக்குத் தீர்வு காண்போம்" என்று உத்தரவாதம் கொடுத்திருந்தீர்கள். ஆகவே, உங்களுடைய தேர்தல் விஞ்ஞாபனத்தை நடைமுறைக்குக் கொண்டுவர வேண்டிய பாரிய பொறுப்பு உங்களுக்கு இருக்கின்றது. அந்த வகையிலே, நீங்கள் இந்த விடயங்களிலே கூடுதல் கவனம் செலுத்தவேண்டும் என்று கேட்டுக்கொள்வதுடன், இந்த விடயங்களிலே நீங்கள் இதுவரை கவனம் செலுத் தாமையையிட்டு என்னுடைய அதிருப்தியையும் இந்தச் சந்தர்ப்பத்திலே தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

அதேபோல, நீங்கள் நாளைக்கு பாதுகாப்பு பணியாட் டொகுதியினரின் தலைமையதிகாரி (நீக்கல்) சட்டமூலத்தை இரண்டாம் மதிப்பீட்டுக்காகக் கொண்டுவர இருக்கின்றீர்கள். பாதுகாப்பு பணியாட்டொகுதியினரின் தலைமையதிகாரி சட்டத்தை 2009ஆம் ஆண்டு கொண்டுவந்ததற்கான காரணம், முப்படைகளையும் இணைத்து நடவடிக்கைகளை மேற் கொள்வதாகும். நீங்கள் குறித்த சட்டத்தை நீக்குவதற்கான சட்டமூலத்தைக் கொண்டுவருவதை நாங்கள் வரவேற் கின்றோம். அது இந்த நாட்டுக்குத் தேவையில்லாத ஒன்று. அந்தச் சட்டத்தை ஏன் இல்லாமல் செய்கிறீர்கள் என்பதற்கு, பாதுகாப்புச் செலவினங்களைக் குறைத்து எங்களுடைய நாட்டின் ஏனைய அபிவிருத்தி நடவடிக்கைகளுக்கு அந்த நிதியைப் பயன்படுத்துவதற்காக என்று உங்களால் விளக்கம் கொடுக்கப்பட்டுள்ளது.

இங்கு முக்கியமான பிரச்சினை நிதி மாத்திரமல்ல; எங்களுடைய நாட்டின் பாதுகாப்பை உறுதிப்படுத்துவதற்கு இந்தச் சட்டம் அவசியமில்லையென்று நீங்கள் கருதுவதாக

நான் நினைக்கின்றேன். அதாவது, எங்களுடைய நாட்டினுடைய பொதுப் பாதுகாப்பு இப்போது சீராக இருக்கிறது என்ற கருதுகோளின் அடிப்படையில்தான் இந்தப் பாதுகாப்பு பணியாட்டொகுதியினரின் தலைமையதிகாரி என்ற பதவியையும் அந்த அலுவலகத்தையும் நாளைய சட்ட மூலத்தினூடாக அகற்றுவதற்கு நீங்கள் முன்வந்திருக்கிறீர்கள். இது மிகவும் நல்ல விஷயம். அப்படியாக இந்த நாட்டினுடைய பாதுகாப்பு உறுதிப்படுத்தப்படுமாக இருந்தால், நீங்கள் உங்களுடைய தேர்தல் விஞ்ஞாபனத்திலே குறிப்பிட்டதன் பிரகாரம், மிகவும் மோசமான, மிகவும் பயங்கரமான, மனித குலத்துக்கு எதிரான குற்றங்களைச் செய்வதற்கு உறுதுணை யாக இருக்கின்ற பயங்கரவாதத் தடைச் சட்டத்தை, நீங்கள் ஆட்சிக்கு வந்து இந்த இரண்டு வருடங்களில் ஏன் நீக்காமல் அல்லது இன்றுவரை அதைப் பற்றி பேசாமல் இருக்கிறீர்கள்? என்ற கேள்வியை நான் இங்கு கேட்கின்றேன். ஆகவே, இந்தப் பிரதானி பதவியை நீக்குவது மாத்திரமல்லாமல், எங்களுடைய நாட்டின் பாதுகாப்பு உறுதிப்படுத்தப்பட்டிருக்கின்றது என்று கருதுகின்ற நீங்கள், தயவுசெய்து மிகவும் மோசமான இந்தப் பயங்கரவாத தடைச் சட்டத்தை உடனடியாக நீக்குவதற்கும் நடவடிக்கை எடுக்க வேண்டுமென்று இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கிறேன்.

அதேபோல, ஊழல் ஒழிப்பு, நிதித் துஷ்பிரயோகம் மற்றும் போதைவஸ்துப் பாவனைக்கு எதிராக இந்த அரசாங்கம் எடுக்கும் நடவடிக்கைகளை நாங்கள் பாராட்டுகிறோம். நீங்கள் இவற்றுக்கு எதிராக எடுக்கும் பயனுள்ள நடவடிக்கைகளின் அடிப்படையில் இப்போது சில முக்கிய கைது நடவடிக்கைகள் நடைபெற்றுக்கொண்டு இருப்பதைப் பார்க்க முடிகின்றது. Always, Karma is a boomerang என்று சொல்வார்கள். இப்போது அதுதான் நடந்துகொண்டு இருக்கின்றது. பெண்களின் கண்களிலிருந்து வந்த கண்ணீர், இன்று முக்கியமான ஒருசிலரின் கண்களிலிருந்து வருவது எங்களுக்கு சந்தோசத்தைத் தரவில்லை; எங்களுக்கு அதில் சந்தோசமுமில்லை. ஆனால், தனக்குத் தனக்கென ஒரு விடயம் நடக்கும்போது அவர்களுக்கு மனச்சாட்சி உறுத்த வேண்டும். தங்களால் எத்தனை பேரின் கண்களிலிருந்து கண்ணீர் வந்தது, அதனால்தான் இந்தக் கண்ணீர் தங்களுக்கும் வருகின்றது என்று இந்த நடவடிக்கைகள் அவர்களுக்கு ஞாபகப்படுத்த வேண்டுமென்று நான் இந்தச் சந்தர்ப்பத்திலே சொல்லிக் கொள்கிறேன்.

இன்றைய சட்டமூலத்திலே குறிப்பிடப்பட்ட முக்கியமான விடயங்களுக்கு எங்களுடைய ஆதரவு நிச்சயமாக இருக்கிறது. இன்றைக்கு இந்த நாட்டின் பொருளாதாரத்தில் பாரிய தாக்கத்தை ஏற்படுத்துகின்ற வீதி விபத்துகளைப் பொறுத்தவரை எங்களுடைய A9 வீதியில் மிக அதிகமான வாகனங்கள் யாழ். நோக்கிச் செல்கின்றன. ஆனால், அனுராதபுரத்திலிருந்து யாழ்ப்பாணம் வரை மூன்று accident and emergency units - விபத்து, அவசர சிகிச்சைப் பிரிவு வசதிகள்தான் இருக்கின்றது. எங்களுடைய முல்லைத்தீவு மாவட்டத்தின் மாங்குளம் ஆதார வைத்தியசாலையில் Rehabilitation Therapy and Mental Health Development Centre புனர்வாழ்வு சிகிச்சை மற்றும் மனநல அபிவிருத்தி நிலையம் ஒன்று அமைக்கப்பட்டிருக்கின்றது. வீதி விபத்துக்களின்போது காயமடைகின்றவர்களுக்குச் சிகிச்சை மற்றும் புனர்வாழ்வு அளிக்கின்ற ஒரு முக்கியமான நிலையமாக அது இருக்கின்றது. ஆனால், இன்று அந்த நிலையத்தில் ஆளணிப் பற்றாக்குறை மிகவும் மோசமாக நிலவுகின்றது. எங்களுடைய வடக்கு மாகாணத்தில் இருக்கின்ற 5 பிரதான வைத்தியசாலைகளில் வவுனியா மற்றும் யாழ்ப்பாண வைத்தியசாலையில் மட்டும்தான் இந்த விபத்துச் சேவை பிரிவு இருக்கின்றது. முல்லைத்தீவு மாவட்டப் பொது வைத்தியசாலை, கிளிநொச்சி மாவட்டப் பொது வைத்தியசாலை, மன்னார் மாவட்டப் பொது வைத்தியசாலை என்பனவற்றில் விபத்து சேவை பிரிவுகள் இல்லை. ஆகவே, வீதி விபத்துக்களால் ஏற்படுகின்ற உயிரிழப்புக்களையும், நாட்டுக்கு ஏற்படுகின்ற பொருளாதார நட்டத்தையும் நாங்கள் குறைக்க வேண்டுமாக இருந்தால், சுகாதார சேவையில் பாரிய முன்னேற்றத்தைக் கொண்டுவர வேண்டிய தேவை இருக்கிறது. மன்னார், முல்லைத்தீவு, கிளிநொச்சி வைத்தியசாலைகளில் எதிர்வரும் காலத்திலாவது விபத்து சேவைப் பிரிவுகள் உருவாக்கப்பட வேண்டும்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි. දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු අත්හිටුවන්නට අවශ්‍යයි.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
தயவுசெய்து இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

அதேபோல, எங்களுடைய வவுனியா பொது வைத்திய சாலையில் விபத்து சேவை பிரிவு இருந்தாலும்கூட, அங்கே ஒரேயொரு மயக்க மருந்து நிபுணர்தான் இருக்கிறார். எல்லா இடங்களில் இருந்தும் சிகிச்சைக்காக மக்கள் அங்கே வருகிறார்கள். அங்கே இருக்கின்ற CT scanner மிகவும் பழமையானது. ஆகவே, விபத்துக்களைக் குறைப்பதற்கும் அதனால் ஏற்படும் பாதிப்பைக் குறைப்பதற்கும் மேற்கூறிய விடயங்களில் இந்தச் சபை கவனமெடுக்க வேண்டுமெனக் கேட்டுக்கொண்டு, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Order, please! දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු පස්වරු 1.00 දක්වා අත්හිටුවනු ලැබේ.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දිනිඳු සමන් හෙන්නායක නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.00]

**ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා (තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தினிந்து சமன் ஹென்நாயக்க - இளைஞர் விவகாரங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Dinindu Saman Hennayake - Deputy Minister of Youth Affairs)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

[ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා]

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය මඟින් මෝටර් වාහන පනත යටතේ වන සුවිශේෂී නියෝග දෙකක් අද දවසේ මෙම පාර්ලිමේන්තුවේ අනුමතියට ඉදිරිපත් කර තිබෙනවා. අපි දන්නවා, අධිවේගී මාර්ගවල සහ සෙසු මාර්ගවල සිද්ධ වන රිය අනතුරු අවම කර ගැනීම සඳහාත්, නව ප්‍රවාහන සංස්කෘතියක් ඇති කර ගැනීම සඳහාත් මැදිහත් වෙමින් විශේෂයෙන්ම මෙම අමාත්‍යාංශය මඟින් අදාළ කරන අත්‍යවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ සිදු කරමින් මෑතකදී අණපනත් සම්මත කළ බව. අපි අද දවසේ දකින්නේත් එවැනි කාරණාවක්.

අධිවේගී මාර්ගවල ධාවනය වන මෝටර් රථ ඇතුළු සියලු වාහනවල ගමන් ගන්නා සියලු මඟීන් ආසන පටි පැළඳීම අනිවාර්යය කිරීම සඳහා 2025.09.25 දින ගැසට් පත්‍රයක් නිකුත් කළ බව අපි දැක්කා. ඒකට අදාළව වසරක කාලයක් එම නීතිය ක්‍රියාත්මක කරන්නට සහන කාලයක් ලබා දීලා තිබුණා. ඒ සහන කාලය මේ මාසයේදී අවසන් වෙනවා. එම නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා; ඒ කියන්නේ, අධිවේගී මාර්ගවල ගමන් කරන වාහනවල බඳ පටි තිබුණේ නැත්නම් ඒ සියලුම වාහනවලට බඳ පටි සවි කර ගැනීමට වසරක කාලයක් ලබා දීලා තිබුණා. එසේ සහන කාලයක් ලබා දීලා තමයි එම නීතිය ක්‍රියාත්මක කරන්නට කටයුතු කළේ.

ඒ වාගේම තවත් සුවිශේෂී ගැසට් පත්‍රයක් නිකුත් කර තිබෙනවා, 2026.05.19 දින. ඒක තමයි, මෝටර් වාහන පරීක්ෂා කිරීමට අදාළ කරන නියෝග ඇතුළත් කර නිකුත් කළ ගැසට් පත්‍රය. ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ, පළාත් මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරියේ සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නියාමනය සහිතව මඟී ප්‍රවාහන කටයුතු සිද්ධ කරන සියලුම වාහනවල තත්ත්වය පරීක්ෂා කර ඒ වාහනවල තත්ත්වය යහපත්භාවයට පත් කරගන්න අදාළ කරන නියෝග නිකුත් කිරීමක් තමයි මේ තුළින් සිද්ධ කරන්නේ.

මෝටර් වාහන පනත යටතේ වන මෙම දෙවන නියෝගය තුළින් කිලෝමීටර 5,000ක් හෝ මාස තුනක කාලයක් ඉක්මවන්නේ නැතුව අදාළ කරන නියෝගය ක්‍රියාත්මක කරන්න අදාළ වාර්තා ලබා ගන්න පුළුවන්. විශේෂයෙන්ම NVQ Level - 4 මට්ටමේ ඉන්න මෝටර් වාහන කාර්මික ශිල්පියෙකුට ඒ සඳහා අවශ්‍ය අනුමැතිය දෙන්න පුළුවන්. ඒ ශිල්පියා අනිවාර්යයෙන්ම මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය සහිත ආයතනයක වැඩ කරන්න ඕනෑ. ඔන්න ඔය වාගේ නීති ටිකක් සම්පාදනය කර තිබෙනවා. ඒකට අදාළ කරන විවාදය තමයි මේ සිදු වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මාර්ගවල සිදු වන වාහන අනතුරුවලින් මේ වනවිට ලංකාවේ වාර්ෂිකව මරණ 3,000කට ආසන්න ප්‍රමාණයක් සිද්ධ වන බව අපි දන්නවා. මාර්ග අනතුරු 38,000කට ආසන්න ප්‍රමාණයක් වර්ෂයකදී ලංකාව තුළ සිද්ධ වෙනවා. ඒ හැම අනතුරකින්ම නැති වෙන්නේ අපේ ගෙවල්වල ඉන්න ආදරණීය අම්මා කෙනෙක්, තාත්තා කෙනෙක්, සහෝදරියක් හෝ සහෝදරයෙක්. ඒ අයගේ ජීවිත තමයි එසේ මාර්ග අනතුරුවලින් නැති වෙන්නේ. 2020-2024 කාලය ගත්තාම, රිය අනතුරු 118,697ක ප්‍රමාණයක් වාර්තා වෙලා තිබෙනවා. ඒ කාලය තුළදී මරණ 12,322ක් වාර්තා වෙලා තිබෙනවා. ලංකාවේ වාර්ෂික මරණ අනුපාතය ගත්තාම, සාමාන්‍යයෙන් මරණ 10,000කට සියයට 11.2කට ආසන්න ප්‍රමාණයකින් මාර්ග අනතුරු නිසා මියයෑම් සිද්ධ වෙනවා. මාර්ග අනතුරු නිසා සිදු වන මේ මරණ අනුපාතය ඉතා ඉහළ අගයක්. ඒක එක්සත් ජාතීන්ගේ අනුමැතිය ලත් අගයට වඩා සීමාව ඉක්මවා ගිහින් තිබෙනවා. ඒක නිසා අපි වාගේ රටක මාර්ග අනතුරු අවම කරගන්න අදාළ කරන විධිමත් නීතිරීති රාමුවක්, පද්ධතියක් හැදෙන්න ඕනෑය කියලා අප හිතනවා. ඒ නිසා මෙවැනි නීතියක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අපි මෙම අමාත්‍යාංශයට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

කොළඹ මහ රෝහලේ හදිසි අනතුරු ඒකකයේ දැඩි සත්කාර ඒකකය ගත්තාම ඒකට ඇතුළත් වන රෝගීන්ගෙන් සියයට 50ක් පමණ මාර්ග අනතුරු නිසා ඇතුළත් වන රෝගීන්. අපේ ඇමතිතුමා කිව්වා වාගේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1ක්, 1.5ක් වාගේ ප්‍රමාණයක් මාර්ග අනතුරු නිසා සිදු වන ආපදා වෙනුවෙන් වෙන් කරනවා. 2021 අවුරුද්දේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3ක් -රුපියල් බිලියන 3කට ආසන්න ප්‍රමාණයක්- මාර්ග අනතුරු නිසා ඇති වන තත්ත්වයන් සඳහා වියදම් කර තිබෙනවා. ඒ නිසා අපි හිතනවා, මේ අනතුරු අවම කර ගැනීමට අදාළ කරන සුවිශේෂී සැලැස්මක් අමාත්‍යාංශයක් විධියට ක්‍රියාත්මක කළ යුතුයි වාගේම එය අමාත්‍යාංශය ඇතුළත ක්‍රියාත්මක වෙන්න ඕනෑය කියා. අපි ස්තුතිවන්ත වෙනවා, එවැනි නීතිමය වැඩ පිළිවෙළක් අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මහාමාර්ග අමාත්‍යාංශය තුළින් මෑතකදී ඉතා සුවිශේෂී කටයුතු ප්‍රමාණයක් සිද්ධ වුණා. අපි දැක්කා, එම අමාත්‍යාංශය හරහා අපේ ප්‍රවාහන පද්ධතියට අලුත් සංස්කෘතියක් එකතු කළ බව. ඒ තමයි, පතුල පහත් මෙට්‍රෝ බස් අපේ ප්‍රවාහන පද්ධතියට එකතු කිරීම. අපේ අම්මලා, තාත්තලාට පහසුවෙන් නඟින්න පුළුවන්, ඒ වාගේම ආබාධිත ජනතාවට පහසුවෙන් ප්‍රවිෂ්ට වීමේ හැකියාව සහිත එම බස් රථ ගෙනෙන්න ප්‍රවාහන අමාත්‍යාංශය කටයුතු කර තිබෙනවා. බදුල්ල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් විධියට මේ අවස්ථාවේදී ඒ සම්බන්ධව මගේ ප්‍රසාදය පිරිනමන්න මම කැමැතියි. අපි දන්නවා, අමාත්‍යාංශය තුළ ඉතාම උනන්දුවෙන් මේ කටයුත්ත කරන්න, නව ප්‍රවාහන සංස්කෘතියක් ඇති කරන්න අමාත්‍යතුමා ඇතුළු කාර්ය මණ්ඩලය විශාල මැදිහත්වීමක් කරන බව. ඒ බව අපට පෞද්ගලිකව දැනිලා තිබෙනවා. පත්තරේ මොනවා හරි දෙයක් පළ වුණාට පස්සේ අමාත්‍යතුමා පෞද්ගලිකව අපෙන් ප්‍රශ්න කරලා තිබෙනවා, බදුල්ලේ මෙහෙම දෙයක් වුණාද, මේ රිය අනතුරට කවුද වග කියන්න ඕනෑ, ඒක අපේ මාර්ගයක්ද, මොනවා හරි අපේ දෝෂයක්ද තිබෙන්නේ කියලා. එතුමා ඒ වාගේ සංවේදීව කටයුතු කිරීම සම්බන්ධයෙන් අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා.

මම තවත් කාරණයක් කියන්න ඕනෑ. අපි දැකලා තිබෙනවා, මේ මාර්ග අනතුරුවලට අදාළව තිබෙන සුවිශේෂී තත්ත්වයන්. විශේෂයෙන්ම බදුල්ල දිස්ත්‍රික්කය තුළ තමයි අපි මෑතකදී දැක්ක දරුණුම රිය අනතුරු ප්‍රමාණයක් වාර්තා වුණු තැන් තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමිය දන්නවා, බදුල්ලේ ඇල්ල ප්‍රදේශය ආශ්‍රිතව මාරක රිය අනතුරක් සිද්ධ වුණු බව. මට මතක හැටියට ඒ අනතුර සිදු වෙලා අදට අවුරුද්දයි දවස් තුනක් වාගේ තමයි වෙන්නේ. ඒ අනතුරින් මිය ගිය ඥාතීන් වෙනුවෙන් මතක බණ කියලා දානය දීලා අදට වසරක කාලයක් ගත වෙලා තිබෙනවා. ඒ ඛේදවාචකය සිද්ධ වුණු තැන පිහිටා තිබෙන්නේ බදුල්ලේ. ඒ වාගේම බදුල්ලේ දුන්හිඳ ආශ්‍රිතව තිබෙන පල්ලම් සහිත ප්‍රදේශයේත් දැවැන්ත රිය අනතුරු ප්‍රමාණයක් සිදු වන බවට වාර්තා වෙනවා. මේ අනතුරු වළක්වා ගැනීම සඳහා වන ක්‍රියාමාර්ග අපි ගන්න ඕනෑ. මෙලෙස වාර්තා වුණු රිය අනතුරු පිළිබඳව පසුවිපරමක් කරලා බැලුවාම අපට දකින්න ලැබෙනවා, මාර්ගවල තත්ත්වයට වඩා ඒ හැම රිය අනතුරක් පිටුපසම ඒ වාහනයේ condition එක, රියැදුරන්ගේ තත්ත්වය වාගේම රියැදුරන්ගේ නොසැලකිල්ල වැනි කාරණා බලපා තිබෙන බව.

විශේෂයෙන්ම ඇල්ල ප්‍රදේශයේ සිදු වුණු අනතුර ගත්තාම, ධාවනයෙන් ඉවත් කරපු වාහනයක් නැවත ධාවනයට යොදා ගත් නිසා තමයි ඒ රිය අනතුර සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ අනතුරින් 12දෙනෙකු වාගේ පිරිසක් මරණයට පත් වුණා. ඒ අනතුර නිසා මරණයට පත් අම්මා, තාත්තා නැතුව දරුවෝ අදටත් දුක් විඳිනවා ඇති. තවම රෝහල්ගත වෙලා ඉන්න, තවම සාමාන්‍ය තත්ත්වයට එන්න බැරි වුණු රෝගීන් විශාල පිරිසකුත් ඇති. අපි විශ්වාස කරනවා, ඔවුන් තවමත් වේදනා විඳිනවා ඇති කියලා. තංගල්ල නගර සභාවේ සේවය කරන රාජ්‍ය සේවකයන් පිරිසක් තමයි එදා ඇල්ල ප්‍රදේශයට ආවේ. ඒ අනතුර නිසා ඒ අයගේ දරුවන්ට, අම්මා තාත්තාට විශාල පාඩුවක් සිද්ධ වෙන්න ඇති.

ඒ වාගේම මහියංගනය පාරේ සිදු වුණු අනතුර ගත්තාම, ඒ බස් රථයේ එක පැත්තක තිරිංග මාස තුනක් වැඩ කරලා නැහැ. එහෙම බස් රථයක් තමයි trip එකට යොදවා තිබුණේ. තමන්ගේ මූල්‍යමය අවශ්‍යතාව ගැන විතරක් හිතලා සාමාන්‍ය මගීන් පීඩාවට පත් කරන මේ ක්‍රියාවලිය අපි නතර කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ සිදු කරන කටයුත්ත අපි අගය කරන්න ඕනෑ. ඇල්ල ප්‍රදේශයේදී අනතුරට පත් වුණු බස් රථයේ රියැදුරු මහත්මයාගේ සංවේදී කථාව අපිට එදා අහන්න ලැබුණා. ඒ රියැදුරු මහතාගේ බාහිර ස්වරූපය දැකලා විවිධ අය විවිධ කථා කිව්වත්, ඔහුගේ තොරතුරු සොයා බලනකොට අපිට දැනගන්න ලැබුණා, ඔහු මේ අවසාන වාරිකාව ඇවිල්ලා තිබෙන්නේ තමන්ගේ ව්‍යාපාර කටයුත්තකට අදාළ කරන මුදලක් හොයා ගන්න බව; වාහනයක් ගන්න අවශ්‍ය මුදලක් හොයා ගන්න. එහෙම සුන්දර හීන දැකපු මිනිස්සුන්ගේ ජීවිත රිය අනතුරු නිසා එක මොහොතින් නැති වෙලා තිබෙනවා. ඒ නිසා එම රිය අනතුරු වළක්වා ගැනීමට අදාළ කරන වැඩ පිළිවෙළ අපි හදන්න ඕනෑ. ඒ වෙනුවෙන් නීතිරීති හදන්න ඕනෑ. ඒ වාගේම ඒ වෙනුවෙන් නව සංස්කෘතියක් අපි අරගෙන එන්න ඕනෑ. අපි විශේෂයෙන්ම දන්නවා, අපේ අමාත්‍යතුමා එක්ක අපේ ගම්වල තිබෙන අඩුපාඩු, අපේ පැත්තේ තිබෙන අඩුපාඩු ගැනත් සාකච්ඡා කරන්න ඕනෑය කියන එක.

මහාමාර්ග අමාත්‍යාංශයට අදාළව කටයුතු කරනකොට අපි දකිනවා, SLTB එක සාමාන්‍ය ජන ජීවිත ගත කරන අපේ මිනිස්සුන්ට තිබෙන වැදගත් තැනක් හැටියට. SLTB එක තුළ බරපතළ විධියට රියදුරන්ගේ ගැටලුවක් තිබුණා. ඒ ගැටලුවට අදාළ උත්තර හොයලා මේ වනකොට රියදුරන් 418ක්, කොන්දොස්තරවරු 246ක් සහ කොන්දොස්තරවරියන් 23ක් බඳවාගෙන තිබෙනවා. අදටත් සමහර ගම්වල රියැදුරා නිවාඩු යද්දී බස් එක ධාවනය නොකර ඉන්නවා. රියැදුරා ලෙඩ වෙද්දී බස් එකත් ධාවනය නොකර ඉන්නවා. ඒක නරක සංස්කෘතියක්. ඒ නරක සංස්කෘතිය අපි නැති කරන්න ඕනෑ. ඒ නරක සංස්කෘතිය නැති කරනවා වාගේම නව නීති පද්ධතියක් SLTB එකට අදාළව ගෙනෙන්නත් ඕනෑ. රියැදුරෙක් නැත්නම් ඒ වෙනුවට වෙනත් රියැදුරෙක් බඳවා ගන්න, ඒකට අදාළ කරන ක්‍රියාවලියක් හදන්න අවශ්‍යයි. අමාත්‍යාංශ මට්ටමින් ඒවාට අදාළ කරන මැදිහත්වීම අපේ ඇමතිතුමා මැදිහත් වෙලා සිද්ධ කරන්න කියලා අපි ඉල්ලනවා.

ඒ වාගේම අපේ ප්‍රදේශයේ මාර්ග ඉදිකිරීම් කරද්දී අපට පෙනෙනවා, ඉතා බෑවුම් සහිත මාර්ග තමයි තිබෙන්නේ කියන එක. අපේ ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය යටතේ මාර්ග විශාල ප්‍රමාණයක් ඉදි කරනවා. ඒ වාගේම ඒ හරහා අපේ ජනතාවට අවශ්‍ය පහසුකම් ලබා දෙනවා. හැබැයි, ඒ මාර්ගවලට වැසි ජලයෙන් බාධාවක් නොවෙන්න නම්, නැවතත් මේ මාර්ග සුරක්ෂිතව වාගේම දීර්ඝ කාලයක් තිබෙන්නට නම් හොඳ කානු පද්ධතියක් වාගේම බෝක්කු පද්ධතියක් හැදෙන්න අදාළ කරන වැඩකටයුතු සිද්ධ වෙන්න ඕනෑ. ඒත් අපි දකිනවා, සමහර ඉදිකිරීම් කරගෙන යද්දී ඒ සැලසුම්වල එවැනි අඩුපාඩු තිබෙන බව. ඒ අඩුපාඩු අපි අවම කර ගන්න ඕනෑ. ඒකට අදාළ කරන මැදිහත්වීම අපි කර ගන්න ඕනෑ. ඒ සඳහා වන සුවිශේෂී මැදිහත්වීමක් අමාත්‍යාංශ මට්ටමින් අපට කර ගන්න පුළුවන් වේවි කියලා අපි හිතනවා. අපට මිනිස්සු බලය දීලා තිබෙන්නේ විශේෂයෙන්ම මේ සුවිශේෂී මැදිහත්වීම කරන්නයි. ඒ නිසා විශේෂයෙන්ම නිලධාරි මහත්වරුන්ගෙන් අපි ඉල්ලනවා, ඔබත් ඒ සඳහා වෙනස් විධියට හිතලා ඒ මැදිහත්වීම කිරීමට අවශ්‍ය කටයුතු කරන්න කියලා.

මේ වාගේ සුවිශේෂී වෙලාවකදී වුණත් අපේ විපක්ෂ නායකතුමා මීට කලින් කියපු කථාව ගැන මම අවධානය යොමු කරන්න ඕනෑ. එතුමා අපේ ජනාධිපතිතුමා කියපු ප්‍රකාශයක් ගැන අදහස් පළ කළා. විපක්ෂ නායකතුමාට අපට කියන්න තිබෙන්නේ අපේ ජනාධිපතිතුමා කථා කළේ අපේ ජනතාවට කියන එකයි. මාලිමාවට ඡන්දය දීපු, මාලිමාවත් එක්ක වැඩ කරපු ජනතාවට කටට, කනට අමතරව මොළයක් තිබුණා. ඒක නිසා ජනාධිපතිතුමා කිව්ව කාරණය තේරුම් ගැනීමේ හැකියාව ඒ ජනතාවට තිබුණා. හැබැයි, කටයි, කනයි විතරක් තිබෙන, මොළේ නැති පිරිසකට ජනාධිපතිතුමා කිව්ව කාරණය තේරුම් ගන්න බැහැ. ජනාධිපතිතුමා මොකක්ද කිව්වේ? ජනාධිපතිතුමා කිව්වා, ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථාන 1,000ක් හදන වැඩසටහන ගැන. අද විපක්ෂ නායකතුමන්ලාට තමන්ට අදාළ කරන පවුලේ වෛද්‍යවරයෙක් ඉන්නවා, නැත්නම් වෛද්‍යවරයෙක් ගෙන්වා ගන්න පුළුවන්, අවශ්‍යතාවක් තිබුණොත් රට යන්න පුළුවන්, ඒ පහසුකම් ගන්න පුළුවන්. හැබැයි, අපේ ගමේ බිමේ ඉන්න අම්මාට තාත්තාට එහෙම පහසුකමක් නැහැ. රෝහලට යනවා, ජනතාව පිරිලා ඉන්නවා, වෛද්‍යවරයාට රෝගීන්ව බලා ගන්න විධියක් නැහැ, ඒවාට අදාළ කරන නිසි ප්‍රතිකාර ලබා දෙන්න විධියක් නැහැ. ඒ රෝහලේ තිබෙන rush එක අඩු කරනවා නම් අපි ගමට වෛද්‍යවරයෙක් හදන්න ඕනෑ. ගමේ ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථාන ඇතුළේ පවුල් 10,000කට එක් වෛද්‍යවරයෙක් හදන්න සැලසුම් කරලා තිබෙනවා. එතකොට අලුත් තාක්ෂණය පාවිච්චි කරලා මධ්‍යස්ථානයක් හදන්න සැලසුම් කරලා, අලුත් තාක්ෂණය තුළින් ලියාපදිංචි කරලා, පවුලේ වෛද්‍යවරයෙක් හදන සැලැස්මකට මේ යන්නේ. මේවා දියුණු රටවල ක්‍රියාත්මක වෙච්ච දේවල්. විපක්ෂ නායකතුමන්ලා ඒවාට ආශීර්වාද කරන්න ඕනෑ. හොඳ විපක්ෂයක් තිබෙනවා නම්, අපේ රටේ ජනතාවගේ පැත්තේ හිටගන්න ඕනෑ. හැබැයි, අද විපක්ෂය මොකද කරන්නේ? ජනතාවගේ පැත්තේ හිටගන්නවා වෙනුවට මෙවැනි ක්‍රියාවලට උදලු දමන එක තමයි කරන්නේ.

අපි දැක්කා, එතුමන්ලාගේ කාලවලදී මොකද වුණේ කියලා, ගිය ආණ්ඩුව ඇතුළේ සෞඛ්‍ය පද්ධතිය කොහොමද තිබුණේ කියලා. අපි එතුමන්ලාට ඒවා මතක් කරනවා. ජනතාවට හොර බෙහෙත් ගෙනැල්ලා දීලා, මිනිස්සු එකාපිට එකා මැරෙද්දී, "ඕකට තමයි ඉස්පිරිතාල ඉස්සරහා මල්ශාලාව තිබෙන්නේ" කියලා කියපු ආණ්ඩුවලට, එහෙම කියපු සෞඛ්‍ය ඇමතිවරුන්ට ආදර්ශයක් වෙලා තිබෙනවා, දැන් මේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ. දැන් ඇන්ජියෝග්‍රෑම් පරීක්ෂණ යන්ත්‍ර ගෙනැල්ලා 16කට වැඩි ප්‍රමාණයක් ඉස්පිරිතාලවල ස්ථාපිත කරලා තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 3,000කට වැඩි ප්‍රමාණයක් වියදම් කරලා ජනතාවට සහන දීලා තිබෙනවා. අපි මිනිස්සුන්ට ජීවිතය දෙනවා. ඔබ මරණය අපේක්ෂා කරන විපක්ෂයක් වෙලා ඉද්දී, අපි ආණ්ඩු පක්ෂයක් විධියට මරණ සහතිකය අතේ තියා ගත්ත මිනිස්සුන්ට ජීවිතය දෙමින් ඉන්නවා කියන එක විපක්ෂ නායකතුමාට මතක් කරන්න ඕනෑ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.12]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම අද පාර්ලිමේන්තුවේදී ප්‍රවාහනය හා අධිකරණය සම්බන්ධයෙන් කථා කරන වෙලාවේ අපි මතක් කරන්න ඕනෑ, දැන් ආණ්ඩුවට අවුරුදු දෙකයි කියන එක. ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා ඔහොම ඉන්න, ඔබතුමා ඉන්න ඕනෑ මම කථා කරනකොට.

වසර දෙකක් වෙන මේ ආණ්ඩුව එන්න ඉස්සෙල්ලා තමුන්නාන්සේලා ප්‍රතිපත්ති ප්‍රකාශනයක් මුළු රටටම ඉදිරිපත් කළා. ඒකේ කිව්වේ, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියලා. ජනතාව බලාපොරොත්තු වුණා, ආර්ථිකය හොඳ වෙව්ව, පොහොසත් රටක, සාක්කුව පිරිලා, ලස්සන ජීවිතයක් ගත කරන්න. ඒ හින්දා තමයි ඔබතුමන්ලාට ඡන්දය දුන්නේ. තමුන්නාන්සේලාට ඡන්දය දුන්නා, ජනාධිපතිතුමාව ජයග්‍රහණය කෙරෙව්වා. තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරු 159ක් පාර්ලිමේන්තුවට එව්වා. ඒ තමයි ජනතාවගේ කැමැත්ත. ජනතාව ඔබට ලබා දීපු රජය. දැන් මා මිත්‍ර නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේම තමුන්නාන්සේලා ඊයේ පෙරේදා පෝස්ටරය ගැහුවා, "අපේ ආණ්ඩුවට වසර දෙකයි-රටට හොඳයි" කියලා. එහෙම කියන්නේ කවුද? NPP එකෙන්, එහෙම නැත්නම් ජේවීපී එකෙන් තමයි ඒ පෝස්ටරය ගැහුවේ. හැබැයි, ඒක ගැහුවාට ඒක වෙලා තිබෙනවාද? අපි බලන්න ඕනෑ, ඒක වෙලා තිබෙනවාද කියලා. වසර දෙක නම් හරි. ඒක අපිට කියන්න පුළුවන්, කාලය හරි නේ. රටට හොඳයි ද? රටට හොඳ නම් අර ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබුණු දේවල් ටික ඉටු කරන්න ඕනෑ. ජනතාවගේ බලාපොරොත්තු ටික ඉටු කරන්න ඕනෑ. ජනතාව බලාපොරොත්තු වුණේ මොනවාද? ජනතාව බලාපොරොත්තු වුණා, අපේ කාලවල රජයන්ට වැඩිය ආර්ථිකය හොඳ වෙයි කියලා. අපේ රජයන් තිබුණු කාලවලදී ඩීසල්වල, පෙට්‍රල්වල මිල ඉහළ ගිහිල්ලා තිබුණා නම් ඒක පහළට දමා ගන්න ජනතාව බලාපොරොත්තු වුණා. විදුලි බිල අහස උසට ගිහිල්ලා තිබුණා නම් ඒක පහළට දමා ගන්න බලාපොරොත්තු වුණා. මෙන්න මේවා බලාපොරොත්තු වුණා. දැන් ඒක වෙලා තිබෙනවාද? දැන් මේ රටට හොඳයි නම්, මේවා වෙන්න ඕනෑ. මොනවාද වෙලා තිබෙන්නේ? ඩීසල්වල මිල අඩු වෙලා තිබෙනවාද? ඒ රජයන්වලදී තිබුණාට වැඩිය ඩීසල්වල මිල වැඩි වෙලා. පෙට්‍රල්වල මිල අඩු වෙලා තිබෙනවාද? පෙට්‍රල් මිල වැඩි වෙලා. විදුලි බිල අඩු වෙලා තිබෙනවාද? වැඩි වෙලා. විදුලි බිල තුනෙන් එකක් අඩු කරනවා කිව්වා. ඒ හින්දා තමයි කතිරය ගැහුවේ, හම්බ වෙලා නැහැ. ඩීසල්වල මිල ඉහළ ගියාම, පෙට්‍රල්වල මිල ඉහළ ගියාම සියලු දේවල්වල මිල ඉහළ යනවා. මොකද, ප්‍රවාහනය හැම දේටම බලපානවා. ප්‍රවාහනය බලපාන කොට භාණ්ඩවල මිල ඉහළ යනවා. ප්ලේන්ටියෙන් පටන් ගත්තාම බත් පාර්සලයේ ඉඳන් ඔක්කොම ඒවායේ මිල ඉහළ යනවා. මොකද හේතුව, ප්‍රවාහනය බලපාන නිසා. දැන් ඒවා අඩු වෙලාත් නැහැ.

තව මොනවාද පොරොන්දු වුණේ? තව ගොඩක් දේවල් පොරොන්දු වුණා. ගොවීන් ගැන බලන්න. තමුන්නාන්සේලාගේ රජය පිහිටුවන්න ගොවි මහත්වරු මහා පරිමාණයෙන් ඡන්දය දුන්නා. පෝලිම්වල ඇවිල්ලා ඡන්දය දුන්නේ, ගොවි මහත්වරු අමුඩය ගහගෙන ඇවිල්ලා ඡන්දය දුන්නේ. මොකටද, නව රජයක්, තමුන්නාන්සේලාගේ රජයක් පිහිටුවා ගන්න. තමුන්නාන්සේලා ගොවියා රජ කරවනවා කිව්වා. ගොවියා රජ කරවනවා කියලා ඒ ගොවියාට කසිප්පුකාරයෝ කියලා කිව්වා. දැන් අද ගොවියෝ කසිප්පුකාරයෝ වෙලා. ඡන්දය ගන්න ඉස්සෙල්ලා ගොවියා රජා.

දැන් ගොවියාට සහතික මිලක් තිබෙනවාද? නැහැ. ගොවියෝ අනාථ වෙලා, නන්නත්තාර වෙලා. දැන් එතකොට මේ කියපු අවුරුදු දෙක ඇතුළත හොඳයිද? නැහැ, හොඳ නැහැ. හැබැයි, තමුන්නාන්සේලාට තවම හොඳ වාගේ පෙනෙනවා. වසර දෙක ඇතුළත ඔබේ වටේ ඉන්න කිහිපදෙනා කියනවා, හොඳටම හොඳයි කියලා. මොකද, අපි මේ ආණ්ඩුවල හිටපු අය හැටියට කියන්නේ.

දැන් තමුන්නාන්සේලා හොඳ නැති නිසා මොකක්ද කරන්නේ? වටේ ඉන්න අය තමුන්නාන්සේලා හොඳයි කියලා කියනවා. ඉතින්, තමුන්නාන්සේලාට ජනතාව පොඩ්ඩක් කුද්දන්න ඕනෑ. කුද්දන්න ඕනෑ නිසා මොකක්ද කරන්නේ? තමුන්නාන්සේලා නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාව අරගෙන ගිහිල්ලා හිරේ දමනවා. දැන් නාමල් මන්ත්‍රීතුමා හිරේ දාලා තිබෙනවා. අද එතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නවා. දැන් නාමල් මන්ත්‍රීතුමාව හිරේ දාලා, තමුන්නාන්සේලාගේ රජය බලාපොරොත්තු වෙන්නේ මිනිස්සු චූන් කරන්න. "චූන් පාන්" එනකොට වාගේ චූන් කරන්න. හැබැයි, චූන් වෙන්නේ කවුද? චූන් වෙන්නේ තමුන්නාන්සේලා එක්ක මේ වෙලාවේ ඉතුරු වෙලා ඉන්න තමුන්නාන්සේලාගේ පාක්ෂිකයින් ටික. ඒ අය අනිවාර්යයෙන් චූන් වෙනවා. ආණ්ඩුවක් තිබෙනකොට විපක්ෂයක් තිබෙනවා, විපක්ෂයක් තිබෙනකොට ආණ්ඩුවක් තිබෙනවා. එහෙම තමයි. දැන් මේකෙදි තමුන්නාන්සේලාගේ පාක්ෂිකයින් චූන් වෙයි. හැබැයි තමුන්නාන්සේලා චූන් කරන්න ඕනෑ තමුන්නාන්සේලාට ඉන්න පාක්ෂිකයෝ සියයට 3 නොවෙයි, අනෙක් සියයට 97. ඒ පිරිස චූන් කරන්න. ඒ පිරිස චූන් කරන්න කියලායි මම මේ කියන්නේ. ඒ අය චූන් කරන්නේ කොහොමද? ඒකට නම් විදුලි බිල අඩු වෙන්න ඕනෑ, ඩීසල් මිල අඩු වෙන්න ඕනෑ, තමන් ගන්න පඩියෙන් ජීවත් වෙන්න පුළුවන්, ජීවන බර නැති වෙන වැඩ පිළිවෙළක්, එයට සරිලන ආර්ථිකයක් හදන්න ඕනෑ. මෙන්න මේ ටික කරලා තමයි ජනතාව චූන් කරන්න පුළුවන් වෙන්නේ. නාමල් මන්ත්‍රීතුමා හිරේ දාලා ඒ විධියට චූන් වුණා නම් හොඳයි. චූන් වෙලා නැහැ නේ. තමුන්නාන්සේලා බලාපොරොත්තු වෙනවා ඇති. නාමල් මන්ත්‍රීතුමාව ඇතුළට දාලා සැප්තැම්බර් 12වෙනි දා අපි අනුරාධපුරයේ ගොවි ජනතාව වෙනුවෙන් කරන රැලිය නවත්වන්න. ගොවි ජනතාව වෙනුවෙන් තමයි ඒ රැලිය සංවිධානය කළේ, ගොවි ජනතාවගේ ප්‍රශ්න කථා කරන්න. ගොවි ජනතාව එනවා. නාමල් මන්ත්‍රීතුමා හිරේ දාලා බලනවා ඒක නවත්වන්න. නවත්වන්නේ නැහැ. ඒක නවත්වන්න බැහැ. ඒක නවත්වන්න පුළුවන්කමක් නැහැ. ඒ රැලිය තියනවා. එදාට අපි බලමු ජනතාව එනවාද, නැද්ද කියලා. තමුන්නාන්සේලා කියනවා නේ, එන්නේ නැහැ කියලා. විපක්ෂය සුන්බුන් වෙලා තිබෙනවා, විපක්ෂය කැලිවලට කැඩිලා තිබෙනවා කියලා නේ කියන්නේ. එහෙම කියන තමුන්නාන්සේලාට අපි කියනවා ජනතාව තමයි බලය කියලා. මතක තියා ගන්න, ජනතාව තීන්දු තීරණ ගත්තු ඉතිහාසයක් මේ රට තුළ තිබෙනවා කියන එක. ජනතාව ගත්ත තීන්දු තීරණ ඕනෑ තරම් තිබෙනවා.

අපි දැක්කා ජනාධිපතිතුමා දැන් ජන රැළි මාලාවක් පවත්වනවා. මුලින්ම ආවා කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහලටයි, බේරුවලටයි. මට ඒක දැක්කාම මොකක්ද මතක් වුණේ? මට මතක් වුණා 2015 කාලය. මේ, අත්දැකීම් කියන්නේ. 2015දී මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ජනාධිපතිවරණයට යන්න ඉස්සෙල්ලා අපිත් ගියා රට වටේ ඔන්න ඔය විධියට. පුටු දාලා, මිනිස්සු ගෙන්වුවා. රජයක් තිබෙනකොට මිනිස්සු ටිකක් ගෙන්වා ගන්න පුළුවන්. එහෙම බැරි නම් රජයක් නොවෙයි නේ. මිනිස්සු ගෙන්වාගෙන පුටු ටික පුරවා ගන්න පුළුවන්. අපිත් රට වටේ ගියා 2015දී. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා අරගෙන රට වටේ ගියා. ගියාම මොකක්ද වුණේ? අඩෝ! සෙනඟත් ඉන්නවා, වැඩේ හොඳයි; මරු. ළඟම ඉන්න අයත් කියනවා, "හරි, හරි භය වෙන්න එපා සර්. පේනවා නේද අපට ඉන්න සෙනඟ? අපට ඉන්නවා සෙනඟ මාර විධියට" කියලා. ඔන්න චූන් වෙනවා. අන්තිමට මොකක්ද වුණේ? 2015දී අපි පරාදයි. ඒක තමයි ජනතාවගේ

තීන්දුව. ජනතාවට දීපු බලාපොරොත්තු ඉටු නොකළාම ජනතාව අනිවාර්යයෙන්ම ආණ්ඩුවෙන් ඉවත් වෙනවා. මොකක්ද හේතුව? මිනිස්සුන්ගේ බඩට ගහලා ආණ්ඩු පැවතුණේ නැහැ. 1970-77 කාලයේ සිරිමාවෝ මැතිනිය හොඳ වැඩක් කරන්න ගියා. නමුත් බඩට වැදුණා; පැරදුවා. ජේ.ආර්. ජයවර්ධන මහත්තයා ආවේ හයෙන් පහක බලයක් අරගෙන; එහෙමයි ඉතිහාසයේ වුණේ. දැන් ජනතාවගේ බඩට වැදිලා තිබෙන්නේ. මිනිස්සුන්ට ජීවත් වෙන්න විධියක් නැහැ. බදු බර කොච්චරද? තමුන්නාන්සේලා බලන්න, අද බදු ගහලා මිනිස්සුන්ට ජීවත් වෙන්න විධියක් නැති තත්ත්වයට පත් කරලා තිබෙනවා. ඒකයි ඇත්ත තත්ත්වය.

මිනිස්සු තමුන්නාන්සේලා එක්ක ඉන්න බව තමයි තමුන්නාන්සේලා කියන්නේ. මම රජයට යෝජනා කරනවා, ජනාධිපතිතුමාව අරගෙන රට වටේ රැස්වීම් තිය තියා යනවාට වඩා, ජනතාවගේ මතය උරගා බලන්න පළාත් සභා ඡන්දය තියන්න කියලා. වැඩේ ඉවරයි නේ. පළාත් සභා ඡන්දය තිබ්බාම තමුන්නාන්සේලාටද ප්‍රසාදය තිබෙන්නේ, හිරේ දාලා ඉන්න නාමල් රාජපක්ෂටද, විපක්ෂයට ද ප්‍රසාදය තිබෙන්නේ කියලා බලාගන්න පුළුවන්. පළාත් සභා මැතිවරණය තියන්න. පළාත් සභා මැතිවරණය තියන්න පුළුවන්. දැන් එහෙමපිටින්ම පළාත් සභා අකර්මණ්‍ය වෙලා තිබෙන්නේ. බස්නාහිර ඇතුළුව මුළු ලංකාවේම පළාත් සභා සඳහා ඡන්ද විමසීම එක පාර තියන්න. එක පාර තිබ්බාම තමුන්නාන්සේලාට පුළුවන්කමක් ලැබෙයි මේ තිබෙන තත්ත්වය හරියාකාරව තේරුම් ගන්න. තමුන්ට හරියට ජන මතය තිබෙනවාද, නැද්ද කියන එක තේරුම් ගන්න, ජනතාවගේ මතය උරගා බලන්න කියන එකයි අපි තමුන්නාන්සේලාට කියන්නේ.

අපි බලාගෙන හිටියා විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් වන විවාදය අද එයි කියලා. අර මොකක්දෝ වැටෙන කල් බලාගෙන ඉන්නවා වාගේ අපි ඒක දිහාත් දැන් බලාගෙන ඉන්නවා. අපි හිතුවා එය අද පාර්ලිමේන්තුවේ විවාදයට ගෙන එයි කියලා. නමුත්, අද එය ගෙන අවේ නැහැ. හැබැයි, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ විවාදයට නොගෙනාවාට අපට පෙනෙනවා, දේශපාලන වේදිකාවේ නම් ඒ ගැන නිතරම කියැවෙනවා. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය විවාදයට ගෙනෙන බවත් කියනවා; ඡන්ද 159ක් අරගෙන එය සම්මත කර ගන්නවා කියලාත් කියනවා. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්මත කර ගෙන රජය කරන්න හදන්නේ මොකක්ද? මේ උත්සාහය, විපක්ෂය සම්පූර්ණයෙන්ම කුඩු පට්ටම් කර දැමීමයි; විපක්ෂය විනාශ කර දැමීමයි. විපක්ෂය විනාශ කරන්න ඒ සියලු දෙනා හිරේ දාලා ප්‍රශ්නය බේරා ගන්න පුළුවන් කියලා හිතනවා නම් ඒක එච්චර හොඳ වැඩක් නොවෙයි. ඒක ටිකිරි ජොලියක් විතරයි. ඒ ටිකිරි ජොලිය ගන්න හදන්න එපා. ඒ ටිකිරි ජොලියෙන් ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. පාකිස්තානය දෙස බලන්න. තමුන්නාන්සේලා ඒ රටට සිදු වෙච්ච දේ ගැන අධ්‍යයනය කරලා බලන්න, මොකද වුණේ කියලා. ඒ නිසා බොහොම පැහැදිලිව අපි කියනවා, අද වන විට ජනතාව ඉන්නේ බොහොම අමාරුවෙන් බව. ඒ අමාරුවෙන් ඉන්න ජනතාව තමන්ගේ ආර්ථික නොහැකියාව නිසා පීඩනයෙන් ඉන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රටේ ඉන්න ධීවර ජනතාව ගැන බලන්න. තමුන්නාන්සේලා එදා ධීවර ජනතාව වෙනුවෙන් පොරොන්දු දුන්නා. මෙතැනටත් ඇවිල්ලා කෑ ගහලා පොරොන්දු වුණා, ධීවරයන්ට සහනාධාරයක් ලබා දෙනවා කියලා. අද පෙන්වන්න, ධීවරයන්ට ලබා දුන්නු සහනාධාර. අපට පෙන්වන්න මෙන්න මේ සහනාධාරය ධීවරයන්ට ලබා දුන්නා කියලා. මේ වසර දෙක ඇතුළත ආපු ආයෝජනයක් පෙන්වන්න. මෙන්න මේ කර්මාන්තශාලා ව්‍යාපෘතිය අපේ රටට ආවා, මෙන්න මේ මේ ආයෝජන මේ රටට ආවා කියලා අපට පෙන්වන්න. නිකම් කියන්න පුළුවන්, "ඔව් ආවා. තවම සාකච්ඡා කරනවා" කියලා. අවුරුදු 5කටයි ආණ්ඩුව දීලා තිබෙන්නේ. හරියට බැලුවොත්, ඒ අවුරුදු 5නුත් 4යි තිබෙන්නේ. මොකක්ද, එහෙම කියන්න හේතුව? ජනාධිපතිවරණයක් එනකොට මිනිස්සු බලාගෙන ඉන්නේ මොකක් ගැන ද? මිනිස්සු බලාගෙන ඉන්නේ කාට බලය යයිද කියලායි. ඒ නිසා ඒ අවුරුද්දේත් වැඩ වෙන්නේ නැහැ. අවුරුදු 4ක් තමයි තිබෙන්නේ. ඒ අවුරුදු 4න් අවුරුදු 2ක් ගිහිල්ලා. තවත් අවුරුදු 2යි තිබෙන්නේ ආණ්ඩුවට යන්න. ඒ අවුරුදු 2 හරියට යන්න. අප මේ කියන්නේ හරියට යන්න කියලා. තමුන්නාන්සේලාට වඩා අපට අත්දැකීම් තිබෙන හින්දායි මේ කියන්නේ. හැබැයි, හරියට නොගියොත් රුයිතෙටයි යන්න වෙන්නේ. තමුන්නාන්සේලා යන විධිය හරි නැහැ. බොහොම වැරදි මාර්ගයක යන විධියකුයි පෙනෙන්නේ. ඒ වැරදි පාරේ යන්න ලෑස්ති වෙන්න එපා. නමුත්, දැන් යන්න හදන්නේ ඒ විධියට නේ. දැන් තමුන්නාන්සේලා හිතා ගෙන ඉන්නවා මේ දේවල් කරලා විපක්ෂය විනාශ කරන්න පුළුවන් කියලා. ඒක වෙන්නේ නැහැ. මා කිව්වේ ඒකයි, ජනතාව වුන් කරන්න ඕනෑ නම් නාමල් හිරේ දාලා නොවෙයි එය කරන්න ඕනෑ කියලා. මිනිසුන්ට දෙනවා කියපු ඒ සහන ටික දෙන්න. මිනිසුන්ට දුන්නු පොරොන්දු ටික ඉටු කරන්න.

රුපියල් ලක්ෂ 12කට "විට්ස්" වර්ගයේ කාර් එකක් දෙන්නම් කිව්වා. දැන් කාර් එක කෙසේ වෙතත් ටයර් එකයි, රිම් එකයි ගන්න බැහැ, රුපියල් ලක්ෂ 12කට; සම්පූර්ණ රෝදයක් ගන්න බැහැ, රුපියල් ලක්ෂ 12කට. දැන් වාහනයක මිල කීයද? දැන් වාහනයක් ගන්නේ කොහොමද? ලීසිං පහසුකම දෙන්නේ සියයට 30යි. සියයට 30ක් දෙන කොට මොකද වෙන්නේ? අතේ සල්ලිවලින් දීලා වාහනයක් ගත්තොත් එහෙම, Inland Revenue Department එකෙන් ඒ මිනිහාගේ ගෙදරට ඇවිල්ලා බෙල්ලෙන් අල්ලාගෙන යනවා, "කොහෙන්ද, යකෝ උඹට සල්ලි?" කියලා. ලීසිං දාන්න ගියාට ඒ පහසුකම දෙන්නේ සියයට 30ක් නිසා කෙනෙකුට වාහනයක් ගන්න වෙන්නේ නැහැ. එහෙම නම්, දුන් පොරොන්දු ඉටු කරන්න. මොන අභියෝගය ආවත් අපි සැප්තැම්බර් 12වන දා අනුරාධපුරයේ රැලිය ජයග්‍රාහී රැලියක් බවට පරිවර්තනය කරනවා කියන එක අපි ඔබතුමන්ලාට මතක් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.24]

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

විපක්ෂයට උත්තරයක් දීගෙනම මම විවාදයට සම්බන්ධ වෙන්නම්. මට ඉස්සෙල්ලා කථා කරපු ගරු මන්ත්‍රීතුමා ඇහුවා, "ආණ්ඩුව මොනවාද කළේ?" කියලා. මේ රටේ පොහොර සහනාධාරය ලෙස තිබුණේ රුපියල් 15,000යි. අපේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ අපි එය රුපියල් 30,000 දක්වා වැඩි කරලා තිබෙනවා. අප බලයට එන විට වී කිලෝවක රජයේ සහතික මිල

[ගරු සුජීව දිසානායක මහතා]

තිබුණේ රුපියල් 105ට. අද අපි වීවල සහතික මිල රුපියල් 120 දක්වා වැඩි කර තිබෙනවා. එදා මහපොළ ශිෂ්‍යාධාරය තිබුණේ රුපියල් 5,000ට. අපේ පාලනය තුළ රුපියල් 10,000ක මහපොළ ශිෂ්‍යාධාරයක් ලබා දෙනවා. රජයේ සේවකයන්ට 2025, 2026 සහ 2027 කියන අවුරුදු තුනටම අදාළව පියවර තුනකින් වැටුප් වැඩි කිරීමක් කර තිබෙනවා. 2027 අවුරුද්දේ ජනවාරි මාසයේ එහි තුන්වන පියවරට අදාළ වැටුප් වැඩිවීම සිදු වෙනවා. ගුරු සේවය ගත්තොත්, මා හිතන විධියට, අද වන කොට 1 ශ්‍රේණියේ ගුරුවරයකුගේ මූලික වැටුප රුපියල් ලක්ෂය ඉක්මවා යනවා. 2027 වැඩි වීමත් එක්ක 1 ශ්‍රේණියේ ගුරුවරයෙකුට ලැබෙන මූලික වැටුප රුපියල් 110,000ක්, රුපියල් 115,000ක් පමණ වෙයි.

අපි වැඩිහිටි දීමනාවත් වැඩි කර තිබෙනවා. ඒ වාගේම, රජයේ විශ්‍රාම ගිය සේවකයන්ගේ විශ්‍රාම දීමනාත් අපි වැඩි කර තිබෙනවා. මේ වන කොට අපට පුළුවන් වෙලා තිබෙනවා අපේ රටේ විදේශ සංචිත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 6.9ක් දක්වා ගෙන එන්න. අපේ ඉලක්කය මේ අවුරුද්ද අවසන් වන කොට අපේ විදේශ සංචිත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 8ක් දක්වා ගෙන ඒමයි.

අවුරුදු 5කට ආසන්න කාලයක් අපේ රටට වාහන ආනයනය කරන්න බැරි වුණා. නමුත් අපේ ආණ්ඩුව මැදිහත් වෙලා වාහන ගෙන්නුවා. මා හිතන්නේ රජයේ සේවකයන් බොහෝ දෙනෙකු අපේ රට අත් හැරලා පිටරට යන්න පටන් ගත්තේ ඔවුන්ට අවශ්‍ය ජීවන තත්ත්වය මේ රටේදී අත් කර ගන්න බැරි වෙච්ච නිසා. නමුත්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ පාලන සමය තුළ වාහන ආනයනය කරන්න අපට පුළුවන් වුණා. ඒ වාගේම අපේ රටේ පැවැති කර්මාන්තශාලා දියුණු කිරීමේ කටයුත්ත අපි පටන් ගත්තා. විදේශ ප්‍රේෂණ ප්‍රමාණය වැඩි වුණා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හරහා, රේගුව හරහා අපට ලබා ගන්න තිබෙන ආදායම අපි වැඩි කර ගත්තා. ලංකා ඉතිහාසයේ ට්‍රිලියනයකට එහා මුදල් ප්‍රමාණයක් 2025 අවුරුද්ද අවසන් වන කොට ඉතිරි කර ගන්න අපට පුළුවන් වුණා.

අප මේ සියලු දේ කළේ දැවැන්ත අර්බුද 2කට මුහුණ දීලායි. මම ඒ ගරු මන්ත්‍රීතුමාට කියනවා, ලංකා ඉතිහාසයේ එතෙක් මෙතෙක් සිදු වුණු දැවැන්තම ස්වාභාවික හානිය "දිට්වා" සුළි කුණාටුව බව. එමඟින් අපේ රටට සිදු වුණු හානිය ඩොලර් බිලියන 4කට වඩා වැඩියි. එයින් පරිසරයට සිදු වුණු හානිය කොච්චරක්ද කියලා අපට කියන්න බැහැ. "දිට්වා" සුළි කුණාටුවෙන් සිදු වුණු හානිය අකා මකා ගන්න, එහෙම නැත්නම් ජනතාවට සහන සලන්න අපි මේ වන කොට රුපියල් කෝටි 50,000ක් වෙන් කරලා තිබෙනවා.

මීට මාස කිහිපයකට ඉස්සෙල්ලා ලෝක අර්බුදයක් ඇති වුණා. විශේෂයෙන්ම ඇමෙරිකාව සහ ඊශ්‍රායලය ඉරානයත් සමඟ ඇති වුණු ගැටුමෙන් ලෝක තෙල් වෙළෙඳ පොළ තුළ විශාල අර්බුදයක් ඇති වුණා. අපේ රට විතරක් නොවෙයි, විශේෂයෙන්ම ලෝකයේ හැම රටක්ම ඒ හේතුවෙන් අර්බුදයට ගිහිල්ලා තිබෙනවා. ලෝකයේ දියුණු රටවල් පවා ඒ තත්ත්වයට මුහුණ දීලා තිබෙනවා. එවැනි තත්ත්වයක් එක්ක තමයි "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ තේමා පාඨය යටතේ අපේ රටේ ජනතාවට අවශ්‍ය පහසුකම් සපයන්න අප සමත් වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලා කියන ආකාරයට ජනතා විරෝධයක් තිබෙනවා නම්, ජනතාවට දැනෙනවා නම්, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධව පසුගිය සතියේ කොටුව දුම්රිය පොළ ඉදිරිපිට පැවැත්වුණු උද්ඝෝෂණයට ජනතාව එන්න එපායැ. අඩුම ගණනේ එයට 150ක්, 200ක්වත් කැඳවා ගන්න බැරි වුණා නේ. විපක්ෂය එම සංශෝධනය ගැන කොච්චර නම් කෑ ගහනවාද. හැබැයි කෑ ගැහුවාට අඩු ගණනේ 200ක්වත් එතැනට ගෙන්වා ගන්න බැරි වුණා නේ. ඔබතුමන්ලා ඔච්චරටම චණ්ඩි නම්, ජනතාව එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ගොඩක්ම විරුද්ධයි කියනවා නම්, ජනතාව එක්ක එන්න කියලා අපි ඔබතුමන්ලාට කියනවා. ජනතාව නැති නිසා තමයි විපක්ෂයේ ඔබතුමන්ලාට මේ විධියට පාර්ලිමේන්තුව තුළ කෑ ගහන්න සිද්ධ වෙලා තිබෙන්නේ. හැබැයි, එළියේ ඔබට ජනමතයක් නැහැ.

"පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" ගොඩනඟන ක්‍රියාවලියේදී, විශේෂයෙන්ම අපේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය ගරු බිමල් රත්නායක මැතිතුමා 2026 මැයි 19 දිනැති අංක 2489/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ සහ 2026 ජුනි 17 දිනැති අංක 2493/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග අනුමත කර ගැනීම සඳහා තමයි ඒවා අද දවසේ මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. අපට මෙම විවාදයට සම්බන්ධ වෙන්න ලැබීම භාග්‍යයක්.

මම කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරන මහජන මන්ත්‍රීවරයෙක්. විශේෂයෙන්ම, කුරුණෑගල කියන්නේ උතුර දකුණ යා කරන, නැඟෙනහිර බටහිර යා කරන ප්‍රධාන නගරයක්; A ශ්‍රේණියේ මාර්ග දෙකක් එකිනෙකට හමු වන නගරයක්. අපේ කුරුණෑගල නගරය ගත්තොත්, එය විශේෂයෙන්ම අධිවේගී මාර්ගයට ප්‍රවේශ මාර්ග කිහිපයක් සහිත, විශේෂයෙන්ම උතුරු අධිවේගී මාර්ගයට, මධ්‍යම අධිවේගී මාර්ගයට, ඒ වාගේම දක්ෂිණ අධිවේගී මාර්ගයට සම්බන්ධ වන ප්‍රවේශ මාර්ග සහිත ප්‍රධාන නගරයක්. සාමාන්‍යයෙන් දවසකට ලක්ෂ 3කට ආසන්න ජන පිරිසක් අපේ කුරුණෑගල නගරයට එනවා. දවසකට වාහන විශාල ප්‍රමාණයක් කුරුණෑගල නගරයට ඇතුළු වෙනවා. විශේෂයෙන්ම උතුර, දකුණ, නැඟෙනහිර, බටහිර සම්බන්ධ කරන ගමන්, අපේ නගරයට විශාල ජන පිරිසක් එකතු වෙනවා. දවසකට පාසල් දරුවෝ විතරක් 35,000කට ආසන්න පිරිසක් එකතු වෙනවා. ජාතික පාසල්වල, පළාත් සභා පාසල්වල 35,000කට ආසන්න ළමුන් පිරිසක් එම නගරයට ඇදී එනවා. කුරුණෑගල කියන්නේ වයඹ පළාතේ ප්‍රධාන පරිපාලන නගරය. එම නිසා විශාල වාහන තදබදයක් අපි දකිනවා. ඒ හේතුව නිසා අපේ දිස්ත්‍රික්කයෙන් අනතුරු විශාල ප්‍රමාණයක් වාර්තා වෙනවා. විශේෂයෙන්ම මීට වසර කිහිපයකට පෙර ලංකාවේ වැඩිම අනතුරු සිදු වුණේ අඹේපුස්ස - ත්‍රිකුණාමලය මාර්ගයේ ගොකරැල්ල පොලිස් බල ප්‍රදේශය තුළයි. වසර කිහිපයක අනතුරු හා සම්බන්ධ වාර්තා ගෙන බැලුවොත් පෙනෙනවා, වැඩිම අනතුරු ප්‍රමාණයක් වාර්තා වන්නේ විශේෂයෙන්ම ගොකරැල්ල ප්‍රදේශයෙන් බව. අන්න එවැනි දේවල් දැකලා මිනිසුන්ගේ ජීවිත ගොඩ නඟන්න තමයි මේ විධියේ පනත් කෙටුම්පත් ගෙනැල්ලා තිබෙන්නේ. විශේෂයෙන්ම වාහනවල තත්ත්ව සහතිකය පිළිබඳව අපි වැඩි අවධානයක් යොමු කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මීට මාස කිහිපයකට ඉස්සෙල්ලා කුලියාපිටිය ප්‍රදේශයේ පාසල් ළමුන් ප්‍රවාහනය කළ වාහනයක් ටිපර් රථයක ගැටිලා දරුවන්ගේ ජීවිත අහිමි වුණා ඔබතුමියටත් මතක ඇති. අද ගත්තොත්, විශේෂයෙන්ම පාසල් ළමුන් ප්‍රවාහනයට, ඒ වාගේම ඇඟලුම් කාර්මාන්තයේ නිරත වන සේවක සේවිකාවන් ප්‍රවාහනයට යොදා ගෙන තිබෙන්නේ භාවිත කරලා, භාවිත කරලා ප්‍රවාහනයට නුසුදුසු, ධාවනයෙන් ඉවත් කරන්න ඕනෑ වාහනයි. ඒ නිසා තමයි ජීවිත විශාල ප්‍රමාණයකට හානි වෙන්නේ. ඒ නිසයි අප ගැසට් නිවේදන හරහා මෙවැනි නියෝග ගෙනැල්ලා හොඳ ප්‍රවාහන සේවයක් නිර්මාණය කරන්න කටයුතු කරන්නේ. ඒක තමයි පොහොසත් රටක් කියන්නේ. එතැනින් තමයි ලස්සන ජීවිතයක් ගොඩ නැඟෙන්නේ. ඒ සඳහා තමයි මේ නීති ගෙනෙන්නේ. එම නිසා අපි කියනවා, මේ හැම නීතියක්ම ගෙනැල්ලා මේ රටේ ජනතාවගේ ජන ජීවිත ඉදිරියට ගෙන යන්න අප උත්සාහ කරනව බව.

අපේ රටේ රිය අනතුරු නිසා අපට දිනකට ජීවිත 7ක් අහිමි වෙනවා; වසරකට 2,700කට ආසන්න පිරිසක් මිය යනවා. අපේ මිනිස්සු, අපේ අම්මලා තාත්තලා, අපේ සහෝදර සහෝදරියන්, අපේ දරුවන් තමයි මේ විධියට අපට අහිමි වෙන්නේ. එම නිසා අපි ඒ සියලු දේ නතර කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් තමයි මේ නීති රීති ගෙනෙන්නේ.

මෙහිදී අපේ කුරුණෑගල නගරය ගැන කියන්න ඕනෑ. 2027, 2028 සහ 2029 කියන්නේ දැවැන්ත සංවර්ධනයක් සහිත වසර තුනක්. අපි එවැනි වසර තුනක් නිර්මාණය කරනවා. ඒ වෙනුවෙන් අපි යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. අපි විශේෂයෙන්ම ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා; අමාත්‍යාංශ ලේකම්තුමාගෙනුත් ඉල්ලීමක් කරනවා. අපි යෝජනා ඉදිරිපත් කරලාත් තිබෙනවා. ඒවායින් සමහරක් අනුමත වෙලා තිබෙනවා. දිගු සංවර්ධන වැඩ සටහනට අනුව ගත්තොත්, අපි මේ වසර අවසන් වෙන්න පෙර කුරුණෑගල - දඹුල්ල අධිවේගී මාර්ගය හා සම්බන්ධ පළමු අදියර ආරම්භ කරනවා. ඒ වාගේම දැනට පොතුහැර - රඹුක්කන මාර්ගයේ වැඩ අවසන් අදියරේ තිබෙන්නේ. එතැනින් එහාට ගියාම ගලගෙදර දක්වා එම මාර්ගයේ වැඩ අවසන් කරන්න තිබෙනවා. කුරුණෑගල නගරය තුළ විශේෂයෙන්ම මල්ලවපිටියේ සිට ගෝනගම දක්වා මහනුවර - පුත්තලම මාර්ගයට අදාළව මංතීරු 4ක් සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය මේ වන කොට සැලසුම් ඉදිරිපත් කරලා තිබෙනවා.

ඒ වාගේම දැවැන්ත රථ වාහන තදබදයක් තිබෙනවා, කුරුණෑගල නගරයේ යන්තම්පලාව හන්දියේ. ඒ ස්ථානය පුළුල් කරලා, විදුලි ආලෝක සංඥා දමලා, ඒ රථ වාහන තදබදය අඩු කරන්න අපි කටයුතු කරනවා. මොකද, ඒ මාර්ගයේ, ඒ ස්ථානයේ විතරක් මිනිසුන්ගේ කාලය, ශ්‍රමය, ඒ වාගේම දැවැන්ත ඉන්ධන ප්‍රමාණයක් විනාශ වන ආකාරය අපි දකිනවා. ඒ වාගේම කුරුණෑගල නගරය ආශ්‍රිතව, වර්තමාන දුම්රිය පොළ කේන්ද්‍ර කරගෙන multi-modal centre එකක් ස්ථාපිත කරන්න කටයුතු කරනවා. ඒ වාගේම පොල්ගහවෙල ඉඳලා මහව මංසන්ධිය දක්වා ද්විත්ව දුම්රිය මාර්ගයක් ඉදිකිරීමට අපි යෝජනා කරලා තිබෙනවා. ඒ වාගේම කුරුණෑගල-මාදම්පේ මාර්ගයේ මුල් කිලෝමීටර 5 මංතීරු හතරක් දක්වා පුළුල් කරන්න යෝජනා කරලා තිබෙනවා. ඒ වාගේම මධ්‍යම අධිවේගී මාර්ගයේ පොතුහැර සිට කුරුණෑගල දක්වා කොටසේ යම් ප්‍රමාණයක් මංතීරු හතරකට තවම හදලා නැහැ. ඒ නිසා පොතුහැර සිට කුරුණෑගල නගරයට ආසන්න වෙනකල් මංතීරු හතරක් දක්වා පුළුල් කිරීමට යෝජනා කරලා තිබෙනවා. ඒ වාගේම කිරිවවුල ඉඳලා කුරුණෑගල නගරය දක්වා කොටසක් තිබෙනවා. ඒකේත් අවසාන ක්‍රියාවලිය තිබෙනවා මංතීරු හතරක් නිර්මාණය කරන්න.

ඒ වාගේම උතුරුදිග දුම්රිය මාර්ගයේ, දඹුල්ල-අඹේපුස්ස මාර්ගයේ ගැටවුවාන ආසන්නයේ තිබෙනවා, දුම්රිය හරස් මාර්ගය. එතැන ගුවන් පාලමක් ඉදිකරන්න අපි යෝජනා කරලා තිබෙනවා. 2029 අවුරුද්ද අවසන් වෙනකොට ඒ සියලු සංවර්ධන කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. අපේ නගරය, ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ විනයක් සහිත, ඉතාම දියුණු නගරයක් බවට පත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. අපේ නගරයේ ව්‍යාපාරික ස්ථානවලින් එළියට බහින්නේ, මහ පාරට. ඒ නිසා ඒ මාර්ග පුළුල් කරලා ජනතාවට ආරක්ෂාව සලසන්න ඕනෑ. ඒ වෙනුවෙන් තමයි අද මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ, අපේ ප්‍රවාහන, මහාමාර්ග අමාත්‍යතුමා. ඒ නිසා අපේ පැත්තෙන් අපි ඒ වෙනුවෙන් අපේ උපරිම සහයෝගය ලබා දෙනවා. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, ප්‍රවාහන, මහාමාර්ග අමාත්‍යාංශය හැටියට, අමාත්‍යතුමා හැටියට අපේ නගරය ඉතාම දියුණු නගරයක් බවට පත් කරන්න අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරන්න මැදිහත් වෙයි කියලා. ඉතින්, මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු දිනේෂ් හේමන්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.31]

**ගරු දිනේෂ් හේමන්ත මහතා**
(மாண்புமிகு தினேஷ் ஹேமந்த)
(The Hon. Dinesh Hemantha)

ජනතාවාදී පාලනයක් සඳහා අපට පාලනය භාර දුන් ජනතාව වෙනුවෙන් තවත් ජනතාවාදී තීන්දු දෙකක් සම්මත කර ගන්නා මේ අවස්ථාවේදී අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න අවසරයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ආණ්ඩු පක්ෂයේ අපේ සහෝදර මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් බොහෝ පිරිසක් අද මේ අලුත් නියෝග දෙක තුළින් ප්‍රවාහනයේ, එහෙම නැත්නම් මඟී ජනතාවගේ සහ පොදු වාහනවල ගමන් කරන්නන්ගේ ආරක්ෂාව වෙනුවෙන් අපි අරගෙන තිබෙන ක්‍රියාමාර්ග දෙකේ ගුණාත්මකභාවය ගැන බොහෝ අදහස් දැක්වූවා. ආණ්ඩුවට අවුරුදු දෙකක් ගතවන මේ වෙලාවේ, පසුගිය වසර දෙක ඇතුළත ප්‍රවාහන ක්ෂේත්‍රයේ මහාමාර්ග දියුණු කිරීම සම්බන්ධයෙන් වූ විවිධ පැතිකඩ ඔස්සේ කථා කරනවා. 2025 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකා ඉතිහාසයේ බිහිසුණුම ස්වාභාවික ව්‍යසනය වූ "දිට්වා" ව්‍යසනයෙන් ප්‍රවාහන ක්ෂේත්‍රයට, විශේෂයෙන්ම මාර්ග පද්ධතියට වෙච්ච හානිය වසරක් - මාස අටක් නවයක් - වාගේ කාලයක් ඇතුළත යථා තත්ත්වයට පත් කර ගන්න ප්‍රවාහන, මහාමාර්ග අමාත්‍යාංශය විධියට අපි සමත් වුණේ කොහොමද කියන එක ගැන ආණ්ඩුවටත් වඩා දුකෙන් ඉන්න අපේ විපක්ෂයේ මහත්තුරුන්ට දැන ගන්නත් එක්ක පැහැදිලි කරන්න මට අවස්ථාවක් දෙන්න.

ලෝක බැංකු තක්සේරුව අනුව, 2025 නොවැම්බර් මාසයේදී "දිට්වා" ව්‍යසනයෙන් වෙච්ච හානිය ඇමෙරිකානු ඩොලර් බිලියන 4.1ක් පමණ වෙනවා. එහිදී RDA එකට අයත් මාර්ග 316ක් හානියට පත් වුණා. ප්‍රාදේශීය සභා, පළාත් සභා සහ RDA කියන සමස්ත මාර්ග පද්ධතියෙන්, අපේ ප්‍රධාන ප්‍රවාහන පද්ධතියට අයත් වන RDA පාරවල් විතරක් 316කට ආසන්න සංඛ්‍යාවක් "දිට්වා" ව්‍යසනයෙන් හානියට පත් වුණා. දළ වශයෙන් ගණනය කළොත්, සාමාන්‍යයෙන් කිලෝමීටර 1,450කට ආසන්න ප්‍රමාණයක් "දිට්වා" ව්‍යසනය නිසා විනාශයට පත්වෙලා තිබුණා. ප්‍රධාන වශයෙන් පාලම් 40ක් හානියට පත් වෙලා තිබුණා. අපි මේ ආපදාවට ඉතා කඩිනමින් - ක්ෂණිකව - ප්‍රතිචාර දැක්වීමේ ප්‍රතිඵලයක් විධියට මේ වන විට ප්‍රධාන මාර්ගයක් සහ පාලම් දෙකක් හැර ඉතුරු සියලු මාර්ග ප්‍රවාහනයට සුදුසු පරිදි තාවකාලිකව සහ ස්ථිරව හදලා ඉවර කරලායි තිබෙන්නේ. ඒක තමයි මේ මාස 9ක් තුළ අපි ලබපු ජයග්‍රහණය. ඒ වාගේම ඒ පාලම් 40න් පාලම් 23ක් ප්‍රවාහනයට සුදුසු පරිදි සකස් කරලා තිබෙනවා. ස්ථිරව හදන්න ඕනෑ ඉතුරු පාලම් සඳහා bailey bridges දමලා, ගමනාගමනයට අවස්ථාව සලසා දීලා තිබෙනවා, පාලම් දෙකක් හැරුණුකොට.

ඒක තමයි, "දිට්වා" ආපදාවට අදාළව ඉතා කෙටි කාලයක් තුළ ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශය විධියට අපි දැක්වූ ප්‍රතිචාරය. ඒ වාගේම මේ ව්‍යසනයට අපි තාවකාලිකව විසඳුම් හොයද්දී ඒ වෙලාවේ විපක්ෂයෙන් අපට චෝදනාව එල්ල වුණේ වැලි කොට්ට සංස්කෘතිය, වැලි කොට්ට සංවර්ධනය, වැලි කොට්ට පැලැස්තර මඟින් මේ ප්‍රශ්නයට උත්තර හොයනවා කියන එක. නමුත් ඉතා ක්ෂණිකව ලබා දුන් ඒ විසඳුම් හේතුවෙන් අපට පුළුවන් වුණා, රටේ සමස්ත සැපයුම් ජාලය - භාණ්ඩ ප්‍රවාහන සහ වෙළඳ පොළට අවශ්‍ය සැපයුම් ජාලය - අඛණ්ඩව පවත්වාගෙන යන්න. ඒ

[ගරු දිනේෂ් හේමන්ත මහතා]

අවස්ථාවේදී ඒ සැපයුම බිඳ වැටුණා නම්, වෙළඳ පොළේ ඉල්ලුමට සරිලන විධියට ඒ සැපයුම අපට පවත්වාගන්න නොහැකි වුණා නම් භාණ්ඩවල මිල ඉහළ ගිහිල්ලා භාණ්ඩ හා සේවාවල පොදු මිල මට්ටම එහෙම නැත්නම් උද්ධමනය තවත් තීව්‍ර වෙලා ජනතාවට තවත් පීඩනයට පත් වෙන්න අවස්ථාව තිබුණා. නමුත් අපි ක්ෂණික ප්‍රතිචාර දක්වලා, එහෙම නැත්නම් මේ කියන තාවකාලික විසඳුම් ලබා දීලා අපට පුළුවන් වුණා, වෙළෙඳ පොළ ස්ථාවරව පවත්වාගෙන ජන ජීවිතයට වෙන්න තිබුණු බලපෑම අවම කරන්න. ඒකයි ජනතාවාදී ආණ්ඩුවක ප්‍රතිචාරය වන්නේ.

මේ අවස්ථාවේදී විශේෂයෙන් තවත් සඳහන් කරන දෙයක් තිබෙනවා. මාර්ග ආරක්ෂණය සම්බන්ධයෙන් මෙතෙක් කල් පැවති ආණ්ඩුවලට අවධානයට යොමු කර ගන්න බැරි වෙච්ච විශේෂ කාරණයක් තිබුණා. ඒ අනුව, කඳුකර ප්‍රදේශ ආශ්‍රිතව සහ අනෙකුත් ප්‍රදේශවල විශේෂයෙන් රිය අනතුරු සිදුවන ස්ථාන හඳුනා ගෙන ඒ අනතුරු ප්‍රමාණය අවම කරන්න අවශ්‍ය ආරක්ෂණ ක්‍රියාමාර්ග ගන්න ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශය විධියට අපි ක්‍රියාත්මක වෙලා තිබෙනවා. සෑම දිස්ත්‍රික්කයකටම මිලියන 60ක මුදලක් වෙන් කරලා, තෝරාගත් ප්‍රාදේශීය සභාවලින් සැලසුම් සහගතව ඉදිරිපත් කරන ආරක්ෂණ ව්‍යාපෘති අවම වශයෙන් දෙකකට හෝ තුනකට මුදල් යොමු කරන්න දැන් අවස්ථාව හදලා තිබෙනවා.

කලින් ආණ්ඩුවලින් වාගේ ඉල්ලුවාට සල්ලි දෙන්නේ නැහැ. ඒකට සැලසුම් ඉදිරිපත් කරන්න ඕනෑ. අපි පෙන්වන්න ඕනෑ, මේ මාර්ග ආරක්ෂණ ක්‍රියාවෙන් පස්සේ ජනතාවගේ සුබ සිද්ධිය, එහෙම නැත්නම් ආරක්ෂාව තහවුරු වෙනවා, මාර්ග අනතුරු ප්‍රමාණය පෙරට වඩා අඩු වෙනවා කියලා. ඒ සහතිකය ලබා දුන්නාට පස්සේ ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශයෙන් ඒ මුදල වෙන් කරනවා. මාතලේ දිස්ත්‍රික්කය ගැන මට අත්දැකීමෙන් කියන්න පුළුවන්. අපට වෙන් වෙච්ච මුදලින් ප්‍රධාන වශයෙන් අපි එක ස්ථානයක් තෝරා ගෙන තිබෙනවා. ලග්ගල ආසනයේ විල්ගමුව එළවනා කන්ද ප්‍රදේශයේ දැනට මාරක රිය අනතුරු 28කට වඩා වැඩි ප්‍රමාණයක් වෙලා තිබෙනවා. පුද්ගලයන් තුන්, හතර දෙනෙක් මිය ගිහිල්ලා තිබෙනවා. මාතලේ දිස්ත්‍රික්කයේ එම ස්ථානයේ ආරක්ෂිත වැටක් නිර්මාණය කරලා රිය අනතුරු ප්‍රමාණය අඩු කර ගන්න අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන අපි වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම අනෙකුත් දිස්ත්‍රික්කවලත් අන්න ඒ වාගේ මාර්ග අනතුරු සිදුවන ස්ථාන හොයාගෙන ආරක්ෂණ වැඩ පිළිවෙළට අදාළ ව්‍යාපෘති හඳුනාගෙන තිබෙනවා. ඉදිරි දවස්වලදී ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වනවිට වසරකදී සිදුවන රිය අනතුරු ප්‍රමාණය සලකා බැලුවාට පස්සේ ඒ රිය අනතුරුවලින් වැඩිම ප්‍රමාණයක් මිය යන්නේ මෝටර් සයිකල් ධාවකයන්. 2023 අවුරුද්දේ දළ වශයෙන් 860දෙනෙක් මිය ගිහිල්ලා තිබෙනවා. 2024 අවුරුද්දේ 923ක් මිය ගිහිල්ලා තිබෙනවා. 2025 අවුරුද්දේ 713ක් මිය ගිහිල්ලා තිබෙනවා. 2026 මේ වනවිට 700කට ආසන්න ප්‍රමාණයක් මිය ගිහිල්ලා තිබෙනවා. මෙන්න මේ ගැන විශේෂ අවධානයක් යොමු කරලා අසීරු නමුත් ජනතා හිතවාදී තීන්දුවක් විධියට අපි තීරණයක් ගත්තා. ඒ මිය යන බොහෝ පුද්ගලයන් හිසට සිදුවන බරපතළ හානි නිසා තමයි මිය යන්නේ. ඒක නිසා SLS ප්‍රමිතියට අනුකූල හිස් වැසුම් පළිඳන්න ඕනෑය කියන නීතිය අපි අරගෙන ඇවිල්ලා තිබෙනවා. මෙතැනින් ඉස්සරහට අළෙවි කරන්න පුළුවන් SLS සහතිකය තිබෙන හිස් වැසුම් පමණයි.

අවසාන වශයෙන් කියන්න දෙයක් තිබෙනවා. අපි තවත් යෝජනාවක් අරගෙන ඇවිල්ලා තිබෙනවා, මාර්ග තදබදය අවම කර ගන්නත්, මෝටර්සයිකල් ධාවකයන්ගේ ආරක්ෂාව තහවුරු කරන්නත්. ප්‍රධාන මාර්ගවල වෙනම මංතීරුවක් මෝටර්සයිකල් පදවන්නන්ට වෙන් කරලා දෙන්න අවස්ථාව හදලා දෙන්නත් අපි ක්‍රියාත්මක වෙලා තිබෙනවා.

මට නියමිත අවසාන විනාඩි දෙක ගන්නම්, මේ කාරණය කියන්න. මීට කලින් විපක්ෂය වෙනුවෙන් කථා කළ මන්ත්‍රීතුමා, එතුමාගේ ආර්ථික දර්ශනය, දැක්ම අනුව අපට සැහෙන උපදෙස් ප්‍රමාණයක් ලබා දුන්නා. එතුමා අපට වඩා දුකෙන් ඉන්නවා, "අවුරුදු දෙකක් යද්දී ආණ්ඩුව ආපස්සට ගිහිල්ලා තිබෙනවා. ඉතුරු අවුරුදු දෙක යනකොට ආණ්ඩුව කඩාගෙන වැටේවි" කියලා. ඒ ගැන එතුමන්ලාට හයක් තිබෙනවා. ඒ හය තිබෙන්නේ ආණ්ඩුව කඩාගෙන වැටිලා ආණ්ඩුව භාර ගත්තාට පස්සේ පරණ අකරතැබ්බයට මුහුණ දෙන්න වෙයි කියන අත්දැකීම තිබෙන නිසා වෙන්න පුළුවන්. 2025 - 2026 වසර සලකා බැලුවොත් ශ්‍රී ලංකා ඉතිහාසයේ වැඩිම රාජ්‍ය ආදායම උපයා දුන්නේ, 2025 අවුරුද්දේ ජාතික ජන බලවේග ආණ්ඩුවෙන්. අපි 2025 අවුරුද්දේ වැඩිම රේගු ආදායම ඉපයුවා. 2025 නොවැම්බර් 14වැනි දා එක් දිනකදී උපයන්න පුළුවන් වැඩිම රේගු ආදායම උපයපු දවස බවට පත් කරන්න අපි සමත් වුණා. ඒ වාගේම, 2018න් පස්සේ වැඩිම විදේශ සංචාරකයන් ප්‍රමාණයක් පැමිණි අවුරුද්ද, වැඩිම විදේශ ප්‍රේෂණ ලබා දුන් අවුරුද්ද බවට 2025 අවුරුද්ද අපි පත් කර තිබෙනවා.

සෞඛ්‍ය ක්ෂේත්‍රය ගැන කථා කළොත්, අවුරුදු 76ක් වාගේ කාලයක් තුළ ශ්‍රී ලංකාවේ රෝහල් පද්ධතිය තුළ තිබිලා තිබුණේ cath labs 10යි. මේ අවුරුදු දෙකට අපි cath labs 16ක් ස්ථාපිත කරලා තිබෙනවා. අවුරුදු 76කට cath labs 10ක් හදපු මිනිස්සු, තමන්ගේ ආර්ථික දැක්ම කොයි වාගේද කියලා ආර්ථික උපදෙස් දෙන්න කලින් ඒ ගැන හිතන්න ඕනෑ. අපි මේ අවුරුදු දෙක ඇතුළත cath labs 16ක් ස්ථාපිත කරලා තිබෙනවා.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මෙයයි. ඩොලර් නැවෙන් එනකම් ඉන්න විධියේ උපදේශයක් ලබාගෙන ආර්ථිකයක් කරගෙන යන්න ජාතික ජන බලවේගයට අවශ්‍යතාවක් නැහැ. ඒ ආර්ථික උපදෙස් නිසා කඩා වැටිච්ච රට භාරගෙන තමයි ජාතික ජන බලවේගය මේ අවුරුදු 2 තුළ ඉස්සරට ඇවිල්ලා තිබෙන්නේ. කිලෝමීටරයක් නොවෙයි, මීටරයක් නොවෙයි, අඩුම තරමේ සෙන්ටිමීටරයක්වත් ඉස්සරහට අරගෙන යන්න බැරි වෙච්ච සංවර්ධනයක් තිබුණු වෙලාවක, වසර 2ක් වාගේ කාලයක් ඇතුළත රුපියල් බිලියනවලින් ගත්තොත්, රුපියල් බිලියන 6කට ආසන්න මුදල් ප්‍රමාණයක් වෙන් කරලා අපි මේ මාර්ග සංවර්ධනයට අත ගහලා තිබෙනවා. ඒ නිසා ජනතාවට සුබයි; රටට සුබයි; ගමන සුබයි කියන එක යළි යළිත් තහවුරු කරනවා. මේ වසරට වඩා ඊළඟ වසර තවත් සුබයි. ඊළඟ වසර ඊටත් වඩා සුබයි කියමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.42]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "සුබයි, සුබයි" කියලා එතුමා කිව්වා. ඔව්, මන්ත්‍රීවරු 159දෙනාටයි, ජනාධිපතිතුමාටයි නම් සුබයි. ඔව්, ශ්‍රී ලංකා රේගුවෙන් වැඩිම ආදායම් ලැබුවේ මේ ආණ්ඩුව, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අර කන්ටේනර් 323 පැන්නුවා නේ. ශ්‍රී ලංකා රේගුවෙන් වැඩිම ආදායම් ලැබුවේ මේ ආණ්ඩුව; ඔබතුමියලාගේ

ආණ්ඩුව. ඒ, කන්ටේනර් 323 පන්නපු වෙලාවේ. ඔබතුමන්ලා බලයට ආපු දවසේ ඉඳලා "අරකට සල්ලි වෙන් කළා, මේකට සල්ලි වෙන් කළා" කියලා කියනවා. හැබැයි අවංකව මේවා බිම් මට්ටමේ යථාර්ථයක් බවට පත් වෙනවාද? මේ මුදල් බිම් මට්ටමේ ආයෝජනය වෙලා රටේ ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය වෙනවාද? වර්තමානයේ තිබෙන ආර්ථික ප්‍රතිපත්තිය මේ රටේ සාමාන්‍ය ව්‍යවසායකයාට, ව්‍යාපාරිකයාට දරාගන්න පුළුවන්ද, බැරිද? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ප්‍රශ්නයට තමයි ආණ්ඩුව උත්තරයක් දෙන්න ඕනෑ. යථාර්ථය නම්, ගමේ ජීවන වියදම වැඩි වෙලා, ගොවියාගේ ආදායම අඩු වෙලා.

දැන් එල් නිනෝ තත්ත්වයක් පිළිබඳව ආණ්ඩුව කියවනවා. හැබැයි, එල් නිනෝ තත්ත්වය එන්න කලින් වෙලාවට වතුර ටික දුන්නේ නැහැ, පොහොර ටික යැව්වේ නැහැ. ආණ්ඩුවෙන් ලබා දෙන්න ඕනෑ පොහොර ප්‍රමාද කළාට පස්සේ මොකද වෙන්නේ? එකම නැවේ පොහොර ටික එන්නේ. හැබැයි පෞද්ගලික ව්‍යාපාරිකයාගේ පොහොර ටික කලින් ගමට යනවා. ආණ්ඩුවේ මුදල් ටික පරක්කු වෙනවා. අවසානයේ ගොවියාට වැඩි මුදලට පොහොර මිලදී ගන්න වෙනවා. වැඩි මුදලට පොහොර මිලදී ගත්තාට පස්සේ නිෂ්පාදන පිරිවැය වැඩි වෙනවා. හැබැයි ආණ්ඩුව සුපුරුදු පරිදි සහන දුන්නා කියලා ගණනත් හදනවා. රුපියල් 120ට වී කිලෝවක් මිලදී ගන්නකොට, වී කිලෝවකට රුපියල් 151ක්වත් දෙන්න ඕනෑ කියලා ඔබතුමන්ලාම නේ කිව්වේ. කුඹුරට බැහැලා, ගොයම් කාලා එදා දැඟලුවේ. අද වෙලා තිබෙන්නේ මොකක්ද? දැන් කියනවා, "නැහැ, වී කිලෝවක මිල රුපියල් 120ත් නොවෙයි, රුපියල් 151ත් නොවෙයි" කියලා. කිලෝවක් රුපියල් 80ට, 85ට තමයි අද තෙත වී කිරන්නේ. මේක තමයි ඇත්ත කථාව. වේළපු වී කිලෝවක් රුපියල් 90යි, 95යි. වී කිලෝවක් රුපියල් 120ක් කියලා ආණ්ඩුව කිව්වාට, ආණ්ඩුව වී මිලදී ගන්නේ නැහැ. ගත්ත ඒවායේ සල්ලි දීලාත් නැහැ. හැබැයි මේ කාල සීමාව ඇතුළත හාල් මෙට්‍රික් ටොන් ලක්ෂ 4ක් පිටරටින් ගෙනැල්ලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රටේ ගොවියාගේ වී ටික විකුණාගන්න බැරි වෙනකොට, මේ රටේ ගොවියාගේ ආර්ථිකය ශක්තිමත් කරන්න බැරි ආණ්ඩුවට පිට රටින් හාල් ගෙනැල්ලා විකුණන්න පුළුවන්. අවුරුද්දේ මාස 12න් මාස 2ක් කන්න දෙන්න පුළුවන් වෙන විධියට පිට රටින් හාල් ගෙනැල්ලා තිබෙනවා. අවසානයේ මොකක්ද වෙන්නේ? අවසානයේ අපහසුතාවට පත් වෙන්නේ ගොවි ජනතාව.

අද වෙනකොට ප්‍රධාන ජලාශ 74හි ජල මට්ටම සියයට 34ට අඩු වෙලා තිබෙනවා. පානීය ජලය නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සමහර ගම්වලට දවස් 20ත්, 25ත් අතර කාලයකට වතාවක් තමයි වතුර යන්නේ. මේවාට සහනයක් දෙන්න ආණ්ඩුවේ මැදිහත්වීම මොකක්ද? පසුගිය කාලයේ "දිට්වා" සුළි කුණාටුව ආපු වෙලාවේ ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා කියපු කථා ටික දැක්කා නේ. මාතලේ දිනේෂ් අයියා මේවා දීලාද දන්නේ නැහැ. ටකරමක් ගියොත් රුපියල් ලක්ෂ 10ක් දෙනවා, ඉඩමකට රුපියල් ලක්ෂ 50ක් දෙනවා, ගෙදරකට රුපියල් ලක්ෂ 50ක් දෙනවා කියලා ජනාධිපතිතුමා කිව්වා. ඒ ඔක්කෝම කියලා මදැයි, දැන් නේපාලයටත් ඩොලර් මිලියනයක් දෙනවාය කියලා එතුමා කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒකටත් පොල්ල තිබ්බාද කියලා මම නම් දන්නේ නැහැ. නේපාලයට නම් පොලු තියන්න ඉඩ තියන්න එපා කියලා තමයි මම ඔබතුමියගෙන් ඉල්ලන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ගරු කථානායකතුමාටත් ඒ ගැන කියන්න. ඒක ජාත්‍යන්තර වශයෙන් මේ රටට හොඳ නැහැ.

ඔබතුමන්ලා එක පැත්තකින් ලස්සන සුරංගනා කථා කියනවා. මාර්ග නීති තද කරන එක හොඳයි. හැබැයි, මගීන් අපහසුතාවට පත් නොවන විධියට ඒක කරන්න ඕනෑ. දැන් expressway එකේ seat belts දමාගෙන යන්න පුළුවන්. හොඳයි නේ, දැන් ඇඹුල්තියල් ගෙනෙන්න පුළුවන්. හෙල්ලෙන්නේ නැහැ නේ, seat belts දමාගෙන යන නිසා. දැන් expressway එකේ කිසි ප්‍රශ්නයක් නැතිව seat belts දමාගෙන ඇඹුල්තියල් අරගෙන එන්න පුළුවන්. හැබැයි, expressway එකේ එන්න තියා දැන් ඇඹුල්තියල් හදන්නවත් විධියක් නැහැ, බේරුවල වරායට බෝට්ටු එන්න දෙන්නේ නැති නිසා. ඇයි? ජනාධිපතිතුමා බේරුවල යනකොට බේරුවල වරායට බෝට්ටු එන්න දෙන්නේ නැහැ. ඉතින්, කොහේද ඇඹුල්තියල් හදන්නේ? ඔබතුමන්ලාගේ කථා නම් හොඳයි. හැබැයි, අනෙක් පැත්තෙන් තිබෙන ප්‍රශ්නය, මේවා බිම් මට්ටමෙන් ප්‍රායෝගික වෙනවාද කියන එකයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

පසුගිය කාලයේ කිව්වා, විශ්වවිද්‍යාල 50ක් හදන්න සැලසුම් කරනවා කියලා. විශ්වවිද්‍යාල 50ක් කෙසේ වෙතත්, ඉස්කෝලෙක බිල්ඩිමක දෙවෙනි තට්ටුවට නම් මුල්ගල තබනවා මම දැක්කා. ගිහිල්ලා නැකතට බ්ලොක් ගලක් තබනවා. විශ්වවිද්‍යාල 50ක් හදනවා කියලා බලයට ආවේ. ඉතින්, කාවද මේ රවට්ටන්න හදන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තව පැත්තක් තිබෙනවා. ජනාධිපතිතුමා කියනවා, කොත්තමල්ලි බීලා ගෙදර ඉන්නලු. බලයට එනකොට කිව්වේ, පුරවැසියන්ගේ - රෝගීන්ගේ - ප්‍රමාණයට අවශ්‍ය වෛද්‍යවරු දෙනවා කියලායි. හැබැයි, ඔබතුමියලා බලයට ආපු ගමන් GMOA එකත් එක්ක හැප්පුණා, වෛද්‍යවරු විවේචනය කළා. දැන් ඉස්පිරිතාලවල බෙහෙත් නැහැ. Life-saving drugs නැහැ, ඉස්පිරිතාලවල. Cancer රෝගීන්ට අවශ්‍ය බෙහෙත් ටික නැහැ, ඉස්පිරිතාලවල. එදා එහෙම කියපු තමුන්නාන්සේලා දැන් ඉස්පිරිතාලවලට අවශ්‍ය බෙහෙත් ටික දෙන්න මැදිහත් වෙන්නේ නැහැ. ඉස්පිරිතාලවලට බෙහෙත් ටික දෙන්නේ නැතිව මොකක්ද කරන්නේ? තමුන්නාන්සේලා දැන් ඇවිල්ලා කියනවා, ඉස්පිරිතාලේ යන්නත් එපාලු. අවුරුද්දකට කෝටි 8ක් ජනතාව ඉස්පිරිතාලවලට යනවා එනවා කියලා කියනවා. ඒ කියන්නේ, දළ වශයෙන් එක පුද්ගලයෙකු හතර වතාවයි නේ, යන්නේ. ඔබතුමන්ලා, ඔබතුමියලාට නම් ප්‍රශ්නයක් නැහැ නේ. 159දෙනා posh වෙලා කොළඹ නේ ඉන්නේ. Insurance එකත් තිබෙනවා නේ, පාර්ලිමේන්තුවේ. ඔබතුමියලා යන්නේ ලොකු ලොකු ඉස්පිරිතාලවලට නේ. ඉතින්, ඒක මේ ආණ්ඩුවේ ඉන්න අයට බලපාන්නේ නැහැ. හැබැයි, තවමත් ගමේ ඉන්න දෙමව්පියන් තමන්ගේ දරුවන්ට අසනීප වුණාම අරගෙන යන්නේ ආණ්ඩුවේ ඉස්පිරිතාලෙට. ඒ ඉස්පිරිතාලෙට බෙහෙත් ටික තිබෙන්න ඕනෑ. ඒ නිසා කොත්තමල්ලි බීලා ගෙදර ඉන්න කියලා ජනාධිපතිතුමාට කියන්න අයිතියක් නැහැ. ජනාධිපතිතුමා හිතනවා නම් කොත්තමල්ලි බීලා ගෙදර හිටියාම වැඩේ හරි, ඉස්පිරිතාලවලට බෙහෙත් ටික අරන් දෙන්න ඕනෑ නැහැ, ඒ නිසා කිසි ප්‍රශ්නයක් නැහැ, ඉස්පිරිතාලවලට බෙහෙත් ටික අරන් නොදී ලෙඩ්ඩු ටික ගෙවල්වල තියා ගන්න පුළුවන් කියලා, ඒකෙන්ම හිතා ගන්න පුළුවන් අද මේ රට පාලනය කරන ජනාධිපතිවරයාගේ මානසිකත්වය.

ඩෙංගු රෝගීන් විතරක් ලක්ෂයක් ඉන්නවා. මරණ ගණනාවක් සිදු වෙලා තිබෙනවා. ඩෙංගු රෝගය හැදෙන අයටත් කොත්තමල්ලි බීලා නිදා ගන්නද කියන්නේ? තමුන්නාන්සේලාට තමයි ප්‍රාදේශීය සභා, නගර සභා බහුතරයක බලය තිබෙන්නේ. අඩුම ගණනේ ඒ නගර සභා, ප්‍රාදේශීය සභා ප්‍රදේශවල සිටින ඩෙංගු රෝගීන් ප්‍රමාණය අඩු කර ගන්න ඔබ මැදිහත් වෙනවාද? නැහැ, ඒකට මැදිහත් වෙන්නේ නැහැ. හැබැයි, රෝගීන් ඉස්පිරිතාලෙට යන එක ප්‍රශ්නයක් කරගෙන තිබෙනවා. අපි ආණ්ඩුවට කියනවා, කරුණාකරලා ඉස්පිරිතාලවලට අවශ්‍ය බෙහෙත් ටික දෙන්න කියලා. රෝගීන්ට කොත්තමල්ලි බීලා ඉන්න කියන්න එපා. කොත්තමල්ලි බොන එකේ ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඒ පුද්ගලයන්ට අයිතියක් තිබෙන්න ඕනෑ, ඉස්පිරිතාලයකට යන්න ඕනෑ නම් යන්න. ජනාධිපතිතුමා හිතනවා ඇති, පොළට ගිහිල්ලා පොළේ තිබෙන බඩුවල මිල ඇහුවාම, උණ හැදෙනවා කියලා. ඇත්ත, බඩුවල මිල වැඩියි. පොළවල්වලට

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා ]

ගිහිල්ලා මිල ගණන් ඇහුවාම මිනිස්සු අසරණ වෙනවා තමයි. හැබැයි, බඩු මිල වැඩියි කියලා පොළට යන හැම කෙනාම ඉස්පිරිතාලෙට යන්නේ නැහැ, බෙහෙත් ගන්න. ඉස්පිරිතාලයට යන කෙනාට එහෙම යන්න අයිතියකුත් තිබෙනවා.

අනෙක් පැත්තෙන්, අද උද්ධමනය වැඩි වෙලා තිබෙනවා. තවත් පැත්තකින්, cybercrimes against children. සයිබර් අවකාශයෙන් දරුවන් ආරක්ෂා කර ගන්න එක අද ජාත්‍යන්තර වශයෙන් ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. අපේ රටෙත් ඒක ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. එක පැත්තකින් ආණ්ඩුව තමන්ගේ සමාජ මාධ්‍ය මෙහෙයවන අය දාලා පරුෂ වචනයෙන් බැණලා, චරිත ඝාතනය කරලා, තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍රය මේක ඇතුළේ ක්‍රියාත්මක කරන්න උත්සාහ කරනකොට, ඒකේ අවසාන ප්‍රතිඵලය තමයි මේ රටේ දරු පරම්පරාව ඒකේ ගොදුරක් බවට පත් වීම. අද අපිත් රටක් විදියට එහි ගොදුරක් බවට පත් වෙලා තිබෙනවා. ආණ්ඩුවටත් වගකීමක් තිබෙනවා, අධ්‍යාපන අමාත්‍යවරිය විධියට අග්‍රාමාත්‍යවරියටත් වගකීමක් තිබෙනවා, මීට වඩා මේ සම්බන්ධයෙන් මැදිහත් වෙලා, cybercrimes against children, නැත්නම් දරුවන් සයිබර් අවකාශයෙන් ආරක්ෂා කරන්න අවශ්‍ය නීති ක්‍රියාත්මක කරන්න, ඒ වාගේම නීති රීති හදන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි පැහැදිලිවම ඔබතුමියලාගෙන් ඉල්ලනවා, කරුණාකරලා මේ රටේ ජනතාව රවටන්න එපා කියලා. රැස්වීම මැදින් ගැරඩියෙක් ගියාද, නැද්ද කියන එක මට ප්‍රශ්නයක් නොවෙයි. හැබැයි ඔබතුමියලා හිතාගෙන ඉන්නවා නම්, සුරංගනා කථා කියලා මේ රටේ මිනිස්සුන්ව අන්දගෙන මේක ඉස්සරහට ගෙනියන්න පුළුවන් කියලා, ඒක සාර්ථක වෙන්නේ නැහැ. මාර්ග නීති හදන එක බොහොම හොඳයි. ඒ වාගේම පාරවල් හදන්න. දෙවැනි තට්ටුවටත් මුල්ගල් තියන්න. කක්කුස්සියටත් මුල්ගල් තියන්න. කොත්තමල්ලි මිලත් අඩු කරලා දෙන්න. හැබැයි ඒ අතර මේ රටේ ජනතාවට දරාගන්න පුළුවන් වන විධියට ජීවන වියදම පාලනය කරන්නත් කටයුතු කරන්න කියලා මම මතක් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.51]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි අද විවාද කරන්නේ, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග පිළිබඳවයි. මේවා ඉතා විශේෂ නියෝග. මේ මඟින් roadworthiness පිළිබඳව සලකා බැලෙනවා. වාහනයක් මාර්ගයකට දාන්න ඉස්සෙල්ලා ඒ වාහනය පාවිච්චි කරන්න සුදුසුද, නැද්ද කියන එක සම්බන්ධයෙන් අපේ රට තුළ මෙතෙක් පැවතුණේ දුර්වල නීති පද්ධතියක්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි පාර්ලිමේන්තුවේ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ අනුකාරක සභාවකදී මේ සම්බන්ධයෙන් යම් සොයා බැලීමක් කළා. ඒ අවස්ථාවේදී ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරින් විසින් ම ඉතාම උනන්දුවෙන් ඉදිරිපත් කරපු සංකල්පයක් තමයි, මේ roadworthiness කියන එක. අපි ආරක්ෂාව ගැන හිතලා තමයි රියැදුරාට බලපත්‍රයක් ලබා දෙන්නේ. මොකද, රියැදුරුට licence එකක් තිබෙන්න ඕනෑ, පාරේ වාහනයක් පදවාගෙන යන්න. හැබැයි, අපි වාහනයේ fitness එක ගැන අවශ්‍ය පරිදි අවධානය යොමු කරනවාද කියන එක සම්බන්ධයෙන් එම නිලධාරින් නිරන්තරයෙන්ම ප්‍රශ්න කළා. මේ roadworthiness, එහෙම නැත්නම් මාර්ගයේ ධාවනය සඳහා සුදුසු පරිදි වාහනයක් සකස් විය යුතුයි කියන අදහස නීතිය තුළ පිහිටුවන්න ඕනෑය කියන කාරණය මෙම අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් වෙච්ච යෝජනාවක්. ඒ යෝජනාව ඉදිරිපත් කරද්දී ඒ නිලධාරින් විසින් ම මතු කරපු කාරණයක් තමයි, දීර්ඝ කාලයක් තිස්සේ මෙවැන්නක් ක්‍රියාත්මක නොවුණාය කියන එක.

ඇත්තටම අවුරුද්දකට අපේ රටේ ඉතා විශාල පිරිසක් - අවම වශයෙන් පුද්ගලයින් 2,000කට වඩා - මාර්ග අනතුරු, road accidents නිසා මිය යනවා. ඒ වාගේම තවත් පුද්ගලයින් විශාල පිරිසක් පූර්ණ ආබාධිත තත්ත්වයට සහ අර්ධ ආබාධිත තත්ත්වයටත් පත්වනවා. මේ විධියට අවුරුද්දක් ගණනේ ලංකාවේ ජනතාව, විශේෂයෙන්ම ශ්‍රම බලකායට දායකත්වයක් දැක්විය හැකි තරුණ පිරිස මාර්ග අනතුරු නිසා පාරේ මිය යද්දී මෙවැනි සරල සංකල්පයක්වත් මෙතෙක් ක්‍රියාත්මක කළේ නැහැ. මේවා විශ්වකර්ම නොවෙයි. කොහේවත් සැඟවිලා තිබෙන දේවල් නොවෙයි. ඉතාම සරලව නිවැරදි කළ හැකි, ඉතාම සරලව නීති මඟින් පාලනය කළ හැකි දෙයක් තමයි වාහනවල fitness කියන එක, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ප්‍රවාහනය සම්බන්ධයෙන් තිබෙන නීති පද්ධතිය තුළ ඇමතිවරයාට බලතල ලබා දීලා තිබුණත්, දීර්ඝ කාලයක් තිස්සේ කිසිදු ඇමතිවරයෙක් වාහනවල යෝග්‍යතාව සම්බන්ධයෙන් යම්කිසි රෙගුලාසි සකස් කිරීමකට, යම්කිසි නියාමනයක් සිදු කිරීමට - අවුරුද්දකට 2,000කට වැඩි පිරිසක් මිය යද්දීත් - අවධානය යොමු කළේ නැහැයි කියන එක ඒ අමාත්‍යාංශයේ නිලධාරින්ගෙන් ම ඉදිරිපත් වෙච්ච කාරණයක්. ඒ නිසා අපි ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය බිමල් රත්නායක මැතිතුමාට විශේෂ ස්තුතියක් පුද කරන්න ඕනෑ, මේ වාගේ නියෝග ගෙන ඒම පිළිබඳව. මේක ඉතාම සරල නියෝගයක්. බොහොම සරල ලෙස ක්‍රියාත්මක කරන්න පුළුවන් දෙයක්. නමුත් එවැනි සරල පිළිතුරක්වත් දෙන්න බැරිවෙච්ච පාලකයෝ තමයි අපේ රටේ මීට ඉස්සෙල්ලා හිටියේ. එවැනි සරල පිළිතුරක්වත් දෙන්න බැරි වෙච්ච ඇමතිවරුන් තමයි අපේ රටේ මීට ඉස්සෙල්ලා හිටියේ. ඔවුන් එහෙම පිළිතුරක් නොදුන්නේ ඇයි, කාට භයවෙලාද නොදුන්නේ, මොකක් නිසාද නොදුන්නේ, ජනතාවගේ ජීවිත ආරක්ෂාවට වඩා ඔවුන්ට වැදගත් වුණේ මොකක්ද කියන එක ගැන අපි ප්‍රශ්න කරන්න ඕනෑ.

ඒ අතරතුර අපේ ඇමතිතුමාට තවත් විශේෂ ස්තුතියක් පුද කරන්න ඕනෑ. අපි මේ වනකොට දකිනවා, ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ විශේෂ දියුණුවක් සිද්ධ වෙමින් පවතින බව. මම හිතන විධියට, අපේ තරුණ ජනතාව අතර, විශේෂයෙන් කොළඹ නගරයේ වාසය කරන ජනතාව අතර මෙට්‍රෝ බස් එක ඉතාම ප්‍රචලිතයි. මෙට්‍රෝ බස් එක හරහා අපට ප්‍රවාහනයේ අනාගතය සම්බන්ධයෙන්, ඉස්සරහට එන ප්‍රවාහනය මොන වාගේද කියන එක සම්බන්ධයෙන් හොඳ පින්තූරයක් ලබා දෙනවා. ජනතාවට සුව පහසු ලෙස, කිසිම පීඩාවකට ලක් නොවී තමන්ගේ එදිනෙදා ප්‍රවාහන කටයුතුවල යෙදෙන්නට අවශ්‍ය ඉඩකඩ මෙට්‍රෝ බස් සේවාව මඟින් ලබා දී තිබෙනවා. එවැනි ආකාරයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත් එක්කම අපි අවධානය යොමු කරන්න ඕනෑ තවත් පැත්තක් තමයි නියාමනය කියන්නේ.

ජාතික ගමනාගමන කොමිෂන් සභාවට සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට බලතල තිබෙනවා, මේ නියාමනය සිද්ධ කිරීමට. රටේ අවාසනාවට මෙච්චර කාලයක් තිස්සේ ඒ නියාමනය සිද්ධ වුණේ නැහැ. මා හිතනවා, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය තුළින් මෙවැනි නීතියක් ඉදිරිපත් කරන එක ගැන දීර්ඝ කාලයක් තිස්සේ ඒ ගැන කථා

කරපු නිලධාරිනුත්, ඒ ගැන අවධානය යොමු කරපු නිලධාරිනුත් ඇතුළු ඒ ගැන කථා කරපු සියලුම පාර්ශ්ව අද සතුටු වනවා ඇති කියලා. ඒ වාගේම මේ වෙලාවේ තමන්ගේ අමාත්‍යාංශය හරහා එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සහ ඒ ගැන සමාජ කතිකාවක් ඇති කිරීමට ඉදිරිපත් වීම සම්බන්ධයෙන් අපි ඇමතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

ඒ වාගේම මෙහි තවත් සුවිශේෂී කාරණයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඇත්තටම මෙතැන තිබෙනවා, private vehicles සම්බන්ධවත්. ඒ කියන්නේ, පෞද්ගලික ප්‍රවාහනයේ යෙදෙන වාහන විතරක් නොවෙයි, බස් රථ, පාසල් වෑන් රථ, office staff වෑන් රථ වැනි පොදු ප්‍රවාහනයේ යෙදෙන වාහන පවා මෙයට ඇතුළත් කර තිබෙනවා. මේ වාහනවල fitness සම්බන්ධව, එහෙම නැත්නම් මේ වාහනවල කාර්මික දුර්වලතා තිබෙනවාද, නැද්ද, බ්‍රේක් පද්ධතිය හොඳින් තිබෙනවාද, රෝද හොඳට වැඩ කරනවාද, එන්ජින් එක හොඳට වැඩ කරනවාද, දොරවල් හරියට වැහෙනවාද වාගේ සරල දේවල් පිළිබඳවත් මේ තුළින් අවධානය යොමු කර තිබෙනවා.

අද උදේ ඇමතිතුමා කථා කරද්දිත් බොහොම පැහැදිලිව ප්‍රකාශ කළා, ගොඩක් අනතුරු සිදු වන්නේ කොහොමද කියලා. ඔව්, රියදුරන්ගේ වැරදිවලින් අනතුරු සිද්ධ වනවා. ඒ වාගේම බරපතළ තුවාල, ජීවිත හානි සිද්ධ වන ආකාරයෙන් අනතුරු සිද්ධ වන්නේ මේ වාහනවල තිබෙන කාර්මික දුර්වලතා හේතුවෙන් කියන එක එතුමා ප්‍රකාශ කළා. ඇත්තටම පසුගිය කාලයේ සිදු වෙච්ච බස් අනතුරු දෙස බැලුවත් ඒක බොහොම පැහැදිලිව තේරෙනවා. එක්කෝ බ්‍රේක් පද්ධතියේ අවුලක්, එක්කෝ රෝදවල ප්‍රශ්නයක් එම අනතුරුවලට හේතු වූ බව එහිදී අනාවරණය වුණා. මෙවැනි වාහන මහාමාර්ගයේ ධාවනය කරන්නේ ඇයි? අපි ගොඩක් වෙලාවට වාහනයක් සම්බන්ධව බලන එකම කාරණය දුම් පිටවෙනවාද, නැද්ද කියන එක විතරයි. ඒ කියන්නේ, carbon emission එක කොහොමද කියන එක. එතැනින් එහාට ගිහින් ආරක්ෂිතව ගමනාගමන කටයුතු කිරීම සඳහා වාහනයක තිබෙන්න ඕනෑ මොනවාද කියන එක ගැන අදහසකුත් මේ අලුත් නියෝග හරහා මතු කර තිබෙනවා. අපි හිතනවා, මෙන්න මේ ආකාරයෙන් පොදු ප්‍රවාහනය තුළ රාජ්‍ය ආයෝජනය සිද්ධ කිරීම වැදගත් කියලා. සුබෝපභෝගීව - පහසුකම් සහිතව - කාර්යක්ෂමව ප්‍රවාහන කටයුතු සිදු කිරීමට ජනතාවට ඉඩ සැලැස්වීම සඳහා මෙට්‍රෝ බස් වැනි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, ඩිපෝ සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් විතරක් නොවෙයි, ගමක් ගමක් ගාණේ ධාවනය වන ලංගම බස් සේවාව සංවර්ධනය කිරීම, ලංගම ඩිපෝ සංවර්ධනය කිරීම වැනි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට සමගාමීව මේ ආකාරයෙන් නියාමන පද්ධතිය ශක්තිමත් කිරීම සම්බන්ධයෙන්, විශේෂයෙන් පොදු ප්‍රවාහනය සම්බන්ධයෙන් තිබෙන නියාමන පද්ධතිය ශක්තිමත් කිරීම සම්බන්ධයෙනුත් අපි අවධානය යොමු කළ යුතුයි.

ඊට අමතරව මේ නියෝගවලම කොටසක් හැටියට තිබෙනවා, garage කියන එක. ඒ කියන්නේ, දැන් අපි මේක නියාමනය කරන්න ගියාම fitness කියන එක check කරන්නේ garage එකක. ඒ garage එකේ වැඩ කරන කෙනාට මේ සඳහා තිබෙන්න ඕනෑ සුදුසුකම් පවා මේ නියෝග යටතේ දක්වා තිබෙනවා. NVQ සුදුසුකම් කොහොමද තිබෙන්න ඕනෑ, ඒ පරීක්ෂණය කරන කෙනාගේ සුදුසුකම් මොන වාගේ වෙන්න ඕනෑද කියලා මෙහි තිබෙනවා. ඊට අමතරව මම හිතන්නේ මේ වනකොටත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට යම් අදහසක් තිබෙනවා, garage නියාමනය සම්බන්ධයෙන්. මම හිතන්නේ අපි මුලින්ම බස් රථ නියාමනය කරනකොට, බස් රථවල ගමන් කරන විට seat belt එක දමන්න ඇමතිතුමා යෝජනා කරනකොට, අමාත්‍යාංශයෙන් ඒ යෝජනාව එනකොට සමාජයේ යම්කිසි විරෝධාකල්පයක් තිබුණාට, අද වනකොට එය වෙනස් වෙලා තිබෙනවා. මම දැක්කා, මෑත කාලීනව Instagram එකේ ඉන්දියානු ජාතිකයකුගේ වීඩියෝ එකක පවා තිබෙනවා, ලංකාවේ බස් රථ රියැදුරන් seat belt එක දමනවා, ලංකාවේ ඉන්නේ විනයක් තිබෙන ජනතාව කියලා. ඔවුන් ඒක කියන්නේ ජාත්‍යන්තරයට. ඔවුන් ලංකාවට ඇවිල්ලා යන සංචාරකයින්. ඔවුන් ලංකාව ගැන තමන්ගේ රටට ගිහිල්ලා කියන්නේ, මේක විනයක් තිබෙන රටක්, බස් රථ රියැදුරා පවා seat belt එක දමනවා කියන එකයි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමියට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මට තව තත්පර 30ක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මෙන්න මේ garage නියාමනය කියන එක කර්මාන්තයක් ලෙස ගත්තාමත් ඉතාම වැදගත් වනවා. ප්‍රවාහනය තුළ පවතින බස් රථ, garage කියන හැම අංශයක්ම මෙහිදී වැදගත් වනවා. පොදු ප්‍රවාහනය කියන එක කර්මාන්තයක් ලෙස ගොඩනැඟීමට නම් රාජ්‍ය ආයෝජනයට අමතරව නියාමනය කියන දේ අතිශයින් වැදගත් වනවා. ඒ සම්බන්ධයෙනුත් අවධානය යොමු කරන්න කියා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමියට බොහොම ස්තුතියි, මට කාලය ලබා දුන්නාට.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) සඳරුවන් මදුරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[අ.භා. 2.01]

**ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෝටර් වාහන පනත යටතේ ගෙනෙන නියෝග සම්බන්ධයෙන් අද පැවැත්වෙන විවාදයේදී අදහස් දක්වන්න මටත් අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට මම ස්තුතිවන්ත වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දත්ත අනුව, අපේ රටේ මෝටර් රථ අනතුරු සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය එතරම් හොඳ නැහැ. විශේෂයෙන්ම රෝහල් පද්ධතිය ගත්තොත්, මෝටර් රථ අනතුරුවලට ලක් වූ රෝගීන් විශාල සංඛ්‍යාවක් ඒවායේ ප්‍රතිකාර ලබනවා. සාමාන්‍යයෙන් ලංකාවේ වසරකට මාර්ග අනතුරු 38,000ක් පමණ සිදු වනවා. ඒ මාර්ග අනතුරු 38,000 තුළ වසරකට මරණ 3,000ක් පමණ සිදු වන බව වාර්තා වනවා. ඒ කියන්නේ, අපේ මාර්ග පද්ධතිය තුළ සිදු වන අනතුරු හේතුවෙන් දෛනිකව ආසන්න වශයෙන් මරණ 8ක් පමණ සිදු වනවා. 2020 - 2024 කාලයේදී එවැනි අනතුරු 118,697ක් සිදු වෙලා තිබෙනවා. ඒ අනතුරු හේතුවෙන් මරණ 12,322ක් සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම 2025 කාල සීමාව තුළ මාර්ග අනතුරු 22,153ක් සිදු වෙලා තිබෙනවා. ඒ හේතුවෙන් මරණ 2,732ක් සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම 2026 ජනවාරි 01වැනි දා ඉඳලා ජුනි 09වැනි දා දක්වා - මේ කාලය අතරතුරත් - අනතුරු 1,179ක් සිදු වෙලා තිබෙනවා. ඒ හේතුවෙන් මරණ 1,240ක් පමණ සිදු වෙලා තිබෙනවා. පසුගිය වසර තුන තුළ අපේ රටේ මාර්ග අනතුරු හේතුවෙන් සිදු වූ වාර්ෂික මරණ අනුපාතය පුද්ගලයන් 10,000කට සියයට 11.2ක වාගේ ඉහළ අගයක් ගෙන තිබෙනවා.

විශේෂයෙන්ම කොළඹ ජාතික රෝහලේ හදිසි අනතුරු අංශයට සහ දැඩි සත්කාර ඒකකයට ඇතුළත් වන රෝගීන්ගෙන් සියයට 50ක් පමණ මාර්ග අනතුරු නිසා ඇතුළත් වන අය. මේ නිසා රජයට දරන්න වන පිරිවැය ඉතා ඉහළයි. දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 3ක පමණ විශාල පිරිවැයක් රජයට ඒ වෙනුවෙන් දරන්න වෙලා තිබෙනවා. 2021දී මාර්ග අනතුරු නිසා සිදු වුණු මරණ, ඒ වාගේම තුවාලකරුවන් නිසා රජය විසින් දරනු ලැබූ පිරිවැය ඇමෙරිකානු ඩොලර් බිලියන 3කට වඩා අධිකයි කියලා තමයි මෙම වාර්තාවල දැක්වෙන්නේ. ඒ කියන්නේ, අපි වසර පුරාවටම අතිවිශාල වියදමක් දරනවා, මාර්ග අනතුරුවලින් රෝහල්ගත වන පිරිසට ප්‍රතිකාර කිරීම සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා. ඒ නිසා මාර්ග අනතුරු වළක්වා ගැනීම සඳහා ඉතාම දැඩි නීති පැනවීම වාගේම ගත හැකි උපරිම ක්‍රියාමාර්ග ගැනීම වගකිව යුතු රජයක යුතුකමක්කොට අපි සලකනවා. ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ගවලින් කිහිපයක් තමයි අද දවසේදීත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මාර්ග අනතුරුවලට එක හේතුවක් තමයි, ධාවනය වන වාහනවල තත්ත්වය. සිදු වුණු අනතුරුවලින් සැලකිය යුතු ප්‍රමාණයක් වාහනවල තිබුණු අඩුපාඩු නිසා සිද්ධ වුණු බව තමයි අදාළ පරීක්ෂකවරුන්ගේ වාර්තාවල සඳහන් වෙන්නේ. අද අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙන නියෝගයක් මඟින් විශේෂයෙන්ම මගීන් ප්‍රවාහනය කරන වාහනවලට යෝග්‍යතා සහතිකය නමින් සහතිකයක් ලබා ගන්න කියලා අනිවාර්යය කරලා තිබෙනවා. එම සහතිකය නැවත නැවතත් අලුත් කර ගැනීම කළ යුතුයි. එම සහතිකය නිකුත් කරන අවස්ථාවේදී සටහන්ව ඇති ධාවන මනු දර්ශකය කියවුම් අගයේ සිට කිලෝමීටර පන්දහසක දුරක් ධාවනය කර ඇති දිනය, එහෙම නැත්නම් එසේ නිකුත් කළ දින සිට මාස තුනක කාල සීමාවක් ඉකුත් වන දිනය කියන ඒ දින දෙකෙන් පළමුව එළඹෙන අවස්ථාවේදී නැවත එම සහතිකය අලුත් කර ගන්න පුළුවන්. එම පරීක්ෂාව සිදු කරන්නේ NVQ Level 4 වාගේ සුදුසුකම් ලත් පරීක්ෂකවරුන් විසින්. එම පරීක්ෂාව සිදු කරන ස්ථානය මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත ස්ථානයක් වෙන්න ඕනෑ. එම ක්‍රියාවලිය හරහා රථ වාහනවල තිබෙන අඩුපාඩු නිසා සිදු වන අනතුරු සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කර ගන්න අපට පුළුවන් වනවා කියා අපි හිතනවා.

ඊළඟට, අධිවේගී මාර්ගවලත් අනතුරු සිදු වනවා. ගරු ඇමතිතුමා අද උදෑසන සිදු කළ කථාවේදී පැහැදිලි කළා, අනතුරුවලින් ජීවිත හානි බොහොමයක් සිද්ධ වෙන්නේ ධාවකයාට නොවෙයි, වාහනයේ පිටුපස ගමන් කරන අයට බව. එම නිසා අපි අවස්ථා තුනකදී කාලය ලබා දී තිබෙනවා, අධිවේගී මාර්ගවල ගමන් කරන වාහනවල seat belts සවි කර ගන්න. ඒ සඳහා අපි වසරක කාලයක් ලබා දී තිබුණා. එය හොඳටම ප්‍රමාණවත්. දැන් අපට අවස්ථාව තිබෙනවා, එම නීති තදින්ම ක්‍රියාත්මක කරන්න. ඒ අනුව, අධිවේගී මාර්ගයක ගමන් කරන වාහනවල සිටින සියලු මගීන් seat belts පැළඳීම අනිවාර්යයි.

ඒ වාගේම මේ රජය රිය අනතුරු සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. විශේෂයෙන්ම මත්ද්‍රව්‍ය භාවිත කරන රියැදුරන් විසින් වාහන ධාවනය කිරීම නිසා අනතුරු සිදු වෙලා තිබෙනවා. 2026 ජනවාරි 01 සිට ජුනි 08 දක්වා කාලය තුළ බීමත්ව රිය පැදවීම සම්බන්ධයෙන් නඩු 62,436ක් පමණ පවරා තිබෙනවා. ඒ අතරින් මත්ද්‍රව්‍ය භාවිත කර රිය පැදවීම සම්බන්ධයෙන් තවත් නඩු 6,940ක පමණ ප්‍රමාණයක් පවරා තිබෙනවා. මෙහිදී සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ප්‍රවාහන අමාත්‍යාංශය එකතු වෙලා ජංගම බස් රථ දෙකක් යොදවා තිබෙනවා, මත්ද්‍රව්‍ය භාවිත කරන රියැදුරන් සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමට. ඒ මඟිනුත් මාර්ගයේ සිදු වන අනතුරු අවම කර ගැනීමට සැලකිය යුතු දායකත්වයක් ලැබෙයි කියලා අපි හිතනවා. මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සහ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ප්‍රධාන මාර්ගවල අනතුරු සිදු වන ස්ථාන නිසි ලෙස නඩත්තු කිරීම සිදු කරනවා.

නමුත්, ග්‍රාමීය මාර්ගවල සිදු වන මාර්ග අනතුරු සම්බන්ධයෙන් අවධානය යොමු වීම අතිශයින්ම අඩු මට්ටමක පවතිනවා. ඒ නිසා රජය විධියට අපි බලාපොරොත්තු වෙනවා, පළාත් පාලන ආයතන කේන්ද්‍ර කරගෙන, එම ආයතනවලට යම් සැලකිය යුතු මුදලක් වෙන් කරමින් ග්‍රාමීය මාර්ගවල අනතුරු සිදු වන ස්ථාන පිළිසකර කර ඒවා අනතුරු සිදු නොවන තත්ත්වයට පත් කර ගන්න. මම නියෝජනය කරන හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව සහ කටුවන ප්‍රාදේශීය සභාවට මේ සඳහා මුදල් වෙන් කර තිබෙනවා. ඉදිරියේදී එම ප්‍රාදේශීය සභාවල මැදිහත් වීම මඟින් ග්‍රාමීය මාර්ග පද්ධතිය තුළ සිදු වන අනතුරු අවම කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ විධියට අපි ගන්නා සෑම ක්‍රියාමාර්ගයක් තුළින්ම බලාපොරොත්තු වෙන්නේ අනතුරු අවම කිරීම සහ මගියාගේ ආරක්ෂාවයි.

විශේෂයෙන්ම ප්‍රවාහන ක්ෂේත්‍රය ගත්තොත්, මහාමාර්ග පද්ධතිය, දුම්රිය මාර්ග පද්ධතිය අපි වෙනස් කරමින් යනවා. අධිවේගී මාර්ග ඉදි කරනවා. මෙට්‍රෝ බස් ගෙන්වනවා. අලුතින් බස් රථ එකතු කරමින් තිබෙනවා. විදුලි දුම්රිය සඳහා අවධානය යොමු වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, විනයක් ඇති රියැදුරන් බිහි කර ගැනීම හා මාර්ග අනතුරු අවම කර ගැනීම සඳහා රජය වශයෙන් ගත හැකි සියලු ක්‍රියාමාර්ග අපි ගනිමින් තිබෙනවා. මම හිතනවා, මේ ක්‍රියාවලිය අවසානයේදී අපේ ප්‍රවාහන පද්ධතිය තුළ සැලකිය යුතු වෙනසක් සිද්ධ වෙයි කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)

මට ලැබී තිබෙන අවසන් විනාඩි දෙකක කාලය තුළ මම මේ කාරණය කියන්න බලාපොරොත්තු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

හොරා කන මිනිස්සු, කප්පම් ගන්න මිනිස්සු අපේ ගම්වල ඉන්නවා අපි ඕනෑ තරම් දැකලා තිබෙනවා. අපේ ගම්වල කවුරු හරි කොල්ලෙක් කප්පම් ගැනීමකට සම්බන්ධ වෙලා තිබෙනවා නම්, හොරකමකට සම්බන්ධ වෙලා තිබෙනවා නම් ඔහු පොලීසියට යන්නේ මුහුණ වහගෙන. බන්ධනාගාරගත වෙනවා නම් ඒ සඳහා යන්නේත් මුහුණ වහගෙන. බන්ධනාගාරගත වෙලා ගෙදර ආවාට පස්සේ සති ගාණක් ගෙයින් එළියට බහින්නේ නැහැ. ඇයි, ඒ? ලජ්ජාව නිසා. මොකද, වටේ ගෙවල්වල මිනිස්සු බලනවා, හොරෙක් තමයි මේ ඇවිල්ලා තිබෙන්නේ කියලා. කොහේට හරි ගියොත් මිනිස්සු කථා වෙනවා, හොරෙක් තමයි ඇවිල්ලා තිබෙන්නේ කියලා. හැබැයි, මේ පාර්ලිමේන්තුව තුළින් අපට ලැබෙන ආදර්ශය නවක මන්ත්‍රීවරු විධියට අපට කිසිසේත්ම අනුමත කරන්න බැහැ. බන්ධනාගාරගත වෙලා ඉන්න හොරු ආණ්ඩුවට උපදෙස් දෙනවා. අපි කොහොමද මේ හොරු දෙන උපදෙස් පිළිපදින්නේ? මොනවාද මේ කියන්නේ?

පොහොර සම්බන්ධයෙන් කථා කළා. අසූචි පොහොර නැව් ගෙනැල්ලා ඒවාට සල්ලි ගෙවපු මිනිස්සු "family doctor" සංකල්පය ගැන කථා කළා. සෞඛ්‍ය සේවා බිඳ වට්ටපු මිනිස්සු බාල බෙහෙත් ගෙනාවා, ඒවාට අත එසවූවා. ඒගොල්ලන් මේ රටේ රෝහල්වලට ගියේ නැහැ. ඔබතුමන්ලා බලන්න, මේගොල්ලන්ගේ නඩුවලට යනකොට මේ අයගේ පාර්ශ්වයෙන් ඉදිරිපත් වන නීතිඥ මහත්වරු මේගොල්ලන් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලෙඩවලට සිංගප්පූරුවේ මවුන්ට් එලිසබෙත් රෝහල තමයි නිර්දේශ කරන්නේ. හැබැයි, අපේ රෝහල් පද්ධතිය දියුණු කරන්න හදනකොට අපට උපදෙස් දෙනවා.

දැන් මේ නිශ්චිත කාරණය, නාමල් රාජපක්ෂ මහත්තයා පිළිබඳ කාරණය ගත්තාට පස්සේ රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා සඳහන් කළා, දේශපාලන පළිගැනීම් කියලා. මේ, දේශපාලන පළිගැනීම් නොවෙයි. මම දැක්කා, මේ නඩු තීන්දුව සම්බන්ධයෙන් තිබුණු මාධ්‍ය වාර්තාකරණයක්. මෙය ඕස්ට්‍රේලියාව, සිංගප්පූරුව, ප්‍රංශය සහ ඇමෙරිකාව කියන රටවල සහයෝගයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සිද්ධ කළ විමර්ශනයක් අනුව ගොනු කළ නඩුවක්. රුපියල් මිලියන 100ක පමණ මුදලක් අල්ලස් වශයෙන් ලබා ගත්තා කියන චෝදනාව තමයි එම නඩුවෙන් එල්ල වෙලා තිබෙන්නේ. එහෙම චෝදනාවක් තිබෙන මනුස්සයෙක් හරි නම් මේ උත්තරීතර පාර්ලිමේන්තුවට එනවා තියා මාධ්‍ය ඉස්සරහ පෙනී ඉන්නේවත් නැහැ. හැබැයි, අපට සිදු වෙලා තිබෙනවා, බන්ධනාගාරගත වෙලා ඉන්න හොරු, අපරාධකාරයෝ, කප්පම්කාරයෝ දෙන උපදෙස් අහගෙන ඉන්න. මොන හොරා සද්දෙ දැම්මත්, මොන කප්පම්කාරයා සද්දෙ දැම්මත්, මොන මිනීමරුවා සද්දෙ දැම්මත් අපේ ආණ්ඩුව ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ එක අඩියකින්වත් පසුපසට ගන්නේ නැහැ. ඒ වෙනුවෙන් අපි හැම වැඩ පිළිවෙළක්ම ක්‍රියාත්මක කරනවා කියමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.11]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ආණ්ඩුවට අවුරුදු දෙකයි, රටට සුබයි" කියලා campaign එකක් කරලා අපේ ගරු මන්ත්‍රීතුමන්ලාත් අද සැහෙන්න ඒ ගැන ප්‍රකාශ කළා. ඒ campaign එක පටන් අරගෙන ජනාධිපතිතුමා බේරුවලට යනකොට මම හිතුවා, ආණ්ඩුව බලයට ඇවිල්ලා අවුරුදු දෙකක් ගිහිල්ලා තිබෙන තැනදී හෝ මුහුදේ මාළු ඉන්න තැන් බලාගන්න පුළුවන් app එක introduce කරලා දෙයි කියලා. ඒකවත් වුණේ නැහැ. ඒ විතරක් නොවෙයි. ඉස්සර නම් කිව්වා, ආණ්ඩුවේ ඉස්පිරිතාලෙට බෙහෙත් ගන්න ගියාම ඇඳක් නැත්නම් ආණ්ඩුවට විරුද්ධව නඩු දමන්න කියලා. මාළු අල්ලන app එක කෙසේ වෙතත්, කොත්තමල්ලි බීලා ගෙදර ඉන්න තමයි දැන් සිද්ධ වෙලා තිබෙන්නේ. එහෙම නේද? වෙන කවුරු හරි මේක කිව්වා නම්, මෙලහට කියපු කෙනා "ඩොක්ටර් කොත්තමල්ලි" වෙලා. අර fake බලකාය ප්‍රබල හින්දා එතුමා "ඩොක්ටර් කොත්තමල්ලි" වෙලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැතිවරණ වේදිකාවේ කිව්වේ මොකක්ද? ලෙඩ වෙලා බෙහෙත් ගන්න ඉස්පිරිතාලෙට ගියාමත් බදු ගෙවන්න ඕනෑ, ජාතික ජන බලවේගය ආණ්ඩුව ආවාම පළමුවැනි අය වැයෙන්ම බදු සම්පූර්ණයෙන්ම අයින් කරනවා කිව්වා. දැන් අවුරුදු දෙකයි. ඕනෑ නම් දැන් මට කියන්න පුළුවන් තව හැටහුටහමාරක් දීපු පොරොන්දු. ඒ වාගේ තොගයක් මා ගාව තිබෙනවා. මේවා කියන එකත් කාලය නාස්ති කිරීමක් කියලායි මට හිතෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අමතක වෙලා තිබෙන නිසා ඒවා පොඩ්ඩක් විතර මතක් කළා නම් හොඳයි කියලා මට හිතෙනවා. අර සංගීත්ගේ යාළුවාගේ ඩොලර් මිලියන දෙක, හඳුන්ගේ කැනඩාවේ ඉන්න යාළුවාගේ ඩොලර් මිලියනය මතකද? ඒවා ගැන වගේ වගක්වත් නැහැ.

හේවගේ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, ලක්ෂ 12ට විට්ස් කාර් ගේනවා කියලා. මම ඒක මතක් කරලා දුන්නාම මට කිව්වා, "මරික්කාර්, මම ඔබට අභියෝග කරනවා. මම කොහේ හරි එහෙම කියලා තිබෙනවා නම් ජාතික ජන බලවේගයේ දේශපාලනයෙන් අයින් වෙලා බැල මෙහෙවර කරන්න එනවා" කියලා. ඕනෑ නම් මම දැන් ඒ වීඩියෝ එක දාලා පෙන්වන්නම්, මරික්කාර්ද, විට්ස් කාර්ද වෙලා තිබෙන්නේ කියලා බලන්න පුළුවන්.

ඒ වාගේම උමා ඔයේ සිදුර අයින් කරනවා කිව්වා. ඉන්දියාවේ, ඇමෙරිකාවේ අධිපතිවාදය අයින් කරනවා කිව්වාට දණ ගහනවා. ඊළඟට කිව්වා, Lanka Hospitals එක ගෝඨාගේ කියලා. ඒක තවම ඔප්පු කර ගන්න බැහැ. වැඩිය ඕනෑ නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නොහැකියාව ගැන අපට කථා කරන්න දෙයක් නැහැ, ඒක ඔප්පු කරලා ඉවරයි. මොකද හේතුව, විදුලි බිල තුනෙන් එකකින් අඩු කරනවා කියලා දැන් තුනෙන් එකකින් වැඩි කරලා නේ තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැකියාව තිබෙන්න ඕනෑ නිර්මාණාත්මක දේවල් කරන්න, අලුත් දේවල් කරන්න. හැබැයි, මහ භාණ්ඩාගාරයට සල්ලි අරගෙන බෙදන්න හැකියාවක් ඕනෑ නැහැ. මේ ආණ්ඩුවට ඒ වාගේ දෙයක්වත් කරගන්න බැහැ. "දිට්වා" සුළි කුණාටුව ආපු වෙලාවේ කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ගංවතුර ආවා. පවුල් 7,000කට වැඩි ප්‍රමාණයකට අදටත් වන්දි ගෙවලා නැහැ. තහඩුවක් ගියත් රුපියල් ලක්ෂ 10ක් දෙනවා කියලා කිව්වාට, ඔප්පු නැහැ කියලා තමන්ට ඡන්දය දුන්න ජනතාවට වන්දි ගෙවන්නේ නැහැ. මම පෙර සභා වාරයේදී මේ ගැන මතක් කළාම අපේ වටගල නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, පුළුවන් නම් එක නමක් කියන්න කියලා.

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

ඔන්න මම ගෙනාවා ඒ නම් ටික. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මෙතැනට sample එකක් ගෙනාවේ. නම් 1,018ක් අඩංගු ලේඛනයක් මම **සභාගත*** කරනවා.

ග්‍රාම නිලධාරි වසම් සහිතව මම ඒකෙන් නම් කිහිපයක් කියන්නම්. මෙගොඩ කොළොන්නාව වසමේ හෙට්ටිආරච්චිගේ රාජා, 161/11සී, මෙගොඩ කොළොන්නාව, වැල්ලම්පිටිය. Tax බිල තිබෙනවා. ඡන්ද හිමි නාම ලේඛනයේ නම තිබෙනවා. විදුලි බිල තිබෙනවා. වතුර බිල නමට තිබෙනවා. ඊළඟට මෙගොඩ කොළොන්නාව වසමේ, කාදිර් මුනාස්, 163/22, මෙගොඩ කොළොන්නාව, වැල්ලම්පිටිය. වෙල්ලවත්ත වසමේ ඒ.පී. ජයරංජනි, 97/60, සමගි මාවත, වෙල්ලවත්ත, වැල්ලම්පිටිය. සිංහපුර වසමේ ටී. මුදියන්සේලාගේ ලීලාවතී, 35/30, ශ්‍රී ආනන්දාරාම මාවත, කොළොන්නාව. *[බාධා කිරීමක්]* නම් දෙන්නම්. ආ, අන්න ආවා නේ. හරි, හරි. පොඩ්ඩක් අහගෙන ඉන්න. මගේ යාළුවා.

ඊළඟට, සේදවත්ත වසමේ වීරප්‍රතාසාමි මහේස්වරි, 79/11බී, උමගිලියවත්ත, සේදවත්ත, වැල්ලම්පිටිය. තව තිබෙනවා. තව දෙන්නම්. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ඔක්කොම කියවන්න බැහැ. වෙලාව නැහැ නේ. මම මේ වසමට එක නම ගණනේ කියවන්නේ. ඊළඟට, මීතොටමුල්ල වසමේ කාසීම් මොහොමඩ් අලියාර්, 198/30එෆ්, පෙරේරා මාවත, වඩුගොඩවත්ත. මහබුත්ගමුව වසමේ සිත්ති හනීමා ෆාරුක්, 100/6/ජී, විජය විමලරත්න මාවත, මහබුත්ගමුව, අංගොඩ. තව නම් තිබෙනවා. ඊළඟට, දහම්පුර වසමේ ලේකම්වසම් ලියනගේ ජගත්, 101/96, නාගහමුල්ල පාර, කොළොන්නාව. *[බාධා කිරීම්]* තව දෙකයි. *[බාධා කිරීම්]* තව දෙකයි. මේවා කියන්න එපායැ. ඊළඟට, අඹතලේ වසමේ ඩබ්ලිව්.ඒ. කුසුමාවතී, බෝධිය පටුමග, මුල්ලේරියාව උතුර, අංගොඩ. මම මේ sample එකක් ගත්තේ. මේ නම් 1,018 ඇතුළත් ලේඛනය මම සභාගත කළා. මා මිත්‍ර වටගල නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමා මට කිව්වා නේ, එක නමක් හෝ දෙන්න කියලා. මෙන්න 1,018ක් ගෙනාවා. ඊළඟට ඉන්නවා, කුරුණියාවත්ත වසමේ කේ. ආරච්චිගේ සෝමාවතී, 302/10, අවිස්සාවේල්ල පාර, කුරුණියාවත්ත, වැල්ලම්පිටිය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එදා මේ ගැන කිව්වේ අපට මේකෙන් දේශපාලනය කරන්න නොවෙයි. *[බාධා කිරීම්]* පොඩ්ඩක් අහගෙන ඉන්න. මට දේශපාලනය කරන්න වුවමනාවක් නැහැ. ආපදා කළමනාකරණ කමිටුවේදීත් ගරු ජනාධිපතිතුමාගෙන් මම ඉල්ලීමක් කළා. මේ පවුල් 7,000 අයින් කරන්න බැහැ. ගඟ අයිනේ ඉන්නා මිනිස්සුන්ව අයින් කරන එක වෙනම කථාවක්. මම එදා මෙතුමාට ඒ ගැන කියපු නිසා දැන් මම ඒ ගැන කියන්නේ නැහැ. කොළඹ නගර සභා සීමාවේ වත්තකට යන්නේ නැහැ. නගරාධිපතිතුමියත් එක්ක වටේ රවුමක් ගහලා එන එක විතරයි කරන්නේ. ඒ නිසා දැනුවත් නැහැ; දන්නේ නැහැ, මොකක්වත්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ 1,018 දෙනාට ඔවුන් ඉන්නා ගෙදරට ඔප්පු නැහැ කියා තමයි ඒ අයට ගංවතුර වන්දි ලබා නොදුන්නේ. මම මේ නම් 1,018 ඇතුළත් ලේඛනය සභාගත කළා. වටගල නියෝජ්‍ය ඇමතිතුමාට තවත් ඕනෑ නම් හෙට සිට මම මුළු ආසනයේම ගෙයින් ගෙට ගිහිල්ලා ඒ අයගේ නම් එකතු කරලා තව මාසයකින් ඉතුරු 6,000 ලැයිස්තුවත් ගෙනැවිත් දෙන්නම් කියා. ඒ ගැන දන්නේ නැත්නම් එරංග මැතිතුමාගෙන් අහගන්න. එතුමා දන්නවා. මම ඊට වඩා ඒ ගැන කථා කරන්නේ නැහැ.

***** ***පුස්තකාලයේ තබා ඇත.***

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු බිමල් ඇමතිතුමාටත් යම් කාරණයක් කියන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ලොකු ලොකු දේවල් එපා. මෝටර් වාහන පනත යටතේ නීති වෙනස් කරන්න. නමුත් ඊට කලින් වාහනයක් ගත්තාම number plate එක දෙන්නකෝ, දවස් 3-4කින්. මොකද, සුමාන 4ක් යනකම් number plate එක දීගන්න බැහැ. *[බාධා කිරීම්]* මම පෞද්ගලිකව දන්නා නිසා - *[බාධා කිරීම්]* මට පෞද්ගලික අත්දැකීම් තිබෙනවා. සුමාන 4ක් යනවා number plate එකක් දෙන්න. ඒ නිසා ඒ තිබෙන backlog එක clear කරන්නකෝ. ලොකු වැඩ එපා, පොඩි පොඩි දේවල් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බේරුවලදී මාර වැඩක් වුණා. දැන් පොඩි පොඩි කට්ටිය ආණ්ඩුවට අරක හොඳයි, මේක හොඳයි කියනවා. නමුත් ජනාධිපතිතුමාගේ කටින් ඇත්ත කියවුණා. මාර වැඩේ කියන්නේ උසාවි තීන්දුව තවම ආවේ නැහැ. ජනාධිපතිතුමා කියනවා, ජනමත විචාරණයක් නැහැ කියලා. ජනාධිපතිතුමා කියනවා, ජනමත විචාරණයක් නැහැ කියලා. ඒකෙන් කියන්නේ මොකක්ද දන්නවාද? මේ රටේ පක්ෂ 2ක් තරග කෙරුවොත් තමන් පරදිනවා කියලා කියන්නේ. පක්ෂ 2ක් තරග කෙරුවොත් තමන් පරදිනවා. ඒ නිසා "විපක්ෂය බෙදුණොත් තමයි අපට දිනන්න පුළුවන්" කියලා තමයි ඒ කියන්නේ. ඒකෙන් තේරුම් යනවා, තමන් ෆේල් කියලා. කොහොමත් ජනාධිපතිවරණයේදී කඳවුරු 3ක් බෙදුණු නිසා තමයි ලංකා ඉතිහාසයේ පළමු වතාවට බහුතරය නැති ජනාධිපතිවරයෙක් පත් වුණේ.

මේ report card එක කියවද්දී, - *[බාධා කිරීම්]* ඇත්තවශයෙන්ම එදා කළ කථා ටික බැලුවාම තේරුම් යනවා, ජනාධිපතිතුමාගේ කටින් බොහෝ ඇත්ත කියැවුණු බව. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් පෙළ ගැසී ගෙන ඉන්නවා, බඩු මිල වැඩි කරලා, ටිරි මාංසය උරා බොනවා වාගේ බදු ගහලා, ගහලා එකතු කරපු රුපියල් ට්‍රිලියන 1.5 පාවිච්චි කරලා යටිතල පහසුකම් හදනකම්. යටිතල පහසුකම් දියුණු වෙන්න ඕනෑ. *[බාධා කිරීම්]* ඒක අත්‍යවශ්‍යයි. *[බාධා කිරීම්]* හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩොලර් සංචිතය වැඩි වෙන්නේ නැහැ. දැන් මේ අධිවේගී මාර්ගවලට අදාළව සැලසුම් කරන ඒවා හොඳයි. හැබැයි, හදන්න ගියාම raw materialsවලට සියයට 45ක් විතර ප්‍රමාණයක් ඩොලර්වලින් වියදම් කරන්න ඕනෑ. දුම්රිය මාර්ග හදන්න ගියාම යකඩ පිට රටින් ගෙනෙන්නේ නැතුව ඒවා හදන්නද? සැලසුම් කරන එක හොඳයි. හැබැයි, යථාර්ථවාදී වෙන්න ඕනෑ. අපි හිතමු, ට්‍රිලියනයක් දැම්මා කියලා; රුපියල් බිලියන 1,000ක් දැම්මා කියලා හිතමු. එතකොට බිලියන 450ක් විතර raw materialsවලට යනවා නම්, ඒ කියන්නේ ඩොලර් බිලියන එකහමාරක් විතර ඕනෑ raw materials ගෙනෙන්න. අපේ සංචිතය ඒ මට්ටමට ශක්තිමත්ද?

දැන් බය නැහැ, බොරු කියන්න. මොකද, අන්දලා ඡන්දය ගත්තා නේ. තවම අන්දාගෙනත් යනවා. ඒවා අහන කොටසකුත් ඉන්නවා. ඒ නිසා තවත් ට්‍රයි කරනවා. මොනවා වුණත්, ජනාධිපතිතුමා අපිත් එක්ක මේ පාර්ලිමේන්තුවේ අවුරුදු 25ක් විතර හිටපු කෙනෙක් නේ. එතුමාගේ sense එක හොඳයි. එතුමා දන්නවා, ආණ්ඩුවට කෙළවිලා තිබෙන්නේ කියලා. දැන් ආණ්ඩුවට බණිනවා; ඇමතිවරුන්ට බණිනවා. අකාර්යක්ෂමයි, ෆේල් කියලා කියනවා. නමුත් තවම එතුමාට යම් මට්ටමකට ජනප්‍රියතාවක් තිබෙනවා. අන්තිමේදී දැන් එතුමාටම සිද්ධ වෙලා තිබෙනවා, තමන්ම පිටියට බැහැලා මැච් එක ගහලා ගොඩ දාන්න. ඉස්සර මහින්ද රාජපක්ෂ කළේත් එහෙම තමයි. හරිද? ඉස්සර මහින්ද රාජපක්ෂ කළේත් ඔය ටිකම තමයි. එදා මහින්ද රාජපක්ෂ කරපු භූමිකාවම අද ජනාධිපතිතුමාටත් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඉතින්, මේ වාගේ plans ගොඩක් තිබෙනවා, 2028

වනකල්. "අපි 2028 වෙනකොට තමයි අධිවේගී මාර්ග deliver කරන්නේ, දුම්රිය මාර්ග deliver කරන්නේ" කියලා කියනවා. එතකල් නඩු හබවලින් ඡන්ද campaign එක කරන්නයි හදන්නේ. එහෙම නේද? ඇත්ත වශයෙන්ම ආණ්ඩුවට මම එක දෙයක් මතක් කරන්න කැමැතියි. ඔයගොල්ලෝ ආර්ථිකය දියුණු කිරීම අතින් ෆේල්; ඩොලර්වලින් ආදායම් උත්පාදනය අතින් ෆේල්. අඩුම ගණනේ දූෂිතයන්ට දඬුවම් දීමවත් හරියට කරන්න. අර නැවත ගේනවා කියපු උගන්ඩාවේ සල්ලි ටික ගේන්න. අත්පත් කර ගන්නවා කියපු දේපළ අත්පත් කර ගන්න. එය, පාන් පිටි කිලෝව රුපියල් 17කින් වැඩි වන කොට හවසට එක්කෙනෙකු අල්ලනවා වාගේ campaign එකක් නොවිය යුතුයි. ඒ වාගේම එය පෙට්‍රල් ලීටරයේ මිල වැඩි වන කොට තව එක්කෙනෙකු අල්ලනවා වාගේ වැඩක් නොවිය යුතුයි. හරිද? ඒක වෙනමයි, මේක වෙනමයි. *[බාධා කිරීමක්]* හොංකොංවල රාජපක්ෂලාට ඩොලර් මිලියන 22ක වත්කම් තිබෙනවා කිව්වා; හෙලිකොප්ටර් තිබෙනවා කිව්වා. අපේ වසන්ත සමරසිංහ මැතිතුමා කිව්වා, විචීගේ බල්ලාගේ බෙල්ලට දාපු මාලය පවුම් 90යි කියලා. මේ රටේ මිනිස්සු බලාගෙන ඉන්නවා, ඒ ටික ඔක්කෝම අල්ලා ගන්න කල්. ඩුබායිවල තිබෙන Marriot Hotel එක නාමල්ගේ කියලා කිව්වා. මිනිස්සු බලාගෙන ඉන්නවා, ඒ ටික ගන්න කල්. එහෙම නම්, ඒ පැත්තෙන් හරි ලොකු වැඩක් කරලා පෙන්වන්න. මොකද, ඔබතුමන්ලා සමාජයට වෛරය වපුරලා වපුරලා සමාජයත් වෛරී ඇහෙන් බලා ගෙන ඉන්නවා. අඩු ගණනේ කන්න බොන්න නැති මිනිසුන්ට ඒ වාගේ වූන් එකක් හරි හරියට දෙන්න; දෙන එක හරියට දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු තුන යද්දී ආණ්ඩුවට මෙහෙම ඉන්න බැහැ. මොකද, ජනාධිපතිතුමාගේ ධුර කාලයෙන් මාස 24ක් දැන් ඉවරයි. එතුමා පත් වෙන්නේ මාස 60කට. ඒ කියන්නේ, මාස 55කින් ඡන්දය පවත්වන්න ඕනෑ. දැන් මාස 24ක් ඉවරයි. තවත් මාස 31යි තිබෙන්නේ. ලබන අවුරුද්දේ මේ වනකල් ගියොත් මාස 36යි. තමන්ට කෙළවෙන කල් මිනිස්සු බලාගෙන ඉන්නේ නැහැ. ඒ නිසා බොරු කියන එකේත් සීමාව අවබෝධ කර ගන්න. සුනිල් වටගල මගේ මිත්‍රයාට මම මතක් කරනවා, පුළුවන් නම්, ඒ අහිංසක මිනිසුන්ට ඒ සල්ලි ටික අරගෙන දෙන්න කියලා. පව්! පුළුවන් නම් ඒ අහිංසක මිනිසුන්ට ඒ සල්ලි ටික අරගෙන දෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇයි, ඔබතුමාට බැරිද?

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මට පුළුවන්, මට පුළුවන්- *[බාධා කිරීම්]* මම ඒ ගැන කියන්නම්. *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න. මට පුළුවන් ඒ ගෙවල් 7,000 ඉන්න මිනිසුන්ගෙන් භාගයක්වත් හෙට Kolonnawa Town එකට බස්සලා ආණ්ඩු විරෝධී වැඩක් කරන්න. *[බාධා කිරීම්]* හැබැයි, අපි ඒක කරන්නේ නැහැ. ඒ මිනිස්සු පව්! මට බැන්නාට කමක් නැහැ. මට කෑ ගැහුවාට කමක් නැහැ. පුළුවන් නම් ඒ සල්ලි ටික ඒ මිනිසුන්ට අරගෙන දෙන්න.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.24]

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහා සෝෂාවකට පස්සේ වැදගත් මාතෘකාවක් සම්බන්ධයෙන් කථා කරන්න ලැබිච්ච මේ අවස්ථාවේ සෑම මිනිත්තුවක්ම ප්‍රයෝජනයට ගන්න මම හිතුවා. ඇත්තෙන්ම මේ ගෙනෙන නියෝග විසින් අපට කියන දේ තමයි ප්‍රවාහනය සුරක්ෂිත විය යුතුයි, ප්‍රවාහනය සුඛෝපභෝගී විය යුතුයි, ප්‍රවාහනය පහසුවෙන් ළඟා කර ගත හැකි විය යුතුයි කියන එක. ඒ සඳහා ගන්නා වූ වටිනා යෝජනාවක් තමයි මෙසේ නියමයන් විධියට එන්නේ. අප ආසන පටි පළඳින්න කියන්නේ මගියාගේ ආරක්ෂාව වෙනුවෙන් සහ රියැදුරාගේ ආරක්ෂාව වෙනුවෙන් මිස වෙනත් කාරණයක් නිසා නොවෙයි. අපි අවුරුද්දක් පුරාවටම අවස්ථාව දුන්නා රියැදුරන්ගේත්, මගීන්ගේත් ආසන පටි සකස් කර ගන්න. මාස තුනෙන් තුනට, හතරෙන් හතරට කාලය ලබා දෙමින් අප ඒ සඳහා ජනතාව පෙලඹෙව්වේ ඇයි? එසේ කළේ මගියාගේ ආරක්ෂාව, රියැදුරාගේ ආරක්ෂාව තහවුරු කරන්නයි.

ඒ හරහා අප බලාපොරොත්තු වන්නේ කුමක්ද? අපි තවදුරටත් ගොඩනගන්න උත්සාහ කරන්නේ බස් හිමියන් හෝ රියැදුරන් කේන්ද්‍ර කර ගත් ප්‍රවාහන පද්ධතියක් නොව, මගියා කේන්ද්‍ර කර ගත් ප්‍රවාහන පද්ධතියක්. මගියා කේන්ද්‍ර කර ගත් ප්‍රවාහන පද්ධතියක් නම්, මගියා සුරක්ෂිත විය යුතුයි; මගියාට පහසුවෙන් ප්‍රවාහන පහසුකම් ලබා ගත හැකි විය යුතුයි. අනෙක් අතට, සුඛෝපභෝගී විධියට අඩු වියදමකින් ප්‍රවාහනය අත්පත් කර ගත හැකි විය යුතුයි. අන්න ඒ කාරණා ඉෂ්ට සිද්ධ කර ගන්න තමයි, පතුල පහළ බස් රථ ගෙනෙන්න අප කටයුතු කළේ. මුලින්ම ගෙනාවේ එවැනි බස් රථ 10යි. ඒ වෙලාවේ සිව්දිගින් සෝෂා ඇති කළා, "මේක අසාර්ථක ව්‍යාපෘතියක්, මේක එල දරන්නේ නැති ව්‍යාපෘතියක්" කියලා. ඒ පතුල පහළ බස් රථවල, මෙට්‍රෝ බස්වල දැන් ගොඩක් සෙනඟ යනවා. ඔවුන් පහසුවෙන් තමන්ගේ ගමන් අවශ්‍යතා ඉෂ්ට කර ගන්නවා; පෞද්ගලික වාහනවලින් අත් මිදිලා, පොදු ප්‍රවාහනයට එකතු වෙනවා.

මේ ගොඩනගන්නේ ප්‍රවාහන සංස්කෘතියක්. පොදු ප්‍රවාහන පද්ධතිය තුළ සියලුදෙනාට පහසුවෙන්, සුඛෝපභෝගීව, කලට වේලාවට තමන්ගේ ගමන් අවශ්‍යතා ඉෂ්ට කර ගන්න තමයි මේ ක්‍රමය ගෙනාවේ. එය පටන් ගත්තේ බස් 10කින්. මේ මාසය තුළ අපි එවැනි බස් රථ එකසිය ගණනක් මාර්ගවල ධාවනයට යොදවනවා. හරිම සතුටුයි කියන්න, මෑතකදී බස් 7ක් ජපන් රජයෙන් පරිත්‍යාගයක් විධියටත් ලැබුණා. ඒ හරහා අපට පුළුවන්, පතුල පහළ බස් රථ, එහෙම නැත්නම් City Bus ක්‍රමය කොළඹට විතරක් නොව, ඉතා නුදුරු කාලයකදී මහනුවරටත්, යාපනයටත් දීලා, දීප ව්‍යාප්තව මේ City Bus සේවයේ පහසුව මගීන්ට අත්පත් කර දෙන්න. ඒ තුළින් ලැබෙන එක්තරා අතුරු වාසියක් තමයි, ආබාධ සහිත ප්‍රජාවට මෙතෙක් තහනම් කරලා තිබුණු පාරවල්, මෙතෙක් තහනම් වෙලා තිබුණු පොදු ප්‍රවාහනයට මේ බස් රථ හරහා ඉඩ හසර ලබා දීම. අන්න ඒක තමයි අප කිව්වේ, එක්ව, අත් නොහැර යන ගමනක් තමයි අප ජනතාව රැගෙන යන්නේ කියලා. ප්‍රවාහනයේදීත් එහෙමයි, සමස්ත ක්‍රියාවලියේදීත් එහෙමයි. අපි කිසිදු කණ්ඩායමක් අත් හරින්නේ නැහැ. විශේෂයෙන්ම, ආබාධ සහිත ප්‍රජාව. ලක්ෂ ගණනක් වන ආබාධ සහිත ප්‍රජාව නිවෙස්වලට වෙලා හිර වෙලා සිටියා, තමන්ගේ රෝද පුටුවෙන් බස් රථයකට ගොඩ වෙන්න අවකාශයක් නැති නිසා. හැබැයි, සමහර කට්ටිය සමච්චල් කළා, "එච්චර ආබාධිත මිනිස්සු ඉන්නවාද? එහෙම ඉන්නවා නම් අපට පාරවල ඒ මිනිස්සු දකින්න පුළුවන් වෙන්න ඕනෑ නේද?" කියලා. ඔවුන්ට පාරට එන්න ක්‍රමයක් නැත්නම් ඔවුන් අනිවාර්යයෙන්ම ගෙදරටම සීමා

[ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා]

වෙනවා. අපි ආබාධ සහිත ප්‍රජාවට ආරාධනා කරනවා, මෙට්‍රෝ බස්වල ගමන් කරන්න කියලා; ඔබ ජීවත් වන බව ලෝකයට පෙන්වන්න, මේ ප්‍රවාහන පහසුකම් භුක්ති විඳින්න එන්න කියලා.

මේක කොළඹට සීමා වන්නේ නැහැ. මම කලින් කිව්වා වාගේ මහනුවරට, යාපනයට කිසිදු භේදයකින් තොරව සෑම අස්සක් මුල්ලක් නෑර මේ City Bus ක්‍රමය දීප ව්‍යාප්තව දියත් කරනවා. ඒ තුළින් පොදු ප්‍රවාහනය ශක්තිමත් කිරීම හරහා මේ රථවාහන තදබදය අහෝසි කරන්න, ජනතාවට සුබෝපභෝගී ප්‍රවාහන පද්ධතියක් උරුම කර දෙන්න ගත්තු උත්සාහයක් තමයි මෙය. මේ උත්සාහයන්ට ජනතාව ඉතාම ළැදිව, කැමැත්තෙන් ප්‍රතිචාර දක්වන බව අපි බුලත්සිංහලදී දැක්කා; බේරුවලදී දැක්කා. තමන් මේ අවුරුදු දෙක තුළ අපේ ආණ්ඩුව ගෙනාපු ක්‍රියාමාර්ගවලට දක්වපු අනුකූලතාව, අනුමැතිය තමයි ඒ රැස්වීම් දෙකේදී ජනතාව ඔල්වරසන් මැද කිව්වේ.

අප ජනතාවට වෙච්ච පොරොන්දු ඉෂ්ට කළේ නැහැ කියන එක තමයි, විපක්ෂයේ මතය. හැබැයි, අපි එකක් දන්නවා. අපි තීරණාත්මක විධියට කිව්වා, එතෙක් දූෂිතව තිබුණු දේශපාලනය අඳුෂා කරනවා කියන එක. ඒක කරලා නැද්ද? අපි වංචාව පිටු දැකලා නැද්ද? අපි තවදුරටත් අල්ලසට, කොමිස් කුට්ටියට, රාජ්‍ය දේපළ වෙන්දේසි කිරීමට සූදානම් නැහැ. ජනතාවගෙන් එකතු කර ගත්තු බදු මුදල් අපි කාබාසිනියා කරන්නේ නැහැ. ඉතාම ඵලදායීව, ප්‍රයෝජනවත්ව, ජනතාවගේ දේ ජනතාවටම දෙන රජයක් විධියට තමයි, මේ පසුගිය අවුරුදු දෙක පුරාවටම අප කටයුතු කළේ. ඒ ක්‍රියාදාමය ඉදිරියට ගෙන යමින්, ජනතාව බුලත්සිංහලදී, බේරුවලදී දක්වපු ප්‍රසාදය ඊටත් වඩා ඉහළින් අප වෙත ළඟා වන බව අපට විශ්වාසයි.

මොකක්ද හේතුව? ජනතාවගේ හද ගැස්මේ රාවය, හද ගැස්මේ රිද්මය හඳුනන ජනාධිපතිවරයෙක් සහ ආණ්ඩුවක් තමයි ජනතාව විසින් පත් කර ගත්තේ. ඔවුන් 159ක මන්ත්‍රීවරු සංඛ්‍යාවක් සහ ජනාධිපතිවරයෙක් පත් කර ගත්තා. ඒ ජනතාවගේ අපේක්ෂා, ඒ ජනතාවගේ ප්‍රාර්ථනා එකක්වත් අඩු නොකර ඉෂ්ට සිද්ධ කරන බව අපේ දැවුරුද්දක අභිමානවත් ගමන තුළින් පේනවා. අපි කියන්නේ ඒකයි. රටට සුබයි; ස්ථිරයි. ඉදිරි අවුරුදු තුන පුරාවටත් ඒ සුබදායක බව තව තවත් සිය දහස් ගුණයකින් වර්ධනය කරනවා. එය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය ධාරිතාව, කැපවීම සහ වුවමනාව අපට තිබෙනවා. විශේෂයෙන්ම මේක ජනතාවගේ වුවමනා හඳුනා ගත්ත ආණ්ඩුවක්, ඒ හද ගැස්ම හඳුනන ආණ්ඩුවක්, සහකම්පනය තිබෙන ආණ්ඩුවක්. තව අවුරුදු කිහිපයක් තුළ ඒ සුබදායක බව අති සාර්ථක ලෙස මේ මහ පොළොව තුළ යථාර්ථයක් බවට පත් වෙන බව සහතික කරලා කියන්න පුළුවන්. දැන් විපක්ෂය ගණන් හදනවා තව අවුරුදු දෙකයි, අවුරුද්දයි තිබෙන්නේ කියලා. නැහැ. අපට ස්ථිර වශයෙන් කියන්න පුළුවන් මීටත් වඩා ඉහළ ජන මතයකින්, ඉහළ ජන අභිලාෂයකින් අපි ඊළඟ අවුරුදු පහටත් බලයට පත් වෙනවා. ඒක ස්ථිරයි.

දැන් ජනමත විචාරණයක් සම්බන්ධ අදහසක් ආවා. ජනමත විචාරණයක් නැහැයි කියන එක ඉතා පැහැදිලියි. ජනමත විචාරණයකට යන්නේ කොහොමද කියන එක අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ පැහැදිලිව කියනවා. ඒක මේ අධිකරණ ප්‍රතිසංස්කරණවලට අදාළ නැහැයි කියන එක තමයි ජනාධිපතිවරයා පැහැදිලි කළේ. ජනතාව අපිත් එක්ක ඉන්න බව අපි ඉතාම ඉහළින් විශ්වාස කරනවා. ඒ අනුව ජනමත විචාරණයක් ආවත් කිසිදු ගැටලුවකින් තොරව අපි ජයග්‍රහණය කරන බව පැහැදිලියි. ඒගොල්ලන්ගේ මතය මොකක්ද? තුන්ගොල්ලකට බෙදුණු නිසාලු, ජාතික ජන බලවේගයට බලය හම්බ වුණේ. නැහැ. ජනතාවත් එක්ක අපි එකට ජීවත් වෙච්ච නිසා, ජනතාවගේ අභිලාෂය අපි හඳුනා ගත්ත නිසා ජනතාව අපි කෙරෙහි තැබූ විශ්වාසය ඔවුන් තහවුරු කළා ඡන්දයෙන්. ඒ කතිරයේ බලය අපි අපයෝජනය කළේ නැහැ, දූෂණය කළේ නැහැ, ඔවුන්ගේ අපේක්ෂා ඉෂ්ට කරන මෙවලමක් බවට පත් කළා මිස.

කොතරම් බල්ලෝ බිරුවත්, කොතරම් නරි හූ කිව්වත් තවලම නොබා ඉදිරියට යන බව සහතික කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. අනිවාර්යයෙන්ම සුබ අනාගතයක් තමයි අපේ ජනතාවට උදා වෙන්නේ. පොරොන්දු වෙච්ච සෑම පොරොන්දුවක්ම ඉටු කරමින් තමයි අපි ඡන්දයකට යන්නේ.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.34]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වත්මන් රජයට අවුරුදු දෙකක් ගතවෙන වෙලාවේ ජනාධිපතිතුමා රැස්වීමක් තියලා බොහොම ලස්සන කථා ටිකක් කිව්වා. එතුමා කිව්වා අලුතින් අධිවේගී මාර්ග තුනක් ආරම්භ කරනවා, විදුලි දුම්රිය ඇති කරනවා කියලා. අපි ජනාධිපතිතුමාට කියනවා, තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට අවුරුදු දෙකයි. අඩු තරමින් අර භාගයට හදපු මධ්‍යම අධිවේගී මාර්ගයේ වැඩ ඉවර කරන්නවත් තමුන්නාන්සේලාට තවම බැරි වුණා. අඩුම තරමින් අවුරුදු පහ ඉවර වෙනකොටවත් ඒක ඉවර කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

"දිට්වා" ඉවර වෙලා මාස 10ක් වෙනවා. තවම රේල් පාර කැඩිලා. මට මතකයි, සුනාමිය වෙලාවේ අඟුලානේ ඉඳලා මාතරට යනකම් කිලෝමීටර එකසිය ගාණක් මුහුදට හෝදාගෙන ගියා. දුම්රිය සේවාවේ ඉංජිනේරුවෝ දවස් 56කින් ඒ මාර්ගය හදලා ඉවර කළා. තමුන්නාන්සේලාට තවම බැරි වුණා අඩුම තරමින් මධ්‍යම දුම්රිය මාර්ගයේ වැඩ ඉවර කරන්න. මෙන්න, තමුන්නාන්සේලාගේ කාර්යක්ෂමතාව.

මහා මාර්ග ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ නැහැ. අද වෙනකොට දුම්රිය සේවාව කඩා වැටිලා තිබෙන්නේ. තමුන්නාන්සේලා මේ රට භාර ගන්නකොට දුම්රිය ගමන් වාර 300ක් දවසකට තිබුණා. අද ඒක අඩු වෙලා තිබෙනවා. මෙන්න, ගිය අවුරුද්දේ, 2025 මහ බැංකු වාර්තාව. ඒ අනුව 2015දී දුම්රිය passenger-kilometres මිලියන 7,407ක් ගිහිල්ලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව යටතේ passenger-kilometres මිලියන 5,990ට අඩු වෙලා තිබෙනවා. ඔන්න දියුණුව! Passenger -kilometres මිලියන 5,999ට අඩු වෙලා තිබෙනවා. මම පෙන්වන්නම්, තමුන්නාන්සේලා නවත්තපු දුම්රිය ගණන. "යාල් දේවි" දුම්රිය මීට පෙර හැමදාම ගිහිල්ලා තිබෙනවා. දැන් යන්නේ දවසක් හැර දවසක් විතරයි. Kankesanthurai Intercity Express Train එක ඉස්සර හැම දාම ගිහිල්ලා තිබෙනවා. දැන් යන්නේ සති අන්තයේ විතරයි. මෙන්න, තමුන්නාන්සේලාගේ සංවර්ධනය! "උත්තර දේවි" දුම්රිය දැන් යන්නේම නැහැ. Vavuniya Intercity Express Train එක දැන් යන්නේ තලෙයිමන්නාරමට. මීට පෙර "රජරට රැජින" වවුනියාවට ගියා. දැන් යන්නේ අනුරාධපුරයට විතරයි.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
උතුරත් එක්ක තරහයි වාගේ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඔව්, උතුර එක්ක තරහයි වාගේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. දැන් නුවරට යන්නේ නැහැ, දුම්රිය. දැනට මාස දහයක් ගියා, තමුන්නාන්සේලාට තවම බැරි වුණා ඒ දුම්රිය මාර්ගය හදන්න. ඔන්න, තමුන්නාන්සේලාගේ කාර්යක්ෂමතාව! නමුත් සල්ලි ඕනෑ තරම් තිබෙනවා කියනවා. මේක තමයි තමුන්නාන්සේලාගේ කාර්යක්ෂමතාව.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ඇමතිතුමාට එන්න කියන්නකෝ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු ඇමතිතුමා මෙම ගරු සභාවට ආවා නම් බොහොම හොඳයි.

ඒ විතරක් නොවෙයි, අද ලංගමට ස්වාභාවික මරණයක් අත්වෙලා තිබෙන්නේ. ලංගමයේ බස් රථ 6,000න් අද දුවන්නේ බස් 4,300යි, දවසකට. ටයර් නැතිව බස් ටික මහ නතර වෙනවා. ඒවාට ඩීසල් ටික වෙලාවට ගෙනෙන්නේ නැහැ. මම තමුන්නාන්සේලාට පෙන්වන්නම්. ලංගම passenger-kilometres මිලියන 15,200යි ගිහිල්ලා තිබෙන්නේ. දැන් ඒක 11,688ට බැහැලා තිබෙනවා. ඒ කියන්නේ ලංගම බස් රථ දුවනවා අඩුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ පෙරේදා නුවර පැත්තේ ඉස්කෝල ළමයින්ගේ බස් එක නැතිව, පොලිසියේ OIC ඒ ළමයි ජීප් එකේ දාගෙන ඉස්කෝලෙට යනවා මම දැක්කා. තමුන්නාන්සේලා කියනවා, අලුත් බස් එකසිය ගණනක් ගෙනාවා කියලා. හැබැයි, තමුන්නාන්සේලාගේ පව් සමා කරන්න බැහැ. මොකද, තමුන්නාන්සේලා 1988-1989 කාලයේ බස් රථ 553ක් ගිනි තියලා තිබෙනවා. තවම පව් සමා කරලා නැහැ. ලංගම ඩිපෝ 15ක් ගිනි තියලා තිබෙනවා. පෞද්ගලික බස් 60ක් ගිනි තියලා තිබෙනවා. දුම්රිය 16ක් ගිනි තියලා තිබෙනවා. දුම්රිය මාර්ග 12ක් කඩලා තිබෙනවා. දුම්රිය ස්ථාන 24ක් ගිනි තියලා තිබෙනවා. මම හිතන විධියට, එදා විරුද්ධ පක්ෂයේ ඉන්නකොට,- *[බාධා කිරීමක්]* ඒ වාර්තාව මා ළඟ තිබෙනවා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
වාර්තාව කෝ?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
වාර්තාව දෙන්නම්. ඉන්න පොඩ්ඩක් කට වහගෙන. මම ඒක සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා.

තව ගොඩක් තිබෙනවා. මරපු ඒවා, බැංකු කඩපු ඒවා. ඒ ඔක්කෝම විස්තර තිබෙනවා. ඒවා දෙන්නම් ඊළඟට. මම අහන්නේ මේකයි. විදුලි දුම්රිය ගැන කථා කරනවා. නමුත් තිබෙන දුම්රිය දුවන්නෙත් නැහැ. දුම්රිය පද්ධතිය කඩා වැටිලා.

Low-flow buses - මෙට්‍රෝ බස් - ගැන කථා කරනවා. තිබෙන බස් ටික දුවන්නෙත් නැහැ. 2015 අවුරුද්දේ passenger-kilometres මිලියන 15,204ක් ධාවනය වූ එක 2025 අවුරුද්දේ කිලෝමීටර මිලියන 12,000කටත් වඩා අඩු වෙලා තිබෙනවා. ඒ කියන්නේ, තමුන්නාන්සේලා බොරුවට කයිවාරු ගහනවා. තිබෙන ප්‍රවාහන සේවයත් තමුන්නාන්සේලා කාලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහෙමද රටේ ප්‍රවාහනය සම්බන්ධයෙන් කටයුතු කරන්නේ?

දැන් කථා කරනවා අධිවේගී මාර්ග තුනක් හදනවා කියලා. කවද්ද ඒවා හදන්නේ? මේක කරන්න පුළුවන් වැඩක්ද? තමුන්නාන්සේලා ඇවිල්ලා බොරු කියනවා, ජනතාවට. තමුන්නාන්සේලාගේ ජනාධිපතිතුමා බොහොම ලස්සනට බොරුව ඇත්ත කරලා කියනවා. එවැනි ජනාධිපතිවරයෙක් තමයි ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් බදු ගැන කියනවා. ඔව්, තමුන්නාන්සේලා මේ රටේ බදු ආදායම වැඩි කරලා තිබෙනවා. කාගෙන්ද මේ බදු ගන්නේ? මේ මුදල් මේ රටේ ඉන්න රජයේ සේවකයාගෙන් ගන්නවා, දොස්තර මහත්තයාගෙන් ගන්නවා, ඉංජිනේරුවාගෙන් ගන්නවා, නඩුකාරයාගෙන් ගන්නවා. මේ හැමෝගෙන්ම ගන්නවා. අද ව්‍යාපාරිකයෝ වැටිලා ඉන්නේ. තමුන්නාන්සේලාගේ ලොකු ව්‍යාපාරිකයෝ හතර, පස් දෙනෙක් විතරයි හම්බ කරන්නේ. අනෙක් මිනිස්සු වැටිලා ඉන්නේ. අපි අහනවා. එහෙමද රටක් දියුණු කරන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව එකක් කියන්න අමතක වුණා. දැනට SLTB එකෙන් සභාපතිලා තුන් දෙනෙක් අයින් වෙලා තිබෙනවා. ඒ අමාත්‍යාංශය ගැන නේ මේ කථා කරන්නේ. NTC එකේ Chairman අයින් වෙලා තිබෙනවා. වෛද්‍ය සේවාවේ දෙන්නෙක් අයින් වෙලා තිබෙනවා. Cabinet Paper එකක් දාලා RMV එකේ එක්කෙනෙක් අයින් කරලා තිබෙනවා. Sri Lanka Railways එකේ GM අයින් කරලා තිබෙනවා. දැන් මේ දෙවැනියා. ඇයි මේ? ප්‍රවාහනය කියන මාතෘකාව ගැන මම එච්චරයි කථා කරන්නේ.

මේ රටේ සීනි කර්මාන්තය දියුණු කරන්න රජයේ සහ පෞද්ගලික අංශයේ සීනි සමාගම් දෙකක් අලුතින් ආරම්භ කරන්න එදා අපේ ආණ්ඩුවට පුළුවන්කම ලැබුණා. අද සෙවණගල සීනි සමාගම ගොවීන්ගේ උක් ටොන් දහස් ගණනක් කපලා නැහැ. ගිය අවුරුද්දේ කපන්න ඕනෑ උක් ගස් මේ අවුරුද්ද වෙනකොටවත් කපලා නැහැ. දැන් ඒ කර්මාන්තශාලාව වහලා. උක් ටොන් එක රුපියල් 10,000යි. ඔන්න, අවුරුදු දෙකක් තිස්සේ කරපු දේවල්. ගිය අවුරුද්දේ කපන්න ඕනෑ උක් ගස් මේ අවුරුද්දේත් කපලා නැහැ. ගොවීන්ගේ උක් ගස් ඒ අයගේ ඉඩම්වල වේළෙනවා. තමුන්නාන්සේලාට බැරි වෙනකොට සීනි සමාගම වහලා දානවා. ඒ විතරක් නොවෙයි, ගොවීන්ගේ උක් ගස්වලට ලබාදෙන මුදල අඩු කරලා තිබෙනවා. ඉස්සර ගොවීන්ට රුපියල් 65 ගණනේ සීනි කිලෝ 5ක් සහනාධාරයක් වශයෙන් ලබා දුන්නා. දැන් ඒකත් කපලා දාලා. ගොවියා සුබසාධන අරමුදලට රුපියල් 7.50ක් දරනකොට සමාගමත් රුපියල් 7.50ක් දැරුවා. දැන් ඒකත් කපා දමා තිබෙනවා. සේවකයින්ගේ දිරි දීමනා අඩු කරලා තිබෙනවා. මට මතකයි, ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා කිව්වා පිට රටින් සීනි ගෙන්වන එක ලාභයි කියලා. එහෙම නම්, මෙම සමාගම් ස්වාභාවික මරණයකට පත් වෙන්නද යන්නේ? මොනරාගල දිස්ත්‍රික්කයේ තිබෙන සෙවණගල සහ

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

පැල්වත්ත සමාගම් තමුන්නාන්සේලා විනාශ කරනවා. මොකද, ජනාධිපතිවරණයේදී මොනරාගල දිස්ත්‍රික්කයේ ජනතාවගේ තැපැල් ඡන්ද නැති වුණාම තමුනාන්නාන්සේලාගේ හිතට අමාරු ඇති. මොනරාගලයි, බිබිලයි දෙකම ජනතාවගේ ඡන්දයෙන් අපි දිනුවා. ඒකට පළි ගන්නද, තමුන්නාන්සේලා මේ විධියට සීනි සමාගම් දෙක වහන්න යන්නේ?

ඒ විතරක් නොවෙයි. තමුන්නාන්සේලා එම සීනි සමාගම් දෙකටත් SLTB එකට කරපු දේම කරන්න යනවා. 1988-1989 කාලයේ සෙවණගල සීනි සමාගමේ ඩෝසර් 7ක් ගිනි තබා තිබෙනවා. ට්‍රැක්ටර්, බවුසර් සහ ලොරි 25ක් ගිනි තබා තිබෙනවා. උක් වගාවටත් ගිනි තබා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. සියඹලාණ්ඩුවේ සීනි සමාගමක් ආරම්භ කරන්න ඉන්දියාවේ මේතා සමාගම ආවා. ඒකට ආපු ආයෝජකයෝ දෙදෙනායි, නෝනා කෙනෙකුයි, ලංකාවේ ඉඩම් කොමසාරිස් වශයෙන් හිටපු සිංහ සේනානායකයි හතරදෙනෙක් මරලා ගිනි තැබුවා. එහෙමයි තමුන්නාන්සේලා උක් වගාව විනාශ කළේ. මට ලජ්ජයි! මේ ආණ්ඩුවේ වෛද්‍යවරු ඉන්නවා, ඉංජිනේරුවරු ඉන්නවා. කෝටි දමාගෙන ඇවිල්ලා තමුන්නාන්සේලා එකතුවෙලා ඉන්නේ කාත් එක්කද? මෙන්න මේ වාගේ වැඩ කරපු අයත් එක්ක තමයි එකතු වෙලා ඉන්නේ. තමුන්නාන්සේලාට ලජ්ජාවක් නැද්ද, මේගොල්ලන් එක්ක එකට වාඩිවෙන්න? NPP එකයි, JVP එකයි නේද? NPP එකේ අයට මම කියන්නේ, මෙන්න කරපු දේවල්.

මේගොල්ලෝ ඇවිල්ලා දැන් බොරුත් කියනවා. මේගොල්ලෝ කියනවා, මේ ආණ්ඩුව ඇවිල්ලා විදේශ සංචිතය ඇමෙරිකානු ඩොලර් මිලියන 6,541ක් දක්වා වැඩි කළා කියලා. ඇයි, මේ රටට බොරු කියන්නේ? තමුන්නාන්සේලා ආණ්ඩුව භාර ගන්නකොට, එදා තිබුණු ආණ්ඩුව ඩොලර් මිලියන 6,195ක සංචිතයක් ඉතුරු කරලා ගියේ. තමුන්නාන්සේලා වැඩි කරගෙන තිබෙන්නේ ඩොලර් මිලියන තුන්සිය ගණනයි. හැබැයි, තමුන්නාන්සේලා ජනතාවට කියන්නේ, "අපි ඩොලර් මිලියන හයදහස් ගණනක සංචිතයක් හැදුවා" කියලා.

තමුන්නාන්සේලා දන්නවා, මේ රට සහලින් ස්වයංපෝෂිත කළේ කවුද කියලා. 1948දී නිදහස ලබනකොට එදා හිටපු ජනගහනයට අවශ්‍ය සහල්වලින් සියයට 35යි අපි නිෂ්පාදනය කළේ. සියයට 65ක් පිට රටින් ගෙනාවා. ඩීඑස්, ඩඩ්ලි, ජේආර්, රණසිංහ ප්‍රේමදාස, ගාමිණී දිසානායක ඇතුළු අපට මේ රටේ විශාල වාරි කර්මාන්ත හදලා මේ රට ස්වයංපෝෂිත කරන්න පුළුවන්කම ලැබුණා. 1948දී අක්කරයකින් ගත්තේ වී බුසල් 46යි. අපි ඒක බුසල් 120ක් දක්වා වැඩි කළා. තමුන්නාන්සේලා අද මොකක්ද කරලා තිබෙන්නේ? ඒක නැත්තටම නැති කරලා විනාශ කරන්න හදනවා. තමුන්නාන්සේලා කිව්වා, වී කිලෝවක සහතික මිල රුපියල් 120යි කියලා. ඇමතිවරයාම ඇවිල්ලා කිව්වා, වී කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 137ක් යනවා කියලා. අද රුපියල් 120ට ගන්නේත් නැහැ. අද මහවැලි ප්‍රදේශවල වී කිලෝව ගන්නේ රුපියල් 85ට, 90ට. මම ටෙලිෆෝන් කරලා ඇහුවා, වේළපු වී කිලෝව ගන්නේ රුපියල් 100ට. තමුන්නාන්සේලා ඉතිහාසගත වෙයි. "අවුරුදු 76ක ශාපය" කියලා කියපු කාලයේ අපි මේ රට සහලින් ස්වයංපෝෂිත කළා. නිදහස ලබාගෙන 77වැනි සහ 78වැනි අවුරුදුවල තමුන්නාන්සේලා ඒක විනාශ කරනවා. අපි ගිය මාසයේ සිටියේ අනුරාධපුරයේ. ඒ ගෙවල්වල කන්න දෙකක වී ගොඩගසා තිබෙනවා. ඔන්න, තමුන්නාන්සේලාගේ ගොවියාගේ ආර්ථිකය! මේ රටේ සියයට 24ක් ඉන්නේ ගොවියෝ. ගොවීන් විනාශ කරපු එකේ පාප කර්මය තමුන්නාන්සේලා භාර ගන්න ඕනෑ. මම අහනවා, -

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
අර ඉන්නේ පොළොන්නරුවේ - *[බාධා කිරීමක්]*

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
පොළොන්නරුව පැත්තේ - *[බාධා කිරීමක්]* ගොවියෝ කසිප්පු බොනවා. එහෙම නේද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මට තව විනාඩියක් දෙන්න.

ඇමතිතුමා කියනවා, වී බුසල් දෙසිය ගණනක් ගන්නවාය කියලා. එහෙම ගන්නේ නැහැ. අපි නම් වැඩි කළා. 1948දී බුසල් 46ක් තිබුණු එක, අපි 120ක් කළා. තමුන්නාන්සේලා දන්නවාද, මහවැලිය පටන් ගත්ත දවස්වල අක්කරයකින් වී කිලෝ 5,000ක්, 7,000ක් ගත්තා. දැන් ගන්නේ 4,500යි, 5,000යි. මම කියන්නේ මේකයි. මේ රටේ ගොවි ජනතාව, ගොවිතැන විනාශ කළ පක්ෂයක් විධියට තමුන්නාන්සේලා ඉතිහාසගත වෙයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඒ විතරක් නොවෙයි. පොහොර සහනාධාරය රුපියල් 15,000 ඉඳලා 30,000 වෙනකල් වැඩි කරනවාය කිව්වා. අපි එදා රුපියල් 1,500ට පොහොර දුන්නා. ලෝක වෙළෙඳ පොළේ 6,000යි. අපි සියයට 75ක සහනාධාරයක් දුන්නා. රුපියල් 1,500ට පොහොර දුන්නා, ඕනෑ ගොවියෙකුට. අද මොකක්ද කරන්නේ? අපි එදා රුපියල් බිලියන 35ක්, 40ක් දුන්නා. රවී කරුණානායක මහත්මයා මේ වෙලාවේ සභාවේ නැහැ. තමුන්නාන්සේලා අද ගොවියාගේ පොහොර සහනාධාරය සඳහා දෙන මුදල බිලියන 30ට අඩු කරලා තිබෙනවා. සියයට 25ක්වත් සහනාධාරය නැහැ. ගොවිතැන විනාශ කරපු ආණ්ඩුවක් විධියට තමුන්නාන්සේලා ඉතිහාසගත වෙයි; වාර්තාගත වෙයි.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.47]

**ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ගමනාගමන කොමිෂන් සභාව, පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය හෝ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ නියාමනය කරනු ලබන මගී ප්‍රවාහන සේවා, පාසල් ළමුන් ප්‍රවාහන සේවා, කාර්යාලයීය ප්‍රවාහන සේවා, කුලී පදනම මත විශේෂ චාරිකාවල යෙදෙන රථ වාහනවල මාර්ග ධාවන යෝග්‍යතාව හා මගී ආරක්ෂාව තහවුරු

කිරීම වෙනුවෙන් ඉදිරිපත් කර තිබෙන 2489/22 දරන අති විශේෂ ගැසට් නිවේදනය පිළිබඳවත්, 2026 සැප්තැම්බර් 19 සිට අධිවේගී මාර්ගවල ධාවනය කරනු ලබන සියලු වාහනවල සියලු ආසනවල ගමන් ගන්නා තැනැත්තන් සඳහා ආසන පටි පැළඳීම අනිවාර්ය කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙන 2493/19 දරන අති විශේෂ ගැසට් නිවේදනය පිළිබඳවත් තමයි අද දවසේ මේ විශේෂ විවාදය පැවැත්වෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සියලු කාරණාවල ප්‍රධාන පරමාර්ථය බවට පත් වෙන්නේ, වාහනවල තාක්ෂණික තත්ත්වය සම්බන්ධ අවම ප්‍රමිති හා පිරිවිතර පරීක්ෂා කිරීම මඟින් ඒ වාහනවලට ධාවනයේ යෙදීමට තිබෙන යෝග්‍යතාව පරීක්ෂා කිරීම සහ සිදුවන මාර්ග අනතුරු අවම කර ගැනීමයි.

අධිවේගී මාර්ගවල ගමන් කරන රියැදුරන්ගේ වාගේම මගීන්ගේ ආරක්ෂාව ඉහළ නැංවීම, මාර්ග අනතුරුවලදී සිදුවන බරපතළ තුවාල හා මරණ අවම කර ගැනීම වාගේම ජාත්‍යන්තර මාර්ග ආරක්ෂණ ප්‍රමිතීන්ට අනුකූලව ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග ආරක්ෂණ රෙගුලාසි ශක්තිමත් කිරීම තමයි අද දවසේ ඉදිරිපත් කර තිබෙන මේ අති විශේෂ ගැසට් නිවේදනවලින් ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වෙන්නේ. විශේෂයෙන්ම පසුගිය අගෝස්තු මාසයේදී නුවරඑළිය පොලිස් කොට්ඨාසයේ, තලවාකැලේ ප්‍රදේශයේදී, රථ වාහන අංශයේ නිලධාරින් සහ මෝටර් රථ පරීක්ෂකවරුන් එක්ව සිදු කළ පරීක්ෂාවකදී වාහන 40කින් 28ක්ම ධාවනයට නුසුදුසු වාහන ලෙස හඳුනාගෙන, ධාවනයෙන් ඉවත් කරලා තිබෙනවා. එතැනදී පෞද්ගලික බස් රථ 4ක් වාගේම ත්‍රිරෝද රථ 15කුත් ධාවනයෙන් ඉවත් කරන්න සිදුවෙලා තිබෙනවා. විශේෂයෙන්ම ගත්තොත්, පොලිස් දත්ත අනුව 2020 සිට 2024 දක්වා කාලය තුළ මාර්ග අනතුරු 118,697ක් වාර්තා වෙලා තිබෙනවා; මරණ 12,322ක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම 2026 ජනවාරි 1වැනි දා ඉඳලා ජුනි 9වැනි දා දක්වා කාල පරාසය තුළ මාරක අනතුරු 1,179ක් සිදුවෙලා තිබෙනවා; මරණ 1,240ක් වාර්තා වෙලා තිබෙනවා. ඒ මිය ගිය පිරිස අතරින් වැඩිම ප්‍රමාණයක් වාහනවල ගමන් කරපු අය නොවෙයි. ඒ අතර පදිකයන් 426දෙනෙකු ඉන්නවා; යතුරුපැදිකරුවන් 424දෙනෙකු ඉන්නවා; මගීන් 115දෙනෙකු ඉන්නවා; රියැදුරන් 107දෙනෙකු ඉන්නවා; පාපැදිකරුවන් 84දෙනෙකු ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 වර්ෂයේ ඒ කාල පරාසයත් එක්ක බලනකොට, මාරක රිය අනතුරු සංඛ්‍යාව 119කින් වැඩි වෙලා තිබෙනවා; මිය ගිය සංඛ්‍යාව 123කින් වැඩි වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අදටත් අපේ සිත්වල දෝංකාර දෙන, අදටත් අපට මතක තිබෙන බොහොම ඛේදනීය රිය අනතුරු සිදුව තිබෙනවා. 2025.09.04වැනි දා ඇල්ල-වැල්ලවාය මාර්ගයේ සිදු වූ මාරක රිය අනතුරත් එවැන්නක්. තංගල්ල නගර සභාවේ සේවක පිරිසක් තමයි එලෙස එදා විනෝද චාරිකාවක යමින් සිටියේ. ඒ බස් අනතුරින් මිය ගිය සංඛ්‍යාව 16දෙනෙක්; තුවාලකරුවෝත් 16දෙනෙක්. විශේෂයෙන් මේ පරීක්ෂණ වාර්තාවල දීපු නිර්දේශ ඇතුළේ සඳහන් වෙලා තිබෙනවා, මෙවැනි නීති රීති ඇයි අපි ගෙන එන්න ඕනෑ කියන කාරණාව. නිසි ප්‍රමිතියකින් තොර වාහන භාවිතය තහනම් කිරීම, වාහන නඩත්තු කිරීම ක්‍රමවත් කිරීම, අමතර කොටස් නිසි ප්‍රමිතියකින් යුතුව යෙදවීම, රථවාහන යෝග්‍යතා සහතික පත්‍ර නිකුත් කිරීම ක්‍රමවත් කිරීම ආදී කාරණා තමයි ඒ පරීක්ෂණයේදී දීලා තිබෙන නිර්දේශවල සඳහන් වන්නේ.

ඒ වාගේම අපට මතකයි, 2025.05.11වන දා සිදු වූ ගැරඬිඇල්ල බස් රථ අනතුර. එදින කතරගම ඩිපෝවට අයත් ලංගම බස් රථයක් අනතුරට ලක් වීමෙන් සිදු වූ මරණ සංඛ්‍යාව 23යි; තුවාලකරුවන් සංඛ්‍යාව 60යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මතකයි, එදා ආදරණීය අම්මා කෙනෙක් තමන්ගේ පුංචි දරු පැටියාගේ ජීවිතය බේරාගන්න මොන තරම් වෙහෙසක්, මොන තරම් උත්සාහයක් ගත්තාද කියලා. මේ හැම කාරණාවකින්ම කියැවෙන්නේ මොකක්ද? මෙම ක්ෂේත්‍රයට අදාළ වෙනස්කම් කරලා ජනතාවට ඉතාම හොඳ ගුණාත්මක ප්‍රවාහන සේවයක් ලබා දීම වෙනුවෙන් තමයි අවුරුදු දෙකක කාලයක් ගත වුණත්, මේ ආණ්ඩුව හැකි ඉක්මනින් මේ ගැසට් නිවේදනය ගෙනාවේ. ගුණාත්මක ප්‍රවාහන සේවාවක් මහජනතාවට ලබා දීම වෙනුවෙන් අපි මේ නීති, අණ පනත් ගෙන එනවා විතරක් නොවෙයි, මේ මොහොතේදී ආණ්ඩුව විධියට කළ හැකි සියල්ල කරමින් ඉන්නවා.

ගුණාත්මක ප්‍රවාහන සේවාවක් ලබා දීම සඳහා අපි මේ වන විට ලංගමට බඳවා ගෙන තිබෙනවා, රියැදුරන් 418ක්, කොන්දොස්තරවරුන් 246ක්. ඉතිහාසයේ පළමුවන වතාවට අපි පසුගිය දවස්වල කොන්දොස්තරවරියන් 23දෙනෙක් බඳවා ගත්තා. ඒ විතරක් නොවෙයි. බඳවා ගත් NTC වේලා සටහන්කරුවන් 18දෙනා අතර කාන්තාවන් දෙදෙනෙකු ද සිටිනවා. ඒ වාගේම කාර්මික අංශයට බඳවා ගැනීම් 428ක් කරන්නත් අපි මේ වන විට සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි බංකොලොත් වෙච්ච රටක, කඩා වැටුණු රටක ආණ්ඩුවක් අරගෙන ගතවෙලා තිබෙන අවුරුද්දයි, මාස 10ක් ඇතුළත සමස්ත කාරණා කළමනාකරණය කරමින් මහජනතාවට සහන ලබා දෙමින් සිටිනවා. මේ වන විට අපි රටේ පාරවල් හදන එක විතරක් නොවෙයි කරන්නේ. අපි හදපු අධිවේගී මාර්ග කෝ කියලා රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා ඇහුවා. අපි මධ්‍යම අධිවේගී මාර්ගයේ වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ සඳහා රුපියල් බිලියන 112ක් වෙන් කරලා තිබෙනවා. අපි ඒ පාරවල් හදන්නේ මුදල් ණයට අරගෙන නොවෙයි, දේශීය අරමුදල් යොදවා කියන එකත් මේ වෙලාවේ මම කියන්න කැමැතියි.

මොනරාගල දිස්ත්‍රික්කය ඇතුළේ මාර්ග ආරක්ෂණ - road safety - වැඩ පිළිවෙළ වෙනුවෙන් රුපියල් 173,864,314ක ප්‍රමාණයක් අපි වෙන් කරලා තිබෙනවා. ඒ විධියට මේ රට තුළ අධිවේගී මාර්ග හැදෙනවා, සාමාන්‍ය මාර්ග පද්ධතිය හැදෙනවා. අපේ නව ප්‍රවාහන පද්ධතියට එකතු කරන්න ඕනෑ, මෙට්‍රෝ බස් රථ විතරක් නොවෙයි. ඒ වාගේම මහජන අවශ්‍යතාව මත මිනිසුන්ට ගුණාත්මක ප්‍රවාහන සේවාවක් ලබා දීම විතරක් නොවෙයි, ජීවිතය ආරක්ෂා කරගෙන ගමන් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ගත් අපි මේ වන විට තෝරමින් ඉන්නේ. විශේෂයෙන් ගත්තොත්, කඳුකර ප්‍රදේශවලට සීට් විසිදෙකේ බස් රථ අපි ආනයනය කරලා තිබෙන්නේ. ඒ වාගේම දිගින් අඩු බස් රථ 50ක් ආනයනය කරන්නත් අපි මේ වන විට කටයුතු සූදානම් කරලා තිබෙන්නේ. මොකද, මේ ගුණාත්මක ප්‍රවාහන සේවාව ඇතුළේ මහජනතාව තවදුරටත් තමන්ගේ ජීවිත ආරක්ෂා කරගෙන ගමන් කරන්න ඕනෑය කියලා අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ වේලාවේ මේ කාරණයත් කියන්න කැමැතියි. අපේ රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා නියෝජනය කරන්නේ මොනරාගල දිස්ත්‍රික්කය. එතුමා පුන පුනා කියා හිටියා, මේ ආණ්ඩුව හදලා අවුරුද්දයි, මාස දහයයි, මේ කාලය ඇතුළත මොනවාද කළේ සහ කරමින් ඉන්නේ කියලා. 76 වසරක දේශපාලනය ඇතුළේ ඔබතුමා මන්ත්‍රීවරයෙකු හැටියට, ඇමතිවරයෙකු හැටියට කොපමණ වර්ෂ ගණනක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරලා තිබෙනවාද? හැබැයි, ඔබතුමන්ලා ඉතිහාසයේ ලියෙව්වේ මොනරාගල දිස්ත්‍රික්කය තවදුරටත් දුප්පත්ම දිස්ත්‍රික්කය කරලායි. එම නිසා හෘදය සාක්ෂියට එකඟව මේ පිළිබඳව අපෙන් ප්‍රශ්න කරන්න ඔබතුමාට අයිතියක් තිබෙනවාද කියලා මම අහන්න කැමැතියි.

[ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉතාම හොඳින්, පවතින තත්ත්වයන් කළමනාකරණය කර ගනිමින්, මේ රටේ පුරවැසියන්ගේ ජීවිත ආරක්ෂා කර ගනිමින්, ගුණාත්මක ප්‍රවාහන සේවයක් ඇතුළේ ගමන් කරන්න ඉඩ සලසමින්, අද දවසේ ගෙනෙන නියෝග හරහා ඒ කාර්යභාරය ඉතාම හොඳින් කර තිබෙන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මංජුල සුරවීර ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සංජීව රණසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SANJEEWA RANASINGHA left the Chair, and THE HON. LAKSHMAN NIPUNA ARACHCHI took the Chair.*

[අ.භා. 2.57]

**ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපට පුදුමත් හිතෙනවා, මැරිලා ඉපදිලා නැවත පාර්ලිමේන්තු ආපු විපක්ෂයේ මන්ත්‍රීවරුන් අවුරුදු දෙකක ආණ්ඩු ක්‍රියාවලියක් ගැන දිගින් දිගටම ප්‍රශ්න කිරීම සම්බන්ධව. *[බාධා කිරීම්]* ඔබතුමන්ලා වාඩිවෙන්න. පසුගිය අවුරුදු දෙකක කාල සීමාව ගැන එතුමන්ලා අපෙන් ප්‍රශ්න කරනවා, අවුරුදු 76ක් තුළ වෙච්ච දේවල් අමතක කරලා.

විශේෂයෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් මම ඔබතුමන්ලාගෙන් ප්‍රශ්න ටිකක් අහන්න කැමැතියි. දිස්ත්‍රික්ක 25න් අඩුම අධ්‍යාපන සුදුසුකම් සහිත දරුවන් ඉන්න දිස්ත්‍රික්කය මොකක්ද? අඩුවෙන්ම පාරවල් හදපු දිස්ත්‍රික්කය මොකක්ද? මන්දපෝෂණය වැඩිම දිස්ත්‍රික්කය මොකක්ද? රාජ්‍ය සේවකයෝ වැඩි පිරිසක් පිටින් ඇවිල්ලා වැඩ කරන දිස්ත්‍රික්කය මොකක්ද? පිරිසිදු පානීය ජලය අඩුවෙන්ම පරිහරණය කරන ජනතාව ඉන්න දිස්ත්‍රික්කය මොකක්ද? ඔබ මේවාට උත්තර දෙන්න ඕනෑ. හැමදාම ලියාගෙන ඇවිල්ලා 1988-89 කාලය ගැන කථා කරනවා වෙනුවට මේ දේවල් ගැන කථා කරලා මේවාට ඔබ උත්තර දෙන්න ඕනෑ. ජනතාව අලුත් ආණ්ඩුවක් හදලා තිබෙන්නේ, ජන වරමක් දීලා තිබෙන්නේ. ජනතාව ආණ්ඩුවට ශක්තිය, ධෛර්යය දෙමින් ඉවසීමෙන් බලාගෙන ඉන්නේ මේ ආණ්ඩුව ගැන සහතිකයක් තිබෙන නිසායි, රට හදනවා කියන විශ්වාසය තිබෙන නිසායි. එම නිසා ජනතාව දවස ගාණේ රොද බඳිමින් එකතු වෙමින් ආණ්ඩුව ශක්තිමත් කරමින් ඉන්නවා.

ඒ අතර රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා, මහනුවර දිස්ත්‍රික්කයේ රේල් පාර ගැන. ඒකටත් මම උත්තරයක් දෙන්න ඕනෑ. විශේෂයෙන්ම බදුල්ල දක්වා තිබෙන දුම්රිය මාර්ග ටික නැවත පිළිසකර කරමින් ඒ සම්බන්ධව කටයුතු කරන ඉංජිනේරුවන් සහ කාර්ය මණ්ඩලය ඉතා වේගවත්, කාර්යක්ෂම සේවාවක් සිද්ධ කරමින් ඉන්නවා. ඒක අර සුනාමියේදී විනාශයක් වුණා වාගේ තත්ත්වයක් නොවෙයි. අඩි තුන් හාරසිය ගණන් පොළොව යටට කිඳා බැහැලා ඒ අවශ්‍ය ඉදිකිරීම් වලින් පසුව තමයි නැවත රේල් පීලි දමන්න තිබෙන්නේ. එම නිසා ප්‍රශ්න සරල ලෙස තේරුම් ගනිමින්, කබරගොයා තලගොයා කරන්න ඕනෑ විධියේ විවේචන කරමින් තර්ක විතර්ක ගෙනැල්ලා ජනතාව අන්දන්න හැදුවාට ජනතාව දන්නවා, ආණ්ඩුව ලස්සනට වැඩේ කරගෙන යනවා, හැබැයි ප්‍රමාදයක් තිබෙනවා, මේ වෙලාවේ තිබෙන තත්ත්වයන්ට යටත්ව තමයි ඒ සියලු දේවල් සිද්ධ වන්නේ කියන එක. විපක්ෂය මොන තරම් කෙඳිරිගෑවත්, මොන තරම් විවේචන කළත්, මොන තරම් මඩ ප්‍රහාර එල්ල කළත් ජනතාවත් දන්නවා, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ හෘදය සාක්ෂියත් පැහැදිලිව දන්නවා, රට ඉස්සරහට යන බව.

අද මෙතැන විශේෂයෙන්ම අපට විවාද කරන්න තිබෙන්නේ මෝටර් වාහන පනත යටතේ ගෙන එන නියෝග කිහිපයක් පිළිබඳවයි. අපි විපක්ෂයට උත්තර දීලා වැඩක් නැහැ. අපි උත්තර දෙන්න ඕනෑ ජනතාවට. මොකද, අපි වග කියන්නේ ජනතාවට, වග කියන්නේ ජන වරමට. එච්චරයි.

අපි දන්නවා, විශේෂයෙන්ම ගත්තොත් මේ වනකොට රටේ සමස්ත ලියාපදිංචි වාහන ප්‍රමාණය ලක්ෂ 83කට ආසන්න බව. මේ වාහන අතරින් මගී ප්‍රවාහනය සඳහා යොදා ගන්නා වාහන ලක්ෂ 9කට, 10කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. පෞද්ගලික බස් රථ 22,000ක බළඇණියක් රටේ ක්‍රියාත්මක වනවා. ඒත් එක්කම ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ 5,000ත්, 5,500ත් අතර ප්‍රමාණයක් මගී ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා වෙනුවෙන් සම්පූර්ණ සේවාවක් කිරීමට යොදවා තිබෙනවා. පාසල් වෑන් රථ 40,000ත්, 50,000ත් අතර ප්‍රමාණයක් රට පුරා සිටින පාසල් දරුවෝ ටික ගෙන යමින් ප්‍රවාහනයේ යෙදෙනවා. ඒ විතරක් නොවෙයි. කාර්, එහෙම නැත්නම් ටැක්සි 50,000කට ආසන්න ප්‍රමාණයක් මහජනතාව වෙනුවෙන් රට පුරා ප්‍රවාහන සේවයේ යෙදෙනවා. කාර්යාල සේවා පවත්වා ගෙන යන වෑන් රථ ගත්තොත්, 50,000ත්, 60,000ත් අතර ප්‍රමාණයක් රට පුරා ප්‍රවාහන සේවයේ යෙදෙනවා. ඊට අමතරව මෑත කාලයේ ප්‍රවණතාවක් ලෙස, ඔබතුමන්ලා රට හදලා පාරවල් හදපු නිසාද කොහෙදෝ හද්දා පිටිසර ගම්මානවලට දෙන්නෙකුට, තුන්දෙනෙකුට යන්න පුළුවන් ත්‍රිරෝද රථ ප්‍රමාණයත් වැඩි වෙලා තිබෙනවා.

ඒ, ඔබතුමන්ලාගේ විපක්ෂය කරපු සංවර්ධනය වෙන්න ඇති. අපි දන්නවා, මේ වනකොට ත්‍රිරෝද රථ ලක්ෂ හතහමාරකට ආසන්න ප්‍රමාණයක් රට පුරා මඟීන් ගෙනයෑමේ කටයුත්තේ යෙදිලා ඉන්න බව. මෙන්න මේ ප්‍රවාහන සේවය ඉතා පුළුල් වෙලා තිබෙනවා. මේක තවදුරටත් විධිමත්, දියුණු රටක අත්දැකීම් සහිත ඉතාම හොඳ ප්‍රවාහන සේවයක් බවට පත් කරන්න විශේෂයෙන්ම ආණ්ඩුව; ජනාධිපතිතුමා, බිමල් රත්නායක ඇමතිතුමා, අමාත්‍ය මණ්ඩලය ඇතුළු සියලුදෙනා උත්සාහ කරමින් ඉන්නවා. අපිට ඒකට අදාළ පාරවල් ටික හදන්න තිබෙනවා. අපිට ඒ ඔක්කෝම කරන්න තිබෙනවා. නමුත් මේ වෙලාවේදී අපිට විශේෂයෙන්ම මඟීන්ගේ ආරක්ෂාව වෙනුවෙන් මේක ප්‍රමිතිගත කරන්න, නියාමනය කරන්න, මේකට අදාළ සංශෝධන කිහිපයක් පනත ඇතුළේ කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ අනුව මිනිස්සුන්ගේ ජීවිත ආරක්ෂා කරන්න, මඟීන්ගේ ආරක්ෂාව සහතික කරන්න, මාර්ගවල ආරක්ෂාව තහවුරු කරන්න, පරිසරය ආරක්ෂා කරන්න වාගේම ජීවිත හා දේපළවල ආරක්ෂාව තහවුරු කරන්න මේ ආණ්ඩුවට වගකීමක් පැවරී තිබෙනවා. ඒ නිසා අද දිනයේ මෝටර් වාහන පනත යටතේ නියෝග ගෙනෙමින් උත්සාහ කරමින් ඉන්නේ විධිමත් ප්‍රවාහන සේවයක් තුළින් මහජන ආරක්ෂාව තහවුරු කරන්නයි.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ පොලිස් ස්ථාන 28ක් තිබෙනවා. මේ පොලිස් ස්ථාන 28 තුළ එක දවසකදී මේ වාහන ටික check කරන්න ගත්තොත්, ඒවායේ ප්‍රමිති සහතිකය, යෝග්‍යතා සහතිකය check කළොත්, අනිවාර්යයෙන් ඒවායෙන් සියයට 60කට වැඩි ප්‍රමාණයක් මාර්ගයේ ධාවනයටවත්, මඟී ප්‍රවාහනයට යොදවන්නවත් සුදුසු ඒවා නොවෙයි කියන එක පෙනී යනවා. ඒවා මොනවා හරි දෝෂයක් තිබෙන ඒවා. ඒවායේ එක්කෝ තිරිංග ප්‍රශ්නයක්, එහෙම නැත්නම් ටයර් ටික ගෙවිලා, සුක්කානම් පද්ධතියේ ප්‍රශ්නයක්, විදුලි පද්ධතියේ ප්‍රශ්නයක්, එක්කෝ seat belts නැහැ, එහෙම නැත්නම් සමහර ඒවායේ රියැදුරා බීලා. දියුණු තැනක ඉඳලා නොවෙයි ඒ කටයුතු සිදු කරලා තිබෙන්නේ. මේ විධියට අනාරක්ෂිත ක්‍රම පාවිච්චි කරමිනුයි ඔවුන් සමහර තැන්වල මඟී ප්‍රවාහනයේ යෙදිලා තිබෙන්නේ. පොල් පටවනවා වාගේ මිනිස්සු පටවලා ප්‍රමිතියක් නැතුව තමයි ධාවනයේ යෙදෙන්නේ. ඒ නිසාම විශේෂයෙන්ම මධ්‍යම කඳුකරයේ සිදු වන අනතුරු ප්‍රමාණය වේගයෙන් වැඩි වෙමින් තිබෙනවා.

පසුගිය දවස්වල අපි දැක්කා, කොත්මලේ ප්‍රදේශයේ සිදු වෙච්ච බිහිසුණු අනතුර. ඒ වාගේමයි මෝහිනී ඇල්ල අසල සිදු වුණු අනතුරත්. ඒත් එක්කම මස්කෙළිය, බගවන්තලාව, ඩයගම වැනි ප්‍රදේශවල ප්‍රපාතවලට ත්‍රී වීලර්, බස් රථ, වෑන් රථ පෙරළෙන ඒවා සම්බන්ධ ප්‍රවෘත්ති දෛනිකව අපට අහන්න සිදු වනවා. ආණ්ඩුවට මේවාට උත්තරයක් සෙවීම සඳහා කටයුතු කරන්න සිද්ධ වෙලා තිබෙනවා.

මෙහි බරපතළම කාරණය මෙයයි. අපි දන්නවා, විධිමත් ප්‍රවාහන සේවයක් සහ නියාමනයක් නොමැතිව මඟී ප්‍රවාහනය සිදු කිරීම නිසා ජීවිත සහ දේපළ විශාල ප්‍රමාණයකට හානි වෙමින් තිබෙන බව. මෑත කාලයේ සංඛ්‍යාලේඛන ටිකක් අධ්‍යයනය කරලා බැලුවාම අපිට තේරෙනවා, මේ රිය අනතුරු සහ මාර්ග ආරක්ෂාව බිඳ වැටීම නිසා ඇති වන තත්ත්වයන් මහ හරවා ගැනීම සඳහා වසරකට රුපියල් බිලියන 480-500 අතර ප්‍රමාණයක රටේ මහජනතාවගේ දේපළ, මුදල් යොදවන්න සිදු වන බව. වසරකට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2-3 අතර ප්‍රමාණයක් ඒ සඳහා නිකරුණේ යොදවන්න අපිට සිද්ධ වෙලා තිබෙනවා.

ඊළඟට, සෞඛ්‍ය පද්ධතිය දිහා බැලුවාම අපට පෙනී යනවා, රෝහල් පද්ධතියට ඇතුළු වන ජනතාවගෙන් සියයට 80ක් මෙලෙස සිදු වන රිය අනතුරු නිසා පීඩාවට පත් වූ අය බව. ඒ වාගේම හදිසි ප්‍රතිකාර ඒකකයේ ඇඳන් ටික සම්පූර්ණයෙන්ම පිරිලා තිබෙන්නේ රිය අනතුරු - accidents - ඇතුළු මාර්ග අනතුරු හේතුවෙන් පීඩාවට පත් වූ අයගෙන්. වසරකට රුපියල් බිලියන 25-30 අතර මුදල් ප්‍රමාණයක් මේ අනතුරු හේතුවෙන් පීඩාවට පත් ජනතාව වෙනුවෙන් සෞඛ්‍ය පද්ධතියට වාගේම රෝහල් පද්ධතියට එකතු කරන්න අපට සිද්ධ වනවා. මේවා කළමනාකරණය කරමින් ජාතික ධනය ඉතුරු කරන සැලැස්මක් තමයි ආණ්ඩුව සකස් කරලා තිබෙන්නේ. අපේ විපක්ෂයට තර්කානුකූලව යමක් ඉදිරිපත් කරන්න බැරි නිසා ඒකට විවේචන ඉදිරිපත් කරන්න පුළුවන්. ඒක ඔවුන්ගේ අයිතිය. ආණ්ඩුවේ වගකීම තමයි මේවාට නිසි පිළිතුරු දෙමින් මේ රට නිවැරදි මඟට ගෙනියන එක. ආණ්ඩුව ඒ සඳහා වේගවත් වැඩ පිළිවෙළක් සූදානම් කර තිබෙනවා. ඒ සියලු වැඩ කටයුතු සිද්ධ වෙන්නත්, රටක පාලනය සඳහාත් අභ්‍යන්තර සාධක සහ බාහිර සාධක වැදගත් කියන එක විපක්ෂය තේරුම් ගන්න ඕනෑ.

අපි බොහෝ දේවල් වේගයෙන් කරන්න ගියත්, සමහර දේවල් වේගයෙන් කරන්න බැහැ. ඒවාට ජාත්‍යන්තර සාධක බලපා තිබෙනවා. ලංකාවට මේ වනවිට කාර් ගෙන්වන්නේ නැහැ. කෝ, කාපට් දැම්මාද, අරක දැම්මාද, මේක දැම්මාද කියලා ඔබතුමන්ලා අපෙන් ඇහුවාට ඒවා කරන්න අදාළ තාර ටික තවම ලංකාවට එන්නේ නැත්නම් සංවර්ධනයේ වේගය අඩාළ වන බව අපි පිළිගන්නවා. සංවර්ධන වේගය අඩාළ වෙලා තිබුණාට අනිවාර්ය ලෙසම අපි ඉදිරි කාල සීමාව තුළ - 2029ට යන්න කලින් - අප දුන් පොරොන්දු වාගේම සියලු ප්‍රශ්න විසඳලා තමයි ඊළඟ මැතිවරණයට යන්නේ. ඒ නිසා විපක්ෂයට කියන්න පුළුවන් ඕනෑ දෙයක් කියන්න. ඒක ඔවුන්ගේ අයිතිය. ජනතාව වෙනුවෙන් වැඩ කරන එක අපේ අයිතිය වාගේම අපේ වගකීම. ඒ වගකීම නොපිරිහෙළා ඉෂ්ට කරන මාලිමාව ආණ්ඩුව මේ අවුරුද්දේ විතරක් නොවෙයි, ලබන අවුරුද්දේ මීටත් වඩා හොඳින් වැඩ කරලා, 2029 අවුරුද්ද වනකොට සියලු ප්‍රශ්න විසඳීම වෙනුවෙන් වුණු පොරොන්දු ඉෂ්ට කරලා, ඊළඟ අවුරුදු පහෙත් ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් ශක්තිමත් ලෙස පිහිටුවනවා කියා ප්‍රකාශ කරමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මුහම්මද් ෆයිසාල් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[ப.ப. 3.07]

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

அஸ்ஸலாமு அலைக்கும்! ஆயுபோவன்! வணக்கம்! கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் சம்பந்தமான இன்றைய விவாதத்தில் எனக்குப் பேசுவதற்கு நேரத்தை ஒதுக்கித் தந்தமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

ஒரு வாகனத்தைப் பாதையில் செலுத்துவதற்கு முன்னர், அது ஓடுவதற்குத் தகுதியான நிலையில் இருக்கிறதா என்பதைக் கட்டாயம் பார்க்க வேண்டும். அதேபோன்று, அந்த வாகனத்தை ஓட்டக்கூடிய சாரதிக்கு சாரதி அனுமதிப்பத்திரம் - driving licence - இருக்கின்றதா என்பதையும் கட்டாயம் பார்க்க

[ගරු මුහම්මද් ෆයිසාල් මහතා]

வேண்டும். அதுமாத்திரமல்ல, அந்த வாகனம் முழுமையாகப் பரிசோதிக்கப்பட்டு பெறப்பட்ட தகைமைச் சான்றிதழும் கட்டாயம் இருக்க வேண்டும். இல்லையென்று சொன்னால், விபத்துகள் ஏற்படலாம். Private busஆக இருக்கலாம், SLTB busஆக இருக்கலாம், மலை பிரதேசங்களில் அல்லது வளைவுகள் உள்ள பாதைகள் இருக்கின்ற பகுதிகளில் ஓடக்கூடிய வாகனங்களுக்கு தகைமைச் சான்றிதழ் இல்லாத தால் அதிகமான விபத்துகள் ஏற்படுகின்றன. அதேபோல், அதிகளவு புகையை வெளியிடக்கூடிய வாகனங்கள்மூலமும் அதிகமான விபத்துகள் ஏற்படுவதற்கு வாய்ப்பு இருக்கின்றது.

Fitness certificate மற்றும் புகை பரிசோதனை சான்றிதழை தனித்தனியாக அல்லாமல் ஒன்றாகச் சேர்த்து 2028ஆம் ஆண்டளவில் ஒரே முறையில் பெறுவதற்கான ஏற்பாடுகளை எமது அரசாங்கம் - போக்குவரத்து அமைச்சு - செய்யவிருப்பது மிகவும் விரும்பத்தக்க விடயமாகும். இது சிறந்ததொரு திட்டமாகவும் இருக்கின்றது. ஒரு வாகனம் 5,000 கிலோமீற்றர் தூரம் ஓடிமுடிந்திருந்தால், அந்தப் பதிவை வைத்துக்கொண்டு, அதனைச் சிறந்த முறையில் service பண்ணி, திரும்பவும் நல்ல நிலைக்குக் கொண்டுவருவதற்கான வாய்ப்பு இந்தச் சட்ட ஏற்பாட்டின்மூலம் கிடைக்கின்றது.

இன்று மெட்ரோ பஸ்கள் அதிகமாக இறக்குமதி செய்யப்பட்டுள்ளன. அவற்றைப் பயன்படுத்துவதன்மூலம் மக்களால் இன்னும் இலகுவாகப் பயணங்களை மேற் கொள்ளக்கூடியதாக இருக்கும். வாகனங்கள் ஓடுவதற்கான ஒழுங்குமுறையும் கட்டாயம் இருக்க வேண்டும். அவற்றையும் நாங்கள் இவற்றுடன் சேர்த்தால் நன்றாக இருக்கும். இந்த ஒழுங்குமுறை இல்லாததால் அதிகமான விபத்துகள் ஏற்படுகின்றன. எமது நாட்டில் motorbikeஇல் இரண்டு பேருக்கு அதிகமானவர்கள் அதாவது மூன்று பேர் செல்கின்றார்கள். இதனால் அதிக விபத்துகள் ஏற்படுவதற்கு வாய்ப்பு இருக்கின்றது. இதனைத் தடுப்பதற்கான யோசனைகளை முன்வைக்க வேண்டும். எமது நாட்டில் நகர்ப் பகுதிகளில் பாடசாலை ஆரம்பமாகின்ற நேரத்திலும் பாடசாலை முடிவடையும் நேரத்திலும் வாகன நெரிசல் அதிகமாக இருக்கின்றது. அந்த நேரங்களில் கனரக வாகனங்கள் பயணிக்காமல் இருப்பதற்கான ஏற்பாடுகளைச் செய்தால் மாணவர்களுக்குப் பாதுகாப்பாக இருக்கும்.

நீண்ட காலமாக பஸ் ஓட்டுநர், நடத்துநர் நியமனங்கள் கொடுக்கப்படாமல் இருந்தன. எனினும், 2025-2026இல் எமது தேசிய மக்கள் சக்தி அரசாங்கத்தால் அதிகமான சாரதி மற்றும் நடத்துநர் நியமனங்கள் கொடுக்கப்பட்டுள்ளன. முதலில் 376 சாரதி மற்றும் 229 நடத்துநர் நியமனங்கள் வழங்கப்பட்டன. அது போதாமையால் மீண்டும் 42 சாரதி மற்றும் 17 நடத்துநர் நியமனங்கள் வழங்கப்பட்டன. இவ்வாறு மொத்தமாக 418 சாரதிகளும் 246 நடத்துநர்களும் நியமிக்கப்பட்டுள்ளனர். வழமைக்கு மாறாக இம்முறை பெண்களுக்கும் சாரதி மற்றும் நடத்துநர் நியமனங்கள் எமது அரசாங்கத்தால் கொடுக்கப் பட்டு இருக்கிறது.

கொழும்புப் பகுதியை எடுத்துக்கொண்டால், தினமும் சுமார் 140,000 வாகனங்கள் Fort மற்றும் Pettah பகுதிகளுக்குள் நுழைகின்றன. விசேடமாக, இராஜகிரிய - மாலபே வழித்தடம் போன்ற முக்கியமான பாதைகளில் நாளொன்றுக்கு 30,000 தொடக்கம் 60,000 வரையான வாகனங்கள் செல்கின்றன. இவ்வாறு செல்லும் நேரத்தில் வாகன நெரிசல் ஏற்படுகின்றது. இதன்போது, உதாரணத்துக்கு ஒரு வாகனத்துக்கு ஒரு லீற்றர் எரிபொருள் waste ஆகின்றதென எடுத்துக்கொண்டால், ஒரு நாளைக்கு சுமார் 36,438 அமெரிக்க டொலர்களுக்கும் அதிகமான தொகை waste ஆகின்றது. இவ்வாறு ஒரு மாதத்திலுள்ள 20 வேலைநாட்களுக்குக் கணக்குப்பார்த்தால், எவ்வளவு எரிபொருள் waste ஆகின்றது என்பதை அறிந்து கொள்ளலாம்.

எமது நாட்டுக்கு Light Rail Transit முறையைக் கொண்டுவருவதற்கான ஏற்பாடுகள் செய்யப்பட்டு இருந்தன. முன்னர் இருந்த சனாதிபதி கோட்டாபய ராஜபக்ஷவின் அரசாங்கம், JICA நிறுவனத்துடன் கலந்தாலோசிக்காமல் இந்தத் திட்டத்தை தன்னிச்சையாக இரத்துச் செய்தது. எமது நாட்டில் இந்தத் திட்டம் நடைமுறைப்படுத்தப்பட்டு இருந்தால், இன்று இவ்வாறான வாகன நெரிசல் இல்லாமல் இருந்திருக்கும்; அதிக பெற்றோல் waste ஆகாமல் இருந்திருக்கும். யப்பான் நாட்டின் JICA நிறுவனத்தோடு செய்த ஒப்பந்தத்தை அந்த நிறுவனத்துடன் எந்தவிதமான கலந்தாலோசனையையும் செய்யாமல் தன்னிச்சையாக இரத்துச்செய்து, எமது நாட்டின் தலைநகரத்தில் மக்களுக்கான சிறந்த போக்குவரத்துச் சேவையை - Light Rail Transit முறையை - இல்லாமலாக்கி இருக்கிறார்கள். இத்திட்டத்தை திடீரென இரத்துச்செய்ததால், இலங்கைக்கு சுமார் 5,978 மில்லியன் ரூபாய் இழப்பு ஏற்பட்டு இருக்கின்றது. கடந்தகால அரசாங்கங்கள் இவ்வாறான வேலைகளைச் செய்து, எமது மக்களின் இலகு போக்குவரத்துக்குத் தடைகளை ஏற்படுத்தியுள்ளது.

அதுமட்டுமல்ல, இரண்டு வருடங்களுக்கு முன்னர் இருந்த அரசாங்கம் ஊழல், இனவாதம், அதிகாரத் துஷ்பிரயோகம் போன்றவற்றை மேற்கொண்டு இந்த நாட்டை ஒரு கறுப்பு நாடாக மாற்றியிருந்தது. தற்போது எமது நாட்டில் மேட்டுக்குடி அரசியலோ, குடும்ப அல்லது தனிநபர் ஆட்சியோ இல்லை. மக்கள் நலன்சார்ந்த ஜனநாயக ஆட்சிதான் இங்கு நடைபெறுகின்றது. மேலும், குற்றங்கள் செய்தவர்கள் இலகுவாகத் தண்டனையிலிருந்து தப்பித்துக்கொள்கின்ற நிலைமாறி, யார் தவறு செய்தாலும் அதனைத் தட்டிக் கேட்கக்கூடிய நிலையிலே இன்றுள்ள அரசாங்கம் இருக்கின்றது. பழைய அதிகார வர்க்கத்தினரான ரணில், ராஜபக்ஷ போன்றவர்கள் தங்களது அரசியல் இருப்பையும் செல்வாக்கையும் அதிகாரங்களையும் பாதுகாப்பதற்காகவே இன்றும் போராடிக்கொண்டு இருக்கிறார்கள். ஆனால், எமது தேசிய மக்கள் சக்தி அரசாங்கமானது மாண்புமிகு சனாதிபதி அவர்களின் தலைமையில் ஊழலற்ற, நீதியான, சட்டத்தின் ஆட்சியுடனான நல்லதொரு நாட்டை உருவாக்குகின்ற - சிறந்ததோர் இலங்கையை உருவாக்குகின்ற - இலக்குடன் முன்னோக்கிப் பயணித்துக்கொண்டு இருக்கின்றது. எவர் அதிகாரத்தில் இருந்தாலும், எவர் குற்றங்களைச் செய்தாலும், அனைவருக்கும் சமமான முறையில் நீதி நிலைநாட்டப்பட வேண்டும் என்பதே நாட்டு மக்களின் எதிர்பார்ப்பாக இருக்கின்றது.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
මට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

பாதாள உலகக் குழுவினர் மற்றும் போதைப்பொருள் கடத்தல் வலையமைப்பினர் - கடந்த கால ஆட்சியாளர்களான ரணில், ராஜபக்ஷ போன்றோருடன் சம்பந்தப்பட்டவர்கள் - இலங்கையின் கடற்கரைப் பகுதிகளில் சட்டவிரோதமாக நிர்மாணித்துள்ள ஹோட்டல்களையும் கட்டிடங்களையும் அகற்றுகின்ற வரலாற்றுச் சிறப்புமிக்க நல்லதொரு முடிவை சுற்றாடல் அமைச்சு எடுத்துள்ளது. இவ்வாறு சிறந்ததொரு மக்கள் ஆட்சியை ஏற்படுத்த எங்களுடைய தேசிய மக்கள் சக்தி அரசாங்கம் முன்நிற்குமெனக் கூறி விடை பெறுகின்றேன். நன்றி.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.15]

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මතු වී ඇති වැදගත් තත්ත්වයන් කිහිපයක් වහාම සංවාදයට ලක් කළ යුතු වුණත්, අපේ රටේ අහිංසක ජනතාව වෙනුවෙන් අපිට දැනෙන බිය එන්න එන්නම වැඩි වෙමින් පවතින මොහොතක- *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, බිය වැඩි වෙමින් පවතිනවා. මොකද, ජනාධිපතිතුමා රැස්වීමට ආපු වෙලාවේ නයෙක් ආවා. ඒ, ගැරඬියෙක් නිසා මම බේරුණා, අපේ ලාල් කාන්ත ඇමතිතුමාට අනුව. එම රැලියේදී අපේ ගරු ජනාධිපතිතුමා සඳහන් කළ කරුණු අතර ඉතා වැදගත්, ඒ වාගේම මම දිගින් දිගටම මතු කරන කාරණයක් පිළිබඳව එතුමාගේ සඳහනක් මේ පාර්ලිමේන්තුවේදී මතු කළ යුතුයි කියා මම හිතුවා.

ඔබතුමන්ලා අමාරුවෙන් ජනතාව ගෙනැල්ලා කියපු කරුණු අතර එතුමා සඳහන් කළා, දේශීයව සොයා ගත් මුදලින් අධිවේගී මාර්ග 3ක් හෝ 4ක් හදන්න කටයුතු කරනවා, ආසන්න වශයෙන් රුපියල් ට්‍රිලියන 2ක් වැය කරන්න එතුමා බලාපොරොත්තු වනවා කියලා. එතුමා මොන අරමුණෙන් එය සඳහන් කළත් අපි විශ්වාස කරනවා, ඒක සද්භාවයෙන් තමයි කියන්න ඇත්තේ කියලා. ඇඹුල්තියල් ගෙනෙන්න හෝ මී කිරි ගෙනෙන්න හෝ මොකක් හෝ හේතුවක් නිසා එතුමා අද විශ්වාස කරනවා, මේ වාගේ highways හදන්න ඕනෑ කියලා.

දැන් මේ කාරණය පමණක්ම ගත්තොත්, ඔබතුමන්ලාගේ ආණ්ඩුව ආවාට පස්සේ නව ධනය නිර්මාණය වෙලා නැහැ, සත පහක්වත්. ඇත්තටම අඩු වෙලා තිබෙනවා. ඒ තත්ත්වයෙන් අපි දේශීයව දුප්පත් මිනිස්සුන්ට බදු ගහලා ට්‍රිලියන ගණනක් භාණ්ඩාගාරයට ගත් බව ඇත්ත. නමුත්, යථාර්ථය තමයි, අධිවේගී මාර්ග හදන්නට නම් සියයට 90ක් ඉක්මවා ගිය ධනයක් ඩොලර්වලින් අවශ්‍යයි කියන එක. මේ ළඟදී කිරිපිටි පැකට් එකටයි, පාන් පිටි කිලෝවටයි බදු ගහලා වැඩි කර ගත්තේ ඩොලර් නොවෙයි, රුපියල්. World Bank එක කියන විධියට, අපේ රටේ ජනතාව 2019 ඉඳලා මේ වනකොට සියයට 19 ඉඳලා සියයට 30 දක්වා අන්ත දුගී බවට පත් වෙලා තිබෙනවා. ඒක මම අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ; ලෝක බැංකුව කියන්න ඕනෑත් නැහැ. ගමට ගියාම ඒක හොඳට තේරෙනවා. 2027 අවුරුද්දේ අපේක්ෂිත සමස්ත ආදායම රුපියල් ට්‍රිලියන 5.8යි. පොලී ගෙවීම සඳහා අපට වැය කරන්නට තිබෙනවා, ඩොලර් බිලියන 2.64ක්. පුනරාවර්තන වියදම් සඳහා වැය වනවා තවත් බිලියන 3.39ක්. ඒ කියන්නේ, වැටුප්, විශ්‍රාම වැටුප්, සුබසාධන දීමනා සහ වියදම් කළ යුතු අනෙකුත් පුනරාවර්තන වියදම්. එතකොට මේ දෙකේ එකතුව ගත්තාම, ඩොලර් බිලියන 6.3ක් වනවා. එයින් රුපියල් ට්‍රිලියන 5.8 අඩු කළාම සෘණ අගයක් එනවා. එය රුපියල් බිලියන 230ක් වනවා. මේ තත්ත්වය තුළ IMF එක අපේක්ෂා කරනවා, දැනටත් එතුමන්ලා මේ බැඳී සිටින, එතුමන්ලාගේ මේ යහ පාලන ආණ්ඩුව බැඳී සිටින IMF ගිවිසුම අනුව බිලියන දශම 86ක ප්‍රාථමික ශේෂයක්. පොලිය රහිතව, පොලිය අයින් කරලා රුපියල් ට්‍රිලියන 2ක් එකතු කළොත්, රුපියල් ට්‍රිලියන 1.14ක ප්‍රාථමික ශේෂයක් අවශ්‍යයි. අප එය දේශීයව හොයා ගත්තා කියලා මොහොතකට උපකල්පනය කළොත්, අපි කොහොමද දැන් ඒකට අදාළව ඩොලර් සොයන්නේ? ඔබතුමන්ලා ඔය කියන පාරවල් හදන්න ඩොලර් සොයන්නේ කොහොමද? එතකොට විසඳිය යුතු ප්‍රශ්නය තමයි, මෙන්න මේ ඩොලර් සොයන්නේ කොහොමද කියන ප්‍රශ්නය. ඒක තමයි අප දිගින් දිගටම පාර්ලිමේන්තුවේ මතු කළේ.

අප නව ධනයක් නිර්මාණය නොකරන තත්ත්වයක් තුළ මේ සංඛ්‍යා දත්ත සරලව විග්‍රහ කර ගත්තොත් අපට තේරුම් ගන්නට පුළුවන් මෙය යථාර්ථයෙන් ඔබ්බට ගිය යෝජනාවක් බව. යම් විටෙක යම් කෙනෙකුට කියන්නට පුළුවන් "මෙය අවුරුදු තුනක් තිස්සේ කරනවා, අපි බිලියන 500ක්, 600ක් වියදම් කරනවා" කියලා. ඒත් ඒ ගණන්වත් සැසඳෙන්නේ නැහැ, පවතින ආර්ථික යථාර්ථය තුළ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා විටින් විට කියනවා අපි දැක්කා, "අපි අපනයන ආදායම වැඩි කරගෙන තිබෙනවා, ආසන්න වශයෙන් ඩොලර් බිලියන 10.1ක් දක්වා එය වැඩි කරගෙන තිබෙනවා" කියලා. අපි මේකේ යථාර්ථය ගෙන බලමු. පසුගිය මාස 7 ඇතුළත දත්ත අනුව අපි වාණිජ අපනයන සිදු කරලා තිබෙනවා, ඩොලර් බිලියන 8.19ක. ඒ වාගේම සේවා අපනයන කරලා තිබෙනවා, ඩොලර් බිලියන 2.3ක. අප මේ වාණිජ අපනයන ආසන්න වශයෙන් ඩොලර් බිලියන 10.1ක් හැටියට හෝ ගත්තොත්, මෙකී වාණිජ අපනයනය සඳහා වාණිජ ආනයනය කිරීම් කර තිබෙනවා, ඩොලර් බිලියන 14.6ක ප්‍රමාණයක්. ඒක ඇත්තටම සංසන්දනය කරන වර්ෂ එක්ක ගත්තාම බිලියන 6.5ක වැඩිවීමක්; ආසන්න වශයෙන් සියයට 77ක වැඩිවීමක්. එතකොට අපට ධන ඩොලර් අගයක් අපේ ආදායමට එකතු වෙන්නේ නැහැ. මේ තත්ත්වය යටතේ අපි කුහකත්වයෙන් තොරව යෝජනාවක් කරනවා. මගේ විශ්වවිද්‍යාල මිත්‍රයා, මගේ කල්‍යාණ මිත්‍රයා වන ගරු නියෝජ්‍ය අමාත්‍ය සුනිල් වටගල මැතිතුමනි, අපි කුහකත්වයෙන් තොරවයි මේ යෝජනාව කරන්නේ. මේ රටේ ඩොලර් ආදායම වැඩි කර ගන්නේ නැතිව වෙන කිසිම දෙයක් කරන්නට බැහැ. නගරයකට මොන තරම් සෙනඟ ගෙනැල්ලා, මොන නයා, මොන ගැරඬියා ගෙනැල්ලා රැස්වීම් කළත්, අහිංසක මිනිසුන්ගේ ජීවිත වර්ධනය වන මධ්‍ය කාලීන, දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් නැහැ.

මේ කියන පාරවල් හදන්න කලින් අප සිතිය යුතු දෙයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගම්වල ඉන්න මිනිසුන්ට දැන් කන්න නැහැ. පාසල් යන ළමයින්ට පොත පත ගන්න විධියක් නැහැ. පාන් පිටි කිලෝවක් ගන්න විධියක් නැහැ. කිරිපිටි නම් දැන් කිලෝවලින් නොවෙයි, ග්‍රෑම් 100 බැගිනුයි ගන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා ගන්න සල්ලි නැති රටේ අපි නිකම් ජනතා ධනය වියදම් කරනවා; ඩොලර් වියදම් කරනවා. ඔය බස්වලින් සෙනඟ ගේන්න වැය වන්නේ ඩොලර්. පවතින රජය ඩොලර් වියදම් කරලා සෙනඟ ගේනවා. ශක්තිය යොදවලා ඕනෑ තරම් සෙනඟ ගේන්න පුළුවන් නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කියන්න තිබෙන්නේ එපමණක් වුවත් මම අවසාන වශයෙන් මේ ආණ්ඩුවට යෝජනාවක් කරන්න ඕනෑ. ඔය කිසිම රැලියක් තියන්න අවශ්‍ය නැහැ. මේ පාර්ලිමේන්තුවේ සේවකයෝ 1,500ක් විතර ඉන්නවා. ඒ අයගෙන් නිකම් සමීක්ෂණයක් කරලා බලන්න, දැන් ජනතා මතය කුමක්ද කියලා.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් වටගල නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.25]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ උගත් මිත්‍රයාට ගැරඩියෙකු දැක්කත් නයාමයි පෙනෙන්නේ. තවම නයා අමතක කරන්න බැරි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය ගැසට් නිවේදන මඟින් ඉදිරිපත් කරපු ඉතාම වැදගත් නියෝග කීපයක් අනුමත කරන්න යන මේ වෙලාවේ මා කිව යුතුයි, එම නියෝග මේ සමාජයේ සුරක්ෂිතතාව වෙනුවෙන් කටයුතු කිරීම සඳහා ගෙනෙන ලද ඒවා බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, ප්‍රවාහන අමාත්‍යාංශය මඟින් මේ ගැසට් කරපු නියෝග අනුමත කර ගත්තත්, ඒවායේ ක්‍රියාත්මක භාවිතාව වෙනුවෙන් මහජන ආරක්ෂක අමාත්‍යාංශය සහ පොලීසිය සැලකිය යුතු කාර්යභාරයක් සිදු කරන බව. අපි බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු ප්‍රවාහන අමාත්‍යවරයාට, මහජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් මේ නියෝග ඉදිරිපත් කරලා අද ඒවා අනුමත කර ගැනීමට කටයුතු කිරීම සම්බන්ධයෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම කැමැතියි, මේ ගරු සභාවේදී මතු වෙච්ච කාරණා කිහිපයකටත් පිළිතුරු දෙන්න. මෙම විවාදයට සම්බන්ධ වෙලා අපේ ගරු විපක්ෂ නායකතුමා කථාවක් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තරම් ගැළපෙන්නේ නැති කථා කියන විපක්ෂ නායකවරයෙක් මම ජීවිතේට දැකලා නැහැ. එතුමා හරි දක්ෂයි, අපට තේරෙන්නේ නැති වචන කියන්න. එතුමා අද සොයාගෙන ආවා ලතින් ආප්තෝපදේශ කිහිපයක්. මට හිතෙන්නේ, එය නීතිඥ මණ්ඩලය දුන්නාද දන්නේත් නැහැ. එතුමා කිව්වා, *audi alteram partem* සිද්ධාන්තය ගැන. ඊට පස්සේ කිව්වා, *nemo judex in causa sua potest* කියලා. *[බාධා කිරීමක්]* ආ, ඔබතුමාට මේවා මතකයි නේද, ගරු මන්ත්‍රීතුමනි? ඔබතුමායි, මමයි එකට නේ ඉගෙන ගත්තේ. අපේ රටේ මිනිස්සු දැන් මේවා අහගෙන ඉඳලා, මේ විපක්ෂ නායකතුමාට වෙලා තිබෙන්නේ මොකක්ද කියලා හිතනවා. එතුමා ඊට පස්සේ කිව්වා, ස්ථාවර නියෝග 50(3) ගැන. අපි ඒක බැලුවා; අදාළ නැත. අපේ ගරු සභානායකතුමා ඒ ගැන කිව්වා. ඊට පස්සේ කිව්වා, ස්ථාවර නියෝග 92 (2) (ආ) ගැන. ඒකත් අදාළ නැත. ඊට පස්සේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, 121වන ව්‍යවස්ථාව ගැන කිව්වා; පැනලා දිව්වා. මේවායේ කිසිම අදාළත්වයක් නැහැ. ගරු විපක්ෂ නායකතුමා අමාරුවේ දැමීමේ පෙරමුණ පුදුම අමාරුවක තමයි විපක්ෂ නායකතුමාව වට්ටලා තිබෙන්නේ. ඒ මදිවාට විපක්ෂ නායකතුමා තවත් කියනවා, පොදු රාජ්‍ය මණ්ඩලයේ නීතිඥ සංගමයේ ප්‍රධානියා - එතුමා අධිකරණය විවේචනය කරලා තිබුණා, අවස්ථාවක් දුන්නේ නැහැ කියලා - ඒ විධියට comment කරපු එක අපේ ආයෝජනවලට බලපානවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ ගැන search කරලා බැලුවා. ගරු මන්ත්‍රීතුමියක් මට ඒ සම්බන්ධව කරුණු ගෙනැල්ලා පෙන්නුවා. ඇත්ත වශයෙන්ම ඒවා සාමාජික මුදලක් ලබාගෙන බඳවා ගන්නා සමිති සමාගම්. හරියට සිංහ සමාජය වාගේ. අපට ඕනෑ නම් සිංහ සමාජයේ සාමාජිකත්වය lifetime ගන්න පුළුවන්; එහෙම නැත්නම් අවුරුද්දකට ගන්න පුළුවන්. අපි search කරලා බැලුවාම, උපුල් ජයසූරිය මහත්මයා ලංකාව නියෝජනය කරමින් එහි ඉන්නවා, ගරු දිලිත් ජයවීර මැතිතුමනි. අන්න ඒ වාගේ එකක් එය. හැබැයි, අන්න ඒක දැන් අපේ ආයෝජනවලට සම්බන්ධයිලු. මට නම් මෙතැනදී මතක් වෙන්නේ මේක ලංකාවේ බනිස් කර්මාන්තයයි, මහින්දාගමනයයි ගැන කථා කරන්න පොඩි එකෙකුට දුන්නා වාගේ වැඩක් කියන එක. හරිද? ආයෝජනවලට සම්බන්ධයිලු, පොදුරාජ්‍ය මණ්ඩල නීතිඥ සංගමයේ සභාපති. ඉතින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා බහුභූත කථා. ඒ විතරක් නොවෙයි. දැන් එතුමාගේ කථාවේදී highlight කරන්න බැලුවා, ප්‍රජාතන්ත්‍රවාදය, අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව ලොකු ප්‍රශ්නයක් අපේ රට ඉස්සරහා ඇතිවෙලා තිබෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විපක්ෂයේ හඬ දිහා බලන්නකෝ. අද වන විට අපේ ආයතන ක්‍රියාත්මක වීමට අදාළව විපක්ෂයෙන් විවේචන නැහැ, ලොකු විවේචනයක් නැහැ. හරි නම් ලොකුම විවේචනය කරන්න තිබුණේ ඇත්තවශයෙන්ම නාමල් රාජපක්ෂ මැතිතුමා. මොකද, අපි හිතුවා එතුමා අද මේ සභාව දෙවනත් කරලා එතුමාව අත්අඩංගුවට ගැනීම ගැන, නීතියේ භාවිතාව ගැන ලොකු ප්‍රශ්න ඇති කරයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද එතුමා එක වචනයක් ඒ ගැන කිව්වේ නැහැ. ඒකෙන් අදහස් වෙනවා, අපේ රටේ ස්වාධීන ආයතන වන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වැනි ආයතනවල ක්‍රියාවලිය අද එතුමාටවත් අභියෝගයට ලක් කරන්න බැහැ කියලා. අර්ච්චුනා මන්ත්‍රීතුමා ද දන්නේ නැහැ, වීඩියෝවක් කරලා දාලා තිබෙනවා නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා සභා ගර්භයට එන ආකාරය. මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ බලන්න, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා සභා ගර්භයට එන එක වීඩියෝ කරලා දාලා තිබෙනවා. එතුමාගේ Facebook පිටුවේ දාලා තිබෙනවා. වෙන දා මේ වාගේ දේවල් ගොඩක් කරන්නේ අර්ච්චුනා මන්ත්‍රීතුමා තමයි. අද අර්ච්චුනා මන්ත්‍රීතුමාගේ භූමිකාව නාමල් රාජපක්ෂත් කරන්න පටන් අරගෙන. අපි දන්නේ නැහැ මේ මොකක්ද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකෙන් පේන්නේ මොකක්ද? විපක්ෂයට උණ ගැනෙන්න බේරුවල ජනතාවයි, බුලත්සිංහල ජනතාවයි හරියටම උත්තර දුන්නා; කට උත්තර නැති වෙන්නම දුන්නා.

මරික්කාර් මන්ත්‍රීතුමා එක එක විකාර කථා කිය කියා හිටියා. එතුමා 2029 ජනාධිපතිවරණය ගැනත් කියවන්න පටන් ගත්තා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතෙක් ආපු දේශපාලන විවේචනවලට හරියටම අපේ ජනවරම උත්තර දුන්නා. බුලත්සිංහල ජනතාවයි, බේරුවල ජනතාවයි විපක්ෂයට කට උත්තර නැති වෙන්න දුන්නා. *[බාධා කිරීමක්]* Only from the Kalutara District, හරිද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීවරු දෙපළක් අපි කරන වැඩ කටයුතු සම්බන්ධයෙන් යම් යම් විවේචන ඉදිරිපත් කරන්න ගත්තා. අපි සද්භාවයෙන් කරන වැඩ ගැනත් විවේචන ඉදිරිපත් කරන්න ගත්තා. ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා කිව්වා, අපි අධිවේගී මාර්ගවල වැඩ කටයුතු නතර කරලා කියලා. ගරු දිලිත් ජයවීර මැතිතුමාත් යම් යම් අදහස් ප්‍රමාණයක් මතු කළා, "ඒවා rupeesවලින් නොවෙයි ගෙවන්න ඕනෑ, dollarsවලින්, මාර වැඩේ, ඇයි ඔයගොල්ලන් rupeesවලින් ගෙවන්නේ?" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සියලුදෙනාම සතුටු වෙන්න ඕනෑ. මොකද, ඉතිහාසයේ ප්‍රථම වතාවටයි මෙවැනි දෙයක් කරන්නේ. මීට පෙර විදෙස් මුදල් ගෙනැල්ලා, ගෙනැල්ලා, ඩොලර් ණය ලෙස අරගෙන ඇවිල්ලා, ඒ ණය පාර හදන්න දාන්නේ නැතිව තමන්ගේ මල්ලට ඔබාගෙන, තමන්ගේ සාක්කුවට දාගත්ත මිනිස්සු අද අපට ඇඟිල්ල දිගු කරනවා. අපේ ජනාධිපතිවරයා පැහැදිලිවම කිව්වා, කහතුඩුව සිට ඉංගිරිය දක්වා වූ රත්නපුර මාර්ගයේත්, දඹුල්ල-කුරුණෑගල-ගලේවෙල මාර්ගයේත්, මධ්‍යම අධිවේගී මාර්ගයේ රඹුක්කන දක්වාත්, කොළඹ-මීරිගම කොටසේත් වැඩ කරන්නේ කිසිදු ණයක් ගන්නේ නැතිව අපේ මුදලින් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතකොට කොච්චර සතුටු වෙන්න ඕනෑද, මේ ගරු සභාව? ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා කියනවා, "මාර වැඩේ නේ, ඇයි rupeesවලින් කරන්නේ, ඒක ඩොලර්වලින් කරන්න බැරිද?" කියලා. *[බාධා කිරීමක්]* - ගරු මන්ත්‍රීතුමනි, අපි අපේ සල්ලිවලින් නේ මේ දේවල් කරන්නේ. අපේ සල්ලිවලින් මේ දේවල් කරනකොට ඒකෙත් යම්කිසි සතුටක් තිබෙන්න එපායැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සාකච්ඡා වන මාර්ගෝපදේශ - guidelines - ඉතාම හොඳ දෙයක්.

පැහැදිලිවම අද මේ ගරු සභාවේ හැසිරීම ගත්තාම, වෙනදාට විපක්ෂය පැත්තෙන් එන දේශපාලන විවේචන වෙනුවට අද මොනවාද තිබෙන්නේ? අද ඔවුන් සියයට 90ක් නිහඬ වෙලා තිබෙනවා. ඇයි ඒ? ඒකට හේතුව තමයි, අපි කථාවෙන් නොවෙයි භාවිතාවෙන් පෙන්වා තිබෙනවා, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව මොනවාද විපක්ෂ නායකතුමා කථා කළේ? අද ප්‍රජාතන්ත්‍රවාදයට අනුව, ඕනෑම පුරවැසියෙකුට අප ගැන ප්‍රශ්න කරන්න අවස්ථාව දීලා තිබෙනවා. ජනාධිපතිතුමාගේ කථාවේදී ඒක තමයි විස්තර කළේ. ඕනෑම කෙනෙකුට රාජ්‍ය ආයතනයක හෝ පොදු ස්ථානයක පවතින පාලනය ගැන ප්‍රශ්න කරන්න අවස්ථාවක් දීලා තිබෙනවා. පවතින පාලනය ප්‍රශ්න කරන්න බැරි අවස්ථා තමයි පසුගිය හැත්තෑපස් වසර තුළ තිබුණේ. පසුගිය පාලනය ප්‍රශ්න කරන්න බැරි නම්, ඒකෙන් ජනතාවට ඇති වැඩක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලිවම අපි මැතිවරණ පොරොන්දුවක් දීලා තිබෙනවා. ඒ මොකක්ද? අපේ පාලනය කලින් පැවැති පාලනවලට වඩා වෙනස්, අපේ පාලනය ජන සහභාගිත්ව පාලනයක් කියලා අපි කියා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් ආණ්ඩුවක ජනප්‍රියත්වය එන්න එන්න අඩු වෙනවා. හැබැයි, අපි අපේ ආණ්ඩුව වෙනස් කියන්නේ ඇයි? එන්න එන්න අපේ ජනප්‍රියත්වය අඩු වෙනවා වෙනුවට අපේ ආණ්ඩුවට අවුරුදු 2ක් ගතවෙනකොට, අපේ දෙවර්ෂ පූර්ණය සමරන්න යළි අපි ජනතාව ළඟට ගිහිල්ලා ඒ සාකච්ඡාව ආරම්භ කර තිබෙනවා. ඊයේ බුලත්සිංහල ජනතාව, බේරුවල ජනතාව අප සාදරයෙන් පිළිඅරගෙන, අප ගෙනයන වැඩ පිළිවෙළ සාර්ථකයි කියලා සීල් එකක් ගහලා දීලා තිබෙනවා. එච්චරයි. දස දහස් ගණනින් මිනිස්සු ඇවිල්ලා අපේ වැඩ පිළිවෙළ හොඳයි කිව්වා. ඒ නිසා විපක්ෂයේ චෝදනාවලට අපි සැලෙන්නේ නැහැ. අද අපට එල්ල කරන්න ලොකු චෝදනාවක් විපක්ෂයට ඇත්තෙත් නැහැ. අත්අඩංගුවට ගත්ත අය "මීක්" සද්දයක් නැහැ. ඒ නිසා පැහැදිලිවම අප ගෙනයන වැඩ පිළිවෙළ නිවැරදියි කියන එක මේ ගරු සභාව ඉස්සරහා අපි සහතික කර කියනවා.

ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මගේ point of Order එක මේකයි. අපේ සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා මගේ නම ප්‍රකාශ කරලා කථා කළා. Standing Order 91(f) අනුව, පවතින නඩු ගැන කථා කරන්න බැරි නිසා අද නාමල් මන්ත්‍රීතුමා කිසි දෙයක් කිව්වේ නැහැ. හැබැයි, නීතිඥවරයෙක් වෙලාත් මෙතුමා දන්නේ නැතිව ඇති, ඒ Standing Orders ගැන. අනේ, ගෙදර ගිහිල්ලා කියවන්නකෝ. *[බාධා කිරීමක්]*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව ආරම්භ කරන්න.

[පි.ප. 3.37]

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு 14 நிமிடங்கள் ஒதுக்கப்பட்டுள்ளதாகச் சொல்லப் பட்டது. இன்றைய பாராளுமன்ற அமர்வில் எனது இறுதி உரையை நான் நிகழ்த்தவிருப்பதால், முழுமையாக அந்த 14 நிமிடங் களையும் வழங்குமாறு மிகவும் அன்பாகக் கேட்டுக் கொள்கின்றேன்.

பசறிச்சேனை உப தபால் அலுவலகத்தில் இடம்பெற்ற கடித விநியோகச் சீர்கேடுகள் குறித்துச் சில முக்கிய விடயங்களை நான் இந்த அவையிலே முன்வைக்க

[ගරු එම්.එස්. අබ්දුල් වාසිද් මහතා]

விரும்புகின்றேன். அறுகம்பை சுற்றுலாப் பிரதேசத்தை உள்ளடக்கிய பசறிச்சேனை உப தபால் நிலையத்தில் 2019 முதல் 2024ஆம் ஆண்டு வரையிலான காலப்பகுதியில், ஏறத்தாழ 20,000க்கும் மேற்பட்ட கடிதங்கள் விநியோகிக்கப் படாமல் தபால்காரரின் வீட்டிலும் அலுவலகத்திலும் மறைத்து வைக்கப்பட்டிருந்த நிலையில் கண்டுபிடிக்கப்பட்டன. மறைத்து வைக்கப்பட்ட கடிதங்களின் எண்ணிக்கையைப் பார்க்கும்போது, இந்தக் காலப்பகுதியில் பசறிச்சேனை மக்களுக்குத் தபால் சேவை திட்டமிட்டு மறுக்கப்பட் டுள்ளதோ? என்ற சந்தேகம் எழுகின்றது. பொது மக்களாலும் அரச நிறுவனங்களாலும் முறைப்பாடுகள் செய்யப்பட்டிருந் தாலும் உரிய விசாரணைகள் மேற்கொள்ளப்படாமல் அக் குற்றங்கள் மூடிமறைக்கப்பட்டன. அதிகாரிகளின் மோசமான நிர்வாக அலட்சியம், செயற்றிறனின்மை ஆகியனவே இச்சீர்கேடு பாரிய அளவில் உருவெடுக்கக் காரணம் என்ற குற்றச்சாட்டை நான் இங்கு முன்வைக்க விரும்புகிறேன்.

மறைத்து வைக்கப்பட்ட தபால்களில் அடங்கியிருந்த ஆவணங்கள் பொதுமக்களின் அடிப்படை உரிமைகள் மற்றும் வாழ்வாதாரத்துடன் நேரடித் தொடர்புடைய சட்டபூர்வ மற்றும் கல்விசார் முக்கிய ஆவணங்களாகும். அவற்றுள் வங்கி ஆவணங்கள், காசோலைகள், பரீட்சைப் பெறுபேறுகள் மற்றும் அனுமதி அட்டைகள், பல்கலைக்கழக அனுமதி மற்றும் நேர்முகப் பரீட்சைக்கான அழைப்புக் கடிதங்கள், தேசிய அடையாள அட்டைகள் போன்றவை அடங்குகின்றன. இச்சம்பவத்தினால் மாணவர்களும் பொதுமக்களும் மோசமான பொருளாதார, உளவியல் பிரச்சினைகளைச் சந்தித்துள்ளனர். இது குறித்த இரு தபால் அலுவலர்களால் ஆயிரக்கணக்கான குடிமக்களுக்கு இழைக்கப்பட்ட மன்னிக்க முடியாத பாரிய மனித உரிமை மீறல் மற்றும் குற்றவியல் தவறு என்பதை இங்கு நான் வலியுறுத்த விரும்புகிறேன்.

2021ஆம் ஆண்டு பத்தாம் மாதம் பொத்துவில் தபால் அலுவலகத்தில் அஞ்சலிடப்பட்ட காசோலையை உள்ளக்கிய speed post கடிதம் 3 வருடங்களின் பின் பசறிச்சேனை வலயத்தில் விநியோகிகப்பட்ட மோசமான சம்பவத்தையும் நான் இங்கு உதாரணமாகச் சொல்கின்றேன். தற்போது இது தொடர்பாக விசாரணைகள் முன்னெடுக்கப்பட்டு வரும் நிலையில், சேவை இடைநிறுத்தப்பட்ட இரு அலுவலர்களை யும் மீண்டும் பசறிச்சேனை அலுவலகத்தில் இணைக்க திணைக்களம் எடுத்துள்ள நடவடிக்கை பொருத்தமற்றதாகும். இவர்கள் மீண்டும் அதே அலுவலகத்திற்குத் திரும்பும்போது அது விசாரணைகளைச் சீர்குலைப்பதோடு, சாட்சிகளை அச்சுறுத்தும் அபாயத்தையும் உருவாக்கும். மேலும், இது பொதுமக்களின் ஆத்திரத்தைத் தூண்ட வழிவகுக்கும் என்பதையும் நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

பொத்துவில் மற்றும் பசறிச்சேனை மக்களின் நம்பிக்கையை மீளப்பெற தபால் திணைக்களம் தகுந்த நடவடிக்கைகளை எடுக்க வேண்டும். மாறாக, பசறிச்சேனை தபால் அலுவலகத்தை விநியோகமற்ற அலுவலகமாகத் தரம் குறைக்க எடுக்கும் முயற்சி மக்களுக்கான தீர்வாக அமையாது. மேலும், குற்றம் புரிந்ததாக நம்பப்படும் இருவரையும் பசறிச்சேனை அலுவலகத்துக்கு நியமிக்கும் முயற்சியையும் உடன் நிறுத்துமாறு கேட்டுக் கொள்கின்றேன்.

இத்தகைய சூழலில், மேலதிக கொடுப்பனவுகள் மறுக்கப் பட்ட நிலையிலும் மக்களின் துயரங்களையும் தேவைகளையும் உணர்ந்து, வருடக்கணக்காக மறைத்து வைக்கப்பட்டிருந்த ஆயிரக்கணக்கான கடிதங்களை இரவு பகலாகப் பாடுபட்டு விநியோகித்துவரும் பதில் அஞ்சலாளர் Mr. Fahmi மற்றும் உப தபாலதிபர் Mrs. Mujaya ஆகியோரின் நட்புறவான சேவையை நான் இந்த அவையில் மனதாரப் பாராட்டுகின்றேன். அவர்களின் அர்ப்பணிப்பு தபால் திணைக்களத்தின் நற் பெயரைக் காப்பாற்ற உதவியுள்ளது என்பதையும் நான் இந்த அவையில் தெரிவிக்க விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பொத்துவில் பிரதேச செயலகத்தில் பாவிக்கப்பட்டு வந்த, கடவுச்சீட்டுகளைப் பெறும்பொருட்டு கைவிரல் அடையாளங் களைப் பெறும் இயந்திரம் பழுதடைந்து பல மாதங்களா கின்றன. அதனைத் திருத்தம் செய்து அப்பிராந்திய மக்களுக்கு இலகுவாக கடவுச்சீட்டுகளைப் பெறுவதற்கு அரசானது நடவடிக்கை எடுக்க வேண்டுமென இந்த அவையில் கேட்டுக் கொள்கின்றேன்.

நாட்டிலுள்ள மத ஸ்தாபனங்களில், குறிப்பாக பள்ளி வாசல்கள், கோயில்கள், 'பன்சல', 'சேர்ச்' ஆகியவற்றில் கடமை புரியும் மார்க்க அறிஞர்களுக்கு அரசின்மூலம் மாதாந்தக் கொடுப்பனவுகளை வழங்க ஆவனபுரிய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். அவர்களுக்கான கொடுப்பனவுகள் அந்தந்த சமய ஸ்தாபனங்களால் வழங்கப்பட்டாலும், அதில் அரசினது சிறிய பங்களிப்பாவது இருக்க வேண்டும் என்பது என்னுடைய நோக்கமாக இருக்கின்றது.

நாடளாவிய ரீதியில் நியமனம் பெற்று கடமைபுரிகின்ற அபிவிருத்தி உத்தியோகத்தர்களின் சேவைப் பிரமாணக் குறிப்பைத் திருத்தம் செய்ய வேண்டுமெனக் கோரிக்கை விடப்பட்டு, ஆர்ப்பாட்டங்களும் நடைபெற்று வருகின்றன. எனவே, அரசாங்கம் இந்த விடயத்தைப் பரிசீலனை செய்து, இவர்களுக்கு நிவாரணம் கிடைக்க ஆவனபுரிய வேண்டு மெனக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாடளாவிய ரீதியிலுள்ள பிரதேச செயலகங்களில் ஓய்வூதியம் பெறுபவர்களின் விடயங்களைக் கவனிக்கவென ஓர் அபிவிருத்தி உத்தியோகத்தர் நியமிக்கப்பட்டு சேவைகள் இலகுவாக்கப்பட்டுள்ளன. ஆனால், ஆளணிப் பற்றாக்குறை காரணமாக பல பிரிவுகளில் பதில் கடமைபுரிந்தே விடயங்கள் கவனிக்கப்படுகின்றன. எனவே, ஓய்வூதியத் திணைக்களத் திலுள்ள வெற்றிடங்களை நிரப்புவதற்கு ஆவனபுரிய வேண்டும் என்பதுடன், பொத்துவில், லகுகலை போன்ற பிரதேச செயலாளர் பிரிவுகளுக்கு நிரந்தரமான அபிவிருத்தி உத்தியோகத்தர்களை நியமித்து, ஓய்வூதிய விடயங்களைத் திறமையாக மேற்கொள்ள உதவிபுரிய வேண்டுமெனவும் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, லகுகல, பானம பிரதேச மக்களது நலன்கருதி எரிபொருள் நிரப்பு நிலையமொன்றை அமைப்பதற்கு அரசு நடவடிக்கை எடுக்க வேண்டும். காரணம், அவர்கள் எரிபொருளைப் பெறுவதற்கு 10-15 கிலோமீற்றர் தூரம் செல்ல வேண்டும். பொத்துவில், சியம்பலாண்டுவவுக்குச் சென்று அவர்கள் தங்களுடைய எரிபொருள் தேவைகளை நிவர்த்தி செய்து வருவதை நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

பொத்துவில் பிரதேச செயலாளர் பிரிவில் பின்தங்கிய செங்காகம் கிராம அலுவலர் பிரிவில் பொது மக்களுக்காக, ஆயர்வேத வைத்தியர்களான Dr. Hamzath, Fathima Rizkhana Fazmiya, Dr. Ameer Ally போன்றவர்களால் இலவச மருத்துவ

முகாமொன்று ஏற்படுத்தப்பட்டமைக்காக இந்தச் சபையில் பாராட்டுகின்றேன். இதனை ஏற்பாடு செய்த SPH Abdul Malik, Arzath Moulana, Rehmathullah, M.I. Makbool, Dr. Uvaizஇற்கும் Mrs. M.A. Janooziya, Mrs. Y.B.R. Niza ஆகியோருக்கு இந்தச் சபையில் நன்றி கூறிக்கொள்ள விரும்புகின்றேன்.

நாடளாவிய ரீதியில் தொழிலற்ற பல பட்டதாரிகளும் இளைஞர்களும் தொழில்வாய்பை எதிர்பார்த்து காத்துக் கொண்டு இருக்கிறார்கள். பல்வேறு தொழில்களுக்கும் விண்ணப்பம் கோரப்படும்போது, பல்லாயிரக்கணக்கான பட்டதாரிகள் விண்ணப்பம் செய்கின்றார்கள். ஆனால், நூற்றுக்கணக்கானோருக்கு மாத்திரமே தொழில் கிடைக் கின்றது. அரசு 50,000 பட்டதாரிகளுக்குத் தொழில் வழங்கு வதாகக் கூறினாலும், தற்போது ஆசிரியர் சேவைக்குள் ஈர்ப்பதற்காகப் பரீட்சையை நடாத்தி, அபிவிருத்தி உத்தியோகத்தர்களான பட்டதாரிகளுக்கு முன்னுரிமை வழங்கவுள்ளதாக அறிகின்றேன். எனவே, அரசானது இந்த நாட்டிலே உள்ள பட்டதாரிகளை வேலைக்கு அமர்த்தும் பொருட்டாக வேலைத்திட்டங்களைத் தயாரித்து அவர்களுக்கு உதவ வேண்டும் என்று கேட்டுக் கொள்வதோடு, வருடம்தோறும் வெளியேறும் பட்டதாரிகளுக்கான தொழில் வாய்ப்புகளுக்காக எவ்வாறான திட்டங்களை வைத்துள்ளது என்பதையும் கேட்டுக்கொள்ள விரும்புகிறேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இவ்வருடம் நாடளாவிய ரீதியில் ஐந்தாம் ஆண்டுப் புலமைப்பரிசில் பரீட்சைக்குத் தோற்றிய 289,867 மாணவர்களில் 56,000 மாணவர்கள் வெட்டுப்புள்ளிக்கு மேல் பெற்றிருக்கின்றார்கள். சிங்கள மொழியில் 193 புள்ளிகளைப் பெற்று, தேசிய ரீதியில் முதலாம் இடம் பெற்ற Ehetuwewa Model Primary Schoolஐச் சேர்ந்த தனோஜ் தீக்ஷண என்ற மாணவனை இச்சந்தர்ப்பத்தில் நான் பாராட்டுகின்றேன். அத்தோடு, தமிழ் மொழியில் 188 புள்ளிகளைப் பெற்ற, யாழ்ப்பாணம்/மல்லாகம் கலாநிதி தங்கம்மா அப்பாக்குட்டி கனிஷ்ட வித்தியாலயத்தைச் சேர்ந்த சுரேந்தர் சபின் என்ற மாணவருக்கும் என்னுடைய வாழ்த்துகளைத் தெரிவித்துக் கொள்கிறேன். மேலும், எமது பொத்துவில் கல்விக் கோட்டத்தில், ஒஸ்மானியா கனிஷ்ட வித்தியாலயத்தில் 1 மாணவனும் மினாறுல் உலூம் வித்தியாலயத்தில் 8 மாணவர் களும் அஸ்ஸாதிக் வித்தியாலயத்தில் 9 மாணவர்களும் தாறுல் பலாஹ் வித்தியாலயத்தில் 15 மாணவர்களும் நூரானிய்யா வித்தியாலயத்தில் 7 மாணவர்களும் அல்-இஷ்ராக் மகா வித்தியாலயத்தில் 1 மாணவனும் அல்-பஹ்ரியா வித்தியா லயத்தில் 1 மாணவனும் அல்-ஹுதா வித்தியாலயத்தில் 2 மாணவர்களும் முனவ்வரா வித்தியாலயத்தில் 2 மாணவர்களும் விபுலானந்தா வித்தியாலயத்தில் 2 மாணவர்களும் கோமாரி M.M.T.M.V.இல் 5 மாணவர்களும் சித்தியடைந்துள்ளனர். அவர்களுக்கும் நாடளாவிய ரீதியில் சித்தியடைந்த அனைத்து மாணவர்களுக்கும் என்னுடைய பாராட்டுகளைத் தெரிவித்துக் கொள்ள விரும்புகிறேன். அத்துடன், கிழக்கு மாகாணத்தில் 181 புள்ளிகளைப் பெற்ற மருதமுனை அல்-மனார் வித்தியாலய மாணவி Mohamed Mujahith Fathima Lifaஇற்கும் நன்றிகளைத் தெரிவித்துக் கொள்கிறேன்.

2025ஆம் ஆண்டில் பொத்துவில் கல்விக் கோட்டம் 69.2 சதவீதம் சித்தி பெற்றிருந்தது; இப்போது 76.9 சதவீதம் சித்தி பெற்றிருக்கின்றது. இதற்குக் காரணமாக இருந்த DEO – Divisional Education Officer, ZDE மற்றும் அனைத்துப் பாடசாலை அதிபர்கள், ஆசிரியர்கள், மாணவர்கள், பெற்றோர் களுக்கும் இந்த வேளையிலே என்னுடைய மனமார்ந்த நன்றிகளைத் தெரிவித்துக்கொள்ள விரும்புகிறேன்.

பாணமை, லகுகலை, செங்காமம், ஊறணி போன்ற கிராம மக்கள் குடிநீரின்றி மிகவும் கஷ்டப்படுகின்றார்கள். இம் மக்களினதும் பொத்துவில் உட்படப் பிராந்திய மக்களினதும் அத்தியாவசியத் தேவையான குடிநீர் மற்றும் விவசாய நீர்த் தேவைகளைப் பூர்த்தி செய்ய, இந்த அரசு ஹெடஓயா திட்டத்தை விரைவில் ஆரம்பித்து, அதனைச் செயற்படுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். கடந்த 5ஆம் மாதம் 22ஆம் திகதி அம்பாறை கச்சேரியில் இடம்பெற்ற விசேட DCC கூட்டத்திலே மாண்புமிகு ஜனாதிபதி அவர்கள் இந்த விடயத்தை ஏற்றுக்கொண்டதையும் இவ்விடத்தில் குறிப் பிட்டுக்கொள்ள விரும்புகின்றேன்.

ஒலுவில் தென்கிழக்கு பல்கலைக்கழகத்திற்கு அண்மித்த A4 பிரதான வீதியில் உள்ள சிறிய பாலம் ஒன்று உடைந்து விழுந்து இரண்டு வருடங்களாகியும் இதுவரைக்கும் திருத்தி யமைக்கப்படவில்லை. அதனை மிகவும் விரைவாகப் புனரமைக்க அரசானது நடவடிக்கைகளை எடுத்து அப் பகுதியில் சிறந்த போக்குவரத்து வசதிகளை ஏற்படுத்தித்தர வேண்டுமென இந்தச் சபையில் கேட்டுக்கொள்ள விரும்பு கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, අපේ රටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල, කැලි පදනම මත සේවය කරන 35දෙනෙක් ඉන්නවා. එම නිලධාරින්ට තම සේවය ස්ථිර කර ගන්න බැරි තත්ත්වයක් තිබෙනවා. අවුරුදු 16ක් තිස්සේ එම නිලධාරීන් වැඩ කරනවා. ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ඇමතිතුමාටත්, මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය ඇමතිතුමාටත් මේ ගැන පැහැදිලි කරලා තිබෙනවා. කරුණාකරලා මේ අවුරුද්දේ වක්‍රලේඛය නිකුත් කරනකොට එම නිලධාරීන්ගේ සේවය ස්ථිර කරන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා මම ගරු සභාවෙන් ඉල්ලනවා. එම නිලධාරීන් සියලුදෙනා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සියලු වැඩ කරන බව මා කියන්න ඕනෑ.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, என்னுடைய பிரதேசத்தினுடைய கல்வி வளர்ச்சி சம்பந்தமாக இந்த அவையிலே நான்கு விடயங்களை முன்வைக்க விரும்புகின்றேன்.

My first suggestion relates to a separate Zonal Education Office for Pottuvil. With my proposal, I request to establish a separate Zonal Education Office for Pottuvil to overcome administrative difficulties and promote educational unity. Currently, the Muslim, Tamil and Sinhalese schools in the Pottuvil area are administered by the Akkaraipattu, Tirukkovil and Ampara Zonal Education Offices, respectively despite being geographically close. Making this proposal, I would like to highlight the long travel distance, administrative delays, limited supervision and the difficulties affecting teachers and students at present. It also suggests as the preferred option a model of full geographical unity bringing all schools in the Pottuvil and Lahugala Divisional Secretaries' Divisions under one zone, covering 37 schools. The proposed zone would improve supervision, teacher management, training, student development and administrative efficiency.

The second suggestion is, to start a Technology Stream for A/L. Although there are several schools in the Pottuvil area, none currently offers a Technology Stream for Advanced Level. As a result, the students who wish to pursue technology-related subjects for Advanced Level

[ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා]

do not have adequate opportunities to study them in their own area, and they may have to face difficulties when travelling elsewhere for studies. In this modern era, technological education is essential for developing students' knowledge, practical skills, to have higher educational opportunities and for employability. Therefore, it is strongly proposed that a Technology Stream for Advanced Level be established at the Pottuvil Central College, the leading National School in Pottuvil area. This initiative would provide equal educational opportunities and prepare students for future technological careers.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் ஏற்கெனவே குறிப்பிட்டது போன்று இன்றைய எனது இந்த உரையானது எனது பாராளுமன்ற அமர்வில் இறுதி உரையாக இருப்பதை மீண்டும் ஒரு முறை ஞாபகப்படுத்திக்கொள்ள விரும்புகின்றேன்.

நான் இந்தச் சபைக்கு வருவதற்கு அருள் புரிந்த எல்லாம் வல்ல அல்லாஹ்வுக்கும் எனது தந்தை மர்ஹூம் KPM ஷரீப், எனது தாய் SD சப்ரா உம்மா, எமது இனத்திற்காக ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் கட்சியை ஆரம்பித்த ஸ்தாபகத் தலைவர் மர்ஹூம் M.H.M. Ashraff அவர்களுக்கும் அவரது வழியில் கட்சியைத் தொடர்ந்து வழிநடாத்திக்கொண்டு செல்கின்ற எமது கட்சியின் தேசியத் தலைவர் the Hon. Al-Haj Rauff Hakeem, MP அவர்களுக்கும் Secretary of Sri Lanka Muslim Congress, Hon. M. Nizam Kariapper, MP, PC அவர்களுக்கும் the Hon. (Dr.) M.L.A.M. Hizbullah, the Hon. M.S. Uthumalebbe, MP அவர்களுக்கும் எமது கட்சியின் உயர்பீட உறுப்பினர்கள், கட்சியின் போராளிகள், அடிமட்டப் போராளிகள் அனைவருக்கும் என்றும் எமது மக்கள் சார்பாகவும் மனமார்ந்த நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

அது மட்டுமன்றி, இதன் பின்னரும் எனது மரணம் வரை எனது பயணம் இந்த ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸ் கட்சியில்தான் என்பதையும் உறுதியாகக்கூறி இந்த ஆட்சியில் எனது பயணத்தில் உதவிய ஆளுங்கட்சி அமைச்சர்கள், செயலாளர்கள், பாராளுமன்ற உறுப்பினர்கள், பாராளுமன்ற ஊழியர்கள், பெயர் சொல்ல மறந்த அனைவருக்கும் எனது மனமார்ந்த நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

எனது இந்தப் பாராளுமன்றப் பயணத்தில் உதவிய இலங்கை சுற்றுலா மற்றும் கைத்தொழில் சம்மேளனத்தின் தலைவர் A.M. Joufer, Mufarizh, A. Salis, சட்டத்தரணி C.M. Faizal, சட்டத்தரணி B. Bashoorkhan, A.L. Kiyazdeen, Z.A.M. Imthiyaz, J. Thaneez Ahamed, A.G. Ameer Alley, A. Safeek, A.S. Azeez, எனது மனைவி S.A.S. Noorjahan, எனது மகன் Fervesh Ahamed, எனது மகள் Zanana, எனது சகோதரன் Abdul Malik, Wareez Ashraff, எனது சகோதரிகள் Kulthum Beavy, Izzathul Azha, Hazeenath Begum Ashraff, எனது மைத்துனர்கள் M.L. Kalender Lebbe, M.L. Haroon, T.L. Fouzer, A.M. Abthullah, Riyan Subair, A.J. Rauff போன்றோருக்கும் இந்த உயரிய சபையில் எனது மனமார்ந்த நன்றிகளைத் தெரிவித்துக்கொண்டு, இறுதியாக ஒரு விடயத்தைக்கூறி என்னுடைய உரையை முடிக்கலாமென நினைக்கின்றேன்.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න.

எனது பிரதேசப் பாடசாலைகளில் இருக்கின்ற ஆசிரிய வெற்றிடங்கள் பற்றி குறிப்பிட விரும்புகின்றேன்.

Ak/Al-Irfan Ladies College, Pottuvil -17, Ak/Al-Bahriya Vidyalaya - 11, Ak/Al-Mina Vidyalaya, Sengamam - 9, Ak/Al-Aqsha Vidyalaya -5, Ak/Hithaya Vidyalaya - 6, Ak/Munnawara Vidyalaya - 2, Ak/As-Sadiq Vidyalaya - 5, Ak/Osmaniya Junior Vidyalaya - 4, Ak/Hijra Nagar GMMS -5, Ak/Dharul Falah Muslim vidyalaya -2, Ak/Minarul Uloom Vidyalaya - 4, Ak/Al-Hutha Vidyalaya -3, Ak/Hijra Vidyalaya -3, Ak/Al-Marwa Vidyalaya -3, Ak/Pottuvil Central College - National School - 18, Ak/Al-Kalam Maha Vidyalaya - 19, Ak/Al-Ishraq Vidyalaya - 14, Ak/Kavivaanan MA Azeez Vidyalaya -4, AK/Al-Abzan Vidyalaya - 2, Ak/Al-Nooraniya Vidyalaya -2.

மூன்று மாடிக் கட்டிடங்களை வேண்டி நிற்கின்ற பாடசாலைகள்: Ak/Al-Irfan Ladies College, Ak/Al-Nooraniya Vidyalaya, Ak/Dharul Falah Muslim vidyalaya, Ak/Minarul Uloom Vidyalaya, Ak/Osmaniya Vidyalaya.

கட்டிடங்கள் திருத்த வேண்டிய பாடசாலைகள்: Ak/Al-Aqsha Vidyalaya, Ak/Minarul Uloom Vidyalaya, Ak/ Kavivaanan MA Azeez Vidyalaya.

மைதானங்கள் தேவையான பாடசாலைகள்: Ak/ Munnawara Vidyalaya, Ak/Al-Nooraniya Vidyalaya, Komari MMTM Vidyalaya, ஊரணி சரஸ்வதி மகா வித்தியாலயம்.

எனது உரையின் எஞ்சிய பகுதியை ஹன்சாட்டிற்காக ***சமர்ப்பிக்கிறேன்.**

மாஷா அல்லாஹ்! அல்லாஹு அக்பர்! அல்லாஹு அக்கபர்! அல்லாஹு அக்பர்!

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දේවානන්ද සුරවීර මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.51]

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමානයේ බලයේ ඉන්න ජාතික ජන බලවේගය ආණ්ඩුව විධියට ඇත්තටම අපට පැහැදිලි ලෙසම ඕනෑ කර තිබෙනවා, මේ රටේ ජනතාවට හොඳ රටක්, ඒ වාගේම ලස්සන ජීවිතයක් ගොඩනහා දෙන්න. ඒ සඳහා අපේ රටේ විවිධ පද්ධති ප්‍රමිතිකරණයට ලක් කරන්න ඕනෑ. එහි එක අවස්ථාවක් විධියට තමයි, අද අපි මෙම නියෝග සම්මත කර ගන්න බලාපොරොත්තු වන්නේ. අද දවසේ අපි මේ සාකච්ඡාවට බඳුන් කරන්නේ, අපේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රය ප්‍රමිතිගත කිරීම ඉලක්ක කරගෙන එන නියෝග.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අපේ රටේ විපක්ෂයට අද අත් වෙලා තිබෙන ඉරණම ජනතාවට තේරුම් ගන්න පුළුවන් වටපිටාවක් නිර්මාණය වෙලා තිබීම මේ රටේ ජනතාවගේ වාසනාවක්. මොකද, අපේ රටේ විපක්ෂය ලක ලැහැස්ති වෙලා ඉන්නේම මොකටද? අද ඇත්තටම කෙරෙන්නේ අතිශය වැදගත් සංවාදයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, අපේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රය මඤ්ඤං කරලා, නන්නත්තාර කරලා, එකිනෙකා අතර තරගයක් ගොඩනඟලා අද මහ පාර එකිනෙකා කා කොටා ගන්න, මරා ගන්නා තැනක් බවට පත් කරලා තිබෙන්නේ. පෞද්ගලික වාහනයේ යන රියැදුරා ගත්තත්, එහි ගමන් කරන අය ගත්තත්, පොදු ප්‍රවාහන සේවයේ යන රියැදුරා ගත්තත්, එම මගියා ගත්තත් අද එකිනෙකා මරා ගන්නා තැනට තරගයක් හදලා, මිනිසුන් නරුමයෝ බවට පත් කළ වටපිටාවක් තමයි දක්නට තිබෙන්නේ. එම නිසා වර්තමාන ආණ්ඩුව විධියට අපට ඕනෑ කරලා තිබෙනවා, ප්‍රවාහන ක්ෂේත්‍රය ප්‍රමිතිගත කරන්න. අපි ක්‍රමානුකූලව මෙම ක්ෂේත්‍රය ප්‍රමිතිගතකරණය කරගෙන එනවා. මොකද, එය රටකට අතිශය වැදගත් දෙයක්. රටක ප්‍රවාහන සේවය කියන්නේම ඒ රටේ ජනතාවගේ ජීවිතය. මොකද, ප්‍රවාහන සේවයත් එක්ක රටේ හැම ක්ෂේත්‍රයකම අය සම්බන්ධයි. රෝගියා වෙන්න පුළුවන්, ගුරුවරයා ඇතුළු වෘත්තිකයෝ වෙන්න පුළුවන්, රටේ සියලු පුරවැසියන් ප්‍රවාහන ක්ෂේත්‍රයත් එක්ක සම්බන්ධයි. එම නිසා එය ප්‍රමිතිගතකරණය කළ යුතුමයි.

මහ පාරේ සිදු වන අනතුරු පිළිබඳව සඳහන් කරමින්, මේ නියෝග සම්මත කර ගන්නේ ඇයි කියලා අද උදේ ඉඳලා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කිව්වා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක වැඩිපුර කාලයක් ලැබෙනවා.

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)
ස්තුතියි.

විපක්ෂය ඒ ගැන නෑසුනු කන් සේ සිටිනවා. ඒ සම්බන්ධව කිසිදු සාකච්ඡාවක් අද ඔවුන් තුළ නැහැ. මොකද, ඒගොල්ලන් ගොඩනැඟුවේ නන්නත්තාර රටක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නන්නත්තාර රට ඇතුළේ වැජඹෙන්න, ඔටුනු පැළඳි රජවරු වෙන්න කල්පනා කළ මිනිස්සු තමයි ඒගොල්ලන්. ඒ නිසා විපක්ෂය කැමැති නැහැ, අද මේ රට පිළිවෙළකට ක්‍රමානුකූලව ගොඩ එනවාට. ඒක තමයි මේකේ තිබෙන ඇත්ත කථාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද උදේ ඉඳන් ගරු සභාවේ ඉඳගෙන, මේ කළ කථා අහගෙන සිටියා. හැබැයි, විපක්ෂයේ එක මන්ත්‍රීවරයෙකුගෙන් දැන් රටක් විධියට අපි තබා තිබෙන ස්ථාවර පදනම පිළිබඳව වචනයක් පිට වුණේ නැහැ. විපක්ෂය දේශපාලනය කරන්න ඕනෑ. හැබැයි, ශිෂ්ට වෙන්න ඕනෑ. අපේ රටේ ප්‍රධාන පුරවැසියා වන ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා පැහැදිලි ලෙසම කිව්වා, "ඔයගොල්ලෝ අපට වඩා ශිෂ්ට වෙලා එන්න, මේ රටේ බලය ගන්න" කියලා. ජනාධිපතිතුමා කිව්වේ එහෙමයි. දැන් දවසින් දවස, දවසින් දවස මොකක්ද මේ කියන්නේ? මේගොල්ලන් විසින්ම ගොඩනඟා ගත් තම තමන්ගේ මොන මොනවා හෝ කැරැට්ටුවක් ඉලක්ක කරගෙන කිසිදු අදහසක් නැතුව ආණ්ඩුවට තඩිබාන්න තමයි try කරමින් ඉන්නේ. හැබැයි, අපේ රටේ ජනතාව ඒක හොඳාකාරවම දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයත් මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. "දෙරණ" නාළිකා අධිපති, පාර්ලිමේන්තු මන්ත්‍රී දිලිත් ජයවීර මැතිතුමා මෙතැන කථාව පටන් ගන්නකොටම කිව්වා, හරිම බයෙන් කථා කරන්නේ කියලා. ඒගොල්ලන් බය වෙන්න ඕනෑ. මොකද, මේකේ බය වෙන්න ඕනෑ කණ්ඩායම් කිහිපයක් නේ ඉන්නේ. හොරු බය වෙන්න ඕනෑ, තක්කඩි බය වෙන්න ඕනෑ, කොමිස් කාක්කෝ බය වෙන්න ඕනෑ. ඒ වාගේම අපේ රටට වින කරපු, රාජ්‍ය දේපළ මංකොල්ල කාපු අය බය වෙන්න ඕනෑ. නැත්නම් කාටද බය තිබෙන්නේ? නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක වෙමින්, ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වෙමින්, රටක් විධියට අපේ රට ඉහළට එසවෙන මෙවැනි වටපිටාවක් ඇතුළේ කාටද බය හිතෙන්නේ? මොකටද බය? අපේ රටේ කළු රාජ්‍යයක් ගොඩනඟා තිබුණා. ඒ ගැන දිගින් දිගටම ජනාධිපති වෙන්න කලින් පවා අනුර කුමාර දිසානායක මහතා මේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කර තිබුණා. ඒ කළු රාජ්‍යයේ, පාතාල රාජ්‍යයේ වරිත 70ක් පමණ මේ වනකොට ලෝකයේ විවිධ රටවල සිට ගෙනැවිත් තිබෙනවා. ඉතින්, බය වෙන්නේ මොකටද? දැන් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වනවා නේ. අපේ රටේ පුරවැසියන්ට ප්‍රශ්නයක් නැහැ නේ. විෂ මත්ද්‍රව්‍ය ජාලයේ ඔස්තාර්ලා අල්ලාගෙන මේ රටට ගෙනෙනවා නේ. ඒක බය වෙන්න දෙයක් නොවෙයි නේ. ඒකෙන් රටක් විධියට යහපත් අනාගතයකට යන්න පාර හැදෙනවා නේ. ඉතින්, මොකටද බය වෙන්නේ? එදාත් මේගොල්ලන් පෙන්නුවේ මිථ්‍යාව. එදාත් මේගොල්ලන් පෙන්නුවේ ප්‍රබන්ධ. අදත් මේගොල්ලන් කරන්නේ ඒ මිථ්‍යා නයි වපුරලා මේ රටේ ජනතාවගේ ඔළු කුහර විනාශ කිරීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි මේ අය කරමින් ඉන්නේ.

තව පට්ටපල් බොරුවක් මෙතැන ඇද බෑවා, දිලිත් ජයවීර මන්ත්‍රීවරයා. අපි ජනතාවගේ රීරි මාංස උරා බොන විධියට බදු වැඩි කර තිබෙනවාය කිව්වා. ජාතික ජන බලවේගය එහෙම කරලා නැහැ. අපි රුපියලකින්වත් බදු වැඩි කරලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, අපි බදු ජාලය විධිමත් කර තිබෙන බව. අපි බදු වැඩි කරලා නැහැ. හැබැයි, බදු නොගෙවපු අයගෙන් බදු අරගෙන තිබෙනවා. අපි භාණ්ඩාගාරය පුරවා තිබෙන්නේ එහෙමයි. අපි රුපියල් ට්‍රිලියන ගණනින් මුදල් එකතු කරලා තිබෙන්නේ එහෙමයි. එදා රුපියල ශක්තිමත්ව නොතිබුණු, ඩොලර් නොතිබුණු රටක් අද වන විට ලෝකයේ ඇගැයීමට ලක් වනකොට, ශීඝ්‍රයෙන් දියුණු වන රටවල් අතරට එක් වනකොට කුහක, තක්කඩි විපක්ෂයට ඒක පෙනෙන්නේ නැහැ. ඒක තමයි තිබෙන අශිෂ්ටත්වය, ඒක තමයි තිබෙන ඊර්ෂ්‍යාව. ඔබතුමන්ලා දන්නවා, ලෝකයේ විවිධ වර්ගයේ බල්ලෝ ඉන්න බව. ඇල්සේෂන් කියයි, බුල්ඩෝග් කියයි, වල් බල්ලෝ කියයි. මේ විධියට විවිධ වර්ගයේ බල්ලෝ ඉන්නවා. බල්ලන්ගේ වැඩේ උඩු බිරීම. එහෙම උඩු බුරනකොට ඒකා මොන වර්ගයේ බල්ලෙක්ද කියලා අපට හොයාගන්න බැහැ නේ. මෙතැනට ආවාට පස්සේ විපක්ෂය කියලා එකක් අපට තිබෙනවා. හැබැයි මේකේ ඉන්න

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඔක්කොම හූ කියනකොට තේරුම් ගන්න බැහැ. අපි දන්නවා, අපට ඒ අය තේරුම් ගන්න පුළුවන්. හැබැයි, බල්ලෝ උඩු බුරනකොට ඒ මොන බල්ලෙක්ද කියලා තෝරාගන්න බැරි වුණාට, මේ රටේ ජනතාව විපක්ෂය කවුද කියලා තෝරාගෙන ඉන්නවා.

ඇත්තටම අපට ඕනෑ කරන්නේ ප්‍රමිතියෙන් යුතු ප්‍රවාහන සේවයක්. ඒ ගමන අපි ආරම්භ කරලා තිබෙන්නේ. අපේ අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාත්, බිමල් රත්නායක ඇමතිවරයාත් මේ වනකොට රට කලඹන ලෙස ප්‍රවාහන සේවය

[ගරු දේවානන්ද සුරවීර මහතා]

ඉහළට ගැනීම සඳහා මෙට්‍රෝ බස් සේවාව ආරම්භ කර තිබෙනවා. අද හැම කෙනෙක්ම කථා කරන්නේ ඒ පිළිබඳවයි. ඒ කටයුත්ත අපි පටන් ගත්තා, පසුගිය 4වැනි දා. එහි පළමුවැනි ඩිපෝව ආරම්භ කළා, තලංගමින්. දෙවැනි එක ආරම්භ කළා, කඩවතින්. ඊළඟ එක ආරම්භ කරන්න බලාපොරොත්තු වනවා, ඒකලින්. 21වැනි දා පටන් ගන්නවා, රත්මලානෙන්. මේ තුළින් අද අපි රටට යහපත් පණිවුඩයක් දෙමින් සිටිනවා. ඒ අනුව අද මුළු රටේම ජනතාව මෙට්‍රෝ බස් රථ සේවාව වැලඳ ගනිමින් ඉන්නවා. ඒ නිසා මෙට්‍රෝ බස් සේවාව කියන්නේ, තවත් එක් නවීන බසයකට වඩා මිනිස්සුන්ට ඩිජිටල් පහසුකම් සපයන, මිනිස්සුන්ට සුව පහසුවෙන් යන්න එන්න පුළුවන්, නිශ්චිත, නියමිත දින චර්යාවක් එක්ක, මිනිස්සුන්ගේ අධ්‍යාත්මයත් එක්ක බැඳිච්ච ප්‍රවාහන සේවයක්. ඒක තමයි ශිෂ්ටත්වය කරා සමාජය ගෙන යන නවයුගය; පුනරුදය. ආණ්ඩුවක් විධියට ඒකේ නායකත්වය අරගෙන අපේ බිමල් රත්නායක ඇමතිතුමා අද රට පුරාම ඒ කටයුත්ත ක්‍රියාත්මක කරමින් සිටිනවා.

මේ වනකොට අපේ රට තුළ තිබෙන මෙට්‍රෝ බස් සංඛ්‍යාව 122යි. කොළඹ දිස්ත්‍රික්කය පුරාම මේ බස් සේවාව ක්‍රියාත්මකයි. ඊට පස්සේ මේ ව්‍යාපෘතිය ගාල්ලට යනවා, නුවරට යනවා. එතැනින් පස්සේ යාපනයට යනවා. මේ විධියට මුළු රටේම දිස්ත්‍රික් මට්ටමින් මේ ව්‍යාපෘතිය ආරම්භ වනවා. ඒ අනුව ප්‍රවාහන සේවය තුළ තිබුණු තරගකාරිත්වය, කුහක මිනිස්සු, නරුමයින් පවත්වා ගෙන ගිය ප්‍රවාහන සංස්කෘතිය විනාශ වෙලා, මිනිස්සු, මිනිස්සු විධියට බස් එකේ යන්න ලක ලැහැස්ති වනවා. මේක ඇතුළේ තරගයකට වඩා අපට වැදගත් වන්නේ ගුණාත්මක සේවාවක් සැපයීමයි. අපට දැන් තිබෙන ප්‍රවාහන සේවයත් එක්ක තරගයක් නොවෙයි මේ තිබෙන්නේ. මේ සේවාව ප්‍රමිතියකින් යුතුව ක්‍රියාත්මක කිරීමේ වුවමනාවයි අපට තිබෙන්නේ. ඒ නිසා අපි මෙට්‍රෝ බස් එක හරහා බලාපොරොත්තු වන්නේම අලුත් කෙනෙක් මිසක්, අර පරණ බස් එකේ යන කෙනාම නොවෙයි. ඔහුට මේ බස් එකේ යන්න බැහැ කියන එක නොවෙයි මම මේ කියන්නේ. තමන්ගේ පෞද්ගලික වාහනයෙන් කොළඹට යන අයට තමන් කැමැති තැනක ඒ වාහනය නතර කරලා, මෙම බස් සේවාව පටන් ගන්න තැනින් කොළඹට යන්න, නගරයට යන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කිරීම තමයි මේක ඇතුළේ තිබෙන්නේ. ඒ නිසා ඒගොල්ලන්ගේ ගමන ඒගොල්ලන්ට යන්න පුළුවන්. හැබැයි, ඒගොල්ලන්ට වෙනස් වෙන්න වනවා. අපේ SLTB එකට වෙනස් වෙන්න වේවි. ඒ වාගේම අපේ private ක්ෂේත්‍රයට වෙනස් වෙන්න වේවි. ඒගොල්ලන් වෙනස් වනකොට තමයි ඒගොල්ලන් පිළිබඳව රටේ ජනතාවගේ අවධානය යොමු වන්නේ. ඒ නිසා අපි කියනවා, මේකට කවුරු විරුද්ධ වුණත්, මේ පාර්ලිමේන්තුව ඇතුළේ කවුරු කෑ ගහලා කිව්වත්, ජාතික ජන බලවේගය යන ගමන සහ මේ රටේ සෑම ක්ෂේත්‍රයක්ම ප්‍රමිතිගත කරන එක නතර කරන්න බැහැ කියලා. ඒක අපි ඉදිරියට ගෙන යනවාමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ගොඩක් ස්තුතියි, මට මේ අවස්ථාව ලබා දුන්නාට.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු කන්දසාමි ප්‍රභු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.02]

**ගරු කන්දසාමි ප්‍රභු මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நாங்கள் இந்தச் சபையில் மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பாக விவாதித்துக்கொண்டு இருக்கின்றோம்.

இந்த நாட்டின் உற்பத்திப் பொருளாதாரத்துக்குப் பங்களிப்பு வழங்கக்கூடிய தரப்பினர் - நாட்டுக்குத் தங்களது உழைப்பை வழங்கக்கூடிய தரப்பினர் - வீதி விபத்துகளால் தங்களது பெறுமதிமிக்க உயிர்களை இழக்கின்ற நிலைமை காணப்படுகின்றது. இது அவர்களது குடும்பத்தினருக்கு மாத்திரமல்ல, இந்த நாட்டுக்கே வேதனை தருகின்ற ஒரு விடயமாக இருக்கின்றது. இதனைத் தவிர்த்துக் கொள்வதற்காக குறித்த சட்டத்தில் சில மாற்றங்களைக் கொண்டுவர நாம் எதிர்பார்க்கின்றோம்.

இந்தக் காலகட்டத்தில் கூடுதலான வாகனங்கள் பதிவு செய்யப்பட்டு, வீதியில் பயணித்துக்கொண்டு இருக்கின்றன. இருந்தாலும், வாகன சாரதிகளின் தவறுகள் காரணமாகவும் வாகனங்களில் இருக்கின்ற தொழில்நுட்பக் கோளாறுகள் காரணமாகவும் பாரிய வீதி விபத்துகள் ஏற்படுவதை நாங்கள் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. மோட்டார் வாகனச் சட்டத்தின் 29ஆவது பிரிவின்படி, வாகன வருமான அனுமதிப்பத்திரம் பெறுகின்றவேளையில், fitness certificate எனப்படுகின்ற தகுதிச் சான்றிதழையும் கட்டாயம் பெற வேண்டும். இருந்தபோதிலும், இதனைச் சரியான முறையில் நடைமுறைப்படுத்த முடியாத நிலைமை இருப்பதை நாங்கள் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. வாகனங்களைப் பரிசோதனை செய்யும்போது, அவற்றில் கூடுதலாக தொழில்நுட்பக் கோளாறுகள் இருப்பது கண்டறியப் படுகின்றது. இந்தத் தொழில்நுட்பக் கோளாறுகள் காரணமாகத் தான் விபத்துகள் ஏற்படுகின்றன. எனவே, இந்த தகுதிச் சான்றிதழ் சரியான முறையில் வழங்கப்படுகின்றதா? என்ற கேள்வி எழுகின்றது.

இந்த நாட்டில் ஒரு நாளைக்கு கிட்டத்தட்ட 8 மரணங்கள் வீதி விபத்துகளால் இடம்பெறுகின்றன. தேசிய போக்குவரத்து ஆணைக்குழு, மாகாண வீதிப் பயணிகள் போக்குவரத்து அதிகாரசபை, இலங்கை போக்குவரத்துச் சபை ஆகியவற்றின் அனுமதியைப் பெற்று சேவையில் ஈடுபடுகின்றவர்களின் குறிப்பாக, பயணிகள் போக்குவரத்துச் சேவை, பாடசாலை போக்குவரத்துச் சேவை, அலுவலக போக்குவரத்துச் சேவை, வாடகை அடிப்படையிலான போக்குவரத்துச் சேவை, சுற்றுலா சார்ந்த போக்குவரத்துச் சேவை ஆகியவற்றில் ஈடுபடுகின்ற வர்களின் பயணப் பாதுகாப்பை உறுதிப்படுத்தவேண்டி இருக்கின்றது. எனவே, மேற்குறித்த சேவைகளில் ஈடுபடுகின்ற வாகனங்களின் தகுதிச் சான்றிதழ் மற்றும் ஏனைய பாதுகாப்புத் தொடர்பான விடயங்களில் கூடுதலான அக்கறை செலுத்த வேண்டி இருக்கின்றது.

அதிவேக நெடுஞ்சாலையில் பயணம் செய்யும்போது seat belt அணிவது தொடர்பான வர்த்தமானி அறிவித்தலொன்று வெளியிடப்பட்டு இருக்கிறது. எனினும், அதனை நடைமுறைப் படுத்தாமல் கிட்டத்தட்ட ஒரு வருடம் கால அவகாசம் வழங்கியிருந்தோம். இம்மாதம் 19ஆம் திகதி முதல் அதிவேக நெடுஞ்சாலையில் பயணம் செய்யும்போது seat belt அணிவது கட்டாயமாக்கப்பட்டு இருக்கின்றது. வாகனத்தின் முன் ஆசனத்தில் அமர்ந்து பயணிப்பவர்கள் ஆசனப்பட்டியை

அணிவதுபோன்று, பின் ஆசனங்களில் அமர்ந்து பயணிப்ப வர்களும் seat beltஐ அணிவது கட்டாயமாக்கப்பட்டு இருக்கின்றது. ஏனெனில், பின் ஆசனத்தில் கூடுதலாகப் பயணிப்பவர்கள் சிறுவர்கள் மற்றும் பெண்களாவர். அவர்களின் பாதுகாப்பைக் கருத்திற்கொண்டே இந்த விடயம் கட்டாயமாக்கப்பட்டு இருக்கின்றது. அதிவேக நெடுஞ் சாலையில் மணித்தியாலத்துக்கு 100 கிலோமீற்றர் என்ற வேகத்திலே பயணம் செய்கின்றார்கள். இதன்போது, விபத்துகள் இடம்பெறக் கூடும். விபத்துகளின்போது பின் ஆசனங்களில் அமர்ந்து பயணிப்பவர்கள்தான் கூடுதலாக இறக்கின்ற, காயமடைகின்ற நிலையைப் பார்க்கின்றோம். மேற்குறித்த நடைமுறையைப் பின்பற்றுவதன்மூலம் விபத்துகளின்போது உயிர் இழப்புகள் ஏற்படுவதைத் தவிர்த்துக்கொள்ள முடியுமென நாங்கள் நம்புகின்றோம்.

வாகன தகுதிச் சான்றிதழ்களை வழங்குபவர்களுக்கு இருக்கவேண்டிய தகுதிகள் தொடர்பாகவும் நாங்கள் இதில் குறிப்பிட்டு இருக்கின்றோம். மோட்டார் வாகன இயந்திரவியல் தொடர்பில் NVQ Level 4 சான்றிதழைப் பெற்றவர்களுக்கு மாத்திரமே இந்தப் பரிசோதனைகளை மேற்கொள்வதற்கு நாங்கள் அனுமதி வழங்கியிருக்கிறோம். வாகனத்தைப் பழுதுபார்க்கும்பொழுது, அதன் தரம் தொடர் பிலும் நாங்கள் அவதானத்தைச் செலுத்தி இருக்கிறோம்.

இந்த நாட்டின் போக்குவரத்துத் துறையில் நாங்கள் பாரியளவு மாற்றத்தைக்கொண்டு வந்திருக்கின்றோம். விசேடமாக, உட்கட்டமைப்பு வசதிகளில் அதிலும் குறிப்பாக வீதிகளை அமைப்பதில் கூடுதலான கவனத்தைச் செலுத்தி இருக்கின்றோம். அதுமாத்திரமன்றி, புகையிரத நிலையங் களைப் புனரமைத்து இருக்கின்றோம். மேலும், மின்சார ரயில்களைக் கொண்டுவருவதற்கான முயற்சிகளும் இந்த அரசாங்கத்தால் மேற்கொள்ளப்பட்டு வருகின்றன. முதற் கட்டமாக, பாணந்துறை, ராகமை, நீர்கொழும்பு போன்ற பிரதேசங்களுக்கு மின்சார ரயில் சேவைகளை நடத்து வதற்கான ஏற்பாடுகளைச் செய்திருக்கிறோம்.

'மெட்ரோ' பஸ் சேவை தொடர்பாகவும் பொதுவாக இப்பொழுது பேசப்பட்டு வருகின்றது. இதுவரையில் 172 buses சேவையில் ஈடுபடுத்தப்பட்டு இருக்கின்றன. மேலும், எதிர்வரும் காலங்களில் 800 AC busesகளைச் சேவையில் ஈடுபடுத்தத் தயாராக இருக்கின்றோம். அதனைப்போன்று, நான்கு புதிய bus தரிப்பு நிலையங்களையும் உருவாக்கி இருக்கின்றோம். எதிர்வரும் காலங்களில் காலி, கண்டி, யாழ்ப்பாணம் போன்ற பிரதேசங்களில் 'மெட்ரோ' பஸ் நிலையங்களை ஏற்படுத்தி சேவைகளை மேற்கொள்ள ஏற்பாடுகளைச் செய்திருக்கின்றோம். அத்துடன், SLTB bus நிலையங்களை நவீன மயப்படுத்துவதற்கான நிதிகள் வழங்கப்பட்டு, அவை நவீன மயப்படுத்தப்பட்டுக் கொண்டு வருகின்றது என்பதையும் இந்த நேரத்தில் நான் ஞாபகமூட்ட விரும்புகின்றேன்.

எமது நாட்டு நிதிமூலம் அதிவேக நெடுஞ்சாலைகளை உருவாக்குவதற்கான ஏற்பாடுகள் செய்யப்பட்டு இருக் கின்றன. கடந்த காலங்களில் அதிவேக நெடுஞ்சாலைகளை உருவாக்குவதற்குக் கூடுதலான நிதியை வெளிநாடுகளில் இருந்து கடனாகப் பெற்றிருந்தோம். அதன் காரணமாக, நாட்டின் கடன் நிலைமை அதிகரித்திருந்தது. ஆனால், தற்பொழுது, தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் நிதி முகாமைத்துவத்தின் ஊடாக எங்களது சொந்த நிதியிலேயே அதிவேக நெடுஞ்சாலைகளை உருவாக்குவதற்கான ஏற்பாடு களைச் செய்துகொண்டு இருக்கின்றோம் என்ற விடயத்தையும் கூறிக்கொள்கின்றேன். அதேபோன்று, போக்குவரத்துத் துறையை நவீனமயப்படுத்தி, இலத்திரனியல் பஸ் சேவைகளை உருவாக்குவதற்கான முயற்சிகளில் தேசிய மக்கள் சக்தி அரசாங்கம் ஈடுபட்டுக்கொண்டு இருக்கின்றது. தற்பொழுது எரிபொருளுக்கான செலவுகள் கடுமையாக அதிகரித்து இருப்பது உங்களுக்குத் தெரியும். வெளிநாடுகளில் இருந்து எரிபொருளை இறக்குமதி செய்யும்பொழுது செலவுகள் அதிகரிக்கின்றன. எங்களது பொருளாதார நெருக்கடி நிலைமைக்கு முக்கியமானதொரு கருப்பொருளாக எரிபொருள் சார்ந்த விடயம் இருக்கின்றது. இவ்விடயங் களைக் கருத்திற்கொண்டு எதிர்வரும் காலங்களில் மின்சார வாகனங்களைப் பயன்படுத்த இருக்கின்றோம். விசேடமாக, மின்சார வாகனங்களுக்கு பச்சை நிற இலக்கத்தகடுகளை அறிமுகப்படுத்தவிருக்கிறோம்.

இந்தக் காலகட்டத்தில் மாண்புமிகு சனாதிபதி அவர்களின் தலைமையில் இடம்பெற்றிருந்த தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் பொதுக்கூட்டம் தொடர்பாகச் சில கருத்துகள் முன்வைக்கப்பட்டு இருந்தன. அந்தப் பொதுக் கூட்டத்தில் சாரைப்பாம்பு வந்ததாகக் குறிப்பிட்டார்கள். அங்கே ஒரு சாரைப்பாம்புதான் வந்தது. ஆனால், இங்கே நிறைய சாரைப்பாம்புகள் சுற்றித் திரிவதைப் பார்க்கக்கூடியதாக இருக்கின்றது. என்னவாக இருந்தாலும், தேசிய மக்கள் சக்தி அரசாங்கம் மக்கள் நேயமிக்க அரசாங்கம் என்பதை நாங்கள் தொடர்ந்தும் பறைசாற்றிக்கொண்டு இருக்கின்றோம். மக்களோடு இணைந்ததாக இந்த ஆட்சி எப்போதும் அமைந்திருக்கும் என்பதைக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி! வணக்கம்.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.11]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා විසින් මෝටර් වාහන පනත යටතේ නියෝග දෙකක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපි ස්තුතිවන්ත වෙනවා. මම මුලින්ම මෙන්න මේ කාරණය කියන්න කැමතියි. අද උදේ ඉඳලා මේ සම්බන්ධව විවිධ කාරණා මතු වුණා. අපේ විපක්ෂ නායකතුමා මතු කළ කාරණය ගැනයි මම මේ කියන්නේ. සුගන්ධිකා මැතිනිය විනිවිද පදනම වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ අංක SCSD 39/2026 සහ SCSD 89/2026 කියන නඩු දෙක විභාගයට ගන්න බැහැ කියලා අපේ අග්‍ර විනිශ්චයකාරතුමා ප්‍රතික්ෂේප කළා. ඊට අමතරව, දූලාර මැතිතුමා ඇතුළු තවත් පිරිසක් මේ සම්බන්ධව ඉදිරිපත් කළ නඩු තවමත් විභාගයට අරගෙන නැහැ. විභාගයට අරගෙන නැති නඩු ගණනාවක් තිබෙනවා. මේ නඩු තිබියදී තමයි මේ සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුව ලබා දීම සඳහා ලිඛිත කරුණු දැක්වීම් ඉදිරිපත් කරන්න කියලා තිබුණේ. මේ ක්‍රියාදාමය තුළ ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වෙලා තිබෙනවා කියලා SCFR 124/2026 කියන නඩුව දැන් පවරා තිබෙනවා. මේ කාරණය පිළිබඳව තමයි අපේ විපක්ෂ නායකතුමා මතු කළේ. හැබැයි, ඒකට වෙන උත්තරයක් දීලා,- අපේ වටගල නියෝජ්‍ය ඇමතිතුමාත් පොත් ගෙනැත් පෙරළලා කියවනවා මම දැක්කා. හරියට කියවලා බැලුවාම ඇත්තටම ඇහුවේ මේ කියන කාරණය සම්බන්ධව තමයි. ස්ථාවර නියෝග 50(3), 92(2)(ආ) කියවලා

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

බලන්න. මේ ස්ථාවර නියෝග යටතේ කථා කළේ මේ කරුණු පිළිබඳවයි. හැබැයි, ඒකට ඉඩ දුන්නේ නැහැ. ඒකට ඉඩ දෙන්නේ නැතිව, "යන්නේ කොහේද" මල්ලේ පොල්" වාගේ කථා කියලා ඒගොල්ලන් නිකම් ඉන්නවා.

අද වෙනකොට ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරපු නඩු හැට ගණනකින්, හැත්තෑ ගණනකින් ප්‍රමාණයක් අහලා නැති තත්ත්වයකට තමයි දැන් පත් වෙලා තිබෙන්නේ. ඒ තත්ත්වය තුළ, දැන් මේ සඳහා අවශ්‍ය කරන නියෝගය එවන්න බලාපොරොත්තු වෙනවා කියලා අග්‍ර විනිශ්චයකාරතුමා කියලා තිබුණා. මම කියන්න කැමතියි, කරුණාකරලා මේ ඉතිරි නඩුත් අහලා ඉවර වෙලාම - සති තුනක් තිබෙනවා නේ - ඔබතුමන්ලා තීන්දුවක් එවන්න කියලා. අපේ අධිකරණ ඇමතිතුමා දිගින් දිගටම කියපු කාරණය තමයි විනිශ්චයකාරවරු ජ්‍යෙෂ්ඨ වුණාම ඒ අයට විශාල පරිණතභාවයක් ලැබෙනවා, පරිණතභාවය තිබෙන්න නම් පරණ විනිශ්වයකාවරු, වැඩියෙන් වැඩ කරපු අය තව ඉන්න ඕනෑ කියන එක. ඉතින්, අපේ අග්‍ර විනිශ්චයකාරතුමාම ඒක බොරු කියලා ඔප්පු කරලා පෙන්වලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මේ නඩුව අහන්න තෝරා ගන්නේ කාවද? මේ ලැයිස්තුවේ අපේ ශ්‍රේෂ්ඨාධිකරණයේ 14දෙනෙකුගේ නම් තිබෙනවා. එහි පළමුවැනියාට එතුමා ඉන්නවා. යසන්ත කෝදාගොඩ මැතිතුමා දෙවැනියාට ඉන්නේ. දිලිප් නවාස් මැතිතුමා තුන්වැනියාට ඉන්නවා. ශිරාන් ගුණරත්න මැතිතුමා හතරවැනියාට ඉන්නවා. පස්වැනියාට ඉන්නවා, ජනක් ද සිල්වා මැතිතුමා. එතුමාව තෝරා ගන්නේ නැහැ. හයවැනියාව තෝරා ගන්නවා. ඊළඟට අටවැනියා - අර්ජුන ඔබේසේකර මැතිතුමාව - තෝරා ගන්නවා, සමයවර්ධන මැතිතුමාව පැත්තකට දාලා. ඊළඟට දොළොස්වැනියා - සම්පත් අබේකෝන් මැතිතුමාව - තෝරා ගන්නවා. ඊළඟට අවසානයට ඉන්න - කනිෂ්ඨම - විනිශ්චයකාරතුමා - ගිහාන් කුලතුංග මැතිතුමාව - තෝරා ගන්නවා. එතකොට මේ රටේ අග්‍ර විනිශ්චයකාරතුමාම ඔප්පු කරලා තිබෙනවා, ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාරවරු අරගෙන මේක කරන එකෙන් ලොකු පරිණතභාවයක් එන්නේ නැහැ කියලා. අපි නොවෙයි මේක කියන්නේ. අග්‍ර විනිශ්චයකාරතුමාම ඔප්පු කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. දැන් නඩු තීන්දු එන්න කලින් තීන්දු කියනවා. අපේ හර්ෂණ නානායක්කාර මහත්මයා "සිරස" මාධ්‍යයේ වැඩසටහනකට ගිහිල්ලා කිව්වා, ජනමත විචාරණයක් එන්නේ නැහැ කියලා. ඊයේ ඔබතුමන්ලාගේ රැස්වීමේදී ජනාධිපතිතුමා කිව්වේ මොකක්ද? මේ 18වැනි දා ද කොහේද මේකේ තීන්දුව එන්න තිබෙනවා, ආපු ගමන් අපි තුනෙන් දෙකේ බහුතරයෙන් මේක සම්මත කරලා ඉවර කරනවා කිව්වා. එතකොට, ජනමත විචාරණයක් එනවාද, නැද්ද කියලා එතුමා කථා කරන්නේ නැහැ. ඒ කියන්නේ, මේක තුනෙන් දෙකේ බහුතරයෙන් සම්මත කරන්න තමයි එතුමන්ලාගේ බලාපොරොත්තුව තිබෙන්නේ. එතකොට, ජනමත විචාරණයක් සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය එවයිද, නැද්ද කියන එක එතුමා දන්නවා. දැනගෙන තමයි මේක කියන්නේ. එහෙම නැත්නම් කියන්න ඕනෑ නැහැ නේ, අපි තීන්දුව ආපු ගමන් තුනෙන් දෙකේ බහුතරයෙන් සම්මත කරලා මේක ඉවර කරනවා කියලා. එහෙම කියන්න ඕනෑද? එහෙම නම් කියන්න තිබුණේ, "අපි දන්නේ නැහැ මොන විධියේ තීන්දුවක් එයිද කියලා. ඕනෑ දෙයකට අපි සූදානම්. තුනෙන් දෙකක් නම් තුනෙන් දෙකක්, ජනමත විචාරණයක් නම් ජනමත විචාරණයක්. ඕනෑ එකකින් අපි කරනවා" කියලා නේ. එහෙම කිව්වේ නැහැ. ඒ ඇයි? එතුමා දන්නවා එන තීන්දුව මොකක්ද කියලා. ඒ නිසා අපට ආපහු කල්පනා කරන්න දෙයක් නැහැ. මොකද, ජනාධිපතිතුමා කියපු හැම එකම වෙලා තිබෙනවා. 25වැනි දා එක්කෙනෙක් අත්අඩංගුවට ගන්නවා, නැත්නම් හිර භාරයට ගන්නවා, හිරේ යනවා අත්පුඩි ගහන්න ලැහැස්ති වෙන්න කිව්වා. හරියටම ඒ වැඩේ වුණා. මේවා කලින් කියනවා, මේගොල්ලන්. කරුණාකරලා අධිකරණය අතට ගත්තාට කමක් නැහැ, හැබැයි නොකියා ඉන්න මහත්මයෝ. උවිඳු කුරුකුලසූරිය මැතිතුමා අදත් දාලා තිබුණා, "දන්නේ නැතිව ඕවා කියන්නේ නැතුව ඉන්නවා, හලෝ" කියලා. කරුණාකරලා ඒක බලන්න.

මේ රටේ නීතිය පිළිබඳව කථා කරනකොට මම මේ කාරණයත් කියන්න ඕනෑ. දැන් අයිස් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 472ක් අඩංගු කන්ටේනරයක් වටලා තිබෙනවා. ලංකාවේ කළ දැවැන්තම වැටලීමක් ඒ කර තිබෙන්නේ. දැන් පොලිස්පතිතුමා මොකක්ද කරන්නේ? අයිස් කන්ටේනරය වැටලීම ගැන විමර්ශනයක් කරනවා. මට හිතාගන්න බැහැ. මොකක්ද මේකට හේතුව කියලා අපි නිකම් සොයා බැලුවා. දින 14ක් විතර පරක්කු වුණාය කියනවා. සාමාන්‍යයෙන් Sri Lanka Customs එකේ තිබෙන system එක අනුව යනකොට එහෙම වෙනවා. නැත්නම් ඕක කලින් ගියා නම්, a bull in a China shop වාගේ මේකට පැන්නා නම් මොකද වෙන්නේ? මේකේ හිටපු මිනිස්සුත් යනවා. මේකට 8දෙනෙක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. මේවා අත්අඩංගුවට ගත් මිනිස්සුන්ට විරුද්ධව දැන් විනය පරීක්ෂණයක්, විමර්ශනයක් කරනවා මේක අල්ලා ගත්තාට. එතකොට මේකට කවුද ආපසු සම්බන්ධ වෙන්නේ? ඒ නිසා කරුණාකරලා මේවා ගැන කල්පනා කරන්න කියලා විශේෂයෙන්ම අපි මතක් කරන්න කැමැතියි.

ඊළඟ කාරණය මේකයි. බේරුවල රැස්වීමේ නයා ඉන්න නිසා නයා බලන්න ගැරඬි ඇවිල්ලා තිබුණා. නයි අරින එක නේ, කරන්නේ දැන්. පව රැස්වීම් මාලාවේ පළමුවැනි එක බුලත්සිංහල; දෙවැනි එක, බේරුවල. ඒ දෙකම කළා. ඒ නයි ඇරපු ඇරිල්ල බැලුවාම හිනාත් යනවා. මොකද, නයි අරිනකොට, ගැරඬි එනවා දුවගෙන. උදාහරණයක් ගත්තොත්, 2031 වසර වෙනකොට විශ්වවිද්‍යාල 50ක් හදනවා කිව්වා. එහෙම නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක අවුරුද්දකට විශ්වවිද්‍යාල 10 ගණනේ හදන්න ඕනෑ. මම දන්නේ නැහැ ගෙවල් හදනවා වාගේ කියලා හිතුවාද කියලා. ඒ කියන්නේ, ඒ කියන විධියට 2031 දක්වා හැදුවොත් එක අවුරුද්දකට විශ්වවිද්‍යාල 10 ගණනේ හදන්න ඕනෑ. ඉතින් එහෙම හදනවාය කිව්වාම අත්පුඩි ගහනවා.

ඒ කාලයේ මොකක්ද කිව්වේ? ඉස්පිරිතාලේ ඇඳන් නැත්නම් නඩු දමන්නය කිව්වා. ජනාධිපතිතුමා ඒ කාලයේ මොනවාද කිව්වේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මතක ඇති නේ. ඉස්පිරිතාලේ ඇඳන් නැත්නම් නඩු දමන්න අයිතියක් හදනවා කිව්වා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්. දැන් මොකද කියන්නේ? හිතෙන හිතෙන විධියට ඉස්පිරිතාල ගණනේ යන්න බැහැ කියනවා. පොළට ආවත් ඉස්පිරිතාලෙට යනවා, හන්දියට ආවත් ඉස්පිරිතාලෙට යනවා, එහෙම ඉස්පිරිතාලෙට යන්නේ නැතුව ගෙදරට වෙලා ඉන්නලු, කොත්තමල්ලි ටිකක් බීලා. ඉස්පිරිතාලේ බෙහෙත් හිඟය නැති කළේ නැහැ. ඉස්පිරිතාලෙට යන එක නතර කරනවා, ජනාධිපතිතුමා. ඔන්න තත්ත්වය; තමුන්නාන්සේලා කරපු දේවල්. මම දැක්කා ඒක දමලා තිබෙනවා අපේ මන්ත්‍රීතුමියක්. ඒ comments ඔක්කෝම block කරලා තිබෙන්නේ. මොකද, අනික් මිනිස්සු දිගට හරහට ගහනවා, මේවා දැම්මාට පසුව.

මම දැක්කා, අපේ අබේසිංහ මැතිතුමාට ඊයේ පුදුම ආවේගයක් නේ තිබුණේ. අපි බොහොම ගරු කරන කෙනෙක්, ඔබතුමා. අවුරුදු 50ක් යනකම් වට්ටන්න බැහැ කිව්වා. හැබැයි, එහා පැත්තේ මොරවක් කෝරළේ සමුපකාරයේ බලය අවුරුදු තුනක් තමුන්නාන්සේලාට තිබුණේ. ඒකට මොකද වුණේ? ඒකේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නවයෙන් නවයම විපක්ෂයෙන් තේරී පත් වුණා. තමුන්නාන්සේ අරහේ බෙරිහන් දෙනවා, අවුරුදු 50ක් යනකම් වට්ටන්න බැහැ කියලා. මට තේරෙන්නේ නැහැ, ඔබතුමා කොහොමද එහෙම කියන්නේ කියලා. යට තට්ටුවේ වැඩේ

හරියටම යනවා. මොකද, යටින් ගහගෙන ගහගෙන යනවා. සමුපකාර ඔක්කෝම පරාදයි. තමුන්නාන්සේලා වෙනදා වාගේම බස් දමලා, ඔක්කෝම කරලා කට්ටිය ගෙනාවා. එහෙම ගෙනැල්ලා තමයි තමුන්නාන්සේලා මේ වැඩේ කළේ.

ඊළඟට කිව්වා, කඳුළු ගෑස් expire වෙලා කියලා පොලිස්පතිතුමා කියනවා කියලා. ඒකට උත්තරය එදා රූප්වාහිනී තිබෙද්දීම ටිල්වින් සිල්වා මහත්මයා කිව්වා. එතුමා කිව්වා, අපේ නාමල් කරුණාරත්න මැතිතුමා ඔක්කෝම ගොවීන් එකතු කරගෙන උද්ඝෝෂණය කෙරුවා, රත්න ගමගේ මැතිතුමා රටේම ධීවරයෝ එක්ක එකතු වෙලා ධීවරයින් පාරට බස්සලා උද්ඝෝෂණය කෙරුවා, ඊළඟට, ශිෂ්‍යයෝ ඔක්කෝම එකතු වෙලා පාරට බැහැලා උද්ඝෝෂණය කෙරුවා, කම්කරු පන්තියේ ඔක්කෝම එකතු වෙලා උද්ඝෝෂණය කෙරුවා කියලා. ඒ උද්ඝෝෂණ නිසා තමයි තමුන්නාන්සේලා බලයට ආවේ කියලා තමයි ඒ කිව්වේ. දැන් කවුරුවත් එහෙම උද්ඝෝෂණ කරන්නේ නැහැ. මොකද, තමුන්නාන්සේලා අද බලයේ ඉන්නේ. ඒ නිසා කඳුළු ගෑස් expire වෙනවා තමයි. මේ රට වැට්ටුවේ එහෙම උද්ඝෝෂණ කරලා, කරලා විනාශ කරලා තමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව වැදගත් කාරණයක් කියන්න කැමැතියි, මට තව විනාඩියක, දෙකක කාලයක් තිබෙන නිසා. අද තෙල් සංස්ථාවේ ඉන්න තමුන්නාන්සේලාගේ නිලධාරින් 2016 වසරේදී කරපු හොරකමකට අද තමුන්නාන්සේලාටම තමයි ගෙවන්න වෙලා තිබෙන්නේ. ඒගොල්ලන් තමුන්නාන්සේලාගේ ළඟම ගෝලයෝ. අද තමුන්නාන්සේලා ඒ අයව තමයි තියාගෙන ඉන්නේ. මේ ක්‍රියාවලිය සිද්ධ වෙන්නේ තෙල් සංස්ථාවේ ඉන්නා දෙදෙනෙක් නිසා. එක්කෙනෙක් සමන්ත ගුණවර්ධන මහතා. එතුමා 2016දී වාණිජ කළමනාකරු - Commercial Manager - විධියට කටයුතු කළේ. අනෙක් කෙනා මහේන්ද්‍ර ගරුසිංහ. එතුමාත් 1995 වසරේ ඉඳලා වාණිජ අංශයේ වැඩ කටයුතු කරලා ප්‍රශ්න ගණනාවක් ඇති වුණාට පසුව මේක දමා යන තැනට පත් වුණා. දැන් ආපසු තමුන්නාන්සේලා ඒ අය ගෙනැල්ලා තියාගෙන ඉන්නවා. මොකක්ද මේ වුණේ? මේක CR 16/2016 දරන ටෙන්ඩරය. Swiss Singapore Overseas Enterprises (Pvt.) Limited එකට තමයි මේක දුන්නේ. බොර තෙල් බැරලයක මිල ඇමෙරිකානු ඩොලර් 45.5 ලෙස තමයි තිබුණේ. මේක දෙන්න තිබුණේ 2016 සැප්තැම්බර් මාසයේ. හැබැයි, මොකක්ද වෙන්නේ? 2016 සැප්තැම්බර් මාසයේ මේක එනවා වෙනුවට 2016 ඔක්තෝබර් මාසයේ එනවා. 30වැනි දාට පෙර මේක ගෙනෙන්න කියලා තිබුණේ. එතකොට දින 4ක් තිබුණේ. හැබැයි, මේක ගෙන්වනකොට මොකද කළේ? Laycan date එක වෙනම දමනවා. එහෙම දමපු ගමන් මොකක්ද වෙන්නේ? Penalty එකක් ගහනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ penalty එකත් එක්ක ඇමෙරිකානු ඩොලර් මිලියන 41.5ක් අද තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට තමයි ගෙවන්න වෙලා තිබෙන්නේ. කවුද වැරැද්ද කර තිබෙන්නේ? තමුන්නාන්සේලා යනවා, මේක බේරුම්කරණයකට. බේරුම්කරණයේදී මේක ප්‍රතික්ෂේප වෙනවා. ඊට පසුව මේ Swiss Singapore Overseas Enterprises (Pvt.) Limited එක කෙළින්ම ගිහිල්ලා නඩුවක් දමනවා Commercial High Court එකේ. එතකොට මොකද වෙන්නේ? ඒකෙන් තීරණයක් එනවා, මේ මුදල ගෙවන්න කියලා. තමුන්නාන්සේලා ආරක්ෂා කරගෙන ඉන්නේ මේ අය. ඒ අය නිසා අද කාටද මේවාට ගෙවන්න වෙලා තිබෙන්නේ? අපේ සාමාන්‍ය මිනිසුන්ටයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩොලර් මිලියන 41ක් කියන්නේ අතිවිශාල මුදලක්. ඒ නිසා මම කියන්න කැමැතියි, තමුන්නාන්සේලා හොරකම්වලට විරුද්ධව වැඩ කරනවා නම්, ඒවාට විරුද්ධව අවශ්‍ය කරන පියවර ගන්නවා නම්, කරුණාකරලා මේ සම්බන්ධවත් පියවර ගන්න කියලා. ඒ අයට විරුද්ධව නඩු පවරන්න. ඒකට සල්ලි ගෙවන එක නොවෙයි කැබිනට් එක කරන්න තිබුණේ. ඔවුන්ට විරුද්ධව නඩු පවරන්න කටයුතු කරන්න කියන කාරණය මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඊළඟට, ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எம்.கே.எம். அஸ்லம் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. LAKSHMAN NIPUNA ARACHCHI left the Chair, and THE HON. M.K.M. ASLAM took the Chair.*

[අ.භා. 4.24]

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஜனக சேனாரத்ன)
(The Hon. (Dr.) Janaka Senarathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාර්ග ආරක්ෂාව සම්බන්ධව ඉතාම වැදගත් නීතියක් සම්මත කර ගැනීම සඳහා සාකච්ඡා කරන මේ වෙලාවේ ඒ මාතෘකාවට සෘජුවම අදාළ නොවුණත්, ඉතාම කෙටි කරුණු දෙකක් ඉදිරිපත් කරමින්ම මගේ කරුණු දැක්වීම කරන්න කැමැතියි.

අද දවසේ අදහස් දක්වපු විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා දිගින් දිගටම පටලවා ගත්තු එක කරුණක් මුලින්ම නිවැරදි කරන්න මම කැමැතියි. මොකද, දිගින් දිගටම ඔවුන් ඒ කාරණාව ගැන කියනවා. OPD එකෙන් බෙහෙත් ගන්නා ජනතාවගේ ප්‍රමාණය අඩු කිරීම සම්බන්ධව ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරපු කාරණාවක් ඔවුන් එක්කෝ වැරදි ලෙස අවබෝධ කරගෙන තිබෙනවා; එහෙම නැත්නම් කපටිකමින් එය පටලවන්න උත්සාහ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ රජයේ රෝහල්වල බාහිර රෝගී අංශයෙන්, එහෙම නැත්නම් OPD එකෙන් සාමාන්‍යයෙන් අවුරුද්දකට මිලියන 55ක් විතර පිරිසක් ප්‍රතිකාර ගන්නවා. ඒ වාගේම පෞද්ගලික අංශයෙන් - private sector එකෙන් - මිලියන 50ක විතර පිරිසක් ප්‍රතිකාර ගන්නවා. මේ දෙකේ එකතුව ගත්තාම, අවුරුද්දකට මිලියන 100කට වැඩි පිරිසක් ප්‍රතිකාර ලබා ගැනීම සිද්ධ වෙනවා. අපේ රටේ ජනගහනය මිලියන 22යි. ඒ කියන්නේ, අපේ රටේ ජනගහනයෙන් සෑම පුද්ගලයෙක්ම අවුරුද්දකට පස් වතාවක් විතර බාහිර රෝගී අංශයෙන් බෙහෙත් ගන්නවා. ගරු ජනාධිපතිතුමා පැහැදිලි කරපු දේ තමයි, අපේ රටේ සෞඛ්‍ය

[ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා]

පද්ධතිය විධිමත් system එකකට ගෙනැල්ලා, මෙසේ අනවශ්‍ය ලෙස බෙහෙත් ගන්න OPDsවලට එන එක වෙනුවට විධිමත් යොමු කිරීමක් සහිතව ප්‍රතිකාර ලබා ගැනීමේ ක්‍රමවේදයක් සඳහා ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථාන ඇති කිරීම ඇතුළු අපේ සෞඛ්‍ය පද්ධතියේ සිද්ධ වන දැවැන්ත වෙනසත් එක්ක විධිමත් ක්‍රමවේදයකට මේ රටේ සෞඛ්‍ය පද්ධතිය ගේන්න ඕනෑ කියන කාරණාව. මේ කාරණය ගරු විපක්ෂ මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙක්ම එක්කෝ පටලවාගෙන ඉන්නවා; එහෙම නැත්නම් පටලවන්න හදනවා.

කළුතර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමෙක් මේ මාර්ග ආරක්ෂාව පිළිබඳ කථා කරද්දි කිව්වා, ආණ්ඩුව ජනතාව චූන් කරනවා කියලා. කළුතර දිස්ත්‍රික්කයේ ඒ වටිනා කියන ගරු මන්ත්‍රීතුමාගේ දුවගේ නමට තිබුණු cut and bud කරපු වාහනයක්; නීති විරෝධී ලෙස ආනයනය කරපු වාහනයක් කළුතර දිස්ත්‍රික්කයේම දැනට මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරයෙකුගේ පුතෙකුට විකුණලා කරපු කෝටි ගණනක වංචාවක් සම්බන්ධව පරීක්ෂණයක් ගියා. ඉතින් එහෙම තමයි මාර්ග ආරක්ෂාව ඒගොල්ලන්ට අදාළ වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා දැන් අද දිනට අදාළ මාතෘකාවට එන්නම්. අපේ රටේ අවුරුද්දකට රථ වාහන අනතුරු 22,000ක් පමණ සිද්ධ වෙනවා. 2025 අවුරුද්දේ රථ වාහන අනතුරු 22,153ක් සිද්ධ වෙලා රටේ ජනතාව 2,732ක් මිය ගියා. මේ මිය යන ජනතාවගෙන් තුනෙන් එකක් විතරම පදිකයන්. ඒ කියන්නේ, 857ක් පදිකයන්. යතුරුපැදිකරුවන්, පාපැදිකරුවන් සහ පදිකයන්ගේ එකතුව තමයි එහි වැඩිපුර ප්‍රමාණයක් නියෝජනය කරන්නේ. පසුගිය අවුරුදු 5ක කාලය ගත්තොත්, 2020-2024 දක්වා මාර්ග අනතුරු 118,000කට වඩා සිද්ධ වෙලා තිබෙනවා. ඒවායෙන් මේ රටට ජීවිත 12,322ක් අහිමි වෙලා තිබෙනවා, 2020-2024 කාලයේ. ඒ කියන්නේ දළ වශයෙන් මාර්ග අනතුරු 23,000කට ආසන්න ප්‍රමාණයක් සිද්ධ වෙනවා; 2,500කගේ විතර ජීවිත වාර්ෂිකව අහිමි වෙනවා. මේ අහිමි වන ජීවිතවලින් වැඩි ප්‍රමාණයක් - තුනෙන් දෙකක් විතර - වයස අවුරුදු 45ට අඩු ජීවිත. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ජනගහන වක්‍රය බැලුවොත්, 2020 වෙද්දී, අපේ රටේ ජනගහනයෙන් අවුරුදු 14ට අඩු දරුවන් සියයට 24.6ක් හිටියා. නමුත්, 2050 වන විට අවුරුදු 14ට අඩු දරුවන් අපේ රටේ ජනගහනයෙන් සියයට 16.1ක් වෙනවා. ඒ වාගේම අවුරුදු 15ත් 64ත් අතර අය, ඒ කියන්නේ ශ්‍රම බලකාය සියයට 58.3ක් දක්වා අඩු වෙනවා. 2020දී සියයට 68ක් වෙච්ච ශ්‍රම බලකාය 2050 වෙද්දී සියයට 58.3ක් දක්වා අඩු වෙනවා. අපේ රටේ තරුණ ජීවිත තමයි මේ මාර්ග අනතුරුවලින් විශාල වශයෙන් අපේ රටට අහිමි වෙන්නේ.

ඒ වාගේම මේ අනතුරුවලින් සිදු වන ආර්ථික බලපෑම ගත්තොත්, දළ ජාතික නිෂ්පාදිතයෙන් - GDP එකෙන් - සියයට 3ත්, 5ත් අතර ප්‍රමාණයක් මාර්ග අනතුරු නිසා අපේ රටේ ආර්ථිකයට අහිමි වෙනවා. අධ්‍යාපනය සඳහා දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 2ක් හා සෞඛ්‍යයට සියයට 1.5ක් වාගේ වෙන් වෙනවා. එතකොට අධ්‍යාපනයටත්, සෞඛ්‍යයටත් දෙකටම යන වියදමට වඩා වැඩි ප්‍රමාණයක් මාර්ග අනතුරු නිසා අපේ රටේ ආර්ථිකයට අහිමි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි මේ කථා කරන seat belts පැලඳීම අනිවාර්ය කිරීම සම්බන්ධ කාරණාව ගත්තොත්, සාමාන්‍යයෙන් අනතුරකදී seat belts පැලඳ නොසිටියහොත් මරණයට පත්වීමේ හැකියාව තිබෙනවා. Seat belts පැලඳගෙන හිටියොත් ඒ අවදානම සියයට 50 සිට 70 දක්වා ප්‍රමාණයකින් අඩු වෙනවා කියලා පර්යේෂණවලින් සොයා ගෙන තිබෙනවා. ඒ කියන්නේ, seat belt එකක් දමාගෙන හිටියේ නැත්නම් මරණයට පත්වීමට තිබෙන හැකියාව, ඒ අවදානම seat belt එකක් දමාගෙන හිටියොත් සියයට 50 සිට 70 දක්වා ප්‍රමාණයකින් අඩු වෙනවා. ඒ නිසා මේක ඉතාම කාලීන, ඉතාම වැදගත් සංශෝධනයක් වෙනවා.

ඒ වාගේම, පසුගිය දශක කිහිපයේ අපේ රටේ ප්‍රවාහන සහ මහාමාර්ග ක්ෂේත්‍රය ආණ්ඩුවත් එක්ක කළු සම්බන්ධයක් තිබුණේ. ඒකට උදාහරණ ඕනෑ තරම් කියන්න පුළුවන් වුණත්, කාල වේලාව නැති නිසා උදාහරණ එකක්, දෙකක් කියන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරු මැද පළාත් සභාව COPA එකට කැඳවපු වෙලාවේදී හෙළි වුණා, ව්‍යාපෘති 741ක් යටතේ මාර්ග 53ක් ඉදි කිරීමේදී, ඉන් ව්‍යාපෘති 629ක් කිසිදු ටෙන්ඩර් පටිපාටියකින් තොරව තනි contractor කෙනෙකුට ලබා දුන්නා කියලා. කිලෝමීටරයක් ඉදි කිරීම සඳහා එවකට රුපියල් මිලියන 11ක වාගේ ඇස්තමේන්තුවක් තිබුණත්, ඒ අයට කිලෝමීටරයකට රුපියල් මිලියන 45 ගණනේ ගෙවලා තිබෙනවා. ඒ කියන්නේ, ඒ වාගේ හතරගුණයක් ගෙවලා තිබෙනවා. ඒ වාගේම, මධ්‍යම අධිවේගී මාර්ගය සඳහා කරපු feasibility study එකකදී රුපියල් බිලියන 1.8ක විතර වංචාවක් සිද්ධ වෙලා තිබෙනවා. අතීතයේ ඒ වාගේ දේවල් සිද්ධ වෙලා තිබියදී අපේ ආණ්ඩුව මාර්ග ආරක්ෂාව වෙනුවෙන් දැවැන්ත ක්‍රියාමාර්ගයක් අරගෙන තිබෙනවා. අපි ජාතික මාර්ග ආරක්ෂණ ක්‍රියාකාරී සැලැස්ම 2025-2026 - National Road Safety Action Plan 2025-2026 - ක්‍රියාත්මක කරන්න පටන් අරගෙන තිබෙනවා. Expressway එකේදී seat belts පැලඳීම අනිවාර්ය කිරීමේ නීතිය, speed limits පරීක්ෂා කිරීම සඳහා රුපියල් මිලියන 91ක වියදමකින් laser speed guns 30ක් ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම digital road accident data management system එකක් පටන් අරගෙන තිබෙනවා. ඒ වාගේම මහාමාර්ගවල භයානක තැන්, අනතුරුදායක තැන් ශක්තිමත් කිරීම සඳහා වැටවල් ඉදි කිරීමට මුදල් විශාල ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම, පොදු ප්‍රවාහනය - public transport - සම්බන්ධවත් ක්‍රියාමාර්ග විශාල ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. Driving licence එක පිළිබඳව, පොදු ප්‍රවාහනයේ යෙදෙන රියැදුරු මහත්වරුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව විටින් විට වැටලීම් කිරීම, පොදු ප්‍රවාහනයේ යෙදෙන රියැදුරන් සඳහා දැනුවත් කිරීම් සහ වැඩමුළු පැවැත්වීම, ඒ වාගේම පාසල් සම්බන්ධව School Road Safety Education ව්‍යාපෘතිය යටතේ “Take Care - Surakimu Magathota” කියලා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම ආදිය ශ්‍රී ලංකා පොලීසිය සම්බන්ධ වෙලා කරගෙන යනවා.

ඒ වාගේම ආයතන ගත්තාම, ආයතන ශක්තිමත් කරමින් අපි National Council for Road Safety, National Transport Safety Commission බවට පත් කරනවා. ඒ මඟින් වඩාත් විධිමත් ආයතන ව්‍යුහයක් මේ කටයුතු සඳහා ඇති කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මතක් කරන්න ඕනෑ මේ කාරණයත්. ඊයේ කැබිනට් තීරණවලදී එළිදැක්වුවා, "මාර්ග ආරක්ෂණ ජනාධිපති සම්මාන උළෙල 2026" සඳහා කැබිනට් අනුමැතිය හිමි වුණු බව. අපි ඒ තරම් තැනක් මාර්ග ආරක්ෂාව වෙනුවෙන්, අපේ රටේ ජීවිත වෙනුවෙන් ලබා දීලා තිබෙනවා.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.33]

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රිය අනතුරු වළක්වා ගැනීම සඳහා මගී සේවාවල, පාසල්, කාර්යාල සහ කුලී සේවා වාහනවල ධාවන යෝග්‍යතාව පරීක්ෂා කිරීම වාගේම, අධිවේගී මාර්ගවල යන වාහනවල ආසන පටි අනිවාර්ය කිරීම සම්බන්ධයෙන් මෝටර් වාහන පනත යටතේ නියෝග දෙකක් ගෙනත් තිබෙනවා. ඒවාට විරුද්ධ වෙන්න කාටවත් අවශ්‍යතාවක් නැහැ. ඒවා සිදු විය යුතු දේවල්. අපි දන්නවා කොච්චර මාර්ග අනතුරු සිද්ධ වෙනවාද, අධිවේගී මාර්ගයේ කොච්චර අනතුරු සිද්ධ වෙනවාද, පාසල් ළමුන් ප්‍රවාහනය කිරීමේදී, කුලී රථවලින් කොච්චර අනතුරු සිද්ධ වෙනවාද කියලා. ඒ නිසා අපට මේ සම්බන්ධයෙන් විශේෂයෙන් විරුද්ධ වෙන්න දෙයක් නැහැ. තවත් කල් ගන්නේ නැතිව අවුරුදු දෙකකට පස්සේ හරි මෙවැනි නියෝග ගෙන ඒම ගැන මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙන්නට කැමැතියි. මොකද, මේ ආණ්ඩුවට වැඩ කරන්න ගොඩක් කාලය යනවා නේ. ඒ කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් මීට වඩා කියන්න දෙයක් නැහැ, හොඳයි කියලා ස්තුතිවන්ත වෙනවා.

මේ අවස්ථාවේ කථා කළ යුතු තව දේවල් තිබෙනවා. සාමාන්‍යයෙන් මම මාතෘකාවෙන් පිට කථා කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදේ කරපු කථාවලදී මගේ අවධානය යොමු වුණු කාරණයක් තිබුණා. ඒ තමයි, පොදු රාජ්‍ය මණ්ඩලයේ නීතිඥ සංගමය ගැන. දැන් ඒක විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා ලංකාවටම. ස්ටීවන් තිරු මහත්මයා ඇවිල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයේ තිබුණු නඩුව නැරඹුවා. ඊට පස්සේ ඒ ගැන යම්කිසි අදහසක් ඉදිරිපත් කළා. එතුමා රටේ දේශපාලන නායකයන් හම්බ වුණා, නිලධාරින් හම්බ වුණා. අධිකරණ ඇමතිතුමාව හම්බ වෙන්න ඇහුවාම ඒකට ඉඩ දුන්නේ නැහැයි කියන එක තමයි ප්‍රශ්නය වුණේ. අද උදේ ඒක ඇහුවාම දීපු උත්තරය තමයි, "මොකක්ද එයාලට තිබෙන ලියාපදිංචිය, කවුද එයාලා ගණන් ගන්නේ?" වාගේ එකක්. ඒ අස්සේ චූට්ටක් හොඳත් කිව්වා ඒක ෂේප් කර ගන්න. මට ඒක ගැන පුදුමයක් නැහැ. මොකද, පිට රට මිනිස්සු ඇවිල්ලා කොහොම හම්බ වෙන්නද? පිට රට මිනිස්සු හම්බ වෙනවා තියා, ශ්‍රී ලංකා නීතිඥ සංගමයට හම්බ වෙන්න තිබුණු අමාරුව අපි දන්නවා නේ. ඒ නිසා මේ මනුස්සයාට ඇවිල්ලා හම්බ වෙන්න අවස්ථාව දුන්නා නම් තමයි පුදුමය.

ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් ගොනු කරලා තිබෙන පෙත්සම අරගෙන කාට හරි කියවන්න පුළුවන් නම් පුදුම වෙන එකක් නැහැ. මොකද, අවස්ථා 7කදීම අධිකරණ ඇමතිවරයා සහ ජනාධිපතිවරයා හම්බ වෙන්න වැන්දේ නැති එක විතරයි නොකළේ.

2026.03.30වෙනි දා තමයි පළමුවෙන්ම අධිකරණ ඇමතිවරයාට ලිපියක් යවලා ඇහුවේ, මෙහෙම කසුකුසුවක් තිබෙනවා, ඒක ඇත්තද කියලා. උත්තර දුන්නාද? නැත, උත්තර නැත. දෙවනුව 2026.04.09වෙනි දා ජනාධිපති ලේකම්ට සහ අධිකරණ ඇමතිවරයාට නැවත ලිපියක් යවලා ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා නීති වෘත්තිය සහ අධිකරණ පද්ධතියේ සංවර්ධනය පිළිබඳව සාකච්ඡාවක් දෙන්න කියලා. දුන්නාද? නැත, දුන්නේ නැත. ඊළඟට තුන්වෙනුව 2026.06.30වෙනි දා නැවත ලිපියක් යවලා කියනවා අධිකරණ පද්ධතියේ තිබෙන පුරප්පාඩු පුරවන්න අවශ්‍යයි සහ මේ ප්‍රශ්න ගැන කථා කරන්න අවස්ථාවක් දෙන්න කියලා. දුන්නාද? දුන්නේ නැහැ. ඊළඟට, 2026.07.16වෙනි දා මේ සම්බන්ධයෙන් සාකච්ඡාවක් ඉල්ලලා අධිකරණ ඇමතිවරයාගෙන් ආයෙත් වේලාවක් ඉල්ලනවා, ශ්‍රී ලංකා නීතිඥ සංගමය. දුන්නාද? දුන්නේ නැත. ඊළඟට, 2026.07.29වෙනි දා නීතිඥ සංගමයේ මහා සභා රැස්වීම කැඳවලා මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරපු දා හවස අධිකරණ ඇමතිවරයා කියනවා ඇවිල්ලා හම්බ වෙන්න කියලා. ඒ වෙනකොට මාස හතරක් විතර ගිහිල්ලා. එතකොට වෙලාව දෙනවා.

ඊළඟට, එදා අධිකරණ ඇමතිතුමා හම්බ වෙන්න වේලාව දුන්නාම ජනාධිපතිවරයා සමඟ සාකච්ඡාවක් දෙන්න කියලාත් ඉල්ලුවා. හැබැයි දුන්නාද? දුන්නේ නැත. ඊළඟට, 2026.08.12වෙනි දා උදේ නීතිඥ සංගමයෙන් නිවේදනයක් නිකුත් කරනවා මේ කාරණයට අපි සම්පූර්ණයෙන් විරුද්ධයි කියලා. අන්න එදා හවස ජනාධිපතිතුමා සාකච්ඡාවක් දෙනවා. මෙච්චර මහන්සි වුණා නම් මේ රටේ නීතිඥ සංගමයේ මිනිස්සුන්ට එතුමන්ලා හම්බ වෙන්න, ස්ටීවන් තිරු කොහොම හම්බ වෙන්නද? දෙන්නේ නැහැ තමයි. දුන්නා නම් තමයි පුදුමය. අපට තේරෙනවා දෙන්නේ නැති හේතුව.

ඒ වාගේම ශ්‍රී ලංකා නීතිඥ සංගමයට ඩීල්කාරයෝ කියලා බැන්නා. අම්මෝ, මේ සභාවේදී මොනවාද නොකිව්වේ? එතුමාට මහ ඇමති අපේක්ෂකකම දෙනවා කිව්වා. එහෙම කිව්ව මන්ත්‍රීතුමා දැන් පේන්නවත් නැහැ. මුළු ලංකාවෙන්ම ඒකට විරෝධය එල්ල වුණා. ඒ බැන්නේ ශ්‍රී ලංකා නීතිඥ සංගමයට. අද පොදු රාජ්‍ය මණ්ඩලයේ නීතිඥ සංගමය ගැන කිව්වේ ඒක fee-paying club එකක් කියලා. ඒක fee-paying club එකක් කියලා අධිකරණ ඇමතිවරයා ගියා. ගාස්තු ගෙවලා ඉන්න සිංහ සමාජයක් වාගේ කියලාත් වටගල ඇමතිතුමා කියනවා මම දැක්කා. ශ්‍රී ලංකා නීතිඥ සංගමයටත් අපි ගාස්තුවක් ගෙවනවා. එතුමා නීතිඥ සංගමයේ සාමාජිකයෙක් නොවෙනවා ඇති, මම දන්නේ නැහැ. එහෙම නොවන අය ආණ්ඩු පක්ෂයේ ඉන්නවා කියලා දැන් ආරංචියි. මම අහපුවාම දෙතුන් දෙනෙක් කිව්වා, "නැහැ නැහැ අපි නම් ඒ සංගමයේ සාමාජිකයෝ නොවෙයි" කියලා. දැන් ඒ ගාණට ඇවිල්ලා, තමන්ගේ සංගමයත් අත හැරලා දාලා කඩේ යන ගාණට ඇවිල්ලා තිබෙනවා. ඒවා ගැන අපි දන්නේ නැහැ. හැබැයි ගොඩක් ඒවා fee-paying clubs තමයි. ඒ වාගේම ආණ්ඩුව එක්ක සම්බන්ධයක් නැහැ. ඒවා සාමාන්‍යයෙන් ආණ්ඩුව එක්ක සම්බන්ධ වෙන ආයතන නොවෙයි. ඒක දුර්වලතාවක් නොවෙයි. ඒක තමයි ඒ ආයතනවල තිබෙන වටිනාකම. ආණ්ඩුවකට සම්බන්ධ වුණා නම් තමයි දේශපාලන වශයෙන් යම් කිසි ප්‍රශ්නයක් වෙන්නේ. ඒ ආයතන එහෙම සම්බන්ධතාවක් නැහැ. එහෙම දුර්වලතාවක් දකින්න ලැබෙන්නේ නැහැ. සාමාන්‍යයෙන් මානව හිමිකම් සංවිධාන තිබෙනවා. ඒවාත් ඒ වාගේම තමයි කියලා අපි දන්නවා.

මේ සංගමය පොදුරාජ්‍ය මණ්ඩලයීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචිද කිය කියා ඇහුවා. මේ වෙනකනුත් කිව්වා. මා ළඟ තිබෙනවා, "The Contribution of Commonwealth-Accredited Organizations to Advancing the Commonwealth Charter" යනුවෙන් සඳහන් වෙන, 2023 වසරට අදාළව පොදු රාජ්‍ය මණ්ඩලයීය ලේකම් කාර්යාලය නිකුත් කරපු වාර්තාව. මෙම වාර්තාව මා **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා]

මේ වාර්තාව ගරු අධිකරණ ඇමතිතුමාටත්, අපේ නීතිඥ සුනිල් වටගල මැතිතුමාටත්, අපේ අනෙක් නීතිඥ මහත්වරුන්ටත් බලා ගන්න පුළුවන්. මේකේ ඇමුණුම 1හි - Appendix 1හි - මොකක්ද තිබෙන්නේ? Commonwealth-accredited organizations ලැයිස්තුව තිබෙනවා, Commonwealth Charter Clausesවලට අනුව. මොකක්ද මේ "accredited" කියන්නේ කියලා මම බැලුවා. "Accredited" කියන වචනය "ඔක්ස්ෆර්ඩ්" ඉංග්‍රීසි ශබ්දකෝෂය නිර්වචනය කර තිබෙන්නේ, "Officially recognized as something; with official permission to be something" ලෙසයි. ඒ කියන්නේ, එය නිල වශයෙන් පිළිගන්නා ලද සංගමයක් විධියට මේකේ සඳහන්ව කියනවා.

ඊළඟට, පොදු රාජ්‍ය මණ්ඩලයීය ප්‍රඥප්ති වගන්ති 16ක් තිබෙනවා. මේ ප්‍රඥප්ති වගන්ති 16ම මම සහාගත කළා. මේ ප්‍රඥප්ති වගන්ති 16 එකින් එකට, එකින් එකට තමන්ගේ accredited organizations ටික list කරලා තිබෙනවා. මේ ප්‍රඥප්ති වගන්ති දහසයේ මුලින්ම තිබෙන්නේ Commonwealth Lawyers Association එක. හැම එකේම මේ ප්‍රඥප්ති වගන්ති 16ම නැහැ. නමුත්, හැම එකේම උඩින්ම තිබෙනවා, Commonwealth Lawyers Association එක. මේක පොදු රාජ්‍ය මණ්ඩලය ඉතාම පැහැදිලි ලෙස, නිල වශයෙන් පිළිගෙන තිබෙන සංගමයක් ලෙස මේකෙන් බලාගන්න පුළුවන්. මේ, කට කහනවාට කියනවා නොවෙයි. මේ ගැන කියපු අය මේ වෙලාවේ එක්කෙනෙක්වත් නැහැ. කාට මේවා කියන්නද කියලා මට තේරෙන්නේ නැහැ. මේක බලයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

වෙලාව යන නිසා මම තව එකක්, දෙකක් කියන්නම්. මේ "Democracy" කියන Charter Clause එකේ මුලින්ම තිබෙන්නේ Commonwealth Lawyers Association එක. "Human Rights" කියන Chater Clause එක යටතේත් මුලින්ම තිබෙන්නේ, Commonwealth Lawyers Association එක. තවත් 90 ගණනක් තිබෙනවා. මේ හැම එකකම පළමුවෙනියට තිබෙන්නේ Commonwealth Lawyers Association එක. "International Peace and Security", "Freedom of Expression", "Good Governance", "Protecting the Environment" කියන Charter Clausesවලත් මුලින්ම සඳහන් වෙනවා මේ Commonwealth Lawyers Association එක. මොකද, ඒ තරමට මේක සම්බන්ධිතයි. ඊළඟට, "Gender Equality" කියන Charter Clause එකෙත් මුලින්ම Commonwealth Lawyers Association එක තිබෙනවා. ඒක නිසා කරුණාකරලා මේක බලන්න කියලා මම ඉල්ලා සිටිනවා, එක එක දේවල් කියන්න කලින්. මොකද, එහේ මෙහේ යන fee-paying club එකක් කියලා නේ කිව්වේ. ඉතින්, එහෙම කියලා බේරෙන්න පුළුවන් නම් ඉතාම හොඳයි.

දැන් උපුල් ජයසූරිය මහත්මයා ගැන කියනවා. එතුමා තමයිලු ඒකේ මෙහේ නියෝජිතයා. මට තේරෙන්නේ නැහැ, 1955 දක්වා ඈතට දිවෙනවා, මේ සංගමය. 1986දී නිල වශයෙන් ආරම්භ කළාට, conferences පවත්වමින් 1955 දක්වා ඈතට ගිය සංගමයක්, මේක. උපුල් ජයසූරිය මහත්මයා, මේකේ නිල නියෝජිතයා කියලා කියන්නේ මොකක්ද? මේ website එකට ගිහිල්ලා බැලුවොත්, ශ්‍රී ලංකා නීතිඥ සංගමය ආයතනික සහකරුවෙක් කියලා logo එකත් එක්කම ඉතා පැහැදිලිව තිබෙනවා. ඇයි, මේ උපුල් ජයසූරිය මහත්මයා ගැන මෙහෙම කියන්නේ? මම කියන්නම්, හේතුව. නැට්ට පාගා ගෙන මේ දඟලන්නේ. 2015දී උපුල් ජයසූරිය මහත්මයා සභාපති වෙලා සිටියදී උපුල් ජයසූරිය මහත්මයාට පොදු රාජ්‍ය මණ්ඩලයීය නීතිඥ සංගමයෙන් සම්මානයක් ලබා දුන්නා. ඒක උපුල් ජයසූරිය මහත්මයාට දුන්නේ. නැත්නම් ශ්‍රී ලංකා නීතිඥ සංගමය සම්බන්ධයෙන් නොවෙයි. ඒ දුන්නේ නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කිරීම සහ අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන්. අදත් ඒගොල්ලන් අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන් තමයි මේ පෙනී ඉන්නේ. ඒ නිසා ඒ ගැන ආයෙත් කථා කරලා වැඩක් නැහැ. මේක පිළිගත් ආයතනයක් බව පැහැදිලියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොඳට බැලුවොත් පෙනේවි, මේ ලැයිස්තුවේ පහළට පහළට යද්දී තවත් තිබෙනවා, අපිට හොඳට දැකලා පුරුදු ආයතනයක්. ඒක තමයි Commonwealth Parliamentary Association එක. CPA කියලා කියන්නේ. ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියලා අහලා තිබෙනවාද? මේ, පාර්ලිමේන්තුව බොහොම එකතු වෙලා වැඩ කරන ආයතනයක්. CPA කියලා, විවිධ වැඩසටහන්වලට රටත් යනවා. පාර්ලිමේන්තුව CPA එකේ member කෙනෙක්. අපි CPA එකේ ඉන්නවා fee එකක් ගෙවලා. හරි නම් මන්ත්‍රීවරුනුත් රුපියල් 15කද කොහෙද fee එකක් ගෙවන්න ඕනෑ. එතකොට අපිත් fee-paying club එකක් ද? දැන් මේ Commonwealth Parliamentary Association එකත් එක්ක ඔබතුමන්ලාට දීග කන්න හොඳයි නම්, මේ උඩම තිබෙන Commonwealth Lawyers Association එක හොඳ නැති වෙන්නේ කොහොමද? මට ඒක තේරෙන්නේ නැහැ. මම මේ කාරණයත් කියන්න ඕනෑ. පසුගිය 2025 මාර්තු මාසයේ Mr. Fraser McIntosh, Programme Manager, Commonwealth Parliamentary Association ඇවිල්ලා ගරු කථානායකතුමාව හමුවුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමාව හමුවුණා, අපේ ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියව හමුවුණා. හොඳම වැඩේ මේකයි. අද උදේ Commonwealth Lawyers Association එක හෝදපු දෙන්නා, කවුද, ඒ දෙන්නා? The Hon. Leader of the House of Parliament and Minister Bimal Rathnayake. ඊළඟට, the Hon. Minister of Justice and National Integration Harshana Nanayakkara. මේගොල්ලෝ එක්ක කොහොමද, කථා-බහ කරගෙන වැඩ කරන්නේ? "ඔබතුමන්ලා ලියාපදිංචි වෙලාද?" කියලා අහලා, "යන්න, අපට හම්බවෙන්න අවශ්‍ය නැහැ" කියලා කියන්න තිබුණා නේ. එහෙම කිව්වේ නැහැ නේ. ඒගොල්ලෝ හම්බවුණා නේ. මම තව ටිකක් බැලුවා. ගිය අවුරුද්දේ හර්ෂණ ඇමතිතුමා එංගලන්තයටත් ගිහිල්ලා Commonwealth Parliamentary Association එකේ අයව හම්බ වෙලා තිබෙනවා. මේ, ලස්සනට ෆෝටෝ ගහලාත් තිබෙන්නේ. මම ඒ ඡායාරූපත් මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

ඒක විතරක් හොඳ වෙන්නයි, මේක නරක වෙන්නයි බැහැ නේ. කන්න ඕනෑ වෙලාවට කබරගොයා තලගොයා කර ගන්න එපා. අවශ්‍යතාව තිබෙනවා නම්, ඒක කරන්න අවශ්‍යයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක නිසා මම කියන්න ඕනෑ, හෙට වෙනකොට -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මට තව පොඩි වේලාවක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

Commonwealth Parliamentary Association එකේ වැඩකට මෙතැන ඉන්න මන්ත්‍රීවරු 5දෙනෙක් හෙට දකුණු අප්‍රිකාවට යනවා. එහෙම නම් ඉතින් "බැහැ" කියන්නකෝ. බැහැ කියලා ගෙදර ඉන්න, යන්න එපා. ඒ අය හෙට යනවා. එහෙම කොහොමද කරන්නේ? ඒක අපේ Commonwealth Lawyers Association

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

එකටත් වඩා පහළින් දක්වලා තිබෙන එකක්. ඒක නිසා, ලියාපදිංචිය, අරවා මේවා නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පණිවුඩකරුට - messengerට - වෙඩි තියන්න එපා කියලා කියනවා නේ. ලියාපදිංචිද, නැද්ද කියන එක නොවෙයි. නීතිඥ සංගමය කියන්නේ මොකක්ද? මහානායක හිමිවරු මොකක්ද කිව්වේ? අපි මොකක්ද කියන්නේ? ශ්‍රී ලංකා නීතිඥ සංගමය මොකක්ද කියන්නේ? ඒක අහන එකයි වැදගත්කම. ඒක නිසා ලියාපදිංචිද, නැද්ද කියන එක නොවෙයි. අපි කියන message එක මොකක්ද කියන එකයි බලන්නට තිබෙන්නේ. ලබන නොවැම්බර්වල පොදුරාජ්‍ය මණ්ඩලයීය රාජ්‍ය නායකයින්ගේ සමුළුවක් ඇන්ටිගුවාවල තිබෙනවා. ජනාධිපතිතුමාත් ඒකට යනවා. පොදුරාජ්‍ය මණ්ඩලයීය නීතිඥ සංගමයට නිල වශයෙන් ආරාධනාවක් ලැබී තිබෙනවා. ජනාධිපතිතුමාට කියන්න, "අනේ please!, ඔබතුමන්ලා ලියාපදිංචි වෙලා නැහැ, ඒ නිසා අපට නම් බැහැ" කියලා හැරිලා එන්න කියලා. කවුරුවත් හම්බ වෙන්න එපා කියලා කියන්න.

ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.45]

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වැදගත් නියෝග දෙකක් සම්මත කර ගැනීමට පාර්ලිමේන්තුවේ විවාදයක් පැවැත්වෙන දවසක්. අපි දන්නවා, මාර්ග අනතුරු නිසා දළ වශයෙන් දිනකට මරණ 6ක්, 7ක් වාගේ ප්‍රමාණයක් සිද්ධ වෙන බව. අපි වාර්ෂිකව ගත්තොත්, රිය අනතුරු නිසා මරණ 2,500ක්, 3,000ක් වාගේ ප්‍රමාණයක් සිද්ධ වෙනවා. මාර්ග අනතුරු නිසා අපට සිදු වන ජීවිත හානි ප්‍රමාණය පැත්තකින් තැබුවත්, සිදු වන damages, රෝගාතුරවීම් සහ ආබාධවීම් ගත්තොත්, දළ වශයෙන් වර්ෂයකට 25,000ක් වාගේ ප්‍රමාණයක් සිද්ධ වෙනවා. කනගාටුවට කරුණ නම්, ඒ හැම ආබාධයට ලක් වීමක්ම, ඒ හැම මරණයක්ම අපට පොඩි පොඩි දේවල්වලින් වළක්වාගත හැකිව තිබූ සිදුවීම්. එම නිසා මෙච්චර කාලයක් සම්මත නොවී තිබුණු, මෙච්චර කාලයක් අවධානය යොමු නොවී තිබුණු මේ ක්ෂේත්‍රය කෙරෙහි අපේ අවධානය යොමු කරලා අමාත්‍යාංශය විධියට ඇමතිතුමාගේ නිර්දේශය සහ direction ඇතිව මෙම නියෝග සම්මත කර ගැනීමට අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. මේ පිළිබඳ සාකච්ඡාව මතු වෙලා, ඇත්තටම මෙම නියෝග ගැන මුල් පැය කිහිපය තුළ කථා වුණාට, වැඩි හරියක්ම සාකච්ඡාවට ලක් වුණේ අමාත්‍යාංශය හරහා ඉදිරියට ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබෙන දැවැන්ත ව්‍යාපෘති පිළිබඳවයි. ඒවායේ දෝෂ කිහිපයක් විවේචනයට ලක් වුණා. ඊට පරිබාහිරව විවේචන විශාල ප්‍රමාණයක් මේ සභාවේ සාකච්ඡාවට ලක් වුණා. ඉතින්, මගේ වගකීම තමයි, මෙම නියෝගවල වගකීම ගැන මුල් පැය කිහිපය තුළ කථා කළා වාගේම, අනෙක් පැත්තෙන් නැඟුණු යෝජනා සහ චෝදනාවලට මගේ පිළිතුරු කථාව තුළ පිළිතුරු ලබා දීම. ඒ අනුව මම මගේ කථාව කරගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැවැන්ත ප්‍රාග්ධන මුදල් ප්‍රමාණයක් වැය කරලා ඉදිරි වර්ෂ තුන ඇතුළත ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කිරීමට නියමිතයි. සමහර ඒවා අපි දැනටත් පටන් අරගෙන තිබෙනවා. කවදාවත් නොකළ විධියට ලංකාවේ මුදල්වලින් - රුපියල්වලින් - ලංකාවේ කොන්ත්‍රාත්කරුවන් ලවා වැඩි ව්‍යාපෘති ප්‍රමාණයක ඉදිකිරීම් අපි පටන් අරගෙන තිබෙනවා. මේ සම්බන්ධයෙනුත් විවේචන විශාල ප්‍රමාණයක් ආවා. ඒ මුදල් ආවේ කොහෙන්ද, මුල්ගල් තැබීම් විතරද, ඒවා පැළවෙන මුල්ගල්ද වාගේ චෝදනාත් ආවා. හැබැයි, අපි ඒක කළේ කෙසේද කියලා අධ්‍යයනය කරගන්න පුළුවන්, - අපට 2025 අවුරුද්දත් තිබුණා - අපි රාජ්‍ය මූල්‍යය කළමනාකරණය කළේ කොහොමද, ඉතිරි කර ගත් මුදල් ප්‍රාග්ධන වියදම් විධියට දැවැන්ත ව්‍යාපෘති සඳහා යොමු කළේ කෙසේද කියන එක පිළිබඳව දළ අවබෝධයක් හදා ගත්තොත්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 අවුරුද්ද අපි ඉවර කරනවා, ලංකාවේ මෑත ඉතිහාසයේ වැඩිම රාජ්‍ය ආදායම ලබා ගත් අවුරුද්ද විධියට. ඒ වාගේම අපි දන්නවා, අවුරුද්ද අන්තිමට අය වැය ලේඛනය ඉදිරිපත් වෙනකොට හැමදාම ලොකු අය වැය පරතරයක් තිබෙන බව; ආදායම අඩුයි, වියදම ගොඩක් වැඩියි. නමුත් අපට පුළුවන් වුණා, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3ක් වෙච්ච, 1956න් පස්සේ වාර්තා වෙච්ච අඩුම ආදායම්-වියදම් පරතරය සහිතව 2025 අවුරුද්ද අවසන් කරන්න. එතකොට අපට යම් කිසි රුපියල් ප්‍රමාණයක් ඉතුරු වෙලාත් තිබෙනවා. අපි ඒක සැහෙන කාලයක් තිස්සේ කිව්වා. හැබැයි, ඒක කියලා විතරක් හරියන්නේ නැහැ. අපට තිබෙනවා, අභියෝගයක්. 2025 අවුරුද්ද අපි සාර්ථක කර ගත්තේ යම්සේද, ඊට වඩා වැඩි සාර්ථකත්වයක් මේ අවුරුද්ද තුළ අපි ඇති කර ගන්න ඕනෑ. අපි ඒක කරලා තිබෙන්නේ කොහොමද? දැන් අපට තව මාස හයක් ඉතිරිව තිබෙනවා. ඒ ඉතිරි මාස හය තුළ අපි ගිය අවුරුද්දේ මාස හයත් එක්ක සංසන්දනය කරලා බලන්න ඕනෑ මොකද වෙලා තිබෙන්නේ කියලා. ගිය අවුරුද්දේ මාස හයේ තිබුණාට වඩා අපි දළ වශයෙන් රාජ්‍ය ආදායම් සහ ප්‍රදාන වැඩි කරගෙන තිබෙනවා, සියයට 27කට වැඩි ප්‍රමාණයකින්. රාජ්‍ය වියදම සහ ශුද්ධ ණය දීම් වැඩි වෙලා තිබෙන්නේ සියයට 7.9ක වාගේ ප්‍රමාණයකින්. එතකොට පැහැදිලි වනවා, ගිය අවුරුද්දට සාපේක්ෂව මේ අවුරුද්දේ වැඩි ආදායමක් උත්පාදනය වෙලා තිබෙනවාය කියලා. මෑත ඉතිහාසයේ සාර්ථකම වෙච්ච 2025 අවුරුද්දේත් පළමුවැනි මාස හය තුළ - ජනවාරි සිට ජූනි දක්වා - අපට තිබුණේ රුපියල් බිලියන 405.6ක පාඩුවක්. වියදම වැඩියි, ආදායම අඩුයි. හැබැයි, මේ අවුරුද්දේ පළමුවැනි මාස හය වනකොට ඒ පාඩුව රුපියල් බිලියන 9.5ක අතිරික්තයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. ඉතිහාසයේම එහෙම දෙයක් වෙලා තිබුණේ නැහැ. මේ තමයි අපේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය. අපි දන්නවා, මේකට නොයෙක් කතන්දර කියන්න පුළුවන් බව. පළමුවැනි කාර්තුව තුළ ප්‍රාග්ධන වියදම් සිද්ධ වෙලා නැහැ, එහෙම වෙන්නේ ඒ නිසාය කියලා කියන්න පුළුළුන්. හැබැයි අපි දන්නවා, ඕනෑම project එකකදී පළමුවැනි මාස හය තුළ ප්‍රසම්පාදන කටයුතුවල නිරත වන බව. එතකොට මුදල් වෙන් කරන්නේ ඉදිරි මාස කිහිපය ඇතුළත, අන්තිම මාස හයේදී තමයි වැඩි ප්‍රගතියක් අත් කර දෙන්නේ. ඒ නිසා මේවා සාධනීය කාරණා නොවෙයි; සාධනීය තර්ක නොවෙයි. ඉලක්කම් සහිතව අපි පෙන්වා තිබෙනවා, රාජ්‍ය මුදල් කළමනාකරණය තුළ ලංකාවේ රුපියල් ආර්ථිකය ගොඩනහා ගන්නේ කෙසේද, ඒ ගොඩනහා ගන්නා රුපියල් ආර්ථිකය තුළ ඒ මුදල් ප්‍රාග්ධන වියදම් වශයෙන් බිම් මට්ටමට වෙන් කරන්නේ කෙසේද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැවැන්ත ලෙස ආර්ථිකය විතරක් නොවෙයි, පොඩි පොඩි ආයතනත් profits ලබා ගන්නා තත්ත්වයට අපි පත් කරලා තිබෙනවා. ලංගමය ගත්තොත්, කොච්චර චෝදනා තිබෙනවාද, පාඩු ලබන ආයතනයක්ය කියලා. ලංකාව පුරා ඩිපෝ 107ක් විහිදිලා තිබෙනවා, ප්‍රාදේශික 12ක් තුළ. මාස තුනකට කලින්, ඒ ඩිපෝ 107න් 63කට තමන්ගේ

[ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා]

සේවකයින්ට වැටුප් ගෙවා ගැනීමට නොහැකිවයි තිබුණේ. ඒ ඩිපෝ 63ටම නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයෙන් මුදල් යවන්න ඕනෑ. ඒ, මීට මාස තුනකට කලින්. හැබැයි, මාස දෙකක් යනකොට අපි ඒ ඩිපෝ සංඛ්‍යාව 13කට බැස්සුවා. මේ මාසය වනකොට ඩිපෝ 4කට විතරයි අපි මුදල් දෙන්න ඕනෑ, පඩි නඩි ගෙවා ගන්න. අනෙක් ඔක්කෝම profitable; ලාභයි. මේ විධියට පොඩි පොඩි ආයතන පවා අපි දැන් උඩට අරගෙන තිබෙනවා. ඒ කාරණය අද මට කිව්වේ ප්‍රධාන විධායක නිලධාරියෙක්, ඇස් දෙකේ කඳුළු පුරවාගෙන, මේ corridor එකේ යනකොට. මම හිතන විධියට එතුමා ඉන්නවා, Officials' Box එකේ. අපි පොඩි පොඩි ආයතනත් ගොඩ දමා තිබෙනවා. අද වනකොට පාඩු ලබන්නේ ඩිපෝ 4යි. ඒක තමයි අපේ කළමනාකරණය.

දැන් කොච්චර චෝදනා තිබෙනවාද, මෙට්‍රෝ බස් රථ සම්බන්ධව? අපට කිව්වේ, මෙට්‍රෝ බස් රථ ධාවනය කරන එක පාඩුයි කියලායි. නමුත් මෙට්‍රෝ බස් රථ ධාවනයෙන් මේ වනකොටත් අපි ලාභ ලබනවා. මීටත් වඩා ලාභ ලබන්න පුළුවන්. හැබැයි, අපි ඒක සූක්ෂ්මව අරගෙන යන්නේ, ළමයෙක් හදනවා වාගේ. එක පාරට හැම bus halt එකකම නවත්වා, හැම bus way එකකම ධාවනය කරලා, overload කරගෙන, අපි ඒක අනාගන්නේ නැහැ. අපි ඒක කරගෙන යන්නේ සූක්ෂ්මව. දැනුත් ඒක ලාභ ලබනවා.

තවත් චෝදනාවක් තිබෙනවා, මෙට්‍රෝ බස් රථ ආනයනය සම්බන්ධයෙන්. ඒ, පළමුව ආනයනය කළ බස් රථ 10 සහ ඊට පසු ආනයනය කළ බස් රථ 100 සම්බන්ධව මූල්‍යමය වටිනාකම අතර වෙනසක් තිබෙනවාය කියලා. ඒක ඉතින් එළියෙන් බලලා, එකෙක් පාත්තයෙක්, එකෙක් තාරාවෙක් කියනවා වාගේ කථාවක්. එහෙම එළියෙන් බලලා බස්වල තත්ත්වය තෝරාගන්න අමාරුයි. පොඩ්ඩක් මොළය කල්පනා කරන්න ඕනෑ. එකම වර්ගයේ ටොයෝටා කාර් එකක් වුණත් options වෙනස් වනකොට ගණන වෙනස් වනවා. මේකත් එහෙම තමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා ඒ ගැන ඉලක්කම් එක්ක පොඩ්ඩක් කියන්න ඕනෑ, නැත්නම් ඒක අනාගන්නා නිසා.

පළමුවැනි බස් රථ 10 ගත්තොත්, ඒවා අපි ආනයනය කරන්නේ Clean Sri Lanka ව්‍යාපෘතිය යටතේ. ඒ වර්ගය - model එක - BJ6329. බස් රථ 100හි model එක BJ6323. Model එක වෙනස්. ඊළඟට, පළමුවැනි බස් රථ 10හි bidding date එක 2025.07.23වැනි දා. බස් රථ 100හි bidding date එක 2025.10.17වැනි දා. මම දිනය කිව්වේ මොකද, එතකොට ඩොලරයේ අගයත් වෙනස් නිසා. මම කියපු දවසේ පළමු බස් රථ 10 ආනයනය කරනකොට ඩොලරයේ අගය රුපියල් 305.51යි. බස් රථ 100 ආනයනය කරනකොට ඩොලරයේ අගය රුපියල් 306.76යි. එතකොට පොඩි හරි විඥානයක් තිබෙන ඕනෑම මනුස්සයෙකුට ගණන හදනකොට තේරෙනවා, ඒ දෙකේ ගණන් වෙනස් වනවාය කියලා.

ඊළඟ කාරණය තමයි, digital system එක. පළමුවැනි බස් රථ 10හි digital system එක තිබුණේ නැහැ; අලුත් බස් රථ 100හි full package එක තිබෙනවා. ඊළඟට, පළමු බස් රථ 10ට credit period එකක් තිබුණේ නැහැ; බස් රථ 100ට එම කාලය මාසයක් තිබෙනවා. පළමුවැනි බස් රථ 10හි performance security එක දින 365යි; බස් රථ 100හි එය දින 1,020යි. ඒ වාගේම පළමුවැනි බස් රථ 10 ගන්නකොට international training period එකක් තිබුණේ නැහැ. නමුත් අලුත් බස් රථ 100 සඳහා technicianසලා දහයකට දවස් හතක training period එකක් තිබෙනවා. අලුත් බස් රථ සියයේ alcohol sensor එක තිබෙනවා. Seats ගණනත් වෙනස්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එළියෙන් බලලා මේ බස්වල තත්ත්වය ගැන කියන්න බැහැ. අලුත් project එකක් ගෙනෙන කොට නිකම් වැඩකට නැති කථා කියන්න එපා. ඔක්කෝම බස් තමයි. හැබැයි, බස් වෙනස්. ටකරන් බස් තිබෙනවා, ලොරි වැසි තිබෙන බස් තිබෙනවා. එක එක ඒවා වෙනස්. ඒගොල්ලන් දන්නේ "bus" කියන වචනය විතරයි; අකුරු තුනයි දන්නේ. ඊට වඩා ගොඩාක් වෙනස් list එකක් තිබෙනවා. එතකොට ඒවායේ ගණන් වෙනස් වනවා. ඒක සරල කාරණයක්.

අපේ දිලිත් ජයවීර මන්ත්‍රීතුමා ව්‍යවසායකයකු විධියට තමයි එළියට එන්නේ. 2029දී තෙරපුම් ජනාධිපති වෙන්නත් බලාපොරොත්තුවක් තිබෙනවා. හැබැයි, මොකක්ද කියන්නේ? මේ ව්‍යාපෘති පටන් ගෙන යනවා, හැබැයි මේකෙන් පාරවල් හදනකොට, highways හදනකොට සියයට 90ක dollar component එකක් යනවා කියනවා. අපේ ලොකුම electrification project එක තමයි, දුම්රිය විදුලිකරණයට ලක් කරන project එක. අපි ඒක ලබන අවුරුද්දේ පටන් ගන්නවා. ඇස්තමේන්තුගත මුදල දළ වශයෙන් රුපියල් බිලියන 600ක් විතර වනවා. ඒකෙන් තමයි වැඩිම dollar component එකක් එළියට යන්නේ. Signalling සහ අලුත් කෝච්චි ගෙනෙන කොට ඩොලර් ප්‍රමාණයක් එළියට යනවා. ඒ, මුළු ප්‍රමාණයෙන් තුනෙන් දෙකක්. රුපියල් බිලියන හයසීයෙන් තුනෙන් දෙකක් කියන්නේ බිලියන 400ක් එළියට යනවා. පාරවල් හදන කොට ගෙනෙන්නේ තාර සහ පොඩි පොඩි දේවල් ටිකක් විතරයි. එතකොට component එකක් විධියට එළියට යන්නේ පොඩි ප්‍රමාණයක්. සියයට 90ක් එළියට යන්නේ නැහැ.

අපි ඩොලර් ආර්ථිකය ස්ථාවර කර ගත්තේ කොහොමද? අපට දැන් ඩොලර් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවට ඩොලර් එන ප්‍රධාන මාර්ග හතරක් තිබෙනවා. පළමුවැනි එක, සංචාරක කර්මාන්තය. 2025 අවුරුද්ද තමයි ලංකා ඉතිහාසයේ වැඩිම සංචාරකයින් පිරිසක් ආ අවුරුද්ද. ආදායම වැඩියෙන් ලැබුණු අවුරුද්ද. ඩොලර් බිලියන 3.25ක ආදායමක් උපයා ගත්තා.

ඉරාන යුද්ධය පටන් ගන්නවා, පෙබරවාරි 28වැනි දා. ඕනෑම කෙනෙකුට තේරෙනවා, මැද පෙරදිග ඉඳලා සංචාරකයෝ ලංකාව ඇතුළට ආවේ නැති වුණාට, වැඩිම වශයෙන් ගුවන් යානා operate වෙන්නේ ඩුබායි, දෝහා කටාර් වාගේ airports ආශ්‍රිතව කියලා. මැද පෙරදිග අර්බුදය නිසා aviation ක්ෂේත්‍රය යම්කිසි අර්බුදයකට ලක් වනවා. එන ගුවන් යානා ප්‍රමාණය අඩු වනවා; සංචාරකයින්ගේ movement එක අඩු වනවා. එම නිසා එන සංචාරකයින් ප්‍රමාණය අඩු වනවා. මේ ප්‍රමාණය 2025 අවුරුද්දේ වාර්තාගතව තිබුණාට ජනවාරි සහ පෙබරවාරි මාස දෙක සංසන්දනය කළොත්, 2025 අවුරුද්දට වඩා 2026 අවුරුද්දේ ජනවාරි සහ පෙබරවාරි මාස දෙකේ සංචාරක ආදායම වැඩියි. හැබැයි, යුද්ධය පටන් ගත්තාට පස්සේ මේක අඩු වනවා. ගිය අවුරුද්දට සාපේක්ෂව මේ අවුරුද්දේ සංචාරකයින්ගේ පැමිණීම සියයට දෙකකින් අඩු වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒත් එක්කම පළමුවැනි මාස අටේ සංචාරක ආදායම ඩොලර් මිලියන 300කින් විතර අඩු වනවා. ජනවාරි ඉඳලා අගෝස්තු දක්වා විතරක් සංසන්දනය කළොත්, ගිය අවුරුද්දේ ඩොලර් මිලියන 2,031ක ආදායමක් ලැබුණා. මේ අවුරුද්දේ ලැබෙන්නේ ඩොලර් මිලියන 1,796යි. සාමාන්‍යයෙන් ඩොලර් මිලියන 250ක විතර අඩුවක් තිබෙනවා. ඒක අපි පිළිගත යුතුයි. එය සාධනීයයි, justifiable, understandable. ඕනෑම කෙනෙකුට තේරෙනවා, මැද පෙරදිග පවතින යුද්ධයත් එක්ක මොකද වෙන්නේ කියලා. හැබැයි, ඒක විතරක් නොවෙයි, ඩොලර් ආර්ථිකය උපයා ගන්න අපට තව මාර්ග තිබෙනවා.

2025 අවුරුද්දේ තමයි ලංකා ඉතිහාසයේ වැඩිම විදේශ ප්‍රේෂණ - foreign remittances - ප්‍රමාණයක් ආවේ. එය ඩොලර් බිලියන 8.1යි. දැන් අපි ඒක කිය කියා ඉඳලා හරියන්නේ නැහැ.

අපි බලන්න ඕනෑ, පළමුවැනි මාස 7 ඉවර වනකොට ගිය අවුරුද්දට වඩා මේ අවුරුද්දේ කොච්චර උපයා ගත හැකිද, උපයා ගත්තාද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගිය අවුරුද්දේ පළමුවැනි මාස හතේ - අපි record තිබ්බ අවුරුද්දේ - විදේශ ප්‍රේෂණ ආවේ, ඩොලර් බිලියන 4.4යි. මේ අවුරුද්දේ පළමුවැනි මාස හතේ ඩොලර් බිලියන 5.3යි. ඒ කියන්නේ, record තිබ්බ ගිය අවුරුද්දට වඩා මේ අවුරුද්දේ ආදායම ඩොලර් මිලියන 900ක් විතර වැඩියි. එක අන්තයකින් අඩු වෙච්ච එක - සංචාරක කර්මාන්තයෙන් අඩු වෙච්ච එක - අපි අනෙක් අන්තයෙන් සපුරා ගෙන ඉවරයි. අපි හිතනවා, මේ අවුරුද්දේ අවසානය වන විට විදේශ ප්‍රේෂණ ඩොලර් බිලියන 9කට වඩා ලැබෙන්න පුළුවන් කියලා. ඒ, මොකක් නිසාද? අපි ඩොලරය ස්ථාවරව තියලා තිබෙනවා. ලෝක යුද්ධයක් තිබියදීත් ඩොලරය ස්ථාවරව තිබෙන නිසා පිට රට ඉන්න මනුස්සයා ලංකාවට සල්ලි එවනවා. ඒ, අවුලක් නැති නිසා. නමුත් මීට කලින් ඒ අය එහෙම සල්ලි එව්වේ නැහැ.

ඊළඟ එක තමයි, export income එක; පිට රටට භාණ්ඩ හා සේවා යවලා ලංකාවට එන මුදල. එම අංශයෙන් ඉතිහාසයේ වැඩිම ආදායම ලැබුවේ 2025 අවුරුද්දේ. එය ඩොලර් බිලියන 17.25යි. අපි ඒක කිය කියා ඉඳලා හරියන්නේ නැහැ. අපි බලමු, ගිය අවුරුද්දේ පළමුවැනි මාස හතේ කොහොමද, මේ අවුරුද්දේ පළමුවැනි මාස හතේ කොහොමද කියලා. ගිය අවුරුද්දේ පළමුවැනි මාස හතට ආවේ ඩොලර් බිලියන 8.1යි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
විනාඩි දෙකක් නම් මදි වෙයි වාගේ.

ගිය අවුරුද්දේ පළමුවැනි මාස හතට ආවේ, ඩොලර් බිලියන 8.1යි. මේ අවුරුද්දේ පළමුවැනි මාස හත වනකොට ඩොලර් බිලියන 10.4ක් එනවා. ඒ කියන්නේ, සියයට 5.5කට වඩා වැඩි වෙලා. ඒකෙන් තේරෙනවා, අපේ ඩොලර් ආර්ථිකය ස්ථාවර වෙලා තිබෙනවා කියන එක. මේ කරන්නේ වෙන මොකුත් නොවෙයි. පෙබරවාරි 28වැනි දා තමයි ඉරානයට ගහන්නේ. ඩොලරය කෙරෙහි කොච්චර තෙරපුමක් තිබෙනවාද කියන එක, 2025 අවුරුද්දේ ඉන්ධන අපනයනය සඳහා ගිය වියදම බැලුවාම පෙනෙනවා. අපේ රටට ඉන්ධන ගෙනෙන්න ගිය අවුරුද්දේ අප්‍රේල් මාසයේ ඩොලර් මිලියන 355ක් වියදම් වනවා, 2026 අප්‍රේල් මාසය වනකොට ඩොලර් මිලියන 866ක් වියදම් වනවා. 2025 මැයි මාසය ගත්තොත්, අපේ රටට ඉන්ධන ගෙනෙන්න ඩොලර් මිලියන 256ක් වියදම් වනවා. මේ අවුරුද්දේ මැයි මාසය වනකොට ඩොලර් මිලියන 536ක් වියදම් වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 අවුරුද්දටම ලංකාවට ඉන්ධන ගෙනෙන්න රටින් එළියට ගියේ ඩොලර් මිලියන 4,048යි. හැබැයි, මේ අවුරුද්දේ පළමුවැනි මාස හයේ විතරක් ඉන්ධන ගෙනෙන්න ඩොලර් මිලියන 3,168ක් රටින් එළියට යනවා, ඩොලරය කෙරෙහි එච්චර තෙරපුමක් තිබියදීත්.

ඔයගොල්ලන්ට මතක ඇති, 2022 අප්‍රේල් 08වැනි දා පුවත් පත්වල පළ වුණු headline එක. ඒ, මොකක්ද? ඉන්දියාවේ යාචකයෝ ලංකාවට එවන්න ඩොලර් එකතු කරනවාය කියලා. බංග්ලාදේශයෙන් ඩොලර් මිලියන 200ක currency swap එකක් ගන්නවා. එහෙම තිබුණු රටක් වන අපි නේපාලයට ඩොලර් මිලියනයක් දෙන්න හදනවා, එච්චර තෙරපුමක් තිබියදීත්. 2026.08.11වන දා වනකොට LC open කරනවා, ඩොලර් බිලියන 3.59ක. වාහනවලට LC open කරලා දවසකට ඩොලර් මිලියන 82ක් වැය වුණු දවස් පවා තිබෙනවා. එහෙම තත්ත්වයක් තිබියදීත් අපි ආර්ථිකය කළමනාකරණය කරනවා.

ජූනි මාසය වනකොට විදේශ සංචිත ඩොලර් බිලියන 6.591 වෙනකම් වැඩි වෙලා තිබෙනවා. ලෝකයේ විදේශ සංචිත වැඩියෙන්ම තිබෙන්නේ චීනයේ. ඒ, ඩොලර් බිලියන 3,500ක් විතර. දෙවැනියට විදේශ සංචිත වැඩියෙන්ම තිබෙන්නේ ජපානයේ. ඒ, ඩොලර් බිලියන 1,100ක් විතර. චීනයට වඩා තුන්ගුණයක් අඩුයි. තුන්වැනියට ස්විට්සර්ලන්තයේ ඩොලර් බිලියන 900ක් විතර තිබෙනවා. හතරවැනියට විදේශ සංචිත වැඩියෙන්ම තිබෙන ලංකාවට අල්ලපු රට වන ඉන්දියාවේ ඩොලර් බිලියන 720ට තිබුණු විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 690කට අඩු වුණා. මෝදි අගමැතිතුමා මොකක්ද කිව්වේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒගොල්ලන්ට දළ වශයෙන් අවුරුද්දකට වැඩියෙන්ම මුදල් වැය වෙන්නේ තෙල් ගෙනෙන්නයි. සාමාන්‍යයෙන් වර්ෂයකට ඩොලර් බිලියන 200ක්, 210ක් වාගේ මුදල් ප්‍රමාණයක් ඒ සඳහා වැය වනවා. ඒගොල්ලන්ට දෙවැනියට වැඩියෙන්ම මුදල් වැය වන්නේ රත්‍රන් ගෙනෙන්න. ඒ සඳහා ඩොලර් බිලියන 100ක, 110ක විතර මුදල් ප්‍රමාණයක් වැය වනවා. මෝදි අගමැතිතුමා ප්‍රසිද්ධියේ කිව්වා, මේ අර්බුදය නිමා වන තෙක් රත්‍රන් ගන්න එපා, විදේශ සංචාර නවත්වන්න කියලා. අපි මොනවාද කළේ? අපි මොනවාවත් කළේ නැහැ. අපි කළේ QR code එක නැවත දීලා,-

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! අද දින විවාදයේ වැඩ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථා කරන්න.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෝදි අගමැතිතුමා කිව්වා, මේ අර්බුදය නිමා වනතෙක් රත්‍රන් ගෙනෙන්න එපා, ඒ අයගේ විදේශ සංචිත ප්‍රමාණය අඩු වන නිසා කියලා. ඩොලර් බිලියන 720ට තිබුණු විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 690කට වාගේ අඩු වුණා, මේ මාස කිහිපය තුළ. හැබැයි, අපි මොකක්ද කළේ? තෙල් දෙන්න QR code system එක නැවත හඳුන්වා දීපු, reintroduce කළ එක විතරයි අපි කළේ. වෙන මොකුත් අපි කළේ නැහැ. වෙන මොකුත් සීමා දැම්මේ නැහැ. වාහන ආනයනය සීමා කළාද? නැහැ. දවසකට ඩොලර් මිලියන 50, 60, 70, 80 ගිය දවස් පවා තිබුණා. මෙහෙම තිබුණු රටක් තමයි අපි භාර ගත්තේ. එහෙම තිබියදීත් අපි ආර්ථිකය කළමනාකරණය කරමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා ගැන අපි කියන්නම ඕනෑ. අපි දන්නවා, "මතට තිත" වැඩසටහන ක්‍රියාත්මක වන බව. මේ වෙනුවෙන් සමාජයේ තිබෙන කැපවීම, උනන්දුව කොච්චරද කියලා අපට තේරෙනවා. 2026.08.11වන දා වනකොට

[ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා]

හෙරොයින් කිලෝග්‍රෑම් 2,260ක් අල්ලා තිබෙනවා. මේවා හෙරොයින්, හාල් නොවෙයි. අයිස් කිලෝග්‍රෑම් 2,656ක්, කොකේන් කිලෝග්‍රෑම් 297ක්, ගංජා කිලෝග්‍රෑම් 8,427ක්, කුෂ් කිලෝග්‍රෑම් 1,657ක් ඇතුළු මත් පෙති 3,224,129ක් අල්ලා තිබෙනවා. මේවා හාල් වුණා නම් පාර්ලිමේන්තුවට අවුරුදු පහම කන්න දෙන්න තිබුණා. දිලිත් ජයවීර මහත්තයා මේ වෙලාවේ සභාවේ හිටියා නම් රොටී කොච්චර ප්‍රමාණයක් හදන්න පුළුවන්ද කියලා ගණන් හදලා කියයි. වෙලාවට එතුමා මේ වෙලාවේ සභාවේ නැහැ. එච්චර ලොකු මත්ද්‍රව්‍ය ජාලයක් තමයි තිබුණේ. මේ ජාලය කොහොමද තිබුණේ කියන එක තේරුම් ගන්න පුළුවන්, පසුගිය කාලය තුළ නීතිය ඉදිරියේ මොකක්ද වුණේ කියන එක බැලුවාම.

ඔයගොල්ලන් දන්නවා, රටේ නීතිය පසිඳලීමට තිබෙන උත්තරීතරම ආයතනයක හිටපු ආරක්ෂක ලේකම්ට අද වනකොට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. ජනාධිපතිතුමා අත්සන් කරන දවසක ඔහු එල්ලා මැරීමට නියමිතයි. හිටපු පොලිස්පතිවරයෙක්, ජනාධිපතිතුමා නියම කරන දවසක එල්ලා මැරීමට නියමිතයි. ඊළඟට, හිටපු තවත් පොලිස්පතිවරයෙක් පිස්තෝලයකින් වෙඩි තියා ගෙන මිය යයි. තවත් හිටපු පොලිස්පති කෙනෙකුට අධිචෝදනා ගොනු වී තිබෙනවා.

හිටපු බන්ධනාගාර ඇමතිගේ පුතාට පාතාලයත් එක්ක තිබෙන ගනුදෙනුව මොකක්ද? කප්පම් ගන්න එක. අපි හිතුවේ සාමාන්‍ය මිනිස්සුන්ගෙන් කප්පම් ගන්නවා කියලා. අන්තිමට පාතාලයෙනුත් කප්පම් අරගෙන. එහෙම සංස්කෘතියක් තමයි තිබුණේ. ඒ, හිටපු අධිකරණ ඇමතිවරයෙකුගේ පුතා, වෙන කවුරුවත් නොවෙයි. එහෙම සංස්කෘතියක් තිබුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැන් මොකද වෙලා තිබෙන්නේ? මෙච්චර කාලයක් ඇතුළට ගියේ කුඩු බීපු කෙනා. කන් හැන්දෙන් ෂොට් එකක් ගහපු ගමන් ඒ පුද්ගලයා ඇතුළේ. නමුත්, දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? කන් හැන්දෙන් ෂොට් එකක් ගහන කෙනාත් ඇතුළේ. කන් හැන්දෙන් ෂොට් එක ගහන්න විකුණන කෙනාත් ඇතුළේ. කන් හැන්දෙන් ෂොට් එක ගහන්න බෙදා හරින්නාත් ඇතුළේ. පිට රට ඉඳලා ඒ ජාලය මෙහෙය වන පාතාලයට සම්බන්ධ කෙනාත් ඇතුළේ. ඒකට සියලු රැකවරණය දීපු දේශපාලන අධිකාරියත් ඇතුළේ. ඒගොල්ලන් එකම කුඩුවේ. දැන් බූරු පැක් එකක් ඒගොල්ලන්ට ගිහිල්ලා දෙන්න ඕනෑ ගහන්න කියලා.

මේක තමයි ජනතාව දීපු mandate එක. මේක තමයි ජනතාව බලාපොරොත්තු වෙච්ච රට. ඉතින්, අපි මේක වෙනස් කරන්න ඕනෑ නැද්ද? මේ ජාලය කුඩු කරන්න ඕනෑ නැද්ද? මේ ජාලය කුඩු වෙන්න ගහන්න ඕනෑ. මේ ජාලය කුඩු වෙන්න ගහනවා. ලොවෙත් නැහැ, ලොව් ගහෙත් නැහැ, බිමත් ඇහිඳින්න නැති වෙන්න ගහනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2029 අවුරුද්දේ අපි ජනතාව ඉදිරියට යන්නේ මේ පාතාලය, කුඩුත් එක්ක ගැව්ච්ච දේශපාලන අධිකාරිය බිමට flat කරලා.

ආයේ දෙකක් නැහැ, අපි ඒක කරනවා. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්වා, ජනාධිපතිතුමා කියන හැම දෙයක්ම වෙනවා කියලා. ඔව්, ඒවා වෙනවා. ඇයි, අවුලක්ද? අපි කිව්වා, කෘෂි කර්මාන්තය හදනවා කියලා; අපි කෘෂි කර්මාන්තය හදනවා. අපි කිව්වා, ප්‍රවාහනයේ පෙරළියක් කරනවා කියලා; අපි ඒක කරනවා. මහා මාර්ගවල පෙරළියක් කරනවා කියලා අපි කිව්වා; අපි ඒක කරනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙනසක් කරනවා කියලා අපි කිව්වා; අපි ඒකත් කරනවා. ඒක තමයි දැන් අපි පටන් ගෙන තිබෙන්නේ. ඒවා interpret කරගන්න තේරෙන්නේ නැහැ. මේ කියපු හැම දෙයක්ම අපි කරනවා. අපි මේ දේශපාලන සංස්කෘතියේ පරිවර්තනයක් කරනවා කියාත් කිව්වා; අපි ඒකත් කරනවා. අපි ඒක කරලා තමයි ඉදිරියට යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාව මේ mandate එක දීලා තිබෙන්නේ අපිට මේවා කරන්න. ජනතාව අපිව වැලඳගෙන ඉන්නවා, ජනතාව අපිත් එක්ක ඉන්නවා කියන විශ්වාසය අපට දිනෙන් දින තිබෙනවා. ගමට යනකොට අපිට තේරෙනවා, මේ පරිවර්තනය කෙසේද සිද්ධ වන්නේ කියලා. වසර දෙකක් අවසානයේදීත් අපි ඒ වෙනුවෙන්, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" හදන ගමන ඉදිරියට ගෙන යනවා. අපේ ආණ්ඩුවට වසර දෙකයි. ආණ්ඩුවට සුබයි. ඒ ගමන ගැන හැමෝටම තේරෙනවා. ඒක නිසා තමයි විපක්ෂය කලබලා වෙලා තිබෙන්නේ. මට අමතර කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "(203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වගන්තිය සමඟ කියවිය යුතු 141, 143, 144, 157අ, 168 සහ 190 වගන්ති යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජූනි 17 දිනැති අංක 2493/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.08.18 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඒ අනුව, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2 යථා පරිදි සම්මත වූ බව ප්‍රකාශ කරමි.

# කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

## හානිකර සමාජ මාධ්‍යවලින් බාලවයස්කාර දරුවන් ආරක්ෂා කර ගැනීම
## தீங்கு விளைவிக்கும் சமூக ஊடகங்களிலிருந்து சிறுவர்களைப் பாதுகாத்தல்
## SAFEGUARD UNDERAGE CHILDREN FROM HARMFUL SOCIAL MEDIA PLATFORMS

[5.04 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)

Hon. Presiding Member, I move the following Adjournment Motion for the protection of Sri Lankan children from harmful social media use:

> "The increasing and unrestricted use of social media platforms by children under the age of 16 years in Sri Lanka, and the serious risks posed thereby to their mental health, safety, education and overall wellbeing.
>
> The UK Government has announced a landmark proposal to ban social media use by children under 16, requiring platforms to enforce a minimum age of 16. The measure would be supported through the Children's wellbeing and Schools Bill, alongside provisions in the Online Safety Act, aimed at strengthening online protections for young people. The ban will restrict access on major platforms like Instagram, TikTok, YouTube, Snapchat, Facebook and X - Twitter, while exempting messaging apps like WhatsApp. Australia's landmark Online Safety Amendment (Social Media Minimum Age) Act bans children under 16 from holding accounts on major social medial platforms.
>
> Accordingly, I propose that this House should call upon the Government to urgently examine and implement appropriate legislative, regulatory and technological measures including effective age-verification mechanisms and accountability standards for social media platforms, with a view to preventing underage access and enhancing the protection of children in the digital environment."

Sir, I am very conscious of the fact that social media has destroyed the mindset of some of our children and have subjected them to various cybercrimes. I have already handed over a Private Members' Bill dealing with social media minimum age. I also spoke to the Minister of Justice and National Integration, and he said that the Legal Draftsman is in the process of drafting a Bill. I do not want to take credit for that. If the Government could expedite the process and bring in an Act, that would solve this major social issue.

Sir, the Social Media Minimum Age Act should only be to protect children in Sri Lanka from harmful online use, not to be anti-technology. It is acknowledged that digital tools have real value, but it is also argued that children need protection from online harm. I would like to give some statistics relating to social media use: 52.8 per cent of young people access the Internet and the average age of first access is, 13 years. Then, 46.3 per cent of children between 10 to 16 years have communicated with strangers online and 27.9 per cent went out to meet such a stranger in person. Earlier, we used to meet people by socializing, but, now, life has changed. The Internet has created an environment where you deal with strangers and unfortunately, the statistics show that 27 per cent of the children who have communicated online with strangers have met them at some point.

Also, if you look at online violence, 28 per cent of the children who use the Internet have experienced some form of online violence. You know that various indecent messages are sent online, and 28 per cent of our children have been subject to such indecent messages while 26 per cent of the children are subject to indecent links and advertisements and 27 per cent have been subject to cyberbullying and extortion. Nearly 20 per cent, that is one in five, have reported that indecent images of themselves were shared online. Unfortunately, today, our children get friendly with various people online and sometimes, share their private photographs, some of which are compromising. Those photographs are shared online and some children had committed suicide due to that. Ninety two per cent of the victimized children would not seek legal redress. That means, unfortunately, children who are subject to online issues, especially where various private images and conversations have been shared online, which is an offence, do not report them.

Then, Sri Lanka ranks 20th globally for cyberspace-related threats. There are 9.1 million distinct cyber threats detected in a single year. Sir, children's sexual abuse material availability rate is 27.8 per 10,000 people, which is a very dangerous phenomena. There is a lot of data on these issues.

So, Sir, this is a social issue. We all should collectively bring in this Act as soon as possible. When I brought in that Private Members' Bill on this, a lot of parents came and told me, "We cannot control our children. So, please, do it. If you would do it, we can, at least, tell our children, 'The law prevents you all from using it.' " Therefore, we have to collectively do it because, today, children are subject to sexual abuse online and are raped by strangers they have met through the Internet.

Also, today, various forms of activities are going on, on the Internet. Drugs are obtained through the Internet and people commit suicide because of the addiction to Internet. Earlier, children used to go out and play - we used to go out and play - but, today, the phone has become the child's best friend. Psychologists have said that phone addiction is a problem because, then, you do not need people, you do not socialize and thereby, you become a loner and suffer from mental issues.

Therefore, I respectfully beg this House - I spoke to the Minister also - that we should collectively and expeditiously bring in a Bill to address this issue.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up.

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Please give me half a minute more, Sir.

With this Bill getting delayed, each day a child would get abused, a child's photographs would be put on social media and a child would meet somebody through social media and be subjected to various forms of sexual harassment. Therefore, compared to any other Bill, this Bill would be more important, if we are to protect our children in the future. The world has changed; today, technology dictates everything. Therefore, I humbly beg this House, through this Adjournment Motion, that we all should collectively and expeditiously bring in a Bill in this regard, whereby there would be restrictions imposed on the use of Internet by children.

Thank you.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එම යෝජනාව ස්ථිර කිරීම, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.12]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ෆයිසර් මුස්තාපා මැතිතුමා ගෙන ආ මෙම සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මා ස්ථිර කරනවා. මම එතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා, මෙවැනි ඉතාම වැදගත් යෝජනාවක් ගෙන ඒම ගැන. මීට පෙරාතුව එතුමා මේ සම්බන්ධව පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතකුත් ගෙනැල්ලා තිබුණා. එතුමාගේ ඒ ක්‍රියාවලිය ගැනත් අපි සතුටු වෙනවා.

විශේෂයෙන් අද අපේ රටේ අර්බුද ගණනාවක් මතු වෙලා තිබෙන කාරණයක් තමයි, අපේ අම්මලා, තාත්තලාට දරුවන් බලාගන්න අවශ්‍ය කරන කාලය නැතිකම. මොකද, සමහර වෙලාවට හැම පවුලකම අම්මයි, තාත්තයි දෙදෙනාම රැකියාවට යනවා. සමහර වෙලාවට ඔවුන් ගෙදර එන්නේ රාත්‍රී 9.00ට, 10.00ට වෙන්න පුළුවන්. ඉතාම සුළු පැය ගණනක් තමයි අම්මලා, තාත්තලා දරුවන් එක්ක ගත කරන්නේ. ඒ නිසා දරුවන්ට තිබෙන රැකවරණය අද විශාල වශයෙන් නැති වෙලා තිබෙනවා. ඔවුන්ට තිබෙන ඊළඟ සතුටුදායක ක්‍රියාවලිය තමයි, සමාජ මාධ්‍ය භාවිතය. ඉස්සර වාගේ ක්‍රීඩා කරන, සෙල්ලම් කරන ක්‍රියාවලින් දරුවන් දැන් ක්‍රම ක්‍රමයෙන් ඈත්වෙලා තිබෙනවා. දරුවෝ අද සම්පූර්ණයෙන්ම ඉන්නේ social mediaවල, නැත්නම් Internet එකේ. මේවාත් එක්ක තමයි ඔවුන්ගේ ක්‍රියාකාරකම් සියල්ල තීන්දු වෙලා තිබෙන්නේ. අම්මලා, තාත්තලාට දරුවන් මේකෙන් මුදා ගැනීම සඳහා මේ ගැන නිසි අවබෝධයක් නැති තත්ත්වයක් තමයි දැන් තිබෙන්නේ. මොකද, ඔවුනුත් දන්නේ නැහැ, මේ සමාජ මාධ්‍යවලට යන්නේ කොහොමද, Internet එක පාවිච්චි කරන්නේ කොහොමද කියලා. මේ ගැන තිබෙන අඩු දැනුම තුළ ඔවුනුත් විශාල අර්බුදයකට ලක් වෙලා තිබෙනවා. තමන්ගේ පුතා, දුව කාමරයක් ඇතුළට වෙලා social mediaවල, නැත්නම් mobile phone එකේ, නැත්නම් Internet එකේ ඉන්න තත්ත්වය තමයි ඔවුන් දකින්නේ. සමහර වෙලාවට ඔවුන් කල්පනා කරනවා වෙන්න පුළුවන්, මේ ක්‍රියාවලිය තුළ දරුවන් අධ්‍යාපනය ලබනවාය කියලා. හැබැයි, විශාල වශයෙන් සිය දිවි නසාගැනීම් සිද්ධ වෙනවා අද අපිට දකින්න ලැබෙනවා. සමහර තැන්වල විශාල තට්ටු නිවාසවලින් බිමට පැනලා මැරෙනවා. සමහර වෙලාවට එහෙම වෙලා තිබෙන්නේ ඔවුන් ගිය තරගයක ප්‍රතිඵලයක් විධියට. මේ විධියට විශාල අර්බුදයක් මේක ඇතුළේ ඇති වෙලා තිබෙනවා.

අපි දන්නවා ලෝකයේ අනෙක් රටවල, විශේෂයෙන් එංගලන්තයේ, නවසීලන්තයේ Online Safety (Minimum Age and Child Safety Risk Assessment) Bill එක 2026දී ඉදිරිපත් කර මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීම ආරම්භ කර තිබෙන බව. මේ විධියට රටවල් ගණනාවක මේ ක්‍රියාවලිය පටන් අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම "protection over control" තමයි ඔවුන්ගේ මූලික තේමාව බවට පත් වෙලා තිබෙන්නේ; control කරන එකටත් වඩා කොහොමද මේ දරුවන් මේකෙන් ආරක්ෂා කර ගන්නේ කියන කාරණය කෙරෙහි අවධානය යොමු කර තිබෙනවා. ඒ නිසා එක පැත්තකින් අපේ වැඩිහිටියන්ට මේ පිළිබඳ දැනුම ලබා දීම වාගේම අනෙක් පැත්තෙන් National Child Protection Authority Act එක යටතේම අපට පුළුවන් මේ සම්බන්ධයෙන් යම් කිසි කොමසාරිස්වරයකු ලවා අවශ්‍ය ක්‍රියාමාර්ග දිගටම ඉදිරියට ගෙනියන්න. අනෙක් පැත්තෙන් පාසල තුළත්, පිටතදීත් දරුවන්ගේ මේ ක්‍රියාදාමය ගැන ඉතාම සෙවිල්ලෙන් බලන වැඩ පිළිවෙළක් ගෙන යන්න පුළුවන්. අපි ඒ යෝජනාව කරනවා.

මම හිතන විධියට, ආණ්ඩුව පැත්තෙන් දැනටමත් මේ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් පටන් අරගෙන තිබෙනවා. අපි ඒකට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් වයස අවුරුදු 16ට අඩු දරුවන් සමාජ මාධ්‍ය තුළ, පරිගණක භාවිතය තුළ මේ විධියට හැසිරෙන එක කිසියම් විධියකට පාලනය කරලා මේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යන්න කියන ඉල්ලීම තමයි අපි කරන්නේ. ඒ සඳහා අපේ පැත්තෙන් දෙන්න පුළුවන් උපරිම සහයෝගය අපි ලබා දෙනවා. අපි ආණ්ඩුවෙන් විශේෂයෙන් ඉල්ලීමක් කරනවා, මේ සම්බන්ධව අවශ්‍ය කරන නීති නොපමාව ගෙනෙන්න කියලා. ඒ සඳහා අපේ සහයෝගය ලබා දෙනවාය කියන කාරණයත් මතක් කරමින්, අපේ ෆයිසර් මුස්තාපා මැතිතුමාට මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධව නැවතත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.17]

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව පිළිබඳව කථා කරද්දී මා මුලින්ම කියන්න ඕනෑ, හානිකර සමාජ මාධ්‍ය භාවිතාවෙන් කොහොමද අපි දරුවන් ආරක්ෂා කර ගන්නේ කියලා අපි දැනටමත් කථා බහ කරමින් පවතිනවා කියන එක. රජයක් විධියට අපි අග්‍රාමාත්‍ය කාර්යාලය, ඒ වාගේම කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය,

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය කියන අමාත්‍යාංශ ඒකාබද්ධ කරමින් මේ සම්බන්ධයෙන් දරුවන් ආරක්ෂා කර ගැනීමේ ක්‍රියාවලිය යම් නීතිමය රාමුවකට ගන්නේ කොහොමද කියන එක සම්බන්ධව දැනට කථා බහ කරමින් පවතිනවා. ඒ සම්බන්ධව ගරු අධිකරණ ඇමතිතුමාත්, ඒ වාගේම කාන්තා හා ළමා කටයුතු ඇමතිතුමියත් කටයුතු කරමින් ඉන්නවා. මේ කාරණය කෙරෙහි අවධානය යොමු කිරීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා.

මේ පිළිබඳව අපි රටක් විධියට අවධානය යොමු කරන්න ඕනෑ. හානිකර සමාජ මාධ්‍ය භාවිතය දරුවන් අතට පත් නොකර සිටීමේ කාරණයේ සියයට සියයක්ම වගකීම තිබෙන්නේ වැඩිහිටියන් වන අපට. මොකද, අනිවාර්යයෙන්ම අපේ ජීවිතයේ අත්‍යවශ්‍ය කොටසක් බවට පත් වෙලා තිබෙනවා, අපි ළඟ තිබෙන mobile phone එක, ඒ වාගේම අනෙකුත් උපකරණ. මේවා ජීවිතයේ කොටසක් බවට පත් වෙලා තිබෙනවා. හැබැයි, අපේ දරුවන් කියන්නේ ගොඩ නැඟුණු කොටසක් නොවෙයි. ඔවුන්ට අත්දැකීම් ප්‍රමාණය අඩුයි. ඒ වාගේම මේ මෙවලම් පාවිච්චි කරන්නේ කොහොමද කියන එක පිළිබඳව තිබෙන්නේ අඩු දැනුමක්. ඒ වාගේම ඒවායින් ආරක්ෂා වෙන්නේ කොහොමද කියන එක පිළිබඳවත් අවබෝධයක් නැහැ. හැබැයි, දැනටමත් අපි රජය විධියට ඒකට දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. Presidential Task Force එක වාගේම අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් ආරම්භ කර තිබෙන වැඩ පිළිවෙළ තුළින් දෙමව්පියන්, ගුරුවරුන් වාගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් අදාළ ළමා සමාජ හා පාසල් දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම අපි පාර්ලිමේන්තුවක් විධියට මේ සම්බන්ධව සාකච්ඡා කරන එක වැදගත්.

උදාහරණයක් ගත්තොත්, අපි දෙමව්පියන් විධියට තමන්ගේ දරුවන්ට කෑම කවද්දී mobile phone එකේ තිබෙන යම් apps පාවිච්චි කරනවා, සමහර games පාවිච්චි කරනවා. මේ පරිසරය තුළින් තමයි ඒ ළමයා ඒකට ඇබ්බැහි වෙලා තිබෙන්නේ. ඒ නිසා දෙමව්පියන් විධියටත්, වැඩිහිටියන් විධියටත් දරුවාගේ ළමා කාලය ලබා දීම කළ යුතුය, සෞන්දර්යාත්මකව, විනෝදාස්වාදය ගෙන දෙන විධියට ඒ ළමා පරිසරය සකස් කළ යුතුය කියා අපි හිතනවා. මොකද, ඇබ්බැහියට කලින් අපි දරුවන් ආරක්ෂා කර ගැනීම කළ යුතු වෙනවා. නීතියේ රැහැනට හසු වීමට කලින් ඇබ්බැහි වීමේ වටපිටාවකින් මිදෙන්න ඕනෑ පරිසරය හැදීම දෙමව්පියන් සහ වැඩිහිටියන් වන අපගේ වගකීමක්. මොකද, මෙහිදී පරිසරය කියන එක අනිවාර්යයෙන්ම බලපානවා. දරුවාට විවිධ ක්‍රියාකාරකම් කළ හැකි පරිසරයක් තිබිය යුතුයි. ඒ වාගේම, මව සහ පියා යන දෙදෙනාම නැත්නම් විද්‍යුත් මෙවලම් භාවිතයට අනවශ්‍ය විධියට ඇබ්බැහි නොවන විධියට එම දරුවන්ට ඒවා පාවිච්චි කළ හැකි ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කරන්නේ කොහොමද කියන කාරණයත් වැදගත් වනවා.

අපේ නව අධ්‍යාපන ක්‍රමය තුළ පවා තිබෙන්නේ දරුවන්ට විද්‍යුත් උපකරණ පාවිච්චි කරන්න තිබෙන අවස්ථා වාගේම, ඊටත් වඩා ක්‍රියාකාරකම් බද්ධ වුණු ප්‍රතිසංස්කරණයි. එහෙම නම්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය සහ අනෙකුත් අමාත්‍යාංශවලින් කරන්න හදන්නේ නීතිය තුළ ළමයා හිර කරනවා වෙනුවට, එවැනි සමාජයක් හදනවා වෙනුවට ඉන් එහාට ගිහිල්ලා prevention කියන කාරණාවට අදාළව දරුවන් වරදින් මුදා ගන්න වුවමනා කරන ආරක්ෂාකාරී පරිසරයක් සකස් කිරීමයි. ඒ නිසා නීති හදන මන්ත්‍රීවරුන්ට වාගේම, පුරවැසියන්ට හා දෙමව්පියන්ටත් වගකීමක් තිබෙනවා දරුවන්ගේ ළමා කාලය ගත කිරීමට අවශ්‍ය නිර්මාණශීලි, සෞන්දර්යාත්මක පරිසරයක් ඇති කිරීමට. එහිදී මෙවැනි සමාජ මාධ්‍යවලින් සිදු කරන හානිය පිළිබඳව වැඩිහිටියන් දැනුවත් කරන එකත් අනිවාර්ය කාරණයක්.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ස්තුතියි. அடுத்து, கௌரவ (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா அவர்கள்! உங்களுக்கு 4 நிமிடங்கள் உண்டு.

[பி.ப. 5.21]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

நன்றி! கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 10 வருடங்கள் வைத்தியசாலையில் மருத்துவராகப் பணியாற்றிய என்னுடைய experienceஇன்படி, நாங்கள் குழந்தைப் பிள்ளைகள் எனக் கருதுவது - paediatricஆகக் கருதுவது - 13 வயதுக்கு உட்பட்ட பிள்ளைகளைத்தான். பின்னர் அது 14ஆக உயர்த்தப்பட்டது. இலங்கையில் 16 வயதுக்கு உட்பட்ட பிள்ளைகளும் சட்டரீதியாக சிறுவர் களாகவே கருதப்படுகின்றார்கள். இன்றைய தினம் கௌரவ பைஸர் முஸ்தபா அவர்கள் 16 வயதுக்கு உட்பட்ட சிறுவர்கள் social mediaஐப் பயன்படுத்துவதை முற்றாக நிறுத்துவது தொடர்பாக ஒத்திவைப்புவேளைப் பிரேரணையைக் கொண்டு வந்ததையிட்டு நான் உண்மையாகவே சந்தோஷப் படுகின்றேன்.

ஒரு மருத்துவராக அதிலும் குறிப்பாக, 10 வருடங்கள் Paediatric Medical Officerஆக நான் பணிபுரிந்திருக்கிறேன். சிறுவர்கள் phone மற்றும் social mediaஐ use பண்ணுவதை இல்லாமல் செய்வது psychiatricஐ விருப்பமான பாடமாகக்கொண்ட எனக்குப் பிடித்த விடயம்தான். நாங்கள் இதிலே மிக முக்கியமாகப் பார்க்கவேண்டிய விடயமொன்று இருக்கின்றது. ஒரு குழந்தையின் மூளை விருத்தியானது - brain development - முதல் 1,000 நாட்களில்தான் நடைபெறும். அதாவது, கிட்டத்தட்ட 3 வருடங்கள் மட்டும்தான் நடைபெறும். அதற்குப் பிறகு neurons multiply ஆகாது. நாங்கள் என்ன செய்கின்றோம் என்றால், எங்களுடைய பிள்ளைகளை easyஆகப் பராமரிப்பதற்காக அவர்களுக்கு 6-7 மாதத்திலிருந்தே YouTubeஐ அல்லது TikTokஐ போட்டுக் காட்டி, சாப்பாடு ஊட்டுகிறோம். அதுமாத்திரமல்ல, அவர்கள் வீட்டில் கஷ்டப்படுத்துகின்ற நேரங்களில் எல்லாம் phoneஐக் கொடுக்கின்றோம். சில பிள்ளைகள் Autism Spectrum Disorderஆல் பாதிக்கப்பட்டு இருப்பார்கள். Autism disorder என்பது ஒரு வகையான Spectrum Disorder. 0 தொடக்கம் 100 வரைக்கும் autism இருக்கலாம். நான் சிலநேரங்களில் பாராளுமன்றத்திலும் சில autism குழந்தைகளைப் பார்க்கின்றேன். நான் அதனைப் பெரிதாக கணக்கில் எடுப்பதில்லை.

Attention-Deficit/Hyperactivity Disorder எனப்படுகின்ற ADHD, autism என்பன screenஉடன் தொடர்புபட்ட விடயங்கள்! அதாவது, screenஐத் தொடர்ந்து பார்ப்பதால் ஏற்படுபவை. இதற்கு நல்லதோர் உதாரணம், அம்மப்பா, அம்மம்மா மட்டும் வளர்க்கின்ற குழந்தைப் பிள்ளைகள் சின்ன வயதில் தொடர்ந்து screenஐப் பார்த்துக்கொண்டு இருப்பர் களாக இருந்தால், அவர்கள் 1-2 வயதிலே phoneக்கு addictஆகி விடுவார்கள். அதாவது, அவர்கள் non-living objectக்கு

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

addictஆகி விடுவார்கள். நான் ஒரு மருத்துவராக இவ்வாறான எத்தனையோ குழந்தைகளைப் பார்த்திருக்கிறேன். எனவே, சிறுவர்கள் 16 வயது வரை social mediaஐப் பயன்படுத்துவதை முற்றாக நிறுத்த வேண்டும்.

நாங்கள் இதில் இன்னுமொரு முக்கியமான விடயத்தை உள்ளடக்க வேண்டும். The most important thing is, we have to consider stopping the use of TikTok in Sri Lanka. இந்தியாவில் TikTok முற்றுமுழுதாகத் தடைசெய்யப்பட்டு இருக்கின்றது. YouTube could be used as an education platform. But, TikTok is not so. எனவே, இலங்கையிலும் TikTokஐ சம்பூர்ணமாக நிறுத்த வேண்டும். Facebook பயன்பாட்டை 18 அல்ல, 21 வயது வரை தடைசெய்யலாம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு ஒரு நிமிடம் தாருங்கள்!

இந்த உரையில் யாழ்ப்பாணம் சம்பந்தமான முக்கிய மானதொரு விடயம் பற்றி சொல்ல வேண்டும். யாழ்ப்பாண பல்கலைக்கழக Vice Chancellor - VC - வேல்நம்பி அவர்கள், தற்சமயம் MA Grade III appointmentஉம் Work Aide appointmentஉம் கொடுத்திருக்கிறார். அது தொடர்பாக எங்களுடைய கௌரவ பிரதமர் அவர்களுக்கு முறைப்பாடு அனுப்பப்பட்டு, அந்த appointments எல்லாவற்றையும் இடைநிறுத்தச் சொல்லி தற்பொழுது அவர் VCக்கு inform பண்ணியிருக்கிறார். இந்த விடயத்தில் கௌரவ பாராளுமன்ற உறுப்பினர் றஜீவன் அண்ணா அவர்களுடைய பெயரும் அடிபடுகிறது. அவர் அடிக்கடி பல்கலைக்கழக செயற்பாடு களில் தன்னுடைய அரசியல் செல்வாக்கைப் பயன்படுத்து கின்ற விடயம் என்னிடம் முறைப்பாடாகத் தரப்பட்டு இருக்கிறது. எனவே, நான் இந்த நேரத்தில் எங்களுடைய கௌரவ றஜீவன் அண்ணா அவர்களிடம் சொல்கிறேன், அரசியல்வாதியாக நாங்கள் ஒருபோதுமே கல்வி நிலையங் களில் அரசியல் தலையீடுகளைச் செய்யக்கூடாது என்று. 16 வயதுக்கு உட்பட்ட பிள்ளைகள் YouTube, TikTok பயன்படுத்துவதையும், 21 வயது வரை பிள்ளைகள் Facebook பயன்படுத்துவதையும் முற்றாகத் தடை செய்ய வேண்டும். இந்தப் பாராளுமன்றத்தில் ஆளுந்தரப்பில் 159 உறுப்பினர்கள் இருக்கின்றபடியால், TikTokஐ இலங்கையில் முற்றாக நிறுத்துவதற்கு Amendment Bill ஒன்றைக் கொண்டுவந்து நிறைவேற்ற முடியும்.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைகின்றது.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම අවසන් කරනවා, sir.

குழந்தைப் பிள்ளைகளைப் பொறுத்தவரையில், அவர்கள் தங்களுடைய நேரத்தைக் கூடுதலாகச் செலவிடுவது TikTok பார்ப்பதில்தான். உங்களுடைய வீட்டிலும் குழந்தைப் பிள்ளைகள் இருப்பார்கள்; என்னுடைய வீட்டிலும் பிள்ளைகள் இருக்கிறார்கள். 2-3 வயதுடைய பிள்ளைகள் TikTok பார்ப்பதை வழக்கமாக வைத்திருக்கிறார்கள். இந்தப் பிரேரணையைக் கொண்டுவந்த கௌரவ பைசர் முஸ்தபா அவர்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்வதோடு, இந்தப் பிரேரணையை முழுமையாக ஆதரித்து விடைபெறுகின்றேன். நன்றி.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුෂ්කා තිලකරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.26]

**ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ජනාධිපති නීතිඥ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ෆයිසර් මුස්තාපා මැතිතුමා විසින් මෙම යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් අපේ ප්‍රශංසනීය ස්තුතිය ආණ්ඩු පක්ෂය විධියට එතුමාට පළ කරන්න ඕනෑ. කෙසේ නමුත්, මෙවැනි සංශෝධන හෝ මෙවැනි යෝජනා සම්බන්ධයෙන් යම් මධ්‍යස්ථ තැනක ඉඳලා තමයි, එහෙම නැත්නම් සංසන්දනාත්මකව තමයි අපට බලන්න වෙන්නේ. මොකද, විශේෂයෙන්ම අපේ ආණ්ඩුව පත් වෙද්දී අපට මූලික වගකීම් 3ක් පැවරී තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒවා තමයි, ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම, ඩිජිටල්කරණය සහ Clean Sri Lanka වැඩසටහන. ඩිජිටල්කරණය කියන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේදී විවිධ අමාත්‍යාංශ ඒකාබද්ධ කර ගනිමින් සහ විවිධ ක්ෂේත්‍ර ඒකාබද්ධ කර ගනිමින් තමයි අප ඒවාට අදාළ වැඩසටහන් හැදුවේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කරන පරිදි, දරුවන්ට අදාළව ඩිජිටල්කරණය සහ සමාජ මාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් විශේෂ සාකච්ඡා ප්‍රමාණයක් අපේ ආණ්ඩුව විධියට අපි සිදු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මුලදීත් සඳහන් කළා වාගේ මේ දියුණු තාක්ෂණය, අන්තර්ජාල පහසුකම්, සමාජ මාධ්‍ය සහ වෙනත් එවැනි තාක්ෂණික මෙවලම් සම්පූර්ණයෙන්ම නරකයි කියලා ඉවත් කරන්න අපට බැහැ; සම්පූර්ණයෙන්ම හොඳයි කියලා භාර ගන්නත් අපට බැහැ. මොකද, අපි දන්නවා අධ්‍යාපනයේ සමහර කඩ ඉම් අප වාගේම අපේ දරුවන් පසු කළේ මේ කියන මාධ්‍ය භාවිතයෙන් බව. මෑත ඉතිහාසය ගත්තාම, ගම්බද දරුවෝ අතිවිශාල පිරිසක් තමන්ගේ දැනුම සංවර්ධනය කර ගැනීමට මෙම මාධ්‍ය භාවිත කරනවා; විවිධ ගුරුවරුන්ගෙන් අධ්‍යාපනය ලබන්නත් මෙම මාධ්‍ය භාවිත කරනවා. කෙසේ නමුත්, ලෝකයේ සමහර රටවල් මේ සම්බන්ධයෙන් විවිධ සීමා පනවා තිබෙනවා. සමහර රටවල් දැඩි සීමා සහ තහනම් ක්‍රියාමාර්ග භාවිත කරනවා. තවත් සමහර රටවල් මෙය සැලසුම් කරන්නේ, දරුවන්ගේ ආරක්ෂාව සහතික කරන, ආරක්ෂාව මූලික කර ගත් සැලසුම්කරණය කියන වැඩසටහනක් ආකාරයටයි. එවැනි විවිධ ක්‍රියාමාර්ග තමයි රටවල් අනුගමනය කරන්නේ. එම නිසා මා හිතන විධියට, ලංකාව වාගේ රටවලටත් ගැළපෙන්නේ එවැනි දැඩි තහනම් කිරීම් වෙනුවට, ආරක්ෂාව මුල් කර ගත් සැලසුම්කරණයයි. එයයි අපට වැදගත් වන්නේ. එතැනදී අපි ජාත්‍යන්තර ප්‍රතිපත්ති, නියාමන සහ ප්‍රවේශ සම්බන්ධයෙනුත්, ශ්‍රී ලංකාවේ ආයතනික ක්‍රියාමාර්ග සම්බන්ධයෙනුත් අවබෝධ කර ගත යුතු වෙනවා. අපි මෙහිදී ගුරුවරුන් පුහුණු කර තිබෙනවා; පොලීසිය පුහුණු කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම දැනට ක්‍රියාත්මක වැඩසටහන් ද තිබෙනවා. විශේෂයෙන් මෙකී මාධ්‍ය තහනම් කරනවා වෙනුවට මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගත් brain health කියන වැඩසටහන, ඒ කියන්නේ මේ කියන සමාජ මාධ්‍ය භාවිතය නිසා දරුවන්ට සිදු විය හැකි හානිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම වැදගත් වනවා. ඒ සම්බන්ධයෙන් ලොකු අවබෝධයක් ලබා දීමට කටයුතු කිරීම තුළින්, මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම තුළින් අපට මෙය නියාමනය කර ගන්න පුළුවන් වනවා.

ඒ වාගේම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ළමා රක්ෂක නිලධාරින් ඉන්නවා. එම නිලධාරින් හරහා පාසල්වලට සහ වෙනත් අධ්‍යාපන ආයතනවලට දැනුවත් කිරීමේ වැඩසටහන් කරලා අපට පුළුවන් මේ තත්ත්වය, මේ හානිය පාලනය කර ගන්න. අපේ සමන්මලී මන්ත්‍රීතුමියත් කථා කළා, ආරක්ෂා වීම සහ පූර්ව සූදානම - protection and prevention - ගැන. මේක දරුවන්ට, දෙමව්පියන්ට සහ තරුණයන්ට උගන්වලා ඒ තුළින් ආරක්ෂා වීම සහ පූර්ව සූදානම් වීම කරන්න පුළුවන්. දැනුවත් කිරීමේ විවිධ වැඩසටහන් තුළින් අපට මේ කටයුත්ත කරන්න පුළුවන්. කෙසේ නමුත්, මේක ඒකාබද්ධ වැඩ පිළිවෙළක්. මේක, තනි තීරණයක් මත, තනි ආයතනයකින්, තනි අමාත්‍යාංශයකින් කරන්න පුළුවන් කාරණයක් නොවෙයි. ඒ නිසා අධ්‍යාපන අමාත්‍යාංශය, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය වාගේ විවිධ ආයතන එකතු කරගෙන, ඒ හැම කෙනෙකුම මූලික කරගෙන සාකච්ඡා කරලා දරුවන් බේරාගත යුතුයි. ඒ සඳහා තමයි අපි කටයුතු කළ යුත්තේ. ඒ නිසා ආණ්ඩුවක් විධියට අපි මේ යෝජනාව ක්‍රියාත්මක කිරීමේදී ඒකාබද්ධ වැඩ පිළිවෙළක් යටතේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව සපථ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.31]

**ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා (කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நாமல் சுதர்சன - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Namal Sudarshana - Deputy Minister of Women and Child Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මැතිතුමා විසින් ඉදිරිපත් කරපු සභාව කල් තැබීමේ යෝජනාව ගැන සාකච්ඡා කරන මේ අවස්ථාවේ මටත් යම් අදහසක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම බොහොම වැදගත් කාරණාවක් තමයි එතුමා මතු කළේ. හැබැයි, අපි ආණ්ඩුවක් විධියට මේ වෙනකොටත් මේ සම්බන්ධව වැදගත් ක්‍රියාමාර්ග කිහිපයක් ගනිමින් ඉන්නවා. ඒ වාගේම මේ ගැන ලොකු සංවාදයක්, සාකච්ඡාවක් මතු කරමින් ඉන්නවා. මේ සම්බන්ධයෙන් අධිකරණ ඇමතිතුමාගේ පැත්තෙන් මතු වුණු කාරණාවක් තමයි, Online Safety Act එක. ඒක අවසන් අදියර දක්වා ගෙනැල්ලා තිබෙනවා. අපි ඒක නුදුරේදීම අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. ඔබතුමන්ලාගේ පැත්තෙනුත් ඒ සම්බන්ධයෙන් අදහස් හා යෝජනා තිබෙනවා නම් ඉදිරිපත් කරන්න. එතකොට අපට අලුතින් දේවල් එකතු කරගන්න පුළුවන්. ඒකට අවස්ථාවක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කෙටි කාලය ඇතුළත මේ කාරණයට අදාළව මතුවෙච්ච කාරණාවලට විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ කියලා අපි හිතනවා. මේ සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් තමයි අපට අරගන්න වෙන්නේ. දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන්, අන්තර්ජාලය හරහා දරුවන්ට සිදුවෙන අකටයුතුකම් සම්බන්ධයෙන්, ඒත් එක්කම සමාජ මාධ්‍ය හරහා දරුවන්ට සිදුවෙන හිංසනය සම්බන්ධයෙන් වාගේම, screen addiction වාගේ දේවල්, මානසිකව බලපාන දේවල්, දරුවන්ගේ සෞඛ්‍යයට බලපාන දේවල් සහ ඔවුන්ගේ සංවර්ධනයට බලපාන කාරණා සම්බන්ධයෙන් ඒකාබද්ධ ප්‍රවේශයක් අපි අරගෙන තිබෙනවා. අපි මේ වෙනකොට ඒ පිළිබඳ සාකච්ඡා වට කිහිපයක් පවත්වලා තිබෙනවා. අපි මේ සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ පිහිටුවා තිබෙන Digital Task Force එකේ පිරිස ඇතුළු ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශය කියන මේ සියලු පාර්ශ්ව එකතු කරගෙන තිබෙනවා. මේ සම්බන්ධයෙන් හොඳ අදහසක් යුනිසෙෆ් වාගේ ජාත්‍යන්තර සංවිධානවලටත් තිබෙනවා. ඔවුන්ට මේ පිළිබඳ තොරතුරු සහ දත්ත ප්‍රමාණයක් තිබෙනවා. අපි සියලුදෙනා එකතුවෙලා සාකච්ඡා වට කිහිපයක්ම මේ වෙනකොට පවත්වලා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමා මතු කළා වාගේම, මේ වෙනකොට ජාත්‍යන්තර වශයෙන් විවිධ රටවල් මේ සම්බන්ධයෙන් විවිධ ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒවා ගැනත් අපි අධ්‍යයනයක් කරමින් පවතිනවා. විවිධ රටවල් විවිධ ක්‍රමවලින් උත්සාහ ගනිමින් ඉන්නවා මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්න. එක පැත්තකින් දැඩි සීමා සහ ව්‍යුහාත්මක ප්‍රවේශයක් අරගෙන තිබෙනවා. උදාහරණයක් විධියට, මෑතකදී ඕස්ට්‍රේලියාව ගත් තීන්දුව ගන්න පුළුවන්. වයස් සීමා අනුව සමාජ මාධ්‍ය තහනම් කිරීම. ඊළඟට පද්ධතිමය ආරක්ෂාව මුල්කර ගත් සැලසුම්කරණය. ඒ සඳහා එක්සත් රාජධානිය ඉදිරිපත් කරපු Online Safety Act එක තිබෙනවා. ඒත් එක්කම යුරෝපා සංගමය ඉදිරිපත් කර තිබෙන Digital Services Act එක තිබෙනවා. මේ විධියට, මේකට උත්තර හොයන්න විවිධ රටවල් විවිධ ආකාරයේ ක්‍රම පාවිච්චි කරමින් ඉන්නවා. අපි මේ සියල්ල ගැන හොඳම අධ්‍යයනයක් සහිතව කටයුතු කරනවා.

අනික් පැත්තෙන් අපි හිතන්න ඕනෑ කාරණයකුත් තිබෙනවා. අපි රටක් විධියට ඩිජිටල්කරණය සම්බන්ධයෙන් ලොකු මැදිහත්වීමක් කරන ගමන්, මේ ඩිජිටල් තාක්ෂණය කොහොමද දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් පාවිච්චි කරන්නේ කියන කාරණය ගැනත් සංවාදයක් කරමින් සිටිනවා. මේ ඩිජිටල් පද්ධති තුළ, ඩිජිටල් අවකාශය තුළ දරුවන්ට ලැබෙන අධ්‍යාපන අවස්ථා අපට අහිමි කරන්න බැහැ. ඒ පැත්තත් අපට කල්පනා කරන්න වෙනවා. මේ සියලු කාරණාත් එක්ක තමයි අපට ආණ්ඩුවක් විධියට මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න වෙන්නේ.

ඉතින් මම හිතනවා, මේ සංවාදය මතු වන එක අතිශයින් වැදගත් කියලා. මේ කෙටි කාලය තුළ වුණත් මතු වෙච්ච කාරණා ඉතාම වැදගත්. ඒ නිසා විශේෂයෙන් අපි ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා මේ කාරණය මතු කිරීම වෙනුවෙන්. අපි රජයක් විධියට මේ වෙනකොටත් සියලු පාර්ශ්ව එකතු කරගනිමින්, සාමූහිකව සාකච්ඡා කරමින්, මේ සඳහා ඉතා ඉක්මනින් ක්‍රියාමාර්ග ගන්න අවශ්‍ය වැඩකටයුතු සකස් කරමින් ඉන්නවාය කියන කාරණාව මතක් කරන්නට අවශ්‍යයි.

ඒ එක්කම, අපි මතු කරගන්න ඕනෑ කාරණාවක් තමයි, මේක හුදු නීතිමය තත්ත්ව ඇතුළේ විතරක් පාලනය කරන්න පුළුවන් දෙයකුත් නොවෙයි කියන එක. මේ පිළිබඳව දෙමාපියන්ටත් ලොකු වගකීමක් තිබෙනවා. අපි දන්නවා, සමහර අවස්ථාවල දරුවාට බත් ටික කවාගන්න පවා දරුවාගේ අතට ජංගම දුරකථනය දෙනවා. එතැනින් තමයි මේ addiction කියන එක පටන් ගන්නේ. එතැන ඉඳලා තමයි පටන් ගන්නේ. එහෙම අවස්ථා අපි දැකලා තිබෙනවා. ඒ නිසා සමස්තයක් විධියට දෙමාපියන්ටත් ලොකු වගකීමක් තිබෙනවා, මේ සඳහා මැදිහත්වීමක් කරන්න. මේ වනකොටත් විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය මැදිහත් වෙලා මේ පිළිබඳව ගුරුවරු දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් යනවා. මම හිතනවා, මේ කාරණය ගැන ගුරුවරු දැනුවත් කිරීමත් අතිශයින් වැදගත් කියලා. මීට අදාළ නීතිමය කටයුතු සහ නියාමන කටයුතු කරන අතරතුර කලාපීය වශයෙන් සහයෝගිතාව ශක්තිමත් කර ගැනීම ගෝලීය තත්ත්වයට මුහුණ දීමටත් අතිශයින් වැදගත් කියලා අපි

හිතනවා. අපි මේ වනකොටත් සාර්ක් රටවල් විධියට, දකුණු ආසියාතික රටවල් විධියට ඒ පිළිබඳ යම්කිසි සාකච්ඡාවක් ගොඩනගමින් ඉන්නවා, කලාපයක් විධියට අපි මේ තත්ත්වයට මුහුණ දෙන්නේ කොහොමද කියන කාරණය ගැන. මේ සියල්ල එක්කම තමයි අපි ඉදිරි කටයුතු කරමින් ඉන්නේ. විශේෂයෙන්ම අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූලිකත්වයෙන් ගොඩනගා තිබෙන කාර්ය සාධක බලකායේ උපදෙසුත් ඇතිව, ඩිජිටල් කටයුතු අමාත්‍යාංශයේ සහයෝගයත් ඇතිව, අනෙකුත් අමාත්‍යාංශ සියල්ලම එකතුවෙලා, මේ digital platforms හරහා දරුවන්ට සිදුවන හිංසන පිළිබඳ හොඳම අදහසක් සහිතව, අපේ රටේ දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කරන්නට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවාය කියන එක කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය විධියට මේ අවස්ථාවේදී සඳහන් කරන්නට කැමැතියි. ඒ එක්කම ඔබතුමන්ලාගේ පැත්තෙන් ලැබෙන අදහස් හා යෝජනාත් එකතු කරගනිමින්, අපේ රටේ දරුවන්ට හොඳම වටපිටාවක් ගොඩනගන්නට, ඩිජිටල් අවකාශය තුළ හිංසනයෙන් තොර පරිසරයක් ගොඩනගන්නට අවශ්‍ය මැදිහත්වීම සිදු කරමින්, අපි ඉදිරියේදී ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට රජයක් විධියට කඩිනම්ව කටයුතු කරනවා කියන කාරණාව තහවුරු කරමින්, මේ සාකච්ඡාව පාර්ලිමේන්තුව තුළට ගෙන ඒම වෙනුවෙන් ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.38ට, 2026 සැප්තැම්බර් 09වන බදාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.38க்கு, பாராளுமன்றம் 2026 செப்ரெம்பர் 09, புதன்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.38 p.m. until 9.30 a.m. on Wednesday, 09th September, 2026.*

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
# வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
# WRITTEN ANSWERS TO QUESTIONS

ගරු තුරෛරාසා රවිකරන් මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 1වන ප්‍රශ්නයට - 2166/2026 - පිළිතුර දීමට අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මාසයක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு துரைராசா ரவிகரன் அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 1ஆம் இலக்க வினாவுக்கு - 2166/2026 - விடையளிப்பதற்கு, பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்கள் ஒரு மாத கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. (Dr.) Harini Amarasuriya, Prime Minister and Minister of Education, Higher Education and Vocational Education has requested for one month's time to reply to Question No. 1 - 2166/2026 - raised by the Hon. Thurairasa Ravikaran, appearing in today's Order Paper.

## බණ්ඩාරගම ගෘහස්ථ ක්‍රීඩා සංකීර්ණය අසල ඇති කසළ එකතු කිරීමේ මධ්‍යස්ථානය: විස්තර
## பண்டாரகம, மாவட்ட விளையாட்டு கட்டடத்தொகுதிக்கு அருகிலுள்ள கழிவு சேகரிப்பு நிலையம்: விபரம்
## WASTE COLLECTION CENTRE ADJACENT TO INDOOR SPORTS COMPLEX, BANDARAGAMA: DETAILS

2183/2026

**2. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ, බණ්ඩාරගම පිහිටි `කළුතර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයට' යාබදව, මීට පෙර `බණ්ඩාරගම සති පොළ' පැවති පරිශ්‍රයේ කසළ එක්රැස් කරමින් පවතින බව දන්නේද;

(ii) එම පරිශ්‍රය තුළ කසළ එක්රැස් කිරීම සිදු කරනු ලබන ආයතනය කවරේද;

(iii) පරිශ්‍රය තුළ කසළ එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අනුමැතියන් ලබා ගෙන තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) එම කසළ එක්රැස් කරන ස්ථානයේ සිට -

(i) බණ්ඩාරගම ගෘහස්ථ ක්‍රීඩාගාරයට ඇති දුර;

(ii) බණ්ඩාරගම පිහිනුම් තටාකයට ඇති දුර;

(iii) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් පරිශ්‍රයට ඇති දුර;

(iv) විවෘත ව්‍යායාම මධ්‍යස්ථානයට ඇති දුර;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) මෙලෙස අනවසරයෙන් පවත්වාගෙන යනු ලබන කසළ එක්රැස් කිරීමේ මධ්‍යස්ථානය හේතුවෙන් බණ්ඩාරගම ගෘහස්ථ ක්‍රීඩාංගණයේ පුහුණුවීම් සිදු කරන ජාතික නෙට්බෝල් කණ්ඩායම ඇතුළු එම ක්‍රීඩාංගණය පරිහරණය කරන ක්‍රීඩකයන් මුහුණදී ඇති සෞඛ්‍ය ගැටලු සම්බන්ධයෙන් සිදු කරන ලද දැනුම්දීම්වලට අනුව ගෙන ඇති පියවර කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) களுத்துறை மாவட்டத்தின் பண்டாரகமவில் அமைந்துள்ள 'களுத்துறை மாவட்ட விளையாட்டு கட்டடத்தொகுதிக்கு' அருகில், முன்னர் 'பண்டாரகம வாராந்த சந்தை' இயங்கிய வளாகத்தில் கழிவுகள் சேகரிக்கப் பட்டு வருவதை அவர் அறிவாரா என்பதையும்;

(ii) மேற்படி வளாகத்தினுள் கழிவுகளைச் சேகரிக்கும் பணியை மேற்கொள்ளும் நிறுவனம் யாது என்பதையும்;

(iii) மேற்படி வளாகத்தினுள் கழிவு சேகரிப்பு மைய மொன்றைப் பராமரித்துச் செல்வதற்குத் தேவை யான அனுமதிகள் பெறப்பட்டுள்ளனவா என்பதையும்;

(iv) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்படி கழிவு சேகரிக்கும் இடத்திலிருந்து -

(i) பண்டாரகம உள்ளக விளையாட்டரங்குக்கான தூரம்;

(ii) பண்டாரகம நீச்சல் தடாகத்துக்கான தூரம்;

(iii) தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபைக்குச் சொந்தமான வளாகத்துக்கான தூரம்;

(iv) திறந்தவெளி உடற்பயிற்சி மையத்துக்கான தூரம்;

யாது என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) சட்டவிரோதமான முறையில் பராமரிக்கப்பட்டுவரும் இக்கழிவு சேகரிப்பு மையம் காரணமாக, பண்டாரகம உள்ளக விளையாட்டு அரங்கில் பயிற்சிகளை மேற்கொள்ளும் தேசிய வலைப்பந்தாட்டக் குழுவினர் உட்பட அவ்விளையாட்டு அரங்கைப் பயன்படுத்தும் விளையாட்டு வீரர்கள் எதிர்நோக்கும் சுகாதாரப் பிரச்சினைகள் தொடர்பாகக் கிடைத்த அறிவித்தல் களுக்கு அமைய எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும் அவர் இச்சபைக்கு மேலும் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) whether he is aware that garbage is being accumulated on the premises where the Bandaragama Weekly Fair was previously held, adjacent to the Kalutara District Sports Complex situated in Bandaragama in the Kalutara District;

(ii) the institution that is responsible for collecting garbage on the said premises;

(iii) whether the necessary approvals have been obtained to maintain a garbage collection centre on the said premises; and

(iv) if not, the reasons therefor?

(b) Will he also inform this House of the distance from the said garbage collection site to the -

(i) Bandaragama Indoor Stadium;

(ii) Bandaragama swimming pool;

(iii) premises belonging to the National Water Supply and Drainage Board; and

(iv) open gymnasium?

(c) Will he further inform this House of the steps that have been taken in response to the complaints received regarding the health issues faced by athletes, including the National Netball Team who utilize the Bandaragama Indoor Stadium, due to the operation of the said unauthorized garbage collection centre?

(d) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

(අ) (i) ඔව්.

(ii) බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව විසින් කසළ හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යනු ලැබේ.

(iii) නැත.

(iv) එම පරිශ්‍රය බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව සතු බැවින් සහ එකී ස්ථානය කසළ හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස පමණක් පවත්වාගෙන යනු ලබන බැවින් අනුමැතියක් ලබා ගැනීමේ අවශ්‍යතාවක් නොමැත.

(ආ) (i) දළ වශයෙන් 25m

(ii) දළ වශයෙන් 40m

(iii) යාබද පරිශ්‍රය

(iv) දළ වශයෙන් 1 ½Km (වැව්ට වැව වටා ඇති ව්‍යායාම මංතීරුව)

(ඇ) මෙය අනවසරයෙන් පවත්වාගෙන යන ස්ථායක් නොවන අතර, මෙම කසළ හුවමාරු මධ්‍යස්ථානය හේතුවෙන් බණ්ඩාරගම ගෘහස්ථ ක්‍රීඩාංගණය පරිහරණය කරන ක්‍රීඩකයින් මුහුණ දී ඇති සෞඛ්‍ය ගැටලු සම්බන්ධයෙන් මෙතෙක් කිසිදු පැමිණිල්ලක් සභාව වෙත ඉදිරිපත් වී නොමැත.

(ඈ) අදාළ නැත.

(அ) (i) ஆம்.

(ii) பண்டாரகம பிரதேச சபையால் கழிவுப் பரிமாற்ற மையமாகப் பராமரிக்கப்பட்டு வருகின்றது.

(iii) இல்லை.

(iv) அவ்வளாகம் பண்டாரகம பிரதேச சபைக்குச் சொந்தமானது என்பதாலும், அவ்விடம் கழிவுப் பரிமாற்ற மையமாக மட்டுமே பராமரிக்கப்பட்டு வருவதாலும், அனுமதி பெறவேண்டிய தேவை இல்லை.

(ஆ) (i) அண்ணளவாக 25m.

(ii) அண்ணளவாக 40m.

(iii) அருகிலுள்ள வளாகம்.

(iv) அண்ணளவாக 1 ½ Km (வேவிட்ட குளத்தைச் சுற்றியுள்ள உடற்பயிற்சி பாதை)

(இ) இது சட்டவிரோதமாக நடாத்திச் செல்லப்படும் இடமல்ல என்பதுடன், இக்கழிவுப் பரிமாற்ற மையம் காரணமாக பண்டாரகம உள்ளக விளையாட்டு அரங்கத்தைப் பயன்படுத்தும் வீரர்கள் எதிர் கொண்டுள்ள சுகாதாரப் பிரச்சினைகள் குறித்து இதுவரை எந்தவொரு முறைப்பாடும் சபைக்குச் சமர்ப்பிக்கப்படவில்லை.

(ஈ) பொருத்தமற்றது.

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

(a) (i) Yes.

(ii) It is maintained by the Bandaragama Pradeshiya Sabha as a waste exchange centre.

(iii) No.

(iv) As the said premises belong to the Bandaragama Pradeshiya Sabha and the said place is maintained only as a waste exchange centre, it is not necessary to obtain approval.

(b) (i) Approximately 25 m.

(ii) Approximately 40 m.

(iii) Adjoining premises.

(iv) Approximately 1.5 km - running track around the Wewita Tank.

(c) This is not a place maintained in an unauthorized manner, and no complaints whatsoever have been received to the Sabha in relation to the health issues faced by the sportsmen using the Bandaragama Indoor Stadium due to this waste exchange centre.

(d) Not applicable.

## කෘෂිකාර්මික මාර්ගයකට බාධා කිරීම සම්බන්ධයෙන් බී.වී. විජේසිරි මහතා සහ තවත් අය විසින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ල පිළිබඳ නියෝගය: බලාත්මක කිරීම

විவசாயப் பாதையில் தடை ஏற்படுத்தியமை தொடர்பாக திரு. பீ.வி. விஜேசிறி மற்றும் இதர நபர்கள் அளித்த புகாரின் மீதான ஆணை: நடைமுறைப்படுத்தல்

ORDER ON COMPLAINT BY MR. B.V. WIJESIRI AND OTHERS REGARDING OBSTRUCTION OF AGRICULTURAL ROAD: ENFORCEMENT

2184/2026

**3. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කළුතර, බෙල්ලන, එගොඩවත්ත පාරේ පදිංචි බී.වී. විජේසිරි යන අය ඇතුළු පිරිසක් විසින් 'පාරම්පරිකව කුඹුරු ඉඩම් වෙත භාවිත කළ ප්‍රවේශ මාර්ගය අවහිර කිරීම' සම්බන්ධයෙන් කරන ලද පැමිණිල්ලකට අදාළව, 2011 අංක 46 දරන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 90(1) වගන්තිය ප්‍රකාරව, කළුතර ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයා විසින් 2024.11.07 දිනැති අංක DAD/KL/L/04/පරි/2024 දරන නියෝගය නිකුත් කර ඇති බව දන්නේද;

(ii) එම නියෝගය මෙතෙක් ක්‍රියාත්මක කර නොමැති බවත්, එය බලාත්මක කිරීම සඳහා වගකිවයුතු නිලධාරීන් පියවර ගෙන නොමැති බවත් දන්නේද;

(iii) ප්‍රදේශයේ ගොවි ජනතාවගේ ප්‍රයෝජනය සඳහා භාවිත වන එම කෘෂි මාර්ගය හරහා කපිල කන්නන්ගර නමැති අයෙකු විසින් නීති විරෝධීව හා බලහත්කාරයෙන් ඉදිකර ඇති ගේට්ටුව සහ වැට කඩිනමින් ඉවත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) களுத்துறை, பெல்லன, எகொடவத்த வீதியில் வசிக்கும் பீ.வி. விஜேசிறி உள்ளிட்ட சிலரால், "பரம்பரை பரம்பரையாக வயல் காணிகளுக்குச் செல்வதற்காகப் பயன்படுத்திய பாதையில் தடை ஏற்படுத்தியமை" தொடர்பாக மேற்கொள்ளப் பட்ட முறைப்பாட்டுக்கு அமைய, 2011ஆம் ஆண்டின் 46ஆம் இலக்கச் சட்டத்தால் திருத்தப் பட்ட 2000ஆம் ஆண்டின் 46ஆம் இலக்க, கமநல அபிவிருத்திச் சட்டத்தின் 90(1)ஆம் பிரிவின் பிரகாரம், களுத்துறை கமநல அபிவிருத்தி உதவி ஆணையாளரால் 2024.11.07ஆம் திகதிய DAD/KL/L/04/පරි/2024ஆம் இலக்கக் கட்டளை பிறப்பிக்கப்பட்டுள்ளமையை அவர் அறிவாரா என்பதையும்;

(ii) தற்போதுவரை மேற்படி கட்டளை நடைமுறைப் படுத்தப்படவில்லை என்பதுடன், பொறுப்பு வாய்ந்த உத்தியோகத்தர்கள் அதனைச் செயல் வலுப்பெறச் செய்வதற்குத் தேவையான நடவடிக்கைகளை மேற்கொள்ளாமை பற்றி அவர் அறிவாரா என்பதையும்;

(iii) இப்பிரதேச விவசாயிகளின் தேவைகளுக்காகப் பயன்படுத்தப்படும் மேற்படி விவசாயப் பாதை யின் குறுக்கே கபில கன்னங்கர என்பவரால் சட்டவிரோதமான முறையில் மற்றும் பலவந்த மாக அமைக்கப்பட்ட வாயிற் கதவையும் வேலியையும் துரிதமாக அகற்றுவதற்காக மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether he is aware that the Assistant Commissioner of Agrarian Development, Kalutara, has issued Order No. DAD/KL/L/04/පරි/2024 dated 07.11.2024, in terms of Section 90(1) of the Agrarian Development Act, No. 46 of 2000, as amended by Act, No. 46 of 2011, in connection with a complaint made by the individual named B.V. Wijesiri and others residing at Egodawatta Road, Bellana, Kalutara, regarding obstruction of the access road traditionally used to reach paddy lands';

(ii) whether he is aware that the said Order has not been implemented to date and that the responsible officers have failed to take steps to enforce it; and

(iii) the measures that will be taken to promptly remove the gate and fence that a person named Kapila Kannangara has illegally and forcibly erected across the said agricultural road, which is used by the farming community in the area?

(b) If not, why?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

(අ) (i) ඔව්.

(ii) නියෝගය සම්බන්ධයෙන් වගඋත්තරකරු වන කපිල කන්නන්ගර යන අය විසින් අභියාචනා කර ඇති බැවින් ඊට අදාළ පරීක්ෂණ කටයුතු අවසන් වන තෙක් නියෝගය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කර ඇත.

(iii) එම පරීක්ෂණ කටයුතු අවසන්ව නියෝගය ක්‍රියාත්මක කිරීමට බාධාවක් නොමැති බව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 7/7/9/kl/4-59 සහ 2026.02.03 දිනැති ලිපියෙන් ගොවිජන සංවර්ධන කොමසාරිස් (කළුතර) වෙත දන්වා ඇත. නමුත්, වගඋත්තරකරු වන කපිල කන්නන්ගර යන අය විසින් නියෝගය සම්බන්ධයෙන් රිට් ආඥාවක් ලබා ගැනීම සඳහා බස්නාහිර පළාත්බද කළුතර මහාධිකරණයේ අංක HCW/98/2026 දරන නඩු ගොනු කර බැවින් එම පෙත්සම විභාග කිරීමෙන් අනතුරුව ඉදිරි පියවර ගැනීමට නියමිතය.

(ආ) අදාළ නොවේ.

(அ) (i) ஆம்.

(ii) இக்கட்டளை தொடர்பாகப் பிரதிவாதியான கபில கன்னங்கர என்பவரால் மேன்முறையீடு செய்யப்பட்டுள்ளமையால், அது தொடர்பான விசாரணைகள் முடிவடையும் வரை கட்டளையை நடைமுறைப்படுத்துவது தாமதமாக்கப்பட்டுள்ளது.

(iii) அவ்விசாரணைகள் முடிவடைந்து கட்டளையை நடைமுறைப்படுத்துவதற்கு எவ்விதத் தடையும் இல்லையென கமநல அபிவிருத்தி ஆணையாளர் நாயகத்தின் 7/7/9/kl/4-59ஆம் இலக்க 2026.02.03ஆம் திகதிய கடிதத்தின்மூலம் கமநல அபிவிருத்தி ஆணையாளருக்கு (களுத்துறை) அறிவிக்கப்பட்டுள்ளது. எனினும், பிரதிவாதி யான கபில கன்னங்கர என்பவரால் இக்கட்டளை தொடர்பாக 'ரிட்' ஆணை ஒன்றைப் பெற்றுக்கொள்வதற்காக களுத்துறை மேல் மாகாண மேல் நீதிமன்றத்தில் HCW 98/2026 என்ற வழக்கு இலக்கத்தின்கீழ் வழக்குத் தாக்கல் செய்யப்பட்டுள்ளமையால், அம்மனு விசாரணை செய்யப்பட்டதன் பின்னர் அடுத்த கட்ட நடவடிக்கைகள் எடுக்கப்படவுள்ளன.

(ஆ) எழவில்லை.

(a) (i) Yes.

(ii) Since respondent Kapila Kannangara has filed an appeal in connection with the order, the implementation of the order has been delayed until the relevant investigation is concluded.

(iii) The Commissioner General of Agrarian Development by his letter No. 7/7/9/kl/4-59 dated 03.02.2026 has informed the Commissioner of Agrarian Development, Kalutara that the aforementioned investigations have been concluded and there is no impediment to implement the order. However, since respondent Kapila Kannangara has filed case No. HCW 98/2026 in the Western Provincial High Court of Kalutara to obtain a writ regarding the order, further steps will be taken subsequent to the hearing of that petition.

(b) Not applicable.

## ඩිජිටල් පරිවර්තනය පිළිබඳව ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර අවබෝධතා ගිවිසුම: විස්තර
## இந்தியாவுக்கும் இலங்கைக்கும் இடையிலான டிஜிட்டல் மாற்றம் தொடர்பான புரிந்துணர்வு ஒப்பந்தம்: விபரம்
## MOU BETWEEN INDIA AND SRI LANKA ON DIGITAL TRANSFORMATION: DETAILS

2256/2026

**4. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2025.04.05 දින ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ඩිජිටල් පරිවර්තනය පිළිබඳ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබේද;

(ii) එම ගිවිසුමේ පාර්ශ්වකරුවන් කවුරුන්ද;

(iii) ගිවිසුම ප්‍රකාරව ගිවිසුමේ එක් එක් පාර්ශ්වය සතු වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මේ වන විට එම ගිවිසුම ක්‍රියාත්මක කිරීමට අදාළව ප්‍රගතිය කවරේද;

(v) ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් මේ දක්වා ආයෝජනය කර ඇති මුදල කොපමණද;

(vi) එම ගිවිසුම අනුව කටයුතු කිරීම ප්‍රමාදවී තිබේද;

(vii) එසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

டிஜிட்டல் பொருளாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2025.04.05ஆந் திகதி இந்தியாவும் இலங்கையும் டிஜிட்டல் மாற்றம் தொடர்பான புரிந்துணர்வு ஒப்பந்தமொன்றில் கைச்சாத்திட்டுள்ளதா என்பதையும்;

(ii) மேற்படி ஒப்பந்தத்தின் தரப்பினர் யாவர் என்பதையும்;

(iii) மேற்படி ஒப்பந்தத்தின் பிரகாரம், ஒவ்வொரு தரப்பினருக்கும் உரிய பொறுப்புகள் தனித் தனியாக யாவை என்பதையும்;

(iv) மேற்படி ஒப்பந்தத்தை நடைமுறைப்படுத்துவது தொடர்பாக தற்போது நிலவும் முன்னேற்றம் யாது என்பதையும்;

(v) மேற்படி ஒப்பந்தத்தை நடைமுறைப்படுத்துவதற்காக இலங்கை அரசாங்கத்தால் இதுவரை முதலீடு செய்யப்பட்டுள்ள நிதி எவ்வளவு என்பதையும்;

(vi) அவ்வொப்பந்தத்தின் பிரகாரம், நடவடிக்கைகளை மேற்கொள்வதில் தாமதம் ஏற்பட்டுள்ளதா என்பதையும்;

(vii) ஆமெனில், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Digital Economy:

(a) Will he inform this House -

(i) whether a Memorandum of Understanding was signed between Sri Lanka and India on digital transformation on 05.04.2025;

(ii) the parties to the said Agreement;

(iii) the respective responsibilities of each party under the said Agreement, separately;

(iv) the progress made to date in implementing the said Agreement;

(v) the amount invested by the Government of Sri Lanka to date for the implementation of the said Agreement;

(vi) whether there has been any delay in implementing the said Agreement; and

(vii) if so, the reasons for such delay?

(b) If not, why?

**ගරු අනුර කුමාර දිසානායක මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரும் டிஜிட்டல் பொருளாதார அமைச்சரும்)
(The Hon. Anura Kumara Dissanayake - President, Minister of Defence, Minister of Finance, Planning and Economic Development and Minister of Digital Economy)

(අ) (i) ඔව්.

(ii) ඉන්දියානු ජනරජයේ ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය.

(iii) ඩිජිටල් පරිවර්තනය සඳහා ජනගහන පරිමාණයෙන් සාර්ථකව ක්‍රියාත්මක කරන ලද ඩිජිටල් විසඳුම් හුවමාරු කර ගැනීමේ ක්ෂේත්‍රයේ සහයෝගීතාව පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය සහ ඉන්දීය ජනරජයේ ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමට අදාළව එක් එක් පාර්ශ්වය සතු වගකීම වෙන් වෙන් වශයෙන් දක්වා නොමැති අතර, මෙම ගිවිසුමට අදාළ ප්‍රධාන අරමුණු පහත දක්වා ඇත.

මෙම අවබෝධතා ගිවිසුම මඟින් ඩිජිටල් පරිවර්තනය සහ ජනගහන පරිමාණයෙන් සාර්ථකව ක්‍රියාත්මක කර ඇති ඩිජිටල් විසඳුම් හුවමාරු කර ගැනීම සම්බන්ධයෙන් සහයෝගීතා රාමුවක් ස්ථාපිත කරයි. දෙරට අතර අන්‍යෝන්‍ය දැනුම හුවමාරුව, ආයතනික හා මානව ධාරිතා සංවර්ධනය සහ ඩිජිටල් පරිසර පද්ධති ශක්තිමත් කිරීම මෙහි ප්‍රධාන අරමුණු වේ.

මෙම සහයෝගීතාව යටතේ දැනුම, තොරතුරු, හොඳ භාවිතයන්, තාක්ෂණික ද්‍රව්‍ය සහ විශේෂඥ දැනුම හුවමාරු කර ගැනීම, ධාරිතා සංවර්ධන හා පුහුණු වැඩසටහන් පැවැත්වීම, රාජ්‍ය නිලධාරින් හා විශේෂඥයින් හුවමාරු කිරීම, අධ්‍යයන චාරිකා, ඒකාබද්ධ වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධානය කිරීම සහ අදාළ නිලධාරින් හා විෂය විශේෂඥයින් අතර උපදේශන පැවැත්වීම සිදු කළ හැකිය. තවද, ශක්‍යතා අධ්‍යයන, විද්‍යුත් සූදානම්භාවය ඇගයීම්, ආයතනික සහයෝගීතාව, රාජ්‍ය හා පෞද්ගලික අංශ අතර සම්බන්ධතා සහ දැනටමත් සාර්ථකව ක්‍රියාත්මක කර ඇති ඩිජිටල් විසඳුම් අත්හදා බැලීම හා පුළුල් කිරීම ද මෙම ගිවිසුම යටතේ ප්‍රවර්ධනය කෙරේ.

(iv) මෙම ගිවිසුම යටතේ ඉන්දියාව සමඟ පහත කරුණු සම්බන්ධව වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. තවත් කාර්යයන් ආරම්භ කිරීම සඳහා අදාළ කටයුතු සාකච්ඡා මට්ටමේ පවතී.

1. <u>ඉන්දියා - ශ්‍රී ලංකා NASSCOM DISHA මාර්ගෝපදේශන වැඩසටහන.</u>

ඉන්දියා-ශ්‍රී ලංකා NASSCOM DISHA මාර්ගෝපදේශන වැඩසටහන යනු, ඉන්දියාවේ මෘදුකාංග හා සේවා සමාගම්වල ජාතික සංගමය වන NASSCOM විසින් ක්‍රියාත්මක කරන ප්‍රමුඛ තාක්ෂණික කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක - Tech SME - මාර්ගෝපදේශන වැඩසටහන වන "DISHA" ශ්‍රී ලංකාවේ තාක්ෂණික ක්ෂුද්‍ර හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙත ද විස්තාරණය කිරීමේ ඉන්දියා - ශ්‍රී ලංකා ඩිජිටල් ආර්ථික සහයෝගීතා මූල පිරිමයි. 2026 ජූලි මස කොළඹ දී, ශ්‍රී ලංකාව සඳහා ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය විසින් SLASSCOM සහ දේශීය දායකත්වකරුවන් සමඟ එක්ව දියත් කරන ලද මෙම වැඩසටහන යටතේ, තෝරාගත් ශ්‍රී ලාංකික තාක්ෂණික ක්ෂුද්‍ර හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 48දෙනෙකුට,

උපායමාර්ගික සැලසුම්කරණය, ව්‍යාපාරික වර්ධනය, සංවිධානාත්මක සංවර්ධනය සහ වෙළෙපොළ ප්‍රවේශය පිළිබඳව NASSCOM විශේෂඥයින් සහ ඉන්දීය කර්මාන්ත නායකයින්ගේ මාර්ගෝපදේශය ලබා දෙනු ලැබේ. මෙය ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ ව්‍යාපාරික ක්‍රියාවලි කළමනාකරණ - ICT/BPM - අංශයේ ධාරිතාව සහ ගෝලීය තරගකාරීත්වය තහවුරු කරමින්, ඩිජිටල් ආර්ථිකය තුළ ඉන්දියා - ශ්‍රී ලංකා සහයෝගීතාව ගැඹුරු කිරීම අරමුණු කරයි.

2. 'ගති ශක්ති' - GatiShakti - වැඩසටහන

ඉන්දියා-ශ්‍රී ලංකා අතර ගති ශක්ති - GatiShakti - වැඩසටහන යනු, බහු-ප්‍රවාහන යටිතල පහසුකම් සැලසුම්කරණය සහ විපත් කළමනාකරණය සඳහා ඉන්දියාව විසින් ක්‍රියාත්මක කරන PM GatiShakti ජාතික මට්ටමේ සැලැස්මේ විවෘත මූලාශ්‍ර රාමුව ශ්‍රී ලංකාව විසින් අනුගමනය කිරීම හා අනුවර්තනය කිරීමයි. 2025 - 2026 කාලයේ පැවති ඉහළ මට්ටමේ සාකච්ඡාවලින් අනතුරුව, ශ්‍රී ලංකා ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - DMC - සමඟ එක්ව, PM GatiShakti රාමුව මත පදනම් වූ භූ-අවකාශීය - geospatial - වේදිකාවක් සංවර්ධනය කර ඇත. මෙමඟින් රජයේ ආයතන අතර ඒකාබද්ධ සැලසුම්කරණය, විපත් බලපෑම් ඇගයීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා පොදු ඩිජිටල් වේදිකාවක් සපයනු ලැබේ. NITI Aayog වැනි ඉන්දීය ආයතන සමඟ දැනුම් හුවමාරුව, ධාරිතා වර්ධනය සහ තාක්ෂණික සහයෝගීතාව මෙම සහකාරීත්වයට ඇතුළත් වන අතර, ශ්‍රී ලංකාවට දේශීය විපත් අවදානම් අවම කිරීමේ හා සංවර්ධන අරමුණු සඳහා ඉන්දියාවේ දත්ත-පාදක සැලසුම්කරණ අත්දැකීම් ප්‍රයෝජනයට ගැනීමට හැකි වී ඇත.

3. ජංගම දුරකථන ආශ්‍රිත හදිසි අනතුරු ඇඟවීම් නියමු ව්‍යාපෘතිය - Cell Broadcasting Pilot

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර Cell Broadcasting පරීක්ෂණ ව්‍යාපෘතිය යනු, ඉන්දියාවේ දුරකථන පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය වන C-DoT විසින් ශ්‍රී ලංකාව සඳහා ජංගම ප්‍රසාරණ හදිසි අනතුරු ඇඟවීමේ පද්ධතියක්, Early Warning System - EWS - එකක් ප්‍රදර්ශනය කරන ලද විපත් අනතුරු ඇඟවීමේ සහයෝගීතාවයකි. මෙය ශ්‍රී ලංකාව තුළ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - DMC - සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය විසින් ඉන්දීය තාක්ෂණික ආයතනවල සහාය ඇතිව ක්‍රියාත්මක කිරීමට නියමිතය.

මෙම මුලපිරීම යටතේ ඉන්දීය ආයතන විසින් ශ්‍රී ලංකාව තුළ සෛල ප්‍රසාරණ පද්ධතිය සඳහා සංකල්ප-සාධන - proof-of-concept - ප්‍රදර්ශන සාර්ථකව සිදු කරන ලද අතර, ගංවතුර, නියඟ, සුළි කුණාටු සහ වෙනත් හදිසි තත්ත්ව පිළිබඳ ජීවිතාරක්ෂක අනතුරු ඇඟවීම්, අන්තර්ජාලය හෝ දත්ත සම්බන්ධතාවක් නොමැතිව පවා, ඉලක්කගත ප්‍රදේශවල සිටින සියලු ජංගම දුරකථන වෙත ක්ෂණිකවම යැවිය හැකි ආකාරය පෙන්වා දෙන ලදී. මෙම පද්ධතිය දැනට විපත් සූදානම සඳහා ඉන්දියාවේ පුළුල් ප්‍රදානයක කොටසක් ලෙස දේශීය භාවිතය සඳහා අනුවර්තනය කරමින් පවතින අතර, Cell Broadcasting සහ පොදු අනතුරු ඇඟවීමේ ප්‍රොටෝකෝලය - Common Alerting Protocol - පිළිබඳ නියාමන හා තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව - TRCSL - සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සංවිධානය - ITU - ද මෙහි ලා සම්බන්ධ වේ.

(v) ශ්‍රී ලංකා රජය විසින් මේ දක්වා කිසිදු මුදලක් ආයෝජනය කර නොමැත.

(vi) යම් කාර්යයන් ආරම්භ වී ඇතත් ගිවිසුමට අදාළ ඉතිරි කටයුතු සිදු කිරීමේ යම් ප්‍රමාදයක් පවතී.

(vii) ධාරිතා සංවර්ධන හා පුහුණු වැඩසටහන් පැවැත්වීම, රාජ්‍ය නිලධාරින් හා විශේෂඥයින් හුවමාරු කිරීම, අධ්‍යයන චාරිකා, ඒකාබද්ධ වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධානය කිරීම යනාදී කාර්යයන් සඳහා අදාළ පාර්ශ්වකරුවන්ගේ කාලසටහන් සම්බන්ධීකරණයට යම් කාලයක් වැය වීම.

(ආ) අදාළ නොවේ.

(அ) (i) ஆம்.

(ii) இந்தியக் குடியரசின் இலத்திரனியல் மற்றும் தகவல் தொழில்நுட்ப அமைச்சு மற்றும் இலங்கை ஜனநாயக சோசலிசக் குடியரசின் டிஜிட்டல் பொருளாதார அமைச்சு.

(iii) இலங்கை ஜனநாயக சோசலிசக் குடியரசின் டிஜிட்டல் பொருளாதார அமைச்சுக்கும் இந்தியக் குடியரசின் இலத்திரனியல் மற்றும் தகவல் தொழில்நுட்ப அமைச்சுக்கும் இடையே டிஜிட்டல் உருமாற்றத்துக்காக மக்கள் அளவில் வெற்றிகரமாகச் செயற்படுத்தப்பட்ட டிஜிட்டல் தீர்வுகளைப் பகிர்ந்துகொள்ளும் துறையில் ஒத்துழைப்பு வழங்குவது தொடர்பான புரிந்துணர்வு ஒப்பந்தம் - MoU - ஒவ்வொரு தரப்பினரின் பொறுப்புகளையும் தனித்தனி யாகக் குறிப்பிடவில்லை. மேலும், இந்த ஒப்பந்தத்தின் முக்கிய நோக்கங்கள் பின்வருமாறு:

இந்தப் புரிந்துணர்வு ஒப்பந்தம், டிஜிட்டல் உருமாற்றத்துக்காக மக்கள் அளவில் வெற்றி கரமான டிஜிட்டல் தீர்வுகளைப் பகிர்ந்து கொள்ளும் துறையில் ஒத்துழைப்புக்கான ஒரு கட்டமைப்பை நிறுவுகிறது. இரு நாடுகளுக்கும் இடையே பரஸ்பர அறிவுப் பரிமாற்றம், நிறுவன மற்றும் மனித ஆற்றல் மேம்பாடு மற்றும் டிஜிட்டல் சூழல் அமைப்புகளை வலுப் படுத்துதல் ஆகியவை இதன் முக்கிய நோக்கங்களாகும்.

இந்த ஒத்துழைப்பில் அறிவு, தகவல், சிறந்த நடைமுறைகள், தொழில்நுட்பப் பொருட்கள் மற்றும் நிபுணத்துவம் ஆகியவற்றின் பரிமாற்றம், திறன் மேம்பாடு மற்றும் பயிற்சித் திட்டங்கள், அரசாங்க அதிகாரிகள் மற்றும் நிபுணர்களின்

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

பரிமாற்றம், கல்விச் சுற்றுப்பயணங்கள், கூட்டுப் பட்டறைகள் மற்றும் கருத்தரங்குகளை ஏற்பாடு செய்தல், தொடர்புடைய அதிகாரிகள் மற்றும் துறைசார் நிபுணர்களுக்கு இடையேயான ஆலோசனைகள் ஆகியவை அடங்கும். மேலும், இந்த ஒப்பந்தத்தின்கீழ் சாத்தியக்கூறு ஆய்வுகள், இலத்திரனியல் தயார்நிலை மதிப்பீடுகள், நிறுவன ஒத்துழைப்பு, பொது - தனியார் துறை இணைப்புகள் மற்றும் ஏற்கனவே வெற்றி கரமாகச் செயற்படுத்தப்பட்ட டிஜிட்டல் தீர்வுகளை முன்னோட்டமிட்டு விரிவுபடுத்துதல் ஆகியவையும் ஊக்குவிக்கப்படும்.

(iv) இந்த ஒப்பந்தத்தின்கீழ் இந்தியாவுடன் பின்வரும் விடயங்கள் சம்பந்தமான திட்டங்கள் செயற்படுத்தப்பட்டுள்ளன. மேலும் சில பணி களைத் தொடங்குவதற்கான நடவடிக்கைகள் கலந்துரையாடல் மட்டத்தில் உள்ளன.

1. இந்தியா-இலங்கை NASSCOM திட்டம்

இந்தியா-இலங்கை NASSCOM - NaSCoM - DISHA வழிகாட்டுதல் திட்டம் -Mentorship Programme- என்பது ஒரு டிஜிட்டல்-பொருளாதார ஒத்துழைப்பு முயற்சியாகும். இதன்கீழ், இந்தியாவின் "மென்பொருள் மற்றும் சேவை நிறுவனங்களின் தேசிய சங்கம்" - NASSCOM - தனது முதன்மைத் திட்டமான 'Tech SME Mentorship Programme - DISHA'ஐ, இந்தியாவுக்கு வெளியே முதன்முறையாக இலங்கையின் தொழில் நுட்பம் சார்ந்த சிறு மற்றும் நடுத்தர நிறுவனங்களுக்கு - SMEs - விரிவுபடுத்தி யுள்ளது. SLASSCOM மற்றும் உள்ளூர் பங்குதாரர்களுடன் இணைந்து கொழும் பிலுள்ள இந்திய உயர் ஸ்தானிகராலயத்தால் தொடங்கப்பட்ட இத்திட்டம், தேர்ந்தெடுக்கப் பட்ட 48 இலங்கை தொழில்நுட்ப SMEsக்கு முறையான மற்றும் அதிக தாக்கத்தை ஏற்படுத்தக்கூடிய வழிகாட்டுதலை வழங்குகிறது. உத்தி - strategy, வளர்ச்சித் திட்டமிடல், நிறுவன மேம்பாடு மற்றும் சந்தை அணுகல் ஆகியவற்றில் NASSCOM நிபுணர்கள் மற்றும் இந்தியத் துறைசார் தலைவர்களின் வழிகாட்டுதல் இதில் கிடைக்கிறது. இதன்மூலம் இலங்கையின் ICT/BPM துறையின் திறன் மற்றும் உலகளாவிய போட்டித்தன்மை வலுப்படுத் தப்படுவதுடன், டிஜிட்டல் பொருளா தாரத்தில் இந்தியா - இலங்கை இடையிலான ஒத்துழைப்பும் ஆழப்படுத்தப்படுகிறது.

2. கதி சக்தி திட்டம் - GatiShakti Programme

இந்தியாவுக்கும் இலங்கைக்கும் இடையே யான கதி சக்தி திட்டம் என்பது, ஒருங்கிணைந்த, புவிசார் அடிப்படையிலான உட்கட்டமைப்பு மற்றும் பேரிடர் மேலாண் மைத் திட்டமிடலுக்காக, இந்தியாவால் நடைமுறைப்படுத்தப்படும் 'கதி சக்தி' தேசிய பெருந்திட்டக் கட்டமைப்பை இலங்கை ஏற்றுக்கொண்டு, தனக்கு ஏற்றவாறு மாற்றி யமைத்துக்கொள்வதைக் குறிக்கிறது. 2025 - 2026ஆம் ஆண்டு காலப்பகுதியில் நடை பெற்ற உயர்மட்டக் கலந்துரையாடல்களைத் தொடர்ந்து, இலங்கையின் டிஜிட்டல் பொருளாதார அமைச்சு, பேரிடர் மேலாண்மை மையத்துடன் இணைந்து, பேரிடல் தாக்க மதிப்பீடு, திட்டமிடல் மற்றும் பதிலளிப்பு ஆகியவற்றில் முழு அரசாங் கத்தின் ஒருங்கிணைப்புக்கு ஆதரவளிக்கும் வகையில், திறந்த மூல PM 'கதி சக்தி' - open-source PM GatiShakti - கட்டமைப்பின்மீது ஒரு புவிசார் தளத்தை உருவாக்கியது. இந்த ஒத்துழைப்பில், NITI Aayog போன்ற இந்திய நிறுவனங்களுடன் அறிவுப் பரிமாற்றம், திறன் மேம்பாடு மற்றும் தொழில்நுட்ப ஒத்துழைப்பு ஆகியவை அடங்கும். இது உள்ளூர் பேரிடர் இடர் குறைப்பு மற்றும் அபிவிருத்தி முன்னுரிமைகளுக்கு ஏற்ப இந்த அமைப் பைத் தனிப்பயனாக்கும் அதேவேளையில், பல்முனை உட்கட்டமைப்பு வரைபடமாக்கல் மற்றும் தரவு சார்ந்த முடிவெடுத்தல் ஆகியவற்றில் இந்தியாவின் அனுபவத்தைப் பயன்படுத்திக்கொள்ள இலங்கைக்கு உதவுகிறது.

3. கைபேசி அடிப்படையிலான பேரிடர் எச்சரிக்கை அமைப்புக்கான செல் ஒளிபரப்பு முன்னோடித் திட்டம் - Cell Broadcasting Pilot for Mobile Phone-based Disaster Alert System

இந்தியாவுக்கும் இலங்கைக்கும் இடையே யான செல் ஒளிபரப்பு முன்னோடித் திட்டம் என்பது, ஒரு பேரிடர் முன்னெச்சரிக்கை ஒத்துழைப்பாகும். இதில் இந்தியாவின் தொலைத்தொடர்பு ஆராய்ச்சி மற்றும் மேம்பாட்டு மையமான தொலைத் தொடர்புத்துறை - C-DoT - இலங்கைக்காக ஒரு மொபைல் ஒளிபரப்பு முன்னெச்சரிக்கை அமைப்பை - EWS - செயல்விளக்கம் செய்துள்ளது. இதனை இந்திய தொழில்நுட்ப நிறுவனங்களின் ஆதரவுடன் பேரிடர் மேலாண்மை மையம் - DMC - மற்றும் டிஜிட்டல் பொருளாதார அமைச்சு செயற் படுத்த உள்ளன. இந்த முயற்சியின்கீழ், இந்திய நிறுவனங்கள் இலங்கையில் செல் ஒளிபரப்பு அமைப்பின் கருத்தாக்கச் சான்று, செயல் விளக்கங்களை நிறைவுசெய்தன. இதன்மூலம் இணையம் அல்லது மொபைல் தரவு இல்லாமலேயே வெள்ளம், நிலச்சரிவு, புயல் மற்றும் பிற அவசரநிலைகள் குறித்த உயிர்காக்கும் எச்சரிக்கைகளை ஒரு குறிப்பிட்ட பகுதியிலுள்ள அனைத்து கைய டக்கத் தொலைபேசிகளுக்கும் நேரடியாக எவ்வாறு அனுப்ப முடியும் என்பது காட்டப்பட்டது. பேரிடர் தயார்நிலையை ஆதரிக்கும் ஒரு பரந்த இந்திய மானியத்தின் ஒரு பகுதியாக இந்த அமைப்பு உள்ளூர் பயன்பாட்டுக்காக மாற்றியமைக்கப்பட்டு வருகிறது. மேலும், இலங்கை தொலைத் தொடர்புகள் ஒழுங்குபடுத்தும் ஆணைக்குழு - TRCSL, சர்வதேச தொலைத்தொடர்பு ஒன்றியம் - ITU - ஆகியவையும் செல்

ஒளிபரப்பு மற்றும் பொது எச்சரிக்கை நெறிமுறையின் ஒழுங்குமுறை மற்றும் தொழில்நுட்ப அம்சங்களில் ஈடுபட்டுள்ளன.

(v) இலங்கை அரசாங்கம் இதுவரை எந்தப் பணத்தையும் முதலீடு செய்யவில்லை.

(vi) சில பணிகள் தொடங்கப்பட்டு இருந்தாலும், இந்த ஒப்பந்தத்தின் எஞ்சிய செயற்பாடுகளைச் செயற்படுத்துவதற்குத் தேவையான ஆரம்பகட்ட நடவடிக்கைகளில் சற்று தாமதம் ஏற்பட்டுள்ளது.

(vii) திறன் மேம்பாடு மற்றும் பயிற்சித் திட்டங்களை நடத்துதல், அரச அதிகாரிகள் மற்றும் நிபுணர்களைப் பரிமாறிக்கொள்ளுதல், கல்விச் சுற்றுலாக்கள், கூட்டுப் பயிலரங்குகள் மற்றும் கருத்தரங்குகளை ஏற்பாடு செய்தல் போன்ற செயற்பாடுகளுக்கு சம்பந்தப்பட்ட தரப்பினரின் கால அட்டவணைகளை ஒருங்கிணைக்க கூடுதல் நேரம் தேவைப்படுகிறது.

(ஆ) ஏற்புடையதாகாது.

(a) (i) Yes.

(ii) The Ministry of Electronics and Information Technology of the Republic of India and the Ministry of Digital Economy of the Democratic Socialist Republic of Sri Lanka.

(iii) The Memorandum of Understanding - MoU - between the Ministry of Digital Economy, Democratic Socialist Republic of Sri Lanka and the Ministry of Electronics and Information Technology, Republic of India on Cooperation in the Field of Sharing Successfully Implemented Digital Solutions at Population Scale for Digital Transformation does not specify the responsibilities of each party separately and the main objectives of this Agreement are as follows:

This MoU establishes a framework for cooperation in the field of sharing successful digital solutions at population scale for digital transformation. The main objectives are mutual knowledge exchange, institutional and human capacity development and strengthening digital ecosystems between the two countries.

This cooperation may include the exchange of knowledge, information, good practices, technical materials and expertise, capacity development and training programmes, exchange of government officials and experts, study tours, organization of joint workshops and seminars, and consultations between relevant officials and subject experts. Furthermore, feasibility studies, e-readiness assessments, institutional cooperation, public-private sector linkages, and piloting and scaling up of already successfully implemented digital solutions will also be promoted under this Agreement.

(iv) Progress made to date in implementing the said Agreement under the following programmes, discussions are underway to initiate some more tasks.

1. <u>The India-Sri Lanka NASSCOM Programme</u>

The India-Sri Lanka NASSCOM - NaSCoM - DISHA Mentorship Programme is a digital-economy cooperation initiative under which India’s National Association of Software and Service Companies - NASSCOM - has extended its flagship Tech SME Mentorship Programme “DISHA” to Sri Lankan technology Small and Medium Enterprises - SMEs - for the first time outside India. Launched in July, 2026 in Colombo by the High Commission of India in collaboration with SLASSCOM and local stakeholders, the programme provides structured, high-impact mentorship to 48 selected Sri Lankan tech SMEs, with guidance from NASSCOM experts and Indian industry leaders on strategy, growth planning, organizational development and market access, thereby strengthening the capacity and global competitiveness of Sri Lanka’s ICT/ BPM sector and deepening India-Sri Lanka cooperation in the digital economy.

2. <u>"GatiShakti" Programme</u>

The GatiShakti Programme between India and Sri Lanka refers to Sri Lanka’s adoption and adaptation of India’s PM GatiShakti National Master Plan framework for integrated, geospatial-based infrastructure and disaster-management planning. Following high-level engagements in 2025-2026, Sri Lanka’s Ministry of Digital Economy, together with the Disaster Management Centre, developed a geospatial platform built on the open-source PM GatiShakti framework to support whole-of-government coordination for disaster impact assessment, planning and response. This cooperation includes knowledge exchange, capacity building and technical collaboration with Indian institutions such as NITI Aayog, enabling Sri Lanka to leverage India’s experience in multimodal infrastructure mapping and data-driven decision-

making while tailoring the system to local disaster-risk reduction and development priorities.

3. Cell Broadcasting Pilot for Mobile Phone-based Disaster Alert System.

The cell broadcasting pilot between India and Sri Lanka is a disaster early-warning cooperation, in which India's telecommunications R&D centre C-DoT has demonstrated a mobile broadcast Early Warning System - EWS - for Sri Lanka, to be implemented by the Disaster Management Centre - DMC - and the Ministry of Digital Economy with support from Indian technical agencies.

Under this initiative, Indian agencies completed proof-of-concept demonstrations of the cell broadcast system in Sri Lanka, showing how life-saving alerts of floods, landslides, cyclones and other emergencies could be sent directly to all mobile phones in a targeted area, even without Internet or mobile data. The system is being adapted for local use as part of a broader Indian grant supporting disaster preparedness, with the Telecommunications Regulatory Commissions of Sri Lanka - TRCSL - and the International Telecommunication Union - ITU - also engaging on regulatory and technical aspects of cell broadcast and the Common Alerting Protocol.

(v) The Sri Lankan Government has not invested any money so far.

(vi) Though some tasks have been initiated, there is some delay in implementing the remaining activities of this Agreement.

(vii) Need for additional time to coordinate scheduling timetables of respective stakeholders on activities such as conducting capacity development and training programmes exchanging government officials and experts, organizing study tours, joint workshops and seminars et cetera.

(b) Does not arise.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.